

Enid Blyton
මැලෝරි ටවර්ස් පාසල
MALORY TOWERS 1
හතුරු මිතුරු
පරිවර්තනය
ගාමිණී සමරකෝන්
WASANA PUBLICATIONS

# 01

ඩැරල් රිවර්ස්, කණ්ණාඩියෙන් තමා දෙස බැලුවා. එය දුම්රියට පිටත් වීමට වේලාව වුවද තම අලුත් පාසල් නිල ඇඳුමේ හැඩ බැලීමට තව විනාඩියක් තිබුණා.

"හරි ලස්සනයි" වටයක් කැරකී බලමින් ඇය කිව්වා. "දුඹුරු පාට කෝට් එක, දුඹුරු පාට ජොප්පිය, කහ රිබන් පටි, කහ බඳ පටිය. මේවා හොඳයි"

ඇගේ මව ඩැරල්ගේ කාමරයට එබී බැලුවා. ඇගේ මුහුණේ සිනාවක් ඇඳුණා. "හැඩ බලනවා ද ?" ඇය ඇසුවා. "මැලෝරි ටවර්ස් ඉස්කෝලේ නිල ඇඳුම ලස්සනයි. දැන් එන්න ඩැරල්. පළමු දවසෙම කෝච්චිය වරද්ද ගන්න හොඳ නෑ"

ඩැරල්ට ඇඩි සතුටක් දැනුණා. ඇය පළමු වතාවට නේවාසික පාසලකට යාමට සූදානම්ව සිටියා. මැලෝරි ටවර්ස් පාසලට අවුරුදු දොළහට අඩු අය බඳවා නොගත් නිසා ඩැරල් එහි කුඩාම සිසුවියක් වනු ඇත. විනෝදය, මිතුරුකම හා ඉගෙනීම, සෙල්ලම පිරි වාර කිහිපයක් එහි සිටීමට ඇය ආශාවෙන් බලා සිටියා. "ඉස්කෝලෙ මොන වගේ ඇති ද ?" ඇය කල්පනා කරන්නට වුණා. "ඉස්කෝලෙ ගැන හුඟාක් කතා කියවලා තිබුණාට මම හිතන්නේ මැලෝරි ටවර්ස් ඒ වගේ නැතිව ඇති. එක එක ඉස්කෝලෙ වෙනස්. එහේදි මම හුඟාක් යාළුවෝ හොයා ගන්නවා"

"ට්‍රන්ක පෙට්ටියේ බඩු පළමුවෙනි දවසෙ අස්කරන්නේ නැහැ." මව කිව්වා. "ඒ නිසා හැම ළමයෙක්ම රෑ ඇඳුමයි, දත් බුරුසුවයි වගේ දෙවල් එක්ක කුඩා බෑග් එකක් ගෙනෙනවා. මෙතන සිලිං දහයක් තියෙනවා. මීට වඩා සල්ලි ඔයාගේ පන්තියේ ළමයින්ට තියා ගන්න දෙන්නේ නැති නිසා මුළු වාරයටම මේක තියා ගන්න වෙනවා"

"මම පිරිමසා ගන්නම්" එය මුදල් පසුම්බියට දමා ගනිමින් ඩැරල් කිව්වා.

ඒ වන විට උදයේ වැඩට පිටත්ව ගොස් සිටි පියාට ඇය ආයුබෝවන් කියා තිබුණා. "මගේ සුබපැතුම් ඩැරල් ! මැලෝ ටවර්ස් හොඳම ඉස්කෝලයක් නිසා ඔයා හොඳට ඉගෙන ගනිවු ඒ වගේම ඉස්කෝලයටත් වැඩ කරන්න"

කුලී රථය පැමිණි අතර ඔවුන් දුම්රියපොළට පිටත් වුණා.

රියදුරා පසෙකින් ඇඳුම් පෙට්ටිය තබාගත් ඔවුන් ගමන් ආරම්භ කළා. රථ කවුළුවෙන් හිස දමා ආපසු බැලූ ඩැරල් අවසාන වරට තම නිවෙස දෙස බැලුවා. " මම ඉක්මනට එනවා !" තාප්පය මත මුහුණ පිසිමින් සිටි ලොකු කළු බළලාට ඇය කිව්වා. මට මුලදි පාළු දැනෙයි. ඒත් ඉක්මනට හුරුවෙන්න පුළුවන් වෙයි නේද, අම්මා !"



"ඇත්තෙන්ම ඔව්" ඇගේ මව කිව්වා. "හොඳ විනෝදයක් තියෙයි. ඔයාට ග්‍රීස්ම නිවාඩුවට ගෙදර එන්න හිතෙන එකක් නැහැ"

මැලෝරි ටවර්ස් පිහිටි කෝන්වෙල් බලා යන දුම්රිය අල්ලා ගැනීමට ඔවුන්ට ලන්ඩනයට යාමට සිදුව තිබුණා. "මැලෝරි ටවර්ස්වලට විශේෂ කෝච්චියක් තියෙනවා" රිවර්ස් මහත්මිය කිව්වා. "අර බලන්න. මැලෝරි ටවර්ස් වේදිකාව 7. ඉක්මනට



එන්න. අපි හොඳ වේලාවට ආවේ. මම විනාඩි කිහිපයක් ඉඳලා ඔයාව පන්තියේ ටීචර්ට බාරදීලා යන්නම්"

ඔවුන් වේදිකාව මතට ගියා. දිගු දුම්රියක් ඒ වෙතට පැමිණ තිබුණා. එහි මැලෝරි ටවර්ස් යනුවෙන් සඳහන්ව තිබුණ අතර සියලුම අසුන්, දැරියන් වෙනුවෙන් වෙන්කර තිබුණා. දුම්රිය මැදිරි වෙනම නම් කර තිබුණා. පළමුවැන්න උතුරු කුලුන, දෙවැන්න දකුණු කුලුන. පසුව බටහිර කුලුන හා නැගෙනහිර කුලුන ලෙස නම් කෙරුණ මැදිරි තිබුණා.

"ඔයා උතුරු කුලුන" මව කිව්වා. "මැලෝරි ටවර්ස් කියන්නේ කුලුනු හතර උඩ හදපු ගොඩනැගිලි හතරක් තියෙන ඉස්කෝලයක්. ඔයා ඉන්නේ උතුරු කුලුනේ. ප්‍රින්සිපල් මැඩම් කිව්වා ඔයාගේ පන්තියේ ටීචර්, මිස් පොට්ස් කියලා. අපි මුලින්ම එයා හම්බ වෙන්න ඕනෑ"

ඩැරල් දැරියන් පිරි වේදිකාවේ වටපිට බැලුවා. දුඹුරු කබා, හිස් වැසුම් හා කහ කොණ්ඩා පටි පැලඳ සිටි ඔවුන් සියලු දෙනාම මැලෝරි දැරියන් ලෙස පෙනුණා. ඔවුන් එකිනෙකා හඳුනන බව පෙනුණ අතර උස් හඬින් සිනාසෙමින් කතා කරමින් සිටියා. ඩැරල්ට හදිසියේම ලැජ්ජාවක් දැනුණා.

ප්‍රීතිමත් කටහඬවල් වේදිකාවේ දස දෙසින් නැගෙන්නට වුණා. ඩැරල් තම මව සෙව්වා. ඇඩි උද්‍යෝගිමත් මුහුණක් ඇති ගුරුතුමිය සමග ඇය කතා කරමින් සිටියා. ඒ පොට්ස් ගුරුතුමිය විය යුතුයි. ඩැරල් ඇය දෙස පුදුමයෙන් බැලුවා. ඇය එක්වරම ඇයට කැමති වුණා. ඇගේ දෙනෙත් දිලිසුණ ආකාරයට ඇය කැමති වුණා. එහෙත් ඇගේ මුවෙහි වූවේ යම් දැඩි පෙනුමක්. ඇයව අමනාප කර ගැනීම එතරම් හොඳ දෙයක් විය නොහැකි බව ඇයට වැටහුණා.

පොට්ස් ගුරුතුමිය පැමිණ ඩැරල්ට සිනාවක් පෑවා. "හොඳයි අලුත් ළමයා !" ඇය කිව්වා. "ඔයා යන්නේ මා එක්ක. අන්න අරක. අලුත් ළමයින් කවදත් යන්නේ මා එක්ක."

"තව අලුත් ළමයි ඉන්නවා ද ? මගේ පන්තියට මම විතරක් නෙමෙයි ද ?" ඩැරල් ඇසුවා.

“ඔව්. තව දෙන්නෙක්. [illegible] නැහැ. මිස
රිවර්ස්. මේ ඉන්නේ ඩැරල්ගේ පන්තියේ තවත් ළමයෙක්. ඇලිසි
ජෝන්ස්. ඔයා ගියාට කමක් නැහැ. එයා ඩැරල්ව බලා ගනියි”

“හෙලෝ” ඇලිසියා කතා කළ අතර ඇගේ දීප්තිමත් ඇ
දිලිසුණා. “මම ඉන්නේ ඔයාගෙ පන්තියේ. ඔයාට කෙළවරේ සී
එකක් ඕනෑ ද ? එහෙම නම් ඉක්මනට එන්න”

“එහෙම නම් මම යන්නම් දුවේ” රිවර්ස් මහත්මිය සතුටි
කියා ඩැරල්ට හාද්දක් දුන්නා. “ඔයා මට ලියුමක් එවපු ගමන්
මමත් ලියනවා. හොඳින් ඉන්න.”

“හොඳයි” කී ඩැරල් වේදිකාව ඔස්සේ යන මව දෙස බල
සිටියා. ඇයට පාළුවක් දැනීමට කල් නොතිබුණේ සම්පූර්ණ
පාලනය අතට ගත් ඇලිසියා ඇයව තල්ලු කරගෙන ගොස් පොට්
ගුරුතුමියගේ මැදිරියට නංවා ගත් නිසයි. “ඔයාගේ බෑග් එක එ
මුල්ලක තියන්න. මගේ එක අනිත් පැත්තෙන් තියන්නම්.” ඇලිසි
කිව්වා. “එතකොට අපිට සිද්ධවෙන දේවල් බලා ගන්න පුළුවන්
මේ අර බලන්න. හුරතල් දුවට යන්නම් කියන්න බැරි දර්ශනයක්

ඇලිසියා හිසින් පෙන්වූ දිශාව දෙස ඩැරල් බැලුවා. තමාගේ
වයසේ එම ඇඳුමින්ම සැරසුණු දැරියක් ඇය දුටු නමුත් ඇගේ
දිගු කෙස් කළඹ බුරුල්ව පහතට කඩා හැලුණා. ඇය තම මවගේ
සිරුරේ එල්ලී වැලපෙමින් සිටියා.

“දැන් ඒ අම්මා කරන්න ඕනෑ චොක්ලට් එකක් අතට ඔබල
හිනාවෙලා යන එකයි” ඇලිසියා කිව්වා. “එහෙම ළමයෙ
ඉන්නවා නම් වෙන මොකවත් කරලා හරියන්නේ නැහැ. පව්
හුරතල් අම්මා”

දැරිය මෙන්ම මව ද අයහපත් කෙනෙක් ! ඇගේ දෙකම්මුල්
දිගේ ද කඳුළු රූරා වැටුණා. පොට්ස් ගුරුතුමිය ඇඩි පියවරින්
ඔවුන් වෙතට ගියා.

“අන්න බලන්න පොට්ටි” ඇලිසියා කිව්වා. ඩැරල්ට මඳ
කම්පනයක් දැනුණා. “පොට්ටි !” පන්ති භාර ගුරුතුමියට දෙන්න
හොඳ නමක් ද ඒ. කෙසේ වෙතත් පොට්ස් ගුරුතුමිය ඇඩි බැල්මෙන්
යුතු වුණා.



“මම ගොන්ඩොලින්ව එක්ක යන්නම්” ඇය දැරියගේ මවට කිව්වා. “දැන් පිටත් වෙන්න වේලාව හරි. මෙයා හරි, ලැසී”

ගොන්ඩොලින් පිටත් වීමට සූදානම් බව පෙනුණ නමුත් ඇගේ මව එවර ඇගේ සිරුරේ එල්ලුණා. ඇලිසියා නොරිස්සුම්ව කතා කළා. “බලන්න, ගොන්ඩොලින්ව එතරම් මෝඩියක් වෙලා තියෙන්නේ ඇයි කියලා” ඇය කිව්වා. “එයාගේ අම්මා ! අපේ අම්මා නම් ඊට වඩා බුද්ධිමත්. ඔයාගේ අම්මත් හොඳයි වගේ පෙනුණා. සතුටින් හිටියේ”

තම මවව වර්ණනා කරනු ඇසුණ ඩැරල් ප්‍රීතියට පත්වුණා. පොට්ස් ගුරුතුමිය ඔවුන්ව ඇඩිව වෙන්කර ගොන්ඩොලින්ව මැදිරිය දෙසට කැඳවාගෙන එනු ඇය දුටුවා.

“ඇලිසියා ! මෙන්න තවත් කෙනෙක්” ඇය කිව්වා. ඇලිසියා ගොන්ඩොලින්ව මැදිරිය තුළට ඇද ගත්තා.

ගොන්ඩොලින්ගේ මව ද මැදිරිය වෙත පැමිණ ඇතුළත බැලුවා. “කොහේ සීට් එකකට යන්න දුවේ” ඇය කිව්වා. “එන්ජිම පැත්තට පස්ස හරවලා වාඩි වෙන්න එපා. ඒක අමාරුයි එතකොට”

තවත් දැරියක් මැදිරිය වෙතට ආවා. කුඩා ශක්තිමත් දැරියක් වූ ඇගේ හිසකෙස් තදින් පිටුපසට කර ගොතා තිබුණා. “මේක මිස් පොට්ස්ගේ පෙට්ටිය ද ?” ඇය ඇසුවා.

“ඔව්” ඇලිසියා කිව්වා. “ඔයා ද අනිත් ළමයා ? උතුරු කුලුනට?”

“ඔව්, මම සැලී හෝප්” දැරිය කිව්වා.

“කෝ ඔයාගෙ අම්මා ?” ඇලිසියා ඇසුවා. “ඉස්සරලාම එයා ඔයාව මිස් පොට්ස්ට බාර දෙන්න ඕනෑ. එතකොට එයා ඔයාගේ නම ලකුණු කර ගන්නවා”

“ඕ..... අපේ අම්මා මා එක්ක එන්න කරදර වුණේ නැහැ” සැලී කිව්වා. “මම ආවේ තනියම”

“දෙවියනේ !” ඇලිසියා කිව්වා. “එක එක අම්මලාගේ හැටි. සමහරු ඇවිදින් හිනාවෙලා යන්නම් කියලා යනවා. සමහරු

ඇවිදින් අඬනවා, වැලපෙනවා. තවත් සමහරු නිකමටවත් එන්නේ නැහැ"

"ඇලිසියා කතාව වැඩියි" පොට්ස් ගුරුතුමියගේ කටහඬ පැමිණියා. ඇලිසියාගේ දඩබ්බර කතා ගැන ඇය දැන සිටියා. හදිසියේ සිත රිදුණ ලැසී මහත්මිය ගොන්ඩොලින්ට තවත් උපදෙස් දෙන්න ගියේ නැහැ. ඇය කෝපයෙන් ඇලිසියා දෙස බැලුවා. වාසනාවකට මෙන් දුම්රිය නියාමකයා තම නළාව පිම්බ අතර ඒ සමගම ආසන සඳහා මහත් පොරයක් ඇති වුණා.

තවත් ඇරියන් දෙතුන් දෙනෙක් සමග පොට්ස් ගුරුතුමිය ඇතුළට පැන ගත්තා. දොර තදින් වැසුණා. ගොන්ඩොලින්ගේ මව ඇතුළට එබී බැලුව නමුත් තමා අතින් වැටුණ යමක් සොයමින් ගොන්ඩොලින් පහතට නැමී සිටියා. "කෝ ගොන්ඩොලින් !" ලැසී මහත්මියගේ කටහඬ පැමිණියා. "මම යන්නම් කියන්න ඕනෑ" කෝ....."

එහෙත් දුම්රිය හති දමමින් ඉදිරියට ඇදුණා. අසුනේ හේත්තු වූ ගොන්ඩොලින් අඬෝනා තියන්නට වුණා.

පොට්ස් ගුරුතුමිය ගොන්ඩොලින් දෙස බැලුවා. ඇය ඒ වන විට ඇරිය මැනගෙන තිබූ අතර ආත්මාර්ථකාමී හා පවුලේ එකම ඇරිය මෙන්ම මුලදී මෙල්ල කර ගැනීමට අපහසු බවක් දැන සිටියා.

ඇය ශාන්තව සිටින කුඩා සැලී හෝප් දෙස බැලුවා. තදින් පීරා ගෙතූ හිස කෙස් හා කුඩා පියකරු මුහුණක් ඇති විනෝදජනක කුඩා දැරියක්. ඇය පිටත්ව යනු බැලීමට මවක් පැමිණ තිබුණේ නැහැ. සැලී එය තැකුවා ද ? පොට්ස් ගුරුතුමියට සිතාගත නොහැකි වුණා.

අනතුරුව ඇය ඩැරල් දෙස බැලුවා.

"හොඳ, අවංක, විශ්වාසවන්ත ළමයෙක්" පොට්ස් ගුරුතුමිය සිතුවා. "ආංගලේ නැතුවත් නොවෙයි. හොඳ ඔළුවක් තියෙනවා වගේ පේනවා. ඒකෙන් වැඩක් ගන්න මම දැන ගන්න ඕනෑ. ඩැරල් වගේ ළමයෙක් එක්ක පන්තියේ කරන්න ඕනෑ දේවල් මම දන්නවා"



ඇරියෝ කතාබහ ආරම්භ කළා. "මැලෝරි ටවර්ස් මොනවගේ තැනක්ද ?" ඩැරල් ඇසුවා. "මම පින්තූර නම් දැකලා තියෙනවා හුඟාක් ලොකුයි වගේ"

"ඔව්, එතෙන්ට මුහුදෙ ලස්සන දර්ශන පෙනෙනවා. ඒක හදලා තියෙන්නේ කන්ද උඩ. ඔයත් උතුරු කුලුනට එන එක වාසනාවක්. එතෙන්ට තමයි මුහුද ලස්සනටම පේන්නේ"

"හැම කුලුනෙම පන්ති කාමර තියෙනවා ද ? ඩැරල් ඇසුවා. ඇලිසියා හිස වැනුවා.

"ඕ, නැහැ ! කුලුනු හතරෙම ළමයින්ගේ පන්ති තියෙන්නේ එකට. එක කුලුනක ළමයි හැටක් විතර ඉන්නවා. අපේ නායිකාව පැමෙලා. අර ඉන්නේ !"

පැමෙලා සම වයසෙම තවත් ගැහැනු ළමයෙකු සමග මැදිරියට පැමිණ සිටි අතර ඇය උස් ශාන්ත දැරියක් වුණා. ඔවුන් පොට්ස් ගුරුතුමිය සමග ඉතා කුළුපග බව පෙනුණ අතරවාරයේ ඉදිරි වැඩ කටයුතු ගැන සාකච්ඡා කරන බවක් පෙනුණා.

ඇලිසියා, ටෙසී නම් තවත් දැරියක්, සැලී හා ඩැරල් කතාවට වැටුණා. ගොන්ඩොලින් අඳුරු මුහුණින් යුතුව තම මුල්ලේ වාඩි වී සිටියා. කිසිවෙක් ඈ දෙස හෝ නොබැලූ අතර ඇයට එය නුහුරු දෙයක් වුණා !

ඇය සෙමින් ඉකියක් ගසා ඇස් කොණින් අනෙක් අය දෙස බැලුවා. ඇලිසියාගේ තියුණු ඇසට එය හසුවූ අතර ඇය සිනාවක් පෑවා. "බොරුවට !" ඇය ඩැරල්ට කෙඳිරුවා. "ඇත්තටම දුක තියෙන අය අහක බලාගෙන කොහොම හරි ඒක හංග ගන්න උත්සාහ කරනවා. අපේ හුරතල් ගොන්ඩොලින්ව ගණන් ගන්න එපා"

අහිංසක ගොන්ඩොලින් ! ඇලිසියාගේ අනුකම්පා විරහිත බව ඇයට යහපතක් බව ඇය දැන සිටියේ නැහැ. මැලෝරි ටවර්ස් හි ඇයගේ ජීවිතය දුෂ්කර වීමට හොඳින්ම ඉඩකඩ තිබුණා.

"හිතාවෙලා ඉන්න ගොන්ඩොලින්" සිත පිනවන කටහඬකින්

කතා කළ පොට්ස් ගුරුතුමිය නැවත වැඩිමල් දැරියන් සමග කතාවට වැටුණා.

"මට අසනීපයි" අවසානයේ අන් අයගේ අනුකම්පාව හා අවධානය ඇද ගැනීමට අධිෂ්ඨාන කරගත් ගොන්ඩොලින් කිව්වා.

"ඒ බවක් පේන්නේ නැහැ" සෘජුව කතා කරන ඇලිසියා කිව්වා. "එහෙම පේන්නේ නැහැ නේද මිස් පොට්ස් ? මම අසනීප වෙනකොට සුදුමැලි වෙනවා"

තමාට සැබෑවටම අසනීප වීමට තිබුණේ නම් හොඳයයි ගොන්ඩොලින් සිතුවා. ඉන් කට සැර කෙල්ලට පාඩමක් ඉගැන්විය හැකි යැයි ඇය සිතුවා. අසුනට හේත්තු වූ ඇය මුමුනන්නට වුණා. "මට ඇත්තටම අසනීපයක් දැනෙනවා. අනේ, මම මොනවා කරන්න ද ?"

"මේ, ටිකක් ඉන්න..... මා ළඟ උරයක් තියෙනවා." ඊ ඇලිසියා තම ගමන් මල්ලට අත දමා විශාල කවරයක් පිටතට ගත්තා. "අපේ මල්ලි කාර් එකේ යද්දි නිතරම අසනීප වෙන නිසා අම්මා මේ වගේ උර ගෙනියනවා. එයාට අසනීප වෙද්දි අම්මා මේ උර මුහුණට දානවා. එතකොට හරියට අශ්වයෙක් වගේ"

ඇලිසියාගේ කතාව ඇසුණ සෑම කෙනෙකුටම සිනා නොවී සිටීමට බැරි වුණා. ගොන්ඩොලින් පමණක් සිනා නොවුණ අතර ඇය රවා බැලුවා. නපුරු කෙල්ල නැවතත් ඇයට විහිළු කරන්න පටන් අරගෙන. ඇය කිසිදින එම දැරියට කැමති වන්නේ නැහැ.

එහෙත් ඩැරල් ඇලිසියා දෙස බැලුවේ සොම්නසින් වූ අතර ඇයට දැරිය ගැන ප්‍රිය බවක් ඇතිවෙන්නට වුණා. ඔවුන්ට එකතුව මොන තරම් විනෝද විය හැකිදැයි සිතුණා.



# 02

මැලෝරි ටවර්ස් දුම්රියපොළට ළඟා වීම සතුට ගෙනදෙන දෙයක්. පාසල පිහිටියේ ඉන් හැතැප්මකින් දෙකකින් ඔබ්බෙන් වූ අතර දැරියන්ව පාසලට රැගෙන යාමට පාසල් බස් රථය පිටත සූදානම්ව තිබුණා.

"එන්න" ඩැරල්ගේ අතින් අදිමින් ඇලිසියා කිව්වා. අපි ඉක්මන් කළොත් බස් එකේ ඉස්සරහ සීට් අල්ලා ගන්න පුළුවන්. ඉක්මන් කරන්න. ඔයාගේ බෑග් එක ගන්න"

"මමත් එනවා" ගොන්ඩොලින් කිව්වා. එහෙත් ඇය තමා සතු දේ රැස්කර ගැනීමට පෙර දැරියෝ බැසගොස් තිබුණා. ඔවුන් රියදුරාගේ අසුනට පසුපසින් වාඩි ගන්නා විට දෙදෙනා තුන්දෙනා බැගින් දැරියෝ පෙළට පැමිණෙන්නට වුණා. රියදුරත් සමග දුම්රියපොළේ එකම බඩු ඔසවන්නා දැරියන්ගේ ට්‍රන්ක පෙට්ටි බස් රථයට පටවන්නට වුණා.

"අපිට ඉස්කෝලෙ පෙනෙනවා ද ?" අතරමගදී ඩැරල් ඇසුවා.

"නැහැ. මම කියන්නම්කෝ වංගුවක් තියෙනවා. එතැනදී යාන්තම් පෙනෙනවා" ඇලිසියා කිව්වා.

"ඔව්, එතැන දී ලස්සනට පෙනෙනවා" ඩැරල්ට හා ඇලිසියාට පසුපසින් නිහඬව සිටි පැමෙලා, කිව්වා. කතා කරන අතරේ ඇගේ ඇස් දිලිසුණා. "මම හිතන්නේ ඉර බැහැගෙන යන වේලාවට මැලෝරි ටවර්ස් හරි ලස්සනට එතෙන්ට පෙනෙනවා කියලා"

තම පාසල ගැන කතා කරන විට පැමෙලාගේ හඬෙහි මහත් සතුටක් ඇති බව ඩැරල්ට දැනුණා. ඈ දෙස බැලූ ඩැරල්ට ඈ ගැන ඇල්මක් ඇතිවුණා.

ඇගේ බැල්ම දුටු පැමෙලා හඬනගා සිනාසුණා. "තවත් වාර ගණනක් ඔයාට ඉස්කෝලෙ ඉන්න පුළුවන් ඩැරල්. ඒත් මම අස්වෙලා යන්නයි ඉන්නේ. තව වාරයක් දෙකක් ගියාට පස්සෙ

මම එන්නේ නැහැ. ඊළඟට එන්න වෙන්නේ ආදි ශිෂ්‍යාවක් හැටියට විතරයි. ඔයත් හොඳට වැඩ කරගෙන යන්න"

"මම උත්සාහ කරනවා" පසුගිය අවුරුදු හය පුරා ඒමට සිහින මැවූ තම පාසල බලා ගැනීමේ ආශාවෙන් යුතුව ජනේලයෙන් පිටත බලමින් ඩැරල් කිව්වා.

ඔවුන් වංගුවක් පසු කරත්ම ඇලිසියා වැලමිටෙන් ඇන්නා. "අන්න..... අර බලන්න කන්ද උඩ. දැක්කෙ නැහැ නේද ?"

ඩැරල් බැලුවා. කන්ද උඩ ඇති සුදු පැහැ හතරැස් ගොඩනැගිල්ල ඇයට දැක ගැනීමට හැකි වූ අතර එම කන්ද මුහුදට බෑවුම් වී ඇති බව ඇයට පෙනුණා. ඉදිරියේ ඇති කුලුනු දෙකත් පසුපස ඇති අනෙක් කුලුනුවල ඡායාවන් ද ඇයට දැකගත හැකි වුණා.

ජනේලය දිලිසුණ අතර බිත්ති මත වැවී තිබුණු කොළ පැහැ වැල් නිසා එය පැරණි බළකොටුවක් ලෙස පෙනුණා.

"ඒ මගේ ඉස්කෝලේ !" උණුසුම් සිතුවිල්ලකින් යුතුව ඩැරල් බලා සිටියා.

"මැලෝරි ටවර්ස් මගේ ඉස්කෝලෙ වුණ එක මට හරි වාසනාවක්. මම හොඳට වැඩ කරනවා"

"ඉස්කෝලෙ කොහොම ද ?" හදිසියේම ඇලිසියා ඇසුවා.

"ඔව්, හුඟක් කැමතියි" ඩැරල් කිව්වා. "ඒක හුඟාක් ලොකු එකක්"

"හරි, මම ඔයාට තැන පෙන්වන්නම්" ඇලිසියා කිව්වා. "ඔයාට ඉක්මනින් වටපිටාවට හුරු වෙන්න පුළුවන් වෙයි."

බස් රථය තවත් වංගුවක් ගනිද්දී පාසල නොපෙනී ගියා. තවත් වංගුවක් පසු කළ පසු එය වඩාත් සමීපව පෙනුණා. තවත් වැඩි වේලාවක් යාමට පෙර විශාල ඉදිරි දොරටුව දක්වා නැගෙන පියගැට පෙළ අසල නැවතුණ බස් රථය ගෙරවිලි හඬ නැගුවා.

"මාලිගාවකට ඇතුල් වෙන දොරටුවක් වගේ" ඩැරල් කිව්වා.



"ඔව්" ඔවුන් පසුපසින් සිටි ගොන්ඩොලින් හදිසියේම කතා කළා. "මම ඒ පඩිපෙළ දිගේ නගින සුරංගනාවියක් කියලා හිතේවි" කී ඇය ඇගේ රන්වන් කෙස් කළඹ උරපතු මත විහිදුවා ගත්තා.

"ඔව්, එහෙමම හිතෙයි" ඇලිසියා අවඥාවෙන් කිව්වා. "පොට්ටි එක්ක වැඩ කරද්දි ඔයාට ඒක හොඳට දැනෙයි"

බසයෙන් බැසගත් ඩැරල් කඩිමුඩියේ පියගැටපෙළ නගින දරුවන් අතරට මැදි වුණා. ඇලිසියා සොයා ඇය වටපිට බැලුව ද ඇය අතුරුදහන්ව තිබුණා. එහෙයින්, දොඩමලු වූ දැරියන් අතර තනිවූ හා අතරමං වූ බවක් හැඟුණ ඇය පියගැට පෙළ ඉහළටම නැංගා. කුඩා බෑගයත්, ටෙනිස් පිත්තත් ඇගේ දෑතේ සිරවී තිබුණා. මිතුරු ඇලිසියා නොමැතිව ඇයට මඳ කලබල ගතියක් දැනුණා.

සියල්ල අපැහැදිලිව පෙනුණ ඩැරල්ට කොහේ යන්න ද, කුමක් කරන්න ද කියා සිතා ගැනීමට අපහසු වුණා. ඇලිසියා හෝ පැමෙලා දැක ගැනීමට ඇය උනන්දු වුණා. ඇයට තනිව උතුරු කුලුන සොයා යාමට සිදුවනු ඇති ද ? සෑම කෙනෙක්ම තමා කළ යුතු දේ දැන තිබුණ බව පෙනුණ ද අසරණ ඩැරල් අතරමං වූ බවක් පෙනුණා.

අනතුරුව පොට්ස් ගුරුතුමිය දැකගත් ඇයට මහත් සහනයක් දැනුණා. ඇය ඈ වෙත ගිය අතර ගුරුතුමිය සිනහවකින් යුතුව ඈ දෙස බැලුවා.

"හෙලෝ ..... අතරමං වුණා කියලා හිතුව ද ? කෝ මේ තක්කඩි ඇලිසියා ? එයා ඔයාව බලා ගන්න ඕනෑ. උතුරු කුලුනේ හැම ළමයෙක්ම එහාට ගිහින් කුඩා බෑග් එක අස්කර ගන්න ඕනෑ. ඔයාලා එනතුරු මේට්‍රන් බලාගෙන ඉන්නවා"

උතුරු කුලුනට යන්නේ කොයි දෙසකින්දැයි නොදත් ඩැරල් මග බලමින් පොට්ස් ගුරුතුමිය සමගම රැඳුණා. තවත් දැරියන් සමූහයක් සමග ඇලිසියා නැවත එනු පෙනුණා.

"හෙලෝ....!" ඇය ඩැරල්ට කතා කළා. "මට ඔයාව හොයා ගන්න බැරි වුණා. මෙතැන අපේ පන්තියේ ඔක්කෝම ඉන්නවා. අනිත් පන්තිවල ළමයි එක්ක පැටලෙන්නේ නැතිව අපි උතුරු කුලුනට යමු. එහෙදි අඳුර ගන්න පුළුවන්. මේට්‍රන් බලාගෙන ඇති. කෝ අපේ හුරතල් ගොන්ඩොලින් ?"

"ඇලිසියා....!" පොට්ස් ගුරුතුමිය ඇඩි හඬකින් කිව ද ඇගෙ
ඇස් දිලිසුණා. "ගොන්ඩොලින්ට ඉන්න දෙන්න"

"එතකොට සැලී හෝප් ? කෝ එයා ?" ඇලිසියා ඇසුව
"එන්න... සැලී හරි. මිස් පොට්ස් මම මෙයාලව උතුරු කුලුන
එක්ක යන්නම්"

"රැස්වීම් ශාලාව, ක්‍රීඩාගාරය, විද්‍යාගාරය, චිත්‍ර කාමරය, මැහු
කාමරය වගේ දේවල් මේ පැත්තේ" ඇලිසියා කිව්වා. "අපි පිටි
හරහා ගිහින් අපේ කුලුනට යමු"

පිටිය යනු කුමක්දැයි ඩැරල් කල්පනා කළා. ඇයට ඒ
දැකගත හැකි වුණා. මැලෝරි ටවර්ස්හි කුලුනු ඉදිකර තිබුණෙ
පිටිය ලෙස හඳුන්වන දිගින් වැඩි, පළලින් අඩු චතුරස්‍රාකාර මිදුල
මැදිවන පරිදි විය. ඔවුන් ඇතුළු වූ පසට විරුද්ධ වූ පසින්
දොරටුවක් තුළින් ඇලිසියා ඔවුන්ව කැඳවාගෙන ගියා. හතරවටින්
ගොඩනැගිල්ලෙන් වට වූ පිටිය නම් මිදුල එහි තිබුණා. "හ
ලස්සන තැනක්" ඩැරල් කිව්වා. "මොකක් ද අර මැද්දේ වළ
වගේ තියෙන්නේ ?"

මිදුලේ මට්ටමින් සැහෙන පහතට බෑවුම් වූ විශාල කවය
පෙන්වමින් ඩැරල් ඇසුවා. එහි අඩිය තණ පලසකින් වැසී ති
අතර පඩිපෙළක් මෙන් වටේ ගල් ආසන රවුම් තිබුණා. ඩැර
කල්පනාවට වැටුණා.

"එතැන තමයි අපි නාට්‍ය පෙන්වන්නේ" ඇලිසියා කිව්ව
"රඟපාන අය රවුම ඇතුළේ. වටේ ඉඳගෙන අනිත් අය බලනව
හරි විනෝදය තියෙන තැනක්"

එම කවාකාර වළට හාත්පසින් රෝස වැනි නොයෙක් මල
වවා තිබුණි. මල් පාත්ති අතර තණ තීරු තිබුණි.

චතුරස්‍රාකාර මිදුලේ හතර කොනින් කුලුනු නැගී සිටියා
ඇලිසියා ගමන් කරමින් සිටියේ උතුරු කුලුන වෙතටයි. එය
අනෙක් කුලුනු තුන මෙන්ම වුණා. ඩැරල් එදෙස බැලුවා. එ
මහල් හතරක් උස් වුණා. පිටත දී ඇලිසියා මොහොතකට නත
වුණා.



"බිම් මහලේ අපේ කෑම කාමර, පොදු කාමරය, අපිට පන්ති නැති වේලාවට ඉන්නේ ඒකේ. කුස්සියත් තියෙන්නේ ඒ ළඟ. දෙවෙනි මහලේ අපේ නිදන කාමර. තුන්වෙනි මහලෙත් නිදන කාමර. උඩම තට්ටුවේ ගුරු මණ්ඩලයේ නිදන කාමරයි, අපේ ට්‍රන්ක පෙට්ටි දාන ගබඩා කාමරයි."

"එතකොට හැම කුලුනක්ම එක වගේ ඇති" කී ඩැරල් හිස ඔසවා කුලුන දෙස බැලුවා. "මේකේ උඩම නිදා ගන්න තියෙනවා නම්, ලස්සනට වටේ පේනවා ඇති"

උතුරු කුලුනේ විවෘත වූ දොරින් දැරියෝ එහෙ මෙහෙ ගියා. "ඉක්මන් කරන්න" ඔවුන් ඇලිසියාට කිව්වා. "තව විකෙන් කෑම ලැබෙනවා. එන සුවඳ නම් හොඳයි"

"අපි එන දවසෙම හොඳ කෑමක් ලැබෙනවා." ඇලිසියා කිව්වා. "ඊට පස්සේ ඒ තරම්ම හොඳ නැහැ. යමු..... අපි මේට්‍රන්ව හොයා ගනිමු"

ඇලිසියා අලුත් දැරියන් ඈ වෙත කැටුව ගියා. "ඔයාට බෙහෙත් දෙන්නයි, බනින්නයි, පස්සෙන් එළවන්නයි තවත් තුන් දෙනෙක් ඉන්නවා" සිනාවක් නැගූ ඇලිසියා කිව්වා.

තම අත වූ දිගු ලැයිස්තුව දෙස දෙනෙත් කුඩා කර බලා සිටින පාලිකාව දෙස ඩැරල් බැලුවා. තිකට යටින් ගැටයක් ඇමූ හිස් වැසුමට යටින් ඇගේ කෙස් කළඹ මනාව පීරා තිබුණ බව පෙනුණා. ඇගේ පිරිසිදුකම දුටු ඩැරල්ට තමා අපිරිසිදු හා අපිළිවෙළ බව සිතුණා. පාලිකාව ගැන බිය සිතුණා. ඩැරල් නිතර ඇගේ බෙහෙත් බීමට සිදුවේදැයි බිය වුණා.

හිස ඔසවා බැලූ පාලිකාව සිනාවක් පාද්දී ඇගේ බිය තුරන් වුණා. එලෙස මුවින්, ඇසින් පමණක් නොව නාසයෙන් ද සිනාව පළ කරන කෙනෙකුට ඇය බිය විය යුතු නැහැ !

"කෝ බලමු.... ඔයා ඩැරල් රිවර්ස්" තම ලැයිස්තුව ලකුණු කර ගනිමින් ඇය කිව්වා. "වෛද්‍ය වාර්තාව තියෙනවා ද ? ඒක මට දෙන්න. එතකොට ඔයා සැලී හෝප්"

"නැහැ. මම ගොන්ඩොලින් මේරි ලැසී" ගොන්ඩොලින් කිව්වා.

"මෙරි කැල්ල අමතක කරන්න එපා" බිය සැක නැති
ඇලිසියා කිව්වා. "අපේ ගොන්ඩොලින් මෙරි"

"ඒ ඇති ඇලිසියා" ලැයිස්තුව ලකුණු කර ගන්නා අතර
පාලිකාව කිව්වා. "ඔයත් අම්මා වගේම නරකයි. නැහැ, ඊට
වැඩියි මම හිතන්නේ"

ඇලිසියා සිනාවක් පෑවා. "අම්මා කුඩා කාලේ මැලෝ
ටවර්ස්වලට ඇවිදින් තියෙනවා" ඇය අනෙක් අයට කිව්වා. "එයා
අවුරුදු හතරක් ඉඳලා තියෙනවා. මේට්‍රන්, එයා ඔයාව ආදරයෙන්
මතක් කරන්න කිව්වා. එයා කියනවා මගේ මල්ලිලාවත් මෙ
ළඟට එවන්න තිබුණා නම් හොඳයි කියලා. එයාලව හදා ගන්
පුළුවන් ඔයාට විතරයි කියලා එයා කියනවා"

"එයාලත් ඔයා වගේ නම් මෙහේ නොඑවන එක ගැන මං
හුඟාක් සතුටුයි" පාලිකාව කිව්වා. "ජෝන්ස් පවුලේ එක්කෙනෙ
එක සැරයකට එනවා නම් ඇති. අම්මා හින්දා මගේ ඉසකෙ
ටිකත් පැසුණා. ඉතුරු ටික ඔයා හින්දා පැහෙනවා"

ඇය නැවත සිනාවක් පෑවා. ඇයට ඥානවන්ත
කරුණාවන්ත මුහුණක් තිබූ අතර අසනීප වන ඇරියන්ට ඇගේ
රැකවරණය මහත් ආරක්ෂාවක් ලෙස දැනුණා. එහෙත් බොරු
කරන, කම්මැලි හෝ නොසැලකිලිමත් අයට ගැලවීමක් ලැබුණේ
නැහැ.

එකවරම විශාල සණ්ටා නාදයක් කුලුන තුළ ගිගුම් දුන්නා.
"කෑම වේලාව" පාලිකාව කිව්වා. "ඊට පස්සේ බෑග් එක අස්
ගන්න, ඇලිසියා. කෝච්චිය ප්‍රමාද වූ නිසා ඔයාලට මහන්සි ඇති.
කෑමෙන් පස්සේ පළමු පන්තියේ හැමෝම වහාම නින්දට යන්න
ඕනෑ"

"අනේ මේට්‍රන් !" ඇලිසියා කෙඳිරිගාන්නට පටන් ගත්තා.
"අපිට බැරිද විනාඩි දහයක්වත්...."

"මම කිව්වනෙ ..... ඇලිසියා" පාලිකාව කිව්වා. "දැන් පහළට
යන්න. අත් සෝදගෙන ඉක්මනට යන්න"

විනාඩි පහකට අනතුරුව ඇලිසියා හා අනෙක් අය වාඩි වී
රසවත් සැඳෑ ආහාර වේලක් භුක්ති විඳිමින් සිටියා.



# 03

පළමු පන්තියේ සියලු ඇරියෝ සිටියේ එකම සයනාගාරයක. ඇලිසියා, ඩැරල්, සැලී හා ගොන්ඩොලින් වැනි සියලු දෙනාම එහි සිටියා. ඊට අමතරව තවත් ඇරියෝ හය දෙනෙක් සිටියා. දත් මදිමින්, මුහුණ සෝදමින් එහෙ මෙහෙ දුවන අලුත් ඇරියන් තිදෙනා දෙස ඔවුන් පුදුමයෙන් බලා සිටියා.

එක් ඇරියක් තම ඔරලෝසුව දෙස බැලුවා. "ඇඳන්වලට යන්න හැම කෙනාම" ඇය අණ කළා. ඇය සන්සුන්ව හැසිරෙන උස් කළු ඇරියක්. ගොන්ඩොලින් හැර සියලු දෙනා ඇඳන්වලට නැග ගත්තා. ගොන්ඩොලින් ඇගේ රන්වන් කෙස් කළඹ පීරමින් සිටියා. පීරන අතරේ ඇය ගණන් කරමින් සිටියා.

"පනස් හතරයි, පනස් පහයි, පනස්....."

"හේයි, ඔය අලුත් ළමයා..... මොකක් ද නම.... ඇඳට නගිනවා!" උස් කළු ඇරිය නැවත අණ කළා.

"මට හැම රෑම කොණ්ඩය සිය පාරක් පීරන්න ඕනෑ" ගොන්ඩොලින් විරුද්ධ වුණා. "මම කීයක් ගැන්න ද කියලා දැන් අමතක වුණා"

"කට වහගෙන ඇඳට යනවා ගොන්ඩොලින් මෙරි" ඇලිසියා ඊළඟ ඇඳේ සිට කීවා. "කැතරින් අපේ නිඳන කාමරයේ නායිකාව. එයා කියන දේ කරන්න ඕනෑ"

"ඒත් මම පොරොන්දු වුණා අම්....ම් අම්..." කඳුළු පෙරමින් ගොන්ඩොලින් අඬන්න පටන් ගත්තා. "මම අම්මාට කිව්වා සිය....සි...ය සැරයක් පී.... පීරනවා කියලා"

"අද පීරන්න බැරි වුණ ගණන හෙට පීරා ගන්න" නායිකාවගේ කටහඬ පැමිණියා. "දැන් ඇඳට නගින්න"

"අනේ, මට ඉවර කරන්න දෙන්නකෝ..." කී ගොන්ඩොලින් කඩිනමින් සිය හිස පීරන්නට වුණා. "පනස් හයයි..... පනස්"

"මම මෙයාට පනාවෙන් දෙන්න ද කැතරින් ?" ඇ... වාඩි වෙමින් ඇලිසියා ඇසුවා. කෑගැසූ ගොන්ඩොලින් ... පැන ගත්තා. දැරියෝ හඬනගා සිනාසුණා. ඇලිසියා සැ... ගොන්ඩොලින්ට ඇත්තටම පහර දීමට නොවන බව ඔවු... සිටියා.

ගොන්ඩොලින් කෝපයෙන් වැතිරුණා. ඇය අසෑ... හඬමින් වැතිර සිටීමට අධිෂ්ඨාන කර ගත්තා. ඇය තම ... දුරින් පිහිටි නිවස මතක් වුණා. ඇය නාසයෙන් ඉහළට ඇ... පටන් ගත්තා.

"ඔය නාසය සුද්ධ කර ගන්න, ගොන්ඩොලින් !" ඇලි... නිදිමතින් කිව්වා.

"කතාව නවත්තන්න" කැතරින් කිව්වා. අනතුරුව නිහැඬිය... පැතිරුණා. සැලී හෝප් සෙමින් සුසුමක් පිට කළා. ඇයට ... ගොස් ඇතිදැයි ඩැරල් කල්පනා කළා. ඇගේ හා සැලීගේ ... අතර වූ තිරය ඉහළට ඇද තිබුණා. සැලී නොනිඳා ඇස් පුළු... විවර කරගෙන වැතිර සිටින බව ඇය දුටුවා. කඳුළු නොතිබුණ... ඇගේ මුහුණ සොවින් බරව තිබුණා.

එවිටම පාලිකාව පැමිණියා. ඇය ඇඳන් දෙස බැල්... හෙළුවා. වෙහෙසට පත්ව සිටි දැරියන් කීප දෙනෙක් ඒ වන වි... තද නින්දට වැටී සිටියා. දිගු කාමරයේ වටයක් ගිය පාලිකාව ... ඇතිරිල්ලක් දෙකක් නිසි පරිදි සැකසුවා. දිය වැහෙන කරාම ... ඇමුවා. ජනේල තිර පහතට ඇමුවා. ඒ පිටත තවමත් ... ආලෝකයෙන් යුතුව තිබූ නිසයි.

"සුබ රාත්‍රියක්" ඇය සෙමින් කිව්වා.

"සුබ රාත්‍රියක් මේට්‍රන්" නින්දට නොවැටී සිටි දැරියන් කිව්... ඩැරල් පාලිකාවගේ කදිම සිනාව මුහුණේ ඇතිදැයි දැක ගැනී... පොරෝනයෙන් මෑත්ව බැලුවා. ඩැරල්ගේ එබී බලන දෙනෙ... දුටු ඇය හිස සැලුවා.

"හොඳට නිඳාගන්න" සිනාමුසුව කී ඇය නිහඬව පිට... ගියා.





ඊළඟ උදයේ, සීනු හඬත් සමග දැරියෝ අවදි වුණා. මුලදී තමා සිටින්නේ කොහිදැයි ඩැරල්ට සිතා ගැනීමට නොහැකි වුණා. ඒ සමගම ඇයට ඇලිසියාගේ කටහඬ ඇසුණා. "නැඟිටපල්ලා, කම්මැළි කෙල්ලෝ ! උදේ කෑමට ඉස්සර ඇඳන් හදා ගන්න ඕනෑ"

ඩැරල් ඇඳෙන් බිමට පැන්නා. කැතරින් ජනෙල් තිර ඔසවා තිබූ නිසා හිරු රැස් කාමරය තුළට ගලා ආවා. දැඩි සෝෂාවක් ඇති වුණා. දැරියෝ කාමරය හරහා සෝදන බේසම් වෙතට දුව ගියා. අනිත් දැරියන් මෙන් දුඹුරු පැහැ කබාය පැලඳ, කහ පැහැ බඳ පටිය බැඳ ඩැරල් ද නිල ඇඳුමින් සැරසුණා. හිසකෙස් පසුපසට පීරූ ඇය කොණ්ඩා කටු දෙකකින් ඒවා දෙපසින් රඳවා ගත්තා. ගොන්ඩොලින් තම කෙස්ස උරපතු මත විහිදුවා ගත්තා.

"ඉස්කෝලේ ඇතුළෙදි ඒ විදිහට පීරන්න බැහැ ගොන්ඩොලින්!" ඇලිසියා කිව්වා.

"මම නිතරම පීරන්නේ මේ විදිහට" ඇගේ කුඩා අනුවණ මුහුණට මුරණ්ඩු පෙණුමක් ආරූඪ ක... ගනිමින් ගොන්ඩොලින් කිව්වා.

"ඒත් හරිම කැතයි" ඇලිසියා කිව්වා.

"එහෙම නැහැ" ගොන්ඩොලින් කිව්වා. "ඔයා එහෙ කියන්නේ ඔයාට තියෙන්නේ රළු කෙටි කොණ්ඩයක් හින්දැ

ඇලිසියා අසලට එමින් කැතරින් ඇසක් ඉඟිමැරුවා. " ගොන්ඩොලින්ට දිලිසෙන කොණ්ඩය පෙන්වන්න ඉඩ දෙමු නේ ඇය මිහිරි හඬකින් කිව්වා. "මිස් පොට්ස් මේ කොණ්ඩය දැකපුව හුඟාක් සතුටු වෙයි"

"අපේ ආයා.... මිස් වින්ටර්, මේ විදිහට තමයි කැමති" සැ බවක් පළ කළ ගොන්ඩොලින් කිව්වා.

"ඕ.... ඔයා ඉස්කෝලෙකට ගිහින් නැද්ද ? ආයගෙන් වි ද ඉගෙන ගත්තේ ?" ඇලිසියා ඇසුවා. "ඒක පෙනෙනවා"

"මොනවා ද පෙනෙන්නේ ?" ගොන්ඩොලින් අහංකාර ලෙ ඇසුවා.

"පස්සේ දැනගන්න ලැබෙයි" ඇලිසියා කිව්වා. "ලැස්ති ඩැරල්? ඒ උදේ කෑමට සීනුව. ඇඳ ඇතිරිල්ල හොඳට යට කරන් ගොන්ඩොලින්, ඔයාගේ නයිට්ය නවලා තියන්න. අර බලන් සැලී.... එයත් අලුත් ළමයෙක් ! ඒත් කවුරුවත් කියන්න ඉස්ස හැම දෙයක්ම වෙලාවට කරලා" සැලී මඳ සිනාවක් පෑවා. ඇ වචනයක් පිට කළේ බොහොම කලාතුරකින්. ඒ කිසිදු ලජ්ජාව නිසා නොවූ අතර ඩැරල්ට ඇය නවක සිසුවියක් යැයි සිතිම බැරි තරමට ඇය ශාන්ත හා විශ්වාසයෙන් යුතු වුණා. කළ යුත්ත කුමක්දැයි නිවැරදිව ඇය නිතර දැන සිටි බව පෙනුණා.

ඔවුන් හැමෝම භෝජන ශාලාවට ගියා. දිගු මේස සූදානම් තිබූ අතර තම පන්ති භාර ගුරුතුමියන්ට විනීතව ආචාර කරමි දැරියන් වාඩි ගන්නට සූදානම් වුණා. නේවාසිකාගාර පාලිකාව එහි සිටියා. එමෙන්ම ඩැරල් මින් පෙර දැක නොතිබූ තවත් වැඩිහි කාන්තාවක් ද හිටියා.

"ඒ මම්සලී ඩූපොන්ට්" ඇලිසියා කෙඳුරුවා. "අපිට ප්‍රං ගුරුවරියෝ දෙන්නෙක් ඉන්නවා. එක්කෙනෙක් මහතයි, සෙල්ලම් කැමතියි. ඒ මම්සලී ඩූපොන්ට් අනිත් කෙනා කෙට්ටුයි, සැරයි.



මම්සලී රොජර්. අපිට මේ වාරෙ ඉන්නේ මහත කෙනා. හැබැයි දෙන්නටම ඉක්මනට තරහා යනවා. මම හිතන්නේ ඔයා ප්‍රංශවලට දක්ෂ ඇති කියලයි"

"ඇත්තෙන්ම නැහැ" ඩැරල් කිව්වා.

"මම්සලී ඩූපොන්ට්, මම්සලී රොජර්ට කැමති නැහැ. මම්සලී රොජර්, මම්සලී ඩූපොන්ට්ට කැමති නැහැ" ඇලිසියා කියාගෙන ගියා. "එයාල රණ්ඩු වෙන හැටි බලන්න වටිනවා. රණ්ඩුව තදේට ගියොත් දෙන්නා දෙපැත්තට කරන්න මෙට්‍රන්ට එන්න සිද්ධ වෙනවා !"

ඩැරල්ගේ දෙනෙත් මහත් වුණා. මේසයේ අනෙක් පස සිටි කැතරින් හඬනගා සිනාසුණා. "ඇලිසියා කියන හැම දේම විශ්වාස කරන්න එපා" ඇය කිව්වා. "එයාගේ කතාත් එයා වගේම වැරදි පැත්තට යනවා. අපි තවම දැකලා නැහැ මම්සලීලා දෙන්නා කොණ්ඩ පටලවා ගන්නවා."

"ඕ.... දවසක ඒක වෙයි. එහෙම දෙයක් බලා ගන්න තිබුණොත් හොඳයි" ඇලිසියා කිව්වා.

මම්සලී ඩූපොන්ට් මිටි තරබාරු කෙනෙක්. ඇයට තිබුණේ හිස මුදුනට වෙන්න බැඳපු කුඩා කොණ්ඩයක්. ඇගේ චංචල කළු ඇස් දිලිසුණා. ඇය ඇඟට හිර වූ කළු ගවුමක් ඇඳ සිටි අතර ඇගේ කුඩා දෙපාවලට ගැළපෙන ලෙස කළු පාවහන් පැලඳ සිටියා.

ඇයට ළඟ නොපෙනුණ නමුත් උපැස් පැලඳුවේ නැහැ. ඒ වෙනුවට ඇය දිග මිටක් සහිත කණ්ණාඩියක් පීත්ත පටියකින් එල්ලාගෙන සිටියා. ඇයට සමීප යමක් බලා ගැනීමට අවශ්‍ය වූ විටෙක ඇය එය ඇස සමීපයට අල්ලා ගෙන එය බලා ගත්තා.

අංග චලනයන් අනුකරණය කර දැක්වීමට ඉතා දක්ෂ වූ ඇලිසියා, මම්සලී කණ්ණාඩිය නාසය මතින් අල්ලාගෙන ඉක්මන් ඇස් තටු සලමින් බලන අයුරු රඟ දක්වා නිතර පන්තිය සිනා ගැස්සුවා. එහෙත් අන් අය මෙන්ම මම්සලී ඩූපොන්ට්ට ගරුත්වයක් දැක්වූ ඇය බැරිම තැනක දී හැර ඇගේ ඉක්මන් කේන්තිය ඇවිස්සුවේ නැහැ.

# 04

යාච්ඤාවේ දී පාසලේ සියලු දැරියෝ එකට මුණගැසුණ පන්ති පිළිවෙළට දැරියෝ එකම තැන රැස්ව සිටගෙන ආග ඇදහීම කළා.

ඩැරල් තම පන්තිය දෙස තැති ගැන්මෙන් යුතුව බැලුව එය කෙතරම් විශාලව පෙනුණා ද ! සැබැවින්ම, දැරියන් විසිපහ හෝ තිහක්. ඔවුන්ගේ නිවාසය මෙන්ම පන්තිය ද භාරව තිබුණේ පොටිස් ගුරුතුමියටයි. මම්සලී ඩූපොන්ට් ද එහි සිටියා. උනන්දුවෙ ගීතිකා ගයමින් සිටි ඇය අසල සිටින ගුරුතුමිය අනිත් ප්‍ර ගුරුතුමිය විය යුතුයි. ඒත් කොතරම් වෙනස් ද ! ඇය ඉතා කෙට හා උස කෙනෙක්. ඇය කොණ්ඩය බැඳ තිබුණේ හිස මුදුනි නොව හිස පසුපසිනුයි. ඇය ඉක්මන් කේන්තිකාරියක බව ඩැරල් පෙනුණා.

ඇලිසියා ඇයට අනෙක් ගුරුතුමියන්ව පෙන්නුවා. "ඈ ඉන්නේ ඉතිහාස ගුරුතුමිය, මිස් කාටන්.... බලන්න ලො කොලරයක් තියෙන ගවුමක් ඇඳලා කණ්ණාඩිය ආලා ඉන් එක්කෙනා. එයා හරිම දක්ෂයි. ඒ වගේම ඉතිහාසය දන්නේ නැ අයට එයා හොඳටම ලජ්ජා කරනවා. අර ඉන්නේ චිත්‍ර ටීචර්, මි ලිනි..... එයා හුඟාක් හොඳයි. හරිම සැහැල්ලුවෙන් ඉන්නේ"

ඇය සැහැල්ලු ගති පැවතුම් ඇති කෙනෙක් නම් තමාට ස සමග බොහෝ ගනුදෙනු ඇතිවෙනු ඇතැයි ඩැරල් සිතුවා. ඈ ඉතා සුන්දර බව පෙනුණා. ඉතා තරුණ බවක් පෙනුණ ඇගෙ තඹවන් කෙස්, රැලි ගැසී තිබුණා.

"අර ඉන්නේ සංගීත ගුරුවරයා..... මිස්ටර් යං, දැක්ක ද සමහර වෙලාවට එයා තරහින් ඉන්නවා. නැතිනම් හරිම හොඳ අපිව සංගීත පාඩම්වලට හරි, ගායනයට හරි ගන්න කොට අ දන්නවා එයා හොඳින් ද තරහින් ද කියලා"



කුලුනු හතරෙම නේවාසිකාගාර පාලිකාවෝ ආගම ඇදහීමට පැමිණ තිබුණා. තම නිවස භාර පාලිකාව දෙස බැලූ ඩැරල්ට ඇය තමා කරන දෙය ගැන දැඩිව කටයුතු කරන කෙනෙක් මෙන් පෙනුණා. ඇලිසියා නැවතත් කෙඳිරීම ඇරඹුවා.

"අනිත් කෙනා....."

පොටිස් ගුරුතුමියගේ දැස කැරකී ඈ වෙත එල්ල වූ අතර වහාම කෙඳිරීම නතර කළ ඇලිසියා ගීතිකා පොතට දෙනෙත් යොමා ගත්තා. පොටිස් ගුරුතුමිය කොඳුරන අයට, විශේෂයෙන්ම ආගම් ඇදහීමේ දී කිසිම සමාවක් දුන්නේ නැහැ.

යාච්ඤා අවසන් වුණා. දැරියෝ තම තමන්ගේ පන්ති කාමරවලට යන්න වුණා.

මුහුදේ ඉතා සුන්දර දර්ශනයක් දැකගත හැකි කාමරයක් වූ පළමු පන්ති කාමරයට එම පන්තියේ දැරියෝ ඇතුළු වුණා. ගුරුතුමියගේ මේසය එක කොනකත්, අනෙක් කොනෙහි කබඩයකුත් තිබූ එය විශාල කාමරයක් වුණා. ඩෙස්ක හා පුටු මනා පිළිවෙළට සකසා තිබුණා.

"ඔහෝ, ජනේලය ළඟ මම !" තරබාරු දැරියක් ජනේලය අසලට පනිමින් කිව්වා.

"එතැන මට" ගොන්ඩොලින් කියන විට තරබාරු දැරියගේ දෙනෙත් මහත් වුණා.

"ඔයා අලුත්.ළමයෙක් නේද ? ඔයාට බැහැ ඒ විදිහට තෝරා ගන්න. පරණ ළමයි තමන්ට ඕන තැන් තෝර ගත්තට පස්සේ අලුත් අයට පුළුවන් ඕනෑ තැනක් තෝර ගන්න"

ගොන්ඩොලින් රතු වුණා. ඇය තම තඹ කොණ්ඩය උරහිස් මතින් ගස්සා බුම්මා ගත්තා.

ඇය තමා තෝරාගත් ඩෙස්කය අසල සිටගෙන එය අත්පත් කර ගැනිමට තරම් නිර්භීතව නොසිටිය ද එය අත් හැරීමට නොහැකි තරමේ මුරණ්ඩු බවක් පෙන්නුවා. කෙට්ටු කුඩා දැරියක් ඇතුළට පැමිණියා.

"මට මේ ඩෙස්කය ! හෙලෝ රීටා ! කොහොම ද නිවාඩු කාලය ? අපේ පොට්ටි ළඟට ආයෙත් එන්න වුණා නේද ?"

ගොන්ඩොලින්, සැලී හා තවත් ඇරියන් කිහිප දෙනෙකු සමග ඩැරල්ට අනෙක් ඇරියන් ස්ථාන ලබා ගන්නා තුරු බලා සිටීමට සිදු වුණා. අනතුරුව ඇය ඇලිසියා අසලම අසුන වෙත ගියේ උදා වූ වාසනාව ගැන සතුටු වෙමින්. තමාට අනෙක් පසින් සිටි ඇරිය සමග ඇලිසියා තොරතුරු කතා කරමින් සිටියා. ඔවුන් දෙදෙනා සමීප මිතුරියන් ලෙස පෙනුණා.

ඇය ඩැරල් වෙතට හැරුණා. "ඩැරල්, මේ මගේ යාළුවා, බෙටී හිල්. අපි දෙන්නා එක ළඟමයි ඉඳගන්නේ. ඒත් දැන් බෙටී ඉන්නේ බටහිර කුලුනේ. මොනවා කරන්න ද ?"

දඟකාර ඇසක් හා නිතර නළලට වැටෙන කෙස් රොදක් සහිත ජීවය පිරි ඇරියක් වූ බෙටී සමග ඩැරල් සිනාසුණා. ඇය බෙටීට කැමති වුවද ඇලිසියාට මිතුරියක් සිටීම ගැන සියුම් දුකක් ඇති වුණා. සැලී හා ගොන්ඩොලින් ගැන ඇයට විශේෂයක් සිතුණේ නැහැ.

"ෂ් !" දොර අසල සිටි ඇරිය හඬ නැගුවා. "පොට්ටි එනවා !"

හදිසියේම නිහඬ බවක් ඇති වුණා. පිටත කොරිඩෝව ඔස්සේ ඔවුන්ගේ පන්ති භාර ගුරුතුමිය එන ඉක්මන් හා සැහැල්ලු පා හඬ ඇසුණා. ඇරියෝ නැඟිට ඍජුව ඉදිරිය බලා සිටියා. ඇය පන්තිය තුළට පැමිණ හිස සැලුවා. "ඔයාලා වාඩි වෙන්න !"

වාඩිගත් ඔවුන් නිහඬව බලා සිටියා. නම් ලැයිස්තුවක් ගත් ඇය අලුත් ඇරියන්ගේ නම් ලකුණු කළා. අනතුරුව ඇය තමා ඉදිරිපිට ඇති උද්‍යෝගිමත් මුහුණු දෙසට හැරුණා.

"හොඳයි" ඇය කතා කළා. "පිහිනන්න, ටෙනිස් ගහන්න, චාරිකා යන්න, ඇවිදින්න වගේ හුඟාක් දේවල් තියෙන ගිම්හාන වාරය තමයි හොඳම. ඒත් මේ වාරය විනෝදයට විතරක්ම තියෙන කාලයක් කියලා වැරදියට හිතන්න එපා. එහෙම නැහැ. මහන්සියෙන් වැඩ කරන්නත් ඕනෑ. ඔයාලා ටික දෙනෙක් ලබන වාරයේ විභාගයට ලියනවා. හොඳයි, මේ වාරයේ හොඳින් වැඩ කළොත් ලබන වාරයේ විභාගය ලේසි වෙයි. ගණන් නොගත්තොත්



මම දන්නවා අනිවාර්යයෙන්ම ලබන වාරයේ කන්කෙඳිරි ගාන්න වෙනවා"

ගුරුතුමිය දිගටම කතා කළා. "මේ වාරයේ මොළේ නැති අය ඉඳියි කියලා මම හිතන්නේ නැහැ" ඇය කිව්වා. "ඇත්තෙන්ම, මම අලුත් ළමයි ගැන එතරම් දන්නේ නැති වුණත් මොළේ පාවිච්චි කරන්නේ නැතිව පන්තියේ අන්තිම වුණත් මම බනින්නේ නැහැ..... ඒත් හොඳ ඔළුවක් තියෙද්දිත් අන්තිම වෙනවා නම් මගෙන් හුඟාක් දේවල් අහගන්න වෙයි. මම කියන දේ තේරෙනවා නේද ?"

"ඔව්" ඇරියෝ වැඩි පිරිසක් උනන්දුවෙන් පිළිතුරු දුන්නා. ගුරුතුමිය මඳ සිනාවක් පෑ අතර ඇගේ උද්‍යෝගිමත් මුහුණ මොහොතකට බැබළුණා. "හොඳයි, දැන් අපි වැඩ පටන් ගනිමු. සෑම ළමයෙකුටම තියෙන්න අවශ්‍ය දේවල් ලැයිස්තුවක් මෙතැන තියෙනවා. මොනවා හරි දෙයක් අඩු කෙනෙක් ඉන්නවා නම් එයා කැතරින්ව හමුවෙන්න. පන්ති නායිකාවගෙන් පාඩම අවසානයේ ඒවා ඉල්ලා ගන්න. ඒකට විනාඩි දහයක් දෙන්නම්"

ඉක්මනින්ම පාඩමක් ඇරඹුණා. ඒ ගණිතය වූ අතර අලුත් ඇරියන්ගේ තත්ත්වය බලා ගැනිමට හා මුළු පන්තියටම එකට වැඩ කළ හැකි ද යන්න බලා ගැනිමට ගුරුතුමිය ප්‍රශ්න පත්‍රයක් දුන්නා. එය ඉතා පහසු බව ඩැරල්ට පෙනුණ ද ඩෙස්කය මත තම රන්වන් කෙස් කළඹ විදහා ගත් ගොන්ඩොලින් දැඩි ලෙස කන් කෙඳිරි ගාන්නට වුණා.

"මොකද ගොන්ඩොලින් ?" අනුකම්පා විරහිතව පොට්ස් ගුරුතුමිය ඇසුවා.

"අපේ ආයා, මිස් වින්ටර්, මෙ විදිහට ගණන් හදන හැටි කියා දීලා නැහැ." ගොන්ඩොලින් වැලපුණා. "එයා වෙනස් විදිහකට මේවා ලියන්නේ."

"දැන් ඔයාට මගේ ක්‍රමය ඉගෙන ගන්න වෙනවා." පොට්ස් ගුරුතුමිය කිව්වා. "ආ ගොන්ඩොලින්.... ඇයි අද උදේ කොණ්ඩය පීරුවේ නැත්තේ ?"

"මම පීරුවා..." තම ලොකු නිල් ඇස් දල්වා බලමින් ගොන්ඩොලින් කිව්වා. "මම හොඳට පීරා ගත්තා. මම හතළිස් සැරයක්...."

"හරි, මට විස්තර එපා....." ගුරුතුමිය කිව්වා. "ඔය ඔයාට පන්තියට එන්න බැහැ. විවේකයෙන් පස්සේ ගොතා ගන්න"

"ගොතන්න !" ගොන්ඩොලින් කෙඳිරිගාන අතරේ ඇරියෝ සිනා හඬ නැගුවා. "ඒත් මම කවදාවත්......"

"ඒ ඇති." පොට්ස් ගුරුතුමිය කිව්වා. "කොණ්ඩය පිළිවෙළට තියා ගන්න බැරි නම් ඊළඟ නිවාඩුවෙන් පස්සේ සිද්ධ වෙයි කොණ්ඩය කොටට කපන්න."

ගොන්ඩොලින් කොතරම් භීතියට පත්වී ද යත් ඩැ හඬනගා සිනා නොවී සිටීමට නොහැකි වුණා.

"මම ඕක කිව්වා !" පොට්ස් ගුරුතුමිය යමක් ලි කළුලෑල්ල දෙසට හැරුණු වහාම ඇලිසියා කෙඳිරුවා. කෝප ඈ දෙස බැලූ ගොන්ඩොලින් මුහුණ ඇදකර ගත්තා.

උදය කාලය ගතවී ගෙන ගියා. විවේකය එළඹී අතර ඇරි තමන් කැමති තැන්වල සෙල්ලම් කිරීමට පිටතට ගියා. සම කෙටි වේලාවක් ටෙනිස් ක්‍රීඩා කිරීමට පිටියට දිව්වා. ඩැරල් ඇලිසි සමග යාමට කැමති වුවද ඇය සිටියේ බෙටී සමග. ඔවු තුන්වැන්නෙක් අවශ්‍ය නොවනු ඇතැයි ඩැරල් සිතුවා. ඇය අ අලුත් ඇරියන් දෙස බැලුවා. තමන් නොහඳුනන ඔවුන් දෙදෙ දැනටමත් මිතුරියන් වී ඇති බව පෙනුණා.

සැලී හෝප් හුදෙකලාව තණ පලස මත වාඩි වී සිටි ඈ ඇගේ මුහුණින් කිසිදු හැඟීමක් ප්‍රකාශ වූයේ නෑ. ඩැරල් ඈ වෙ ගියා. "ඔයා මැලෝරි ටවර්ස් ගැන මොකද හිතන්නේ ?" ඇසුවා. "මම හිතන්නේ අපූරුයි කියලා"

සැලී හිස ඔසවා බැලුවා. "නරක නැහැ" ඇය කිව්වා.

"පරණ ඉස්කෝලෙන් අස්වෙන්න වුණ එක ගැන දුක ද ඩැරල් ඇසුවා. "ඇත්තටම මට මැලෝරිවලට එන්න ආශාව තිබුණා. ඒත් යාළුවෝ දාලා එන්න බැරිවයි හිටියේ. ඔයාටත් යාළු දාලා එන්න දුක හිතෙන්න ඇති"



"මට එහෙම යාළුවෝ හිටියේ නැහැ" සැලී කල්පනාවෙන් යුතුව කිව්වා. එය අමුතු යැයි ඩැරල්ට සිතුණා. සැලීගෙන් යමක් දැන ගැනීම දුෂ්කර වුණා. ඇය විනීතව ප්‍රශ්නවලට පිළිතුරු දුන්න ද කිසිදු ප්‍රශ්නයක් ඇසුවේ නැහැ.

"මෙයා මගේ යාළුවෙක් කර ගන්න මම හිතන්නේ නැහැ" අවසානයේ ඩැරල් සිතුවා. "දෙවියනේ, මෙන්න ගොන්ඩොලින් ! එයා හිතනව ද කොණ්ඩය ගොතලා කියලා ? අවුල් වෙලා විතරයි"

"මගෙ කොණ්ඩය හරි ද ?" ඇය දුක්මුසු ස්වරයකින් ඇසුවා. "මම ගොතන්න හැදුවා. මිස් පොට්ස් මට ඕනෑ විදිහට කොණ්ඩය තියා ගන්න දෙන්නේ නැති එක මොන තරම් නරක ද ? මම එයාට කැමති නැහැ"

"ඉන්න, මම ගොතලා දෙන්න" නැගිටිමින් ඩැරල් කිව්වා. "මට පේන්නේ ඔයා කොණ්ඩය ගොතන්නේ කොහොම ද කියලා දන්නේ නෑ වගේ, ගොන්ඩොලින්"

ඉක්මනටත්, දක්ෂ ලෙසත් දිගු රන්වන් කෙස් කළඹ කරල් දෙකකට ගෙතූ ඇය ඒවායේ අග කුඩා පීත්ත පටි කැබලි දෙකකින් ගැට ගැසුවා.

"ඔන්න !" කී ඇය හොඳින් බලා ගැනීමට ගොන්ඩොලින්ව රවුමක් කැරකෙව්වා. "දැන් හුඟක් ලස්සනයි...."

බුම්මාගත් ගොන්ඩොලින්ට ඩැරල්ට ස්තුති කිරීමටත් අමතක වුණා. සැබැවින්ම ඇය වඩාත් ලස්සනට පෙනුණා. "මොන තරම් නරක් වෙලා ද ?" ඩැරල් සිතුවා. "මට සැලී යාළුවෙක් හැටියට එපා වගේම ගොන්ඩොලින්වත් එපා. එයාගේ මෝඩ සෝබනකම යන්න දෙකක් දෙන්න හිතෙනවා"

සීනුව නාද වූ අතර ඇරියෝ තම තමන්ගේ පන්ති බලා දුවන්නට වුණා. ඩැරල් ද ඒ සමග දිව්වා. තම පන්ති කාමරය ඇති තැන ඇයට මතක තිබුණා. ඇය තම පන්තියේ බොහෝ දෙනෙකුගේ නම් මතක තබා ගැනීමට සමත්ව තිබුණා. මැලෝරි ටවර්ස් හුරුපුරුදු තැනක් වීමට ඇයට වැඩි කලක් ගත නොවනු ඇත.

ඩැරල් ඉක්මනින්ම පරිසරයට හුරුපුරුදු වීමට පටන් ගත් ඇය දැරියන්ගේ නම් පමණක් නොව ඔවුන් සැම දෙනා කොරතුරු පන්ති නායිකාව පැමෙලාගෙන් දැනගත්තා. පන්ති ළාබාලම දැරිය වූ මේරි ලෝව්ගේ සිට සියලු දෙනා ගැන සැම දේ දැන සිටියා.

මේරි ලෝව් බියපත් මීයෙක් ලෙස ඇයට පෙනුණා. දැරිය මීයන්ට, කුරුමිණියන්ට, අකුණු හඬට, රාත්‍රියේ ඇසෙ ශබ්දවලට හා අඳුර වැනි දහසකුත් දේවලට බියක් දැක්වූ අහිංසක මේරි ලෝව්, ඇයට බියපත් විශාල දැසක් තිබීම පුදුම නොවෙයි.

ඩැරල්ගේ නිදන කාමරයේ දැරියෝ දස දෙනෙක් සිටි කලබල නැති පන්ති නායිකාව කැතරින්, නොහික්මුණු කට ඇති ඇලිසියා, අලුත් දැරියන් වූ ඩැරල්, සැලී හා ගොන්ඩොලි අනපේක්ෂිත යමක දී කුළෑටි අශ්වයෙකු මෙන් පසුපසට පනි බියපත් දැසකින් යුතු මේරි ලෝව්.

පන්තියේ නිතරම පළමුවැනියා වන, ගණිතය හා සංගීතය දක්ෂ අරුම පුදුම අයිරින් ද එහි සිටියා. එහෙත්.... ජීවිතයේ සාමාන්‍ය දේවල් ගැන ඇය මොන තරම් අඥාන ද ! පොත නැති වූයේ නම් ඒ අයිරින්ගේමයි. වැරදීමකින් වැරදි වේලාවේ අනුන්ගේ පන්තියකට ගියා නම් ඒ අයිරින්මයි. වරක් චිත්‍රකර්ම කාමරයට ගොස් එහි වාඩි වූ ඇය ලිනී ගුරුතුමිය එනතුරු පැය භාගයක් කල්මැරූ බවට කතාවකුත් තියෙනවා.

"ඒත් කවුරුවත් ආවේ නැත්තේ ඇයි කියලා නොසිතු කොහොමද ඔයා එතරම් වෙලාවක් එතැන ඉඳගෙන හිටියේ ?" කැතරින් ඇසුවා. "මොනවද ඔයා කල්පනා කර කර හිටියේ ?"

"පොට්ටි දූන්න ගණන් ගැන මම හිත හිතා හිටියා. එච්චරයි" තම උපැස් යුවළ තුළින් දිලිසෙන දෑස්වලින් යුතුව අයිරින් කිව්වා.



"ඒක අපූරු ගණනක්... දෙතුන් විදිහකින් හදන්න පුළුවන්. ඔන්න..."

"ඕ..... ගණිතය නම් එපා." ඇලිසියා කෙඳිරිගෑවා. "අයිරින් ඔයා නම් මොට්ටියක්"

එහෙත් අයිරින් එසේ නොවිය. ඇය පාසලේ සිටි දක්ෂම සිසුවියක් වූ අතර නිතර ඇගේ සිත ගැඹුරු දේවල් ගැනම කල්පනාවේ තිබූ හෙයින් එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය දේවල් ඇයට අමතක වන බවක් පෙනුණා. ඇයට විනෝදකාමී හැඟීමක් ද තිබුණ අතර ඇත්තෙන්ම හාස්‍යජනක දෙයක් සිදු වූ විට අතිමහත් ලෙස සිනා හඬ දෙන ඇය පොට්ස් ගුරුතුමියගේ ද කේන්තිය ඇවිස්සුවා.

මෙලෙස සමහර විට ඇයව සිනහවට පොලඹවන්නේ හා පන්තිය අවුල් කරන්නේ ඇලිසියායි.

අනික් දැරියන් තිදෙනා වූයේ ස්කොට්ලන්තයෙන් පැමිණි විනෝදකාමී ජීන් නම් පාසලේ නොයෙක් සමිති සමාගම්වල හා සමාජ සේවා කටයුතුවල මුදල් ගනුදෙනු සඳහා දක්ෂ දැරිය; මැහුම් ගෙතුම්වලට දක්ෂ නිසා නිතර මම්සලීගේ සිත් ගත් ඉගෙනීමට දක්ෂ එමිලි හා කිසිදු වැඩකට උනන්දුවක් නොදක්වන බව පෙනුණ හෙයින් සැම තැනකදීම කොන් වන හා මේ නිසාම නිතර ලජ්ජාශීලී වූ වයලට් නම් දැරියයි. පන්තියේ අඩක් පමණ වයලට් සිටින බවක් හෝ දැන සිටියේ නැහැ.

ඒ දැරියෝ දසදෙනායි. ඔවුන් සමග දවස් කිහිපයක් පමණක් සිටීමෙන් අනතුරුව තමා ඔවුන් වසර ගණනක සිට දැන හඳුනන බවක් ඩැරල්ට හැඟුණා. නිතර අයිරින්ගේ මේස් ඇකිළී පහළට එන බව ඇය දැන ගත්තා. තම ස්කොට් උච්චාරණයෙන් සැර පරුෂ ලෙස ජීන් කතා කරන ආකාරය ඇය දැන ගත්තා. මම්සලීගේ උනන්දුවට හා හැඟීම්වලට අවඥා සහගතව සලකන නිසා මම්සලී ජීන්ව අප්‍රිය කරන බව ඇය දැන ගත්තා. ජීන් කිසි දින, කිසි දෙයකින් තෘප්තිමත් වුණේ නැහැ.

බොරු මවාපෑම්වලට, කෝමල ලෙස හැසිරීමට, සුසුම්ලෑමට හෝ කෙනෙකුට සෙනෙහස දැක්වීමට ඇලිසියාට කාලයක් තිබුණේ නැහැ. ඩැරල් මෙන්ම ඇය ද ඍජු ප්‍රතිපත්තිවලින් යුතු වුවද

එතරම් කාරුණික වුණේ නැහැ. තමාට රිසි පරිදි ඇය අවශ්‍ය සහායත හා නපුරු ලෙස කටයුතු කළ හෙයින් ගොන්ඩොලින් වැනි අය ඇයව පිළිකුල් කළ අතර මේරි ලෝව් වැනි අය ඇයට බියක් දැක්වූවා. ඩැරල් ඇයට දැක්වූයේ මහත් ඇල්මක්.

"එයා හැම තිස්සෙම විනෝදෙන්" ඩැරල් සිතන්නට වුණා. "එයා ඉන්න තැනක පාළුවක් නැහැ. මටත් ඒ වගේ සතුටින් ඉන්න පුළුවන් නම්. එයා කතා කරද්දි හැම කෙනෙක්ම, තරක දෙයක් වුණත්, අහගෙන ඉන්නවා. ඒත් මම මොනවා හරි කියන්න ගියොත් කවුරුත් අහන්නේ නැහැ. මම ඇලිසියාට කැමති වුණාට එයා බෙටී එක්ක යාළු වුණ එකට මම කැමති නැහැ. එයාට යාළු වෙන්න තිබුණේ මාත් එක්ක" ඇය සිතුවා.

සැම කෙනෙක්ම පන්ති නායිකා පැමෙලාට ද ගරු කරන බව පෙනුණා. ඇය දක්ෂ මෙන්ම පොතේ පතේ දැනුමෙන් යුතු වුණා. ඒ වන විට ද ඇය පොතක් ලියමින් සිටින බවට කතාවක් තිබුණා. එය පළමු පන්තියේ දැරියන්ගේ උද්‍යෝගය වැඩි කරන දෙයක් වුණා. රචනාවක් හෝ ලිවීම ඉතා අසීරු වූ අතරේ පොතක් ලිවීම ගැන කවර කතා ද !

ඩැරල් ඉක්මනින්ම අනෙක් පන්ති කාමර ගැන ද දැන ගත්තා. උතුරු දෙසින් ආලෝක වූ චිත්‍ර කාමරය ඇය දැන ගත්තා. ලණු ඔංචිල්ලා, උස් බංකු හා ගුදිරි සහිත ක්‍රීඩාගාරයට ඇය ඇලුම් කළා. යම් බියක් ගෙන දෙන පෙනුමක් සතු විද්‍යාගාරයේ තවම ඇයට ඉගෙන ගැනීමට අවස්ථාවක් ලැබී තිබුණේ නැහැ. ඇය ක්‍රීඩාවලට දක්ෂකම් දැක්වූ නිසා ක්‍රීඩාගාරය ඇයට කදිම තැනක් ලෙස පෙනුණා. අශ්වයකු සේ ජවසම්පන්න හා වඳුරෙකු සේ කඹ දිගේ බඩගාන ඇලිසියා ද, ඇය මෙන්ම ක්‍රීඩාවට ඇලුම් කළා. මේරි ලෝව්ට බල නොකළේ නම් ඇය කිසිම කටයුත්තකට සහභාගී නොවන්නට තිබුණා.

# 06

ඩැරල්ට හොඳ ඔළුවක් තිබුණු අතර එය පාවිච්චි කිරීමට ද ඇය ඉගෙන තිබුණා. පන්ති වැඩ ඇයට ඉතා පහසු බවක් දැනුණ අතර රචනා වැනි දෑවල දී ඇය බොහෝ දෙනෙකුට ඉදිරියෙන් සිටියා. ඇයට සතුටක් දැනුණා.

"මම හිතුවා පරණ ඉස්කෝලෙට වඩා හුඟාක් මහන්සි වෙලා වැඩ කරන්න වෙයි කියලා" ඇය තනිව සිතුවා. "ඒත් එහෙම නැහැ. ගණිතයට තමයි මම දක්ෂ නැත්තේ. මටත් අයිරින්ට වගේ ගණිතයට දක්ෂ වෙන්න පුළුවන්නම්. එයා හිතෙන් කරන දේවල් මට ලියලවත් කරන්න බැහැ"

මෙසේ පළමු සතියට දෙකට පසු ඩැරල් සැහැල්ලුවට පත් වූ අතර ඇය තම වැඩ ගැන එතරම් වද වුණේ නැහැ. ඇලිසියා මෙන්ම ඇය ද මඳක් පන්තියේ විනෝද වීම ඇරඹුවා. තම දඟ වැඩවලට උදව් දීමට කෙනෙකු සිටීම ගැන ඇලිසියා ඇඩි සේ සතුටට පත් වුණා.

බෙටී හිල් ඇලිසියාට වඩා එහාට ගියා. ඇයව වැළකීමට යමෙක් නැතිදැයි විටෙක ඩැරල් පුදුමයෙන් සිතුවා. බෙටී හා ඇලිසියා කවටකම් කළ ගුරුවරියන් දෙදෙනෙක් සිටියා. එක් අයෙක් මම්සලී ඩූපොන්ට්, අනිත් කෙනා මැහුම් වැඩත්, සමහර විට රාත්‍රී සූදානම් පන්තිත් ගත් වැඩි කලබලයක් නැති ගුරුතුමියක් වූ ඩේවිස් ගුරුතුමිය. බෙටී හා ඇලිසියා ඇයට කපටිකම් කරන බවට ඇය කිසි දින සැක කළේ නැහැ. මම්සලීට එය අවබෝධ වුවද සියල්ල විඳ දරාගෙන සිටියා.

"මම්සලීගේ මේසයට බෙටී සුදු මීයෙක් දාපු හැටි ඔයා අහල තියෙනවා ද ?" ඇලිසියා ඇහුවා.

"අහිංසකයා, ඌට එළියට එන්න බැරිව හිටියේ. හදිසියේම ඌ ගැස්සිලා වැටුණේ තීන්ත කුඩුව උඩට. උගේ හොම්බ කුප්පි කටේ හිර වුණා. මම්සලීට කලන්තේ නොහැදුණා විතරයි"

"එයා මොනවා ද කළේ ?" ඇඩි උනන්දුවෙන් ඩැරල් ඇසුවා

"එයා පස්සෙන් බල්ලෝ සීයක් එළවනවා වගේ පන්තියෙ එළියට දිව්වා" ඇලිසියා කිව්වා. "එයා ගියාට පස්සේ අපි මීයා අල්ල ගත්තා. බෙටී ඌව කොලර් එක අස්සේ හංග ගත්තා. මම්සලී ආපහු ඇවිදින් අපට මීයව හොයන්න කිව්වා. එතැන මීයෙ හිටියේ නැහැ. ඉතින් මම්සලී හිතුවේ ඒක එයාගේ ඇස්වල දෝෂයක් කියලා !"

"අනේ මමත් හිටියා නම්" ඩැරල් සුසුම් හෙළුවා. "ඇලිසියා විහිළු වැඩක් කරන්නකෝ..... ගණිතය පන්තියේ දී මොනවා හරි දෙයක් කරන්න ඔයාට බැරි ද ? මිස් පොට්ස් ගණිත පාඩමේ දී මගේ පස්සෙන් පන්නනවා. මොකක් හරි කරනවා නම් එයා මාව අතහරියි"

"මොනවා ! පොට්ටිගේ පන්තියේදී විහිළු කරන්න !" ඇලිසියා අවඥාවෙන් කිව්වා. "මෝඩ වෙන්න එපා. පොට්ටි ඕනෑම එකක ඔට්ටුයි. එයාව ගොනාට අන්දන්න බැහැ !"

"හරි.... එහෙනම් මම්සලීගේ පන්තියේ දී" ඩැරල් ආයාචනා කළා. "මම මම්ඝලීට කැමතියි. ඒත් තවම එයාට තරහා ගිහි ඉන්නවා දැකලා නැහැ. අනේ, එයාගෙ පන්තියේ දී විහිළුවක් කරන්නකෝ"

ඩැරල් තමාව වඩාත්ම අගය කරන රසිකාවිය ලෙ ඇලිසියාට දැනුණා. ඇයට යමක් සිතා ගැනීමට අවශ්‍ය වුණා නළල රැලි ගන්වා ගත් ඇය තදින් කල්පනා කරන්නට වුණා.

බෙටී ඇයව උනන්දු කළා. "සෑම් හරි, රොජර් හරි, ඩික් හරි ගිය වාරයේ කරපු දෙයක් ඔයාට මතක් කරන්න බැරි ද ?" ඇය ඇසුවා. ඈ ඩැරල් දෙසට හැරුණා. "ඇලිසියාගේ සහෝදරයෝ තුන් දෙනාම යන්නේ එකම ඉස්කෝලෙට" ඇය කිව්වා. "ටොගල් කියලා ගුරුවරයෙක් ඉන්නවා...... කොහොම වුණත් ඒක තමයි කොල්ලො එයාට කියන නම.... එයා හරිම මෝඩ නිසා කොල්ලෙ කොලොප්පම් කරලා පැන ගන්නවා"

රොජර්, සෑම් හා ඩික් වැනි සොයුරන් තමාටත් සිටින්නේ නම් යැයි ඇයට සිතුණා. එහෙත් ඇයට සිටියේ සොහොයුරියක් පමණයි.



"ගිය වාරයේ රොජර් කරපු හොඳ කවටකමක් තියෙනවා." හදිසියේම ඇලිසියා කිව්වා. "මම හිතන්නේ අපිටත් කරන්න පුළුවන්. ඔයයි, බෙටියි උදව් කරන්න ඕනෑ, ඩැරල්"

"ඕ..... කරන්නම්" ඩැරල් කිව්වා.

"මම කන් ඇහෙන්නේ නැති විදියට ඉන්නම්" ඇලිසියා කිව්වා.

"ඕ.... ඇලිසියා, අපූරු වැඩක්. ඔයා බිහිරි විදියට ඉන්න. අපි ඕනෑම දෙයක් කරන්නම්. මම්සලීගේ පන්තියේ දී ඒක කරමු"

ඇලිසියා මම්සලීව රවටන්නට යන බව ආරංචි වූ පළමු පන්තිය මහත් සතුටට පත්වුණා. ආපසු පාසලට පැමිණීමෙන් ලද සොම්නස වියැකෙමින් තිබුණා. තවත් විනෝදයක් ලැබීමට ඇරියෝ සූදානම්ව නොඉවසිලිමත් වුණා.

"දැන්" ඇලිසියා කතා කළා. "මම්සලී කියන දේවල් වැරදියට ඇහෙන විදියට මම බොරු කරනවා..... ඔයා ඒක හයියෙන් කියන්න ඕනෑ ඩැරල්, ඊළඟට බෙටී ඔයා, ඊට පස්සේ පන්තියේ අනිත් අය.... හරිද ? අපි පොඩි සෙල්ලමක් කරමු."

මේ කිසිත් ගැන සැකයක් නොසිතූ මම්සලී ඊළඟ උදයේ දීප්තිමත් සිනාවකින් මුව සරසාගෙන පළමු පන්තියට ආවා. එය ගිම්හානයේ සුන්දර දවසක්. ඇයට අලුත් ඥාති පුත්‍රයකු ලැබී ඇති බව දන්වමින් එදින ලිපි දෙකක් ද නිවසින් එවා තිබුණා. පෙරදින හොඳින් ස්නානය කර අලුත් කොණ්ඩා කටුවක් ද පැලඳ සිටි ඇය සතුටු සිතින් පසුවූවා.

ඇය සතුටින් ඉපිලී පන්තිය සිසාරා බැලුවා. "ඕ.... මගෙ හොඳ ළමයි !" ඇය කිව්වා. "අපි අද හොඳම හොඳ ප්‍රංශ පාඩමක් කරන්නයි යන්නේ හරිද ! අපි දෙවැනි පන්තියට වඩා හොඳ වෙන්න ඕනෑ."

ප්‍රංශයේ සිටින තම පවුලෙන් ආරංචියක් ලද විට තම ආදරණීය පවුලේ උදවිය ගැන කතා කිරීම මම්සලීට කිසිසේත් නවතා ගත නොහැකි වුණා. ජෝසපින් අක්කා හා ඉවෝන් නෑනා. ලුවිස් මස්සිනා ගැන වැඩි වැඩියෙන් කියද්දී ක්‍රියා පද හෝ ලිංග

ගැහැද ගැන කියැවුණේ අඩුවෙන් නිසා ඇරියෝ නිතර ඇයට අනුබ
දුන්නා. එහෙයින් මම්සලී තම අලුත් ඥාති පුතුයා ගැන කියු
ඇරියෝ සතුටින් අසා සිටියා.

"එයාගේ නම ජෝන්..... හරිම හුරුබුහුටියි" මම්සලී ගැ
යම් දුරක තබා දරුවාගේ තරම පෙන්නුවා. "දැන් හුරුබුහුටි
කියන්න යොදන ප්‍රංශ වචනය කියන්න. කාටද කියන්න පුළුව
?"

කන පිටුපසට අතක් ද තබාගෙන හැකිතාක් දුරු
ඩෙස්කයෙන් ඉදිරියට නැඹුරු වී ඇඩි අවධානයකින් සවන් දෙ
විලාසයක් දක්වමින් ඇලිසියා වාඩි වී සිටියා. මම්සලී ඇව දැක්ක

"ඕ..... ඇලිසියා, ඔයාට මම කියන දේ හරියට ඇහෙන්නෙ
නැද්ද ? හුරුබුහුටියි කියන්න බලන්න"

"මොකක් ද ?" දෑතම දෙකන් පිටුපසින් තබාගෙන ඇලිසි
විනීතව ඇසුවා.

ඩැරල්ට තදින් හිනා යන්න ආවා. ඇය ඇඩි කරගත් මුහුණ
තබා ගැනීමට වෙහෙසුණා.

"ඇලිසියා ! මොකද වෙලා තියෙන්නේ ?" මම්සලී කෑගැසුව
"ඔයාට ඇහෙන්නේ නැද්ද ?"

"මොකට ද මම ගැහෙන්නේ ?" එහෙම එකක් නැහැ
මම්සලී" මඳක් මවිත වූ බවක් දක්වමින් ඇලිසියා කිව්වා.

යමෙක් සිනහා නැඟුව ද ඉක්මනින් එය යටපත් කර ගත්ත

"මම්සලී ඇහුවේ 'ඇහෙන්නේ නැද්ද ?' කියලා" ඩැරල් මැ
හඬින් එය ප්‍රතිරාවය කළා.

"වැහෙන්නේ ?" පෙරටත් වඩා මවිතයෙන් ඇලිසියා ඇහුව

"ඇහෙන්නේ නැද්ද ?" සෙල්ලමට එක් වෙමින් බෙටී ඇසුව
මුළු පන්තියම එයට එකතු වුණා. "ඇහෙන්නේ නැද්ද ?"

මම්සලී මේසයට පහරක් දුන්නා. "ළමයි ! අමතක වුණා ද
පන්තියේ එහෙම කෑගහනවා ද ?"



"මම්සලී, සමහර වෙලාවට ඇලිසියා බිහිරිය ... "එයාට කනේ
කෙනෙකුට කතා කරන අයුරින්ම මම්සලීට කිව්වා. "එයාට කනේ
අමාරුවක් ඇති."

"ඕ.... පව් !" තමාට ද නිතර කනේ අමාරුව හැදෙන නිසා
කනේ අමාරුවක් ඇති ඕනෑම කෙනෙකුට අනුකම්පා දක්වන
මම්සලී කිව්වා. ඇය ඇලිසියාට බෙරිහන් දී කතා කළා.

"ඔයාගේ කන රිදිල්ලක් තියෙනවා ද ?"

"ඉදලක් ? මට ඉදල් එපා මම්සලී" ඇලිසියා පිළිතුරු දුන්නා.
"අද මම නෙමෙයි මිදුල අතුගාන්නේ"

අයිරින්ට මෙය තවත් ඉවසිය නොහැකි වුණා. ඇය සිනහ
හඬින් පුපුරද්දී ඉදිරියේ සිටින ඇරියෝ උඩ විසිවුණා.

"නවත්වනවා" මම්සලී ද උඩගොස් කෑගැසුවා. "ඒ මොක ද
? ඇයි අයිරින් අමුතු විදිහට ශබ්ද කරන්නේ. මම ඒවට කැමති
නැහැ"

"කිවිසුම් යද්දි කරන්න දෙයක් නැහැ මම්සලී" නැවත
කිවිසුමක් පිට කරන්නට මෙන් තම මුහුණ අත් ලේන්සුවේ ඔබා
ගනිමින් අයිරින් ගොත ගසමින් කිව්වා. සිනහව තදකර ගැනීමට
වෙහෙසෙන ඇයගෙන් නොයෙක් අමුතු ශබ්ද නැගෙන්නට වුණා.

"ඇලිසියා" දඟකාරිය වෙතට නැවත හැරෙමින් මම්සලී කතා
කළ අතර එකවරම දෑත දෙකන් පිටුපසට කර අල්ලා ගත් ඇලිසියා
උනන්දුවෙන් ඇහුම්කන් දෙන බවක් පළ කරමින් නළල රැලි
නංවා ගත්තා. "ඇලිසියා, ඉදල් ගැන නොවෙයි. මට කියන්න
ඔයාට හෙම්බිරිස්සාව තියෙනවා ද කියලා"

"ගම්මිරිස් නම් නැහැ. අබ තමයි සැන්ඩ්විච්වලට හොඳ"
මම්සලී තවත් අසරණ කරමින් ඇලිසියා පිළිතුරු දුන්නා.

"මම්සලී ඇහුවේ හෙම්බිරිස්සාව, ගම්මිරිස් නොවෙයි" ඩැරල්
යටිගිරියෙන් කෑගසා කිව්වා.

"දන්නවානේ..... හෙම්බිරිස්සාව" උදව් කිරීමට ඉදිරිපත්ව
බෙටී හඬනැඟුවා. "ඔයාට හෙම්බිරිස්සාව ද ?"

"ඔයාට හෙම්බිරිස්සාව ද ?" පන්තියම හඬනැගුවා. එය ප්‍රගුණ කළ අත්වැල් ගායනයක් මෙන් වුණා.

"ඕ.... හෙම්බිරිස්සාව. පැහැදිලිව කියන්න තිබුණානෙ. එහෙනම් මට ඇහෙනවා" ඇලිසියා කිව්වා. "ඔව්.... මට හෙම්බිරිස්සාවක් තිබුණා, ඇත්තමයි"

"අන්න..... ඒක තමයි කන්වලට බලපාන්නේ" මම්සලී කිව්වා. "කොයි කාලෙ ද ඒක හැදුණෙ ඇලිසියා ?"

ඩැරල් එම ප්‍රශ්නයම හැකි උපරිම හඬින් කී අතර බෙටී ද එයම තවත් මහ හඬින් කිව්වා. "කවදාද හෙම්බිරිස්සාව හැදුණේ ?" පන්තියම පුහුණු කළ කලෙක මෙන් ඇසුවා.

"ඕ, මට කවදාද හෙම්බිරිස්සාව හැදුණෙ ? අවුරුදු දෙකකට ඉස්සර" ඇලිසියා කිව්වා. අයිරින් නැවත වතාවක් මුහුණ අත් ලේන්සුවේ ඔබා ගත්තා. මම්සලී තරහින් බැලුවා.

"මේ අභිංසක ළමයට ප්‍රංශ පාඩම් කරන්න කිව්වට වැඩක් නැහැ" මම්සලී කිව්වා. "ඇලිසියා ජනේල ළඟ ඉර අව්වට ගිහින් ප්‍රංශ පොත කියවා ගන්න. ඔයාට අපි කියන වචනයක් ඇහෙන්නේ නැහැ"

කිසිවක් නැසුණු බව පළ කරමින් ඇලිසියා යමක් විමසීමට මෙන් ඩැරල් දෙස බැලුවා. ඩැරල් ගුරුතුමිය කී දෙය යටිගිරියෙන් කෑගසා කිව්වා. හඬනගා සිනාසීමට බෙටීට කොතරම් ඇඩි ආශාවක් ඇතිවීද යත් ඇයට මම්සලී කී දෙය කෑගසා කීමට නොහැකි වුණා. එහෙත් පන්තියේ සෙසු පිරිස මහත් ආශාවෙන් එය ප්‍රතිරාවය කළා.

"ඔයාට අපි කියන වචනයක්වත් ඇහෙන්නේ නැහැ" ඔවුන් එක හඬින් මොර දුන්නා.

දොර විවෘත වී හදිසියේම කෝපාවිෂ්ට පොට්ස් ගුරුතුමිය පන්තියට එබුණා. යාබද දෙවැනි පන්ති කාමරයේ සිටි ඇය පළමු පන්තියේ ඝෝෂාව කුමක්දැයි සිතා ගැනීමට අපොහොසත්ව සිටියා.

"මම්සලී, බාධා කළාට සමාවෙන්න. මේ ළමයි ප්‍රංශ පාඩමේ

දී ඒ තරම් හයියෙන් කෑගහන්න ඕනෑ ද ?" ඇය ඇසුවා.

"ඔ, මිස් පොට්ස්, මට කනගාටුයි. ඒත් ළමයි කෑගහලා කතා කළේ මට නොවෙයි. ඒ මේ අහිංසක ඇලිසියාට" මම්සලී පැහැදිලි කළා.

පොට්ස් ගුරුතුමිය දැඩි විමතියට පත් වූ බවක් පළ කළා. ඇය ඇලිසියා දෙස බැලුවා. ඇලිසියාට අපහසුතාවයක් දැනුණා. ඇය හැකි පමණ අහිංසක බවක් පළ කළා. එහෙත් බෙට් හෝ ඇලිසියා අහිංසක බව පළ කරන හැම විටකම පොට්ස් ගුරුතුමිය දැඩි අවධානයකින් යුතු වුණා.

"ඒකේ තේරුම මොකක් ද මම්සලී ?" පොට්ස් ගුරුතුමිය සැරෙන් ඇසුවා. "ඇලිසියා හදිසියේම බිහිරි වෙලා ද ? එයා උදේ හොඳට හිටියනේ"

"එයා දැන් හොඳටම බිහිරියි" මම්සලී සහතික කර කියා සිටියා. පොට්ස් ගුරුතුමිය ඇලිසියා වෙත තියුණු බැල්මක් හෙළුවා.

"විවේකයේ දී මාව හමුවෙන්න ඇලිසියා" ඇය කිව්වා. "මට ටිකක් කතා කරන්න ඕනා"

වචන හඬනගා ප්‍රතිරාව කිරීමට තරම් කිසිවෙක් නිර්භීත නොවූ නමුත් මම්සලී උපකාරයට ඉදිරිපත් වුණා. ඇය ඇලිසියාට කෑගසා කතා කළා.

"මිස් පොට්ස් කියනවා, ඔයාට......!"

"මම කියපු දේ කෑගහලා කියන්න කරදර වෙන්න එපා, මම්සලී" මිස් පොට්ස් කිව්වා. "ඇලිසියා නොවැරදීම එයි. මම එකොළහට බලාපොරොත්තු වෙනවා ඇලිසියා. අනික මම කතා කරද්දි කරුණාකරලා නැගිටින්න"

රතු පැහැයෙන් ගිනිගත් මුහුණින් යුතුව ඇලිසියා නැගී සිටියා. පොට්ස් ගුරුතුමිය පන්ති කාමරයෙන් පිට වූ අතර ඇය දොර වැසුවේ සෙමින් නොවෙයි. දොරවල් මහ හඬින් වසන අයට මම්සලී කැමති වුණේ නැහැ.

"ඔ.... මේ දොර. මගේ ඔළුව පැළෙන්න එනවා" ඇය කිව්වා.

"මිස් පොට්ස් හොඳයි. දක්ෂයි. ඒත් එයාට ඔළුවෙ කැක්කුමක් නැහැ මට වගේ....."

"නැහැ කනේ කැක්කුමක්" ඩැරල් මැදිහත් වුණා. එහෙත් කිසිවෙක් කැකිරි පළන සිනා හඬ නැගුවේ නැහැ. පොට්ස් ගුරුතුමියගේ පැමිණීම හා ඇගේ බිහිසුණුකම නිසා ඔවුන්ගේ ප්‍රමෝදය ඇල්මැරී තිබුණා.

ඇලිසියා තම කන් අමාරුව ගැන තවදුරටත් කතා කළේ නැහැ. පොතක් ගත් ඇය ජනේලය අසල හිරුඑළියේ වාඩි වී, පොට්ස් ගුරුතුමිය නැවත නොපැමිණෙනු ඇතැයි හැඟීමෙන් යුතුව සිටියා. තම රඟපෑමෙන් යමක් ඇයට ලැබෙන බව ඇය සිතුවා. ඈ ගැන තවදුරටත් සැලකිල්ලක් නොදැක්වූ මම්සලී සියලු ප්‍රංශ ක්‍රියාපද නිවැරදිව වර නැගීමට හැකි අයෙකුව සොයා ගැනීමට නොහැකි වීමෙන්, පන්තියට ඇතුළු වීමේදී ඈ සතු වූ ප්‍රියමනාප බව පහව ගොස් පන්තියට අපල කාලයක් උදා වුණා.

විවේකය සඳහා සීනුව නාද වූ පසු ඇය පන්තියෙන් පිටව ගියා. දැරියෝ ඇලිසියා වටා රොක් වුණා. "ඕ.... ඇලිසියා, මට හිනාවෙලා පණ යන්න ආවා. අපරාදෙ පොට්ටි ආවේ.... ඔයා ලොකු අමාරුවක වැටෙයි ද ඇලිසියා ?"

"ඩැරල් වහලෙ උඩ යන්න කැගැහුවා" අයිරින් කිව්වා. "හිනා නොවී ඉන්න ගිහින් මාව පුපුරන්න ආවා"

"මම ගිහින් පොට්ටි කියන්නේ මොනවා ද කියලා අහගෙන එන්නම්" ඇලිසියා කිව්වා. "අපරාදේ, එයා දෙවැනි පන්තියේ ඉන්නවා කියලා මට අමතක වුණා.... මම ගිහින් එන්නම්"



# 07

ඇලිසියාට හොඳ බැණුමකුත්, වැඩිපුර අභ්‍යාසයකුත් ලැබුණා. ඇය පොට්ස් ගුරුතුමියගේ කාමරයෙන් පිටතට එන්ම මුණගැසුණේ මම්සලී.

"මිස් පොට්ස් හමුවෙන්න ගියා ද ඇලිසියා ?" තමා අසන දෙය සමහර විට ඇලිසියාට නෑසෙනු ඇතිදැයි සැක සිතමින් මම්සලී ඇසුවා.

"ආහ්....ඔව්, ස්තුතියි මම්සලී" කී ඇලිසියා ඉක්මනින් ඉවතට පා තැබුවා. ඈතට යන ඈ දෙස මම්සලී බලා සිටියා. හරි අමුතුයි. ඈ කී දෙය ඇලිසියාට හොඳින් ඇසී තිබුණා. එහෙනම් කනේ අමාරු එතරම් ඉක්මනින් සුව වෙනවා ද ? දෑස කුඩා කරගත් මම්සලී නොසැලී බලා සිටියා. කාමරයෙන් පිටතට පැමිණි පොට්ස් ගුරුතුමිය ඇව දැක්කා.

"ඇලිසියා තවත් රෝග ලක්ෂණ පෙන්නුවොත් මා ළඟට එවන්න" පොට්ස් ගුරුතුමිය නුරුස්සනා හඬකින් කිව්වා. "මට එක වතාවෙන් සුව කරන්න බැරි වෙයි"

ඇය පිටතට පා තැබුවා. මම්සලී තදින් හුස්ම ගත්තා. "නරක කෙල්ල..... ඇලිසියා මාව රවට්ටලා" මම්සලී තමාටම කියා ගත්තා! "මට බොරුවක් කරලා! ආයෙත් නම් කවදාවත් මම රැවටෙන්නේ නැහැ. නරක කෙල්ල"

පන්තිය පිළිගත් නායිකාව වූ බෙටී හා ඇලිසියා ඩැරල් සමග මිතුරුදමක් ගොඩනගා ගත් ආකාරයට ගොන්ඩොලින් ඊර්ෂ්‍යා කළා. කෙසේ වෙතත් ඩැරල් ද ඇය මෙන්ම අලුත් සිසුවියක්. එමෙන්ම ඇය, ගොන්ඩොලින්ට වඩා ලස්සන මෙන්ම කදිම සිරිත් විරිත්වලින් යුතු වුණා.

ඇය සැලී හෝප් කෙරෙහි විශ්වාසය තැබුවා. "මම කැමති නැහැ හැම තිස්සෙම ඩැරල් රිවර්ස් මුදුනා වෙන්න හදනවාට.

ඔයා කැමති ද ?" ඇය සැලීගෙන් ඇසුවා. "එයා හරි
කියලා හිතාගෙන ඉන්නේ ! ඇලිසියා බෙටී එක්ක පැහිලා.
කිව්වත් මම යාළුවෙන්නේ නැහැ"

සැලී එතරම් උනන්දුවක් නොදැක්වුවද ගොන්ඩොලින්
තැකුවේ නැහැ. ඇය දිගටම ඩැරල් ගැන මැසිවිලි නැගුවා.
හිතාගෙන ඉන්නේ එයා හරිම ඥානවන්තයි, පුදුම විදියට
සෙල්ලම් කරන්න පුළුවන්, පිහිනන්න දක්ෂයි කියලා.
මට හිතෙනවා එයා වගේ දෙගුණයක් මම දක්ෂයි
පෙන්වන්න"

"ඉතින් ඇයි නොකරන්නේ ?" වෙහෙසට පත් සැලී
"ඒ වෙනුවට ඔයා කරන්නේ ඒ වගේ දෙගුණයක් නරකයි
හැම කෙනාටම පෙන්වන එකනේ"

ගොන්ඩොලින්ගේ හිත රිදුණා. ශාන්තව සිටින කුඩා
හෝප් වගේ කෙනෙක් එහෙම දෙයක් කියන හැටි. සැලීව
යන ආකාරයේ බැල්මක් ඇය හෙළුවා.

"හොඳයි" ගොන්ඩොලින් උදාරම් ලෙස කිව්වා. "මම
පෙන්වන්නම් සැලී, මම ඉස්සර උත්සාහ කළේ නැහැ. ඒ
දෙයක් කරන්න ඕනෑ කියලා මට පෙනුණේ නැහැ. මට
ටවර්ස්වලට එන්න වුවමනාවක් තිබුණේ නැහැ. අම්මට
වුණෙත් නැහැ. තාත්තා තමයි මාව එව්වේ. ආයත් එක්ක
අපූරුවට වැඩ කරගෙන හිටියා. මෙතැන වැදගත්කමක් තියෙන
කියලා හිතුණොත් ඇනුත් මට හොඳට වැඩ කරන්න පුළුවන්"

මෙතැනට පැමිණි ඇලිසියාට මෙම අමුතු කතාව
ඇය හඬනගා සිනාසුණා.

"ඔයාට ටෙනිස් ගහන්න බැහැ. පිහිනන්න බැහැ. කකුලේ
ටිකක් ගෑවෙද්දි කෑගහනවා. ඔයාට තවම දොළොස්
වක්කරෙත් බැහැනේ බබෝ ! ඒත් කරන්න පුළුවන් දේවල්
පෙන්වන්න තව කයිවාරුත් ගහනවා. ඔයාගේ ඔය
හින්දා ඔයාට කිසිම දෙයක් කරන්නත් බැහැ, පුළුවන්
නැහැ"



සැලී ද හඬනගා සිනාසුන අතර ගොන්ඩොලින්ට තරහා ගියා. ඒ දෙන්නාටම අතුල් පහර දෙන්නට තරම් ඇයට සිතුණා. එහෙත් ඇගේ ආයා, මිස් වින්ටර්, ඇයට කියා තිබුණේ පුංචි නෝනා මහත්මියක් අතපය විසි නොකරන බවයි. කෙසේ වෙතත් ඇලිසියාට අතුල් පහරක් දීම භයානක විය හැක.

මුහුණ දික් කරගත් ගොන්ඩොලින් ඉවතට පා තැබුවා. "අනේ, ගොන්ඩොලින් මේරි !" ඇලිසියා මහ හඬින් කතා කළා. "අම්මාගේ හුරතලී, තාත්තාගේ පුංචි පැංචි, මිස් වින්ටර්ගේ වස්තුව. ඒත් කිසිම දෙයක් තවම හරියට කර ගන්න බැහැ"

එදින සවස් යාමයේ ඇරියෝ පිහිනුම් තටාකයේ විනෝද වෙමින් සිටියා. තටාකයේ එක් අන්තයක සිට අනෙක් අන්තයට හරස් අතට ඇලිසියා දිය යටින් පිහිනා ගොස් ආපසු පිහිනුවා. සියලු දෙනා ඇයට අත්පොළසන් හඬ දුන්නා.

"ඔයා කොහොම ද ඒ තරම් වෙලාවක් හුස්ම අල්ලා ගෙන ඉන්නේ ?" ඩැරල් කෑගසා ඇසුවා. "මටත් පුළුවන් නම් ! ආයෙත් කරන්න. ඇලිසියා හොඳ හුස්මක් අරගෙන"

"මේ සැරේ නම් කනට හොඳටම වතුර ගියා !" තදින් හිස වනමින් ඇලිසියා කිව්වා. "කන් අගුල් වැටිලා. ඒක හරි ගියාම කිමිදෙන්න ඕනා"

ඇය ශූර පිහිනුම්කාරියක් මෙන්ම දක්ෂ කිමිදුම්කාරියක් ද වුණා. ගොන්ඩොලින් ඊර්ෂ්‍යාවෙන් යුතුව නොගැඹුරු ඉසව්වේ අතපය ගසමින් හිටියා. ඇලිසියා වඩා දක්ෂ ලෙස තමාට පිහිනීමටත්, කිමිදීමටත් හැකි බව ඇය සහතිකවම දැන සිටියා. නමුත් ඒ අප්‍රසන්න ආරම්භය මගහැර ගැනීමට හැකි නම් පමණයි. පළමුව දැනෙන සීතල ඇය මහත් සේ පිළිකුල් කළා. ජලයේ ගිලීම ඇයට දැරිය නොහැකි වුණා. තමා ගිලී නාසයට වතුර ගිය කලක මෙන් ඇය මුවින් දිය වගුරන්නට වුණා.

ඇයට වඩා දුර්වල තව එක් අයෙක් පමණයි හිටියේ. ඒ අහිංසක මේරි ලෝව්. කවුරුත් මේරි ලෝව්ට කවටකම් කළේ නැහැ. එය බිය වූ කුඩා පූස් පැටවකු රිදවීමක් වගේ වුණා. ඇය තමා අසලම අතපය ගසමින් සිටිනු ගොන්ඩොලින් දුටු අතර

තමාට වඩා මේරි ලෝව් බියක් දක්වන බවක් දැනී ඇය... බලවතෙක් ලෙස හැඟුණා.

මේරි ලෝව් සමීපයට ගිය ගොන්ඩොලින් ඇරිය... පැන ඇයව ජලයේ ඔබා ගත්තා. මේරි ලෝව්ට කෑගැසීමට... කාලයක් තිබුණේ නැහැ. ඇය මුව විවර කරද්දී මුව තුළ... පිරුණා. ඇය දිවි රැක ගැනීමට මෙන් දඟලුවා. දැඟලිල්ල... ගොන්ඩොලින් සිතා සිටි කාලයටත් වඩා තපුරු ලෙස... ජලයේ ඔබාගෙන සිටියා. ඇගේ උරහිසට තදින් පහරක්... ඇනුණ විටයි ඇය දැරියව අත්හැරියේ.

ඇය හැරී බැලුවා. දැඩි කෝපය නිසා තදබල... ගැහෙමින් ඈ දෙස බලා සිටියේ ඩැරල්. "තපුරි !" ඩැරල් කෑගැ... "මම බලාගෙන හිටියා තමුසේ අහිංසක මේරි ලෝව්ව වතුරේ ඔබන... දන්නවා ද එයා කොයි තරම් බය වෙලා ද කියලා. තමුසෙ... ටිකෙන් එයාව ගිල්ලවලා මරනවා"

ඇය මේරි ලෝව් දිය මතුපිටට ඇද ඔසවා අල්ලා ගත්... දැරිය කහිමින් හුස්ම අල්ලා ගැනීමට වෙහෙසෙද්දී මුහුණ... පැහැ වූ ඇය ගිලුණු ලුණු වතුර ප්‍රමාණය නිසා අසනීප වී... ආසන්නව සිටියා.

සෙසු දැරියෝ කලබලය ඇති ස්ථානයට පිහිනා එන්න... ගත්තා. කෝපයෙන් වෙව්ලන හඬින් ඩැරල් නැවත... ගොන්ඩොලින්ව ඇමතුවා. "විනාඩියක් ඉන්නවා. මම තමුසෙ... වතුරෙ ඔබනවා ගොන්ඩොලින්. එතකොට මොන වගේ ද කියලා... තේරෙයි"

මේරි ලෝව් හැකි උපරිම ශක්තියෙන් ඩැරල්ගේ සිරුර... එල්ලී සිටියා. ඩැරල්ගේ හඬෙහි වූ කෝපය නිසා බියට... ගොන්ඩොලින් මෙම තර්ජනය ඩැරල් හෝ අන් අයෙකු ක්‍රියා... නගනු ඇතැයි සිතා ඉක්මනින් තටාකයෙන් පිටතට යාම... සැරසුණා. ඇය තටාකයට ඇති පියගැට පෙළ වෙත ගියා.

ඇය පඩියකට ගොඩවත්ම වැලපෙන මේරි ලෝව්... ඇලිසියාට භාර කළ ඩැරල් ඈ වෙතට වේගයෙන් ආවා.



"මම තමුසෙව වතුරෙ ඔබන්නේ නැහැ.... බයගුල්ලි !" ඇය කෑගැසුවා. "ඒත් තමුසේ වගේ අයට සලකන්න ඕනෑ හැටි පෙන්වන්නම් !"

තදින් අතුල් පහර හතරක් දෙන හඬ සමග ගොන්ඩොලින් වේදනාවෙන් කෑගසන හඬ ඇසුණා. ඩැරල්ගේ ශක්තිමත් දැඩි හස්තයෙන් වතුරෙන් ගොඩට යාමට සැරසෙන ගොන්ඩොලින්ගේ සිරුරේ හැකි සෑම තැනකටම ඩැරල් හැකි වෙර යොදා පහර දී තිබුණා. පහර දීමේ හඬ පිස්තෝලයක උණ්ඩ පිටවන හඬට සමාන වුණා.



"හේයි, ඩැරල් !" සයනාගාර නායිකාව කැතරින්ගේ හඬ නැඟුණා. "ඔක නවත්වන්න ! මොනවා ද හිතාගෙන ඉන්නේ. ගොන්ඩොලින් අතහරින්න"

ගිනිගත් දෙනෙතින් යුතු ඩැරල් හැරී කැතරින් දෙස බැලුවා. "කවුරු හරි ගොන්ඩොලින් බයගුල්ලිට පාඩමක් උගන්වන්න ඕනෑ නැද්ද ?"

"ඔව්. ඒත් ඔයා නොවෙයි" කැතරින් කලබලයකින් තො
කිව්වා. "ඔය විදිහට ගහන්න ගිහින් ඔයා වැරදි කරන්න එ
ඔයා ගැන මට ලැජ්ජයි"

"මටත් ඔයා ගැන ලැජ්ජයි !" කාගෙත් මහත් විස්මයට මෙ
ඩැරල් තරහින් පිපිරුවා. "පන්තියේ නායිකාව මම වුණා ත
ගොන්ඩොලින් වගේ අයට පිහිනන්නේ කොහොම ද, කිම්දෙන්
කොහොම ද, අනිත් අයට පාඩුවේ ඉන්න දෙන්නෙ කොහොම
කියලා උගන්වලා ඉවරයි. හරිද ?"

ඩැරල් කෝප වී සිටිනු මින් පෙර කිසිවෙක් දැක තිබුණෙ
නැහැ. ඔවුන් මහත් වූ දෙනෙතින් බලා සිටියා.

"ගොඩට යනවා" කැතරින් අණ කළා. "යනවා, ගොඩට
හොඳ වෙලාවට ටීචර් කෙනෙක් මේක දැක්කේ නැත්තේ"

තවමත් වෙව්ලමින් සිටි ඩැරල් ගොඩට ආවා. තම තුවාය
දමා තිබූ තැනට ගිය ඇය එය දවටා ගත්තා. හදවත ගැහෙන
අතරේ ඇය ගල් තලාව ඔස්සේ යන්නට වුණා. පිළිකුල් සහගත
ගොන්ඩොලින් ! නපුරු කැතරින් ! තිරිසන් මැලෝරි ටවර්ස් !

එහෙත් ගල්තලාව නැඟ පාසල් වත්තට ඇතුළු වීමට ඇති
කුඩා ගේට්ටුව අසලට යන්නටත් පෙර ඩැරල්ගේ කෝපය
සම්පූර්ණයෙන් පහව ගොස් තිබුණා. ඇගේ සිත කැලඹිල්ලෙන්
යුතු වුණා. ඇය එසේ හැසිරුණේ කෙසේ ද ? ඇය තම කෝපය
පාලනය කර ගැනීමට සම්පූර්ණයෙන්ම අදහස් කරගෙන තිබු
අතර කුඩා කල දී මෙන් නොව දැන් ඇය කෝපයේ ගිනිදලු
පිටතට ඒම වළකා ගත යුතුව තිබුණා.

බොහෝ සේ දමනය වූ ඩැරල් ආපසු පාසලට ගොස් තෙත
මාත්තු කර ඇඳුම් මාරුකර ගත්තා.

ඇඳුම් මාරු කරන කාමරයේ කවුරුන් හෝ ඉහළට අදිමින් සුසුම්ලනු ඩැරල්ට ඇසුණා. ඒ කවුරුන්දැයි දැක ගැනීමට ඩැරල් ඒ දෙස බැලුවා. ඒ තම කලවයේ තද රතු පාටින් ඉල්පී ඇති පාරවල් ශෝක පීඩිතව පරීක්ෂා කරමින් සිටි ගොන්ඩොලින්. ඒ ඩැරල් පහර දී තිබූ තැන්. ගොන්ඩොලින් හඬනගා ඉකිගැසුවා.



"මම අම්මට ලියලා යවනවා" ඇය සිතුවා. "එයා මේ පාරවල් දැක්කා නම්...... මේ ඩැරල්ගේ ඔක්කොම ඇඟිලි පාරවල් මෙතැන පෙනෙනවා"

ඩැරල් පසුපසින් පැමිණෙද්දී ඇය උඩ විසිවුණා. "ගොන්ඩොලින් මම කරපු දේ ගැන මට කනගාටුයි. ඇත්තටම. මට හුඟාක් නරක විදිහට තරහා ගිය නිසා මාව පාලනය කර ගන්න බැරි වුණා"

එවැනි ස්වාභාවික සමාව ඉල්ලීමක් පිළිගැනීමට තරම් ගොන්ඩොලින් උදාර වූවේ හෝ දයාබරිත වූයේ නැත. සිරුර සෘජු කරගත් ඇය දුගඳ හමන පිළිකුල් යමක් දෙස බලන කලක මෙන් ඩැරල් දෙස බැලුවාය.

"ඔයා කනගාටු වෙන්න ඕනැ තමයි !" ඇය අවමන සහගතව කිව්වා. "මම අම්මට ලියලා යවනවා. මැලෝරි ටවර්ස් ළමයි ඔය වගේ හැසිරෙනවා කියලා එයා දැනගත්තොත්, එයා මාව කවදාවත් මෙහාට එවන්නේ නැහැ !"

08

තටාකයේ ඉතිරි වූ ඇරියෝ උනන්දුවෙන් හා විමතියෙ... හදිසියේ සිදු වූ දෙය ගැන කතා කළා.

"සාන්ත දාන්ත තින්ත කුඩුව වගේ හිටපු ඩැරල් ඒ විදිහ... අතපය විසි කරයි කියලා කාටද හිතන්න පුළුවන් වුණේ ?"

"එයාට මුරණ්ඩු වෙන්න දෙන්න බැහැ, කැතරින්. එය... නපුරුයි"

"කැතරින්, ඔයා මේ ගැන මොනවා හරි කරන්න ද ඉන්නේ"

මේ වන විට තටාකයෙන් පිටතට පැමිණ සිටි කැතරින්ගේ... ශාන්ත මුහුණ රතු වී කලබලකාරී පෙනුමක් ගෙන තිබුණා. ඇය... ඩැරල්ට බොහෝ සේ ඇලුම් කර තිබුණා. එමෙන්ම දැන් එ... නිමේෂයකින් ඇයට ඩැරල් ගැන තිබුණේ වෙනස් වූ අදහසක්... ඇලිසියා ද ව්‍යාකූලව සිටියා. කනින් වතුර පිටවන ලෙස ඇය හිස... දෙපසට වනමින් සිටියා. ඩැරල් එතරම් කේන්තිකාරියක් බව කවුරු... නම් සිතුවෝ ද ?

"උතුරු කුලුනේ ළමයි, ඇඳුම් දාගත්ත වහාම පොදු කාමරයට... එන්න" අන්තිමේ දී කැතරින් තම සුපුරුදු ශාන්ත හඬින් කිව්වා. ඇරියෝ එකිනෙකා දෙස බලා ගත්තා. පළමු පන්තියේ රැස්වීමක්... ගොන්ඩොලින් හා ඩැරල් ගැන විය හැකි යැයි ඔවුන් සිතුවා. ගල් තලාව ඔස්සේ දුව ගිය ඔවුන් හඬනගා කතා කරමින් ඇඳුම් මාරුකර ගන්නා කාමරයට වැදුණා. ගොන්ඩොලින් හෝ ඩැරල් හෝ එහි සිටියේ නැහැ.

තම කකුලේ වූ රතු වැවරි පහර්වලට යමක් ආලේප කර ගැනීමට ගොන්ඩොලින් සයනාගාරයට ගොස් තිබුණා. ඇයට සැබැවින්ම යමක් ගල්වා ගැනීම අවශ්‍ය නොවුවද මෙය ලොකු සිද්ධියක් කර පෙන්වීමට ඇය අදහස් කරගෙන සිටියා ! නිතරම ඇය ඩැරල්ට ඊර්ෂ්‍යා කළ අතර ඩැරල්ට එරෙහිව යමක් කිරීමට



මෙය අවස්ථාවක් කර ගැනීමට ඇය මහත් සතුටින් සිටියා. ඩැරල්ගේ සමාව ගැනීම ඇයට වචනයක් හෝ කීමට තරම් වැදගත් දෙයක් වුණේ නැහැ.

උතුරු කුලුනේ අනෙක් ඇරියෝ සියලු දෙනා, ඔවුන් අට දෙනෙක්, පොදු කාමරයට රැස්වුණා. ඩෙස්කයක් මත වාඩිගත් කැතරින් වටපිට බැලුවා.

"මම හිතන්නේ ඔයාලා දන්නවා අපි හැමෝම ඩැරල්ට කැමති වුණාට අද එයාගෙ හැසිරීම අපිට අනුමත කරන්න බැහැ" ඇය පටන් ගත්තා.

"අනේ කැතරින්, එයාට කරදර කරන්න එපා !" මේරි ලෝව්ගේ සියුමැලි කට හඬින් කියවුණා. "එයා මාව ගිලිලා මැරෙන එකෙන් බේරුවා. ඇත්තටම"

"එහෙම වෙන්න බැහැ" කැතරින් කිව්වා. "ඔයාව ගිල්වලා මරන්න තරම් ගොන්ඩොලින් මෝඩියක් නොවෙයි. එයාට පිහිනන්න බැහැ කියලා අනිත් අය කරන විහිළු නිසා එයා තරහින් ඉන්න ඇති"

ඩැරල් වීරවරියක් බව මේරි ලෝව්ට දැඩිව අවබෝධ වී තිබුණා. ඇය සැබැවින්ම ගිලී මැරෙන්න යන තරමට දිය යට දී මහත් හිංසනයට ලක්ව තිබුණා. එවැනි විටකය ඩැරල් ඇගේ පිහිටට පැමිණ තිබුණේ. එවැනි අයෙකුට කැතරින් අකරුණාවන්තව සලකන්නේ කෙසේ ද ? තමාට නිර්භීතව හා බියකින් තොරව ඩැරල්ට පක්ෂව කතා කිරීමට හැකි නම් යැයි සිතමින් කරදරයට පත් වූ හා කුතුහලයෙන් පිරි මුහුණින් යුතුව වාඩි වී සිටි මේරි ලෝව් තව දුරටත් කතා කිරීමට උත්සාහ කළේ නැහැ. ඇයට වෙනත් කිසිවක් කියාගත නොහැකි වුණා.

"මම හිතන්නේ" අයිරින් කතා කළා. "කැතරින්ට කැගහපු එකට ඩැරල් එයාගෙන් සමාව ගන්න ඕනෑ. එහෙම නොකළොත් අපි එයා එක්ක ආශ්‍රයක් නැහැ. සතියක් යන තුරු අපි එයා එක්ක කතා කරන්නේ නැහැ. මට පුදුමයි ඩැරල් ගැන"

"හරි, මම හිතන්නේ එයා ගොන්ඩොලින්ගෙනුත් සමාව ගන්න ඕනෑ" කැතරින් කිව්වා.

"ගහපු පාරවල්වල සද්දේ තටාකේ අනිත් කෙළවරට ඇහුණා ! මගෙන් සමාව ගන්නවට වඩා ඒක වැදගත්"

"ඩැරල් කොහේද දන්නේ නැහැ. ඩැරල් සමාව ගත්ත කියලා කලබලයක් කළොත් තමයි වැඩේ. එයා තව කේන්තියෙන් ඉන්නවා නම් එයාට කතා කරන එක අමාරු එයා ගැන කියන්නවත්, ආශ්‍රය අතහරින්නවත් මම කැමති මට හිතාගන්න බැරි එයාට ඒ තරම් කේන්ති යනවා ද එකයි"

ඇගේ එම කතාව අවසන්වත්ම දොර විවර වී ඩැරල් ඇතුළු පැමිණියා. බැරෑරුම් පෙනුමින් යුතුව වාඩි වී සිටින දැරියන් ඇය පුදුම වුණා. ඇගේ ශාන්ත බව දැක මවිතයට පත්ව ඇය යමක් කීමට කැතරින් සැරසුණා.

එහෙත් ඇය වචනයක් හෝ කීමට පෙර ඩැරල් තොස ඈ වෙතට පියමං කළා. "අර විදිහට ඔයාට කෑගහපු එකගැන හුඟාක් කනගාටු වෙනවා" ඇය තරමක් අපහසුවෙන් කිව්වා. " මම කොහොම කළා ද මම දන්නේ නැහැ. මම හිතන්නේ හුඟාක් තරහා ගියා"

කැතරින්ගේ හුළං බැස්සා. ඩැරල් වෙත රවා බලනු වෙනුව ඇය මඳ සිනාවක් පෑවා. "ඒකට කමක් නැහැ" තරමක් අපහසුවෙ ඇය කිව්වා. "ඔයාට තරහා ගිය බව මම දැක්කා. ඒත් ඩැරල්

"ඒක මගේ ලොකු අඩුපාඩුවක්" තමා ගැන ලැජ්ජා වූ වි සෑම වරකම කරන පරිදි තම නාසය අතුල්ලමින් ඩැරල් කළා. "මගේ තරහා, මම කියන්නේ.... නිතරම එහෙම තම මේක තාත්තගෙන් ආව පුරුද්දක්. ඒත් එයාට තරහා යන් නැහැ. මම කියන්නේ එයාට තරහා යන්නේ ඒකට ලොකු හේතුව තියෙනවා නම් විතරයි. මම එහෙම නැහැ. සුළු මෝඩකම්වලට මට තරහා යනවා. මම නරකයි, කැතරින් ! ඒත් මම හිත හදාගෙ හිටියේ මැලෝරි ටවර්ස්වලට ආවට පස්සේ මම ඒක පාලනය ක ගන්නවා කියලා. මම ඒ හින්දමයි ගොන්ඩොලින්ගෙන් සමාව ගත් ඒත් හැබැයි එකක් ..... ගොන්ඩොලින් වගේ ඊර්ෂ්‍යාකාරයින් අහිංසකයින්ට රිදවන්න දෙන්න බැහැ"



ඩැරල් කාමරය වෙතට එන විට නුරුස්සනා බැල්මෙන් හිටි දැරියෝ මේ වන විට ඇයට මහත් ඇල්මෙන් ප්‍රතුව සලකන්නට වුණා. මෙහි සිටින්නේ වැරදිකාර, වැරැද්ද පිළිගන්නා හා ඒ ගැන කනගාටු වන කෙනෙකි. එමෙන්ම ඇය එයට සමාවට කරුණු නොකියයි. එවැනි අයෙකුට ඇලුම් කළ නොහැක්කේ කාට ද ?

ගොන්ඩොලින් දොර විවෘත කර රූපසෙන් මැදට වදිනා රණකාමියෙකු ලෙස ඇතුළට පිවිසුණා. වරල මුදාහැර තිබූ හෙයින් රන් සළුවක් සේ එය ඇගේ උරහිස මත විහිදුණා. තමා කෙනෙකුගේ පීඩාවට ලක් වූ සුරංගනාවියක ලෙස ඇය සිතා සිටින බවක් පෙනුණා.

ඩැරල් අවසන් වශයෙන් කී වචන ඇසී තිබුණ ඇය මුහුණ රතු කරගෙන සිටියා. "ගොන්ඩොලින් වගේ ඊර්ෂ්‍යාකාරයින්ට අහිංසකයින්ට රිදවන්න දෙන්න බැහැ !" ඇයට ඇසුණේ එයයි.

"ඕ..... ගොන්ඩොලින් ආයෙත් කවුරුහරි එක්ක පොර අල්ලන්න ඕනැ නම් ඔයා එක්ක හැප්පෙන්න පුළුවන් කෙනෙක් තෝරා ගන්න" තරමක තද ස්වරයකින් කැතරින් කිව්වා. "ඇත් ඔයා මේරි ලෝව්ට කරපු දේ වැරදියි කියලා එයාගෙන් සමාව ගන්න. ඔයා එයාව හොඳටම බය කළා. ඩැරල් ඔයාගෙන් සමාව ගත්ත නිසා ඔයාගේ ටික ඔයාට හොඳින්ම කරන්න පුළුවන්"

"ඕ.... ඩැරල් මගෙන් සමාව ගත්තා කියලා කිව්වද, එහෙනම්" ගොන්ඩොලින් කිව්වා. "හරි, ඒක සමාව ගැනීමක් කියලා මට නම් කියන්න බැහැ"

"බොරුකාරි !" විමතියට පත් ඩැරල් කිව්වා. ඇය දැරියන් වෙතට වහා හැරුණා. "ඇත්තමයි !" ඇය කිව්වා. "ඔයාලට මාව හරි ගොන්ඩොලින්ව හරි විශ්වාස කරන්න වෙනවා. ඒත් මම සමාව ගත්තා අවංකවම"

කැතරින් ඩැරල්ගේ කෝපය වැඩෙන මුහුණින් ඉවතට ගත් දෙනෙතින් ගොන්ඩොලින්ගේ අවඥාව මෝදු වන මුහුණ වෙතට යොමු කළා. "අපිට ඔයා විශ්වාසයි" ඇය ශාන්තව කිව්වා. ඇගේ හඬ නැවත දැඩි වුණා. "දැන්, ගොන්ඩොලින්, අපි ඉදිරිපිටම, අපිටත් ඇහෙන්න..... කරුණාකරලා මේරි ලෝව්ට කියන්න තියෙන දෙයක් කියන්න."

සමාව ගන්නා ලෙසට ගොන්ඩොලින්ට බල කෙරුණා. ඈ
කිසිවක් කියන්න අවශ්‍ය නොවුවද, අනෙක් අය ඈ වෙතට යො
යොමුකරගෙන සිටින නිසා එසේ කිරීමට සිදු වූ හෙයින් ඈ
ගොත ගසමින් වචන කිහිපයක් ආයාසයෙන් පිට කළා. ජීවිතයේ
කිසි දිනක කිසිවකට සමාව නොගෙන තිබුණ නිසා ඇය එලෙ
කිරීමට කිසිසේත් කැමැත්තක් තිබුණේ නැහැ. එතැන් පටන් ඈ
ඩැරල්ට වෛර කළා..... එමෙන්ම ඇය අඥාන ෟමරි ලෝව්
පිළිකුල් කළා.

ඇය කාමරයෙන් පිට වුණේ ඇසේ කඳුළු පුරවාගෙන. ඈ
පිටවත්ම කවුරුත් සැනසුම් සුසුමක් හෙළුවා. "හරි, ඒක ඉවර වුණ
එක ලොකු දෙයක් !" සංවේදී අවස්ථා පිළිකුල් කළ අයිරින් කිව්ව
"මම සංගීත කාමරයට යනවා. මේ කලබලයෙන් පස්සේ සංගීතය
තිබුණොත් හොඳයි කියලා මට හිතෙනවා"

තමාගේ සැනසීමට පියානෝව වාදනය කිරීමට ඇය සංගීත
කාමරය බලා පිටත් වුණා. තමා වාදනය කරන තනුව හැර ඈ
කිසි දෙයක් ඇගේ මතකයට නොනැගෙනු ඇත. එහෙත් සෙස
අයට කිසිවක් පහසුවෙන් අමතක කළ නොහැකි වුණා. ඩැරල්
කේන්ති ගැනීම දැකීම හොඳ දෙයක් නොවුණ ද, ගොන්ඩොලින්
ඉන් යස පාඩමක් ඉගෙන 'ගත් බව සැවොම සිතුවා.



# 09

තටාකයේ සිද්ධියෙන් හොඳ හොඳ දේවල් සිද්ධ වුණා. පළමුව, තම ස්වාමියා හමුවූ සුනඛයෙකු නැවත හැර නොයන ආකාරයට මේරි ලෝව් ඩැරල් යන යන තැන පස්සෙන් වැටුණා. ඩැරල්ගේ අතට පයට හැම දෙයක්ම කරදීමට ඇය සූදානමින් සිටියා. ඇය ඇගේ ඩෙස්කය අස්පස් කළා. ඇය ඇගේ කණ්ණාඩි මේසයේ ලාච්චුව පවා පිළිවෙළට සැකසුවා පමණක් නොව සෑම දිනම ඇඳ ද සකසා දීමට ඉදිරිපත් වුණා.

එහෙත් ඩැරල් එවැනි දේකට කැමති වුණේ නැහැ. "එපා" ඇය මේරි ලෝව්ට කිව්වා. "මගේ දේවල් මමයි කර ගන්නේ. ඇයි ඔයා මගේ ඇඳ හදන්නේ ? ඔයා දන්නවා අපි හැමෝම අපේ දේවල් කර ගන්න ඕනෑ කියලා. මේරි ලෝව් මෝඩ වැඩ කරන්න එපා"

"නැහැ" ඇගේ විශාල ඇස් දෙක තවත් ලොකු කර බලමින් මේරි ලෝව් කිව්වා. "මම හදන්නේ ටිකක් ඔයාට කළගුණ සලකන්න, ඩැරල්.... ඒ....ඒ මාව ගිලෙන එකෙන් බේරා ගත්තට"

"මෝඩ වෙන්න එපා." ඩැරල් කිව්වා. "ඔයා ගිලෙන්න ගියේ නැහැ. ඇත්තටම මම දන්නවා. ඒක කොහොම වුණත්, මම ගොන්ඩොලින්ට හොඳ පාරවල් ටිකක් දුන්නා. එච්චරයි"

ඩැරල් කී දෙයින් සුළු හෝ බලපෑමක් ඇති වුණේ නැහැ. මේරි ලෝව් ඇයට සෙනෙහස දැක්වීමේ අඩුවක් වුණේ නැහැ. නිතර යමක් කර දීමට කුරුමානම් අල්ලමින් සිටියා. තම ඩෙස්කයට දමා ඇති චොක්ලට් ඩැරල්ට හමුවුණා. ඇගේ කණ්ණාඩි මේසය උඩ මල් ඇමූ කුඩා බඳුනක් ඇයට හමුවුණා. එහෙත් ඉන් ඇය සිත රිදී කිපුණා. ඇයට යහපතක් වන මිත්‍රත්වයක් මේරි ලෝව්ගේ සිත තුළින් පැන නගින බවක් ඇය දුටුවේ නැහැ. මේරි ලෝව් ඉතා දුර්වල කෙනෙක්. ඇයට ශක්තිමත් කෙනෙකු අවශ්‍ය වූ නිසා ඩැරල් ඇයට හමු වූ කදිම කෙනා වුණා.

මේරි ලෝව්ගේ අවධානය ගැන අනෙක් ඇරියෝ ඇ... විහිළු කළා.

"බලු පැටික්කි අදත් ඔයාට වලිගය වැනුවා ද ?" ඇලිස... ඇසුවා.

"මටත් ලාස්...ස...න මල් මේසය උඩින් තියලා දෙ... කෙනෙක් ඉන්නවා නම් !" අයිරින් කිව්වා.

"ඒ වගේ මෝඩ විකාරවලට ඩැරල් කැමති නැටි" මේරි ලෙ... බොළඳ ලෙස ඩැරල්ට සෙනෙහස පානු ඊර්ෂ්‍යාවෙන් බලා ... ගොන්ඩොලින් කිව්වා.

"එයා කැමති නැහැ" කැතරින් කිව්වා. "ඒක ඔයාට ජේන...

නංාක සිද්ධියේ ඊළඟ ප්‍රතිඵලය වූයේ දිගු වේලාවක් දිය ... හිනිම නිසා ඇලිසියා බිහිරි වීමයි. එය දිගු කලක් පවතින බි... බවක් නොවන බව ඇලිසියා දැන සිටියා. හදිසියේම ඇගේ දෙ... තුළ අගුල් වැටුණු බවක් දැනුණ අතර පෙර දී මෙන් ඇයට හොඳ... ඇසුණේ නැහැ. එහෙත් මේ අතරම එය ඉතා හිත රිදවන ... කාරණයක් වූවේ වරක් බොරුවට බිහිරි වූ බව ඇඟවූ නි... ඇත්තෙන්ම බිහිරි බවට පත්වූ විට මම්සලී කුමක් කියනු ඇති... සිතීමයි.

පන්තිය පිටුපස අවසාන පේළියේ වාඩි වීමට සිදුවී... ඇලිසියාගේ අවාසනාව වුණා. පිටුපස පෙළෙහි වුවද, සාමාන... ඇසීමක් ඇති අයට එය ප්‍රමාණවත් වුවද කන් "හිරවී" ඇ... ඇලිසියාට ගුරුවරියන් කියන දේට ඇහුම්කන් දීම අතිශය දුෂ්ක... වුණා.

කාරණය තවත් දරුණු වූවේ එදින උදයේ ප්‍රංශ පන්තිය... පැමිණියේ මම්සලී ඩූපොන්ට් නොව මම්සලී රොජර් වීම නිසා... කෙසඟ උස් මම්සලී රොජර් කවටකමට කලාතුරකින් ලැදි වූව... තදින් පියාගත් සිහින් දෙතොලින් යුතුව පන්තියට පැමිණුණ... සිහින් තොල් ඇති අය ඉක්මන් කේන්තිකාරියන් බව ඇලිසියා... සිහිවුණා.

මම්සලී රොජර්ට තිබුණේ සිහින් මෘදු කටහඬක් වුවද කෝ...



වූ විට එය මහත් හඬ දුන්නා. කිකිළියකගේ කෙකරගෑමක් බඳු වුවද කනෙහි යවුල් අනින එම හඬ ඇරියෝ ඇඩි ලෙස පිළිකුල් කළා.

මෙදින ඇය ඇරියන් සමග ප්‍රංශ නාට්‍යයක පුහුණුවීම ආරම්භ කිරීමට සූදානම්ව සිටියා. එක් එක් චරිත ගෙන සෑම වාරයකටම නාට්‍යයක් කිරීමට සිදුව තිබුණා. සමහර විටක ඔවුන් එය පාසල් විවිධ ප්‍රසංගයේ දී රඟදැක්වූව ද බොහෝ විට රඟදැක්වූවේ හුදෙක් පන්තියේ පමණයි. "අද ...." මම්සලී රොජර් කතා කළා. "අපි නාට්‍ය ගැන සාකච්ඡා කරලා චරිත බෙදා ගනිමු. අලුත් ළමයි කීප දෙනෙක් ප්‍රංශවලට දක්ෂ ඇති නිසා ප්‍රධාන චරිතවලට එන්න පුළුවන්. ඒක හොඳයි වගේ ! පරණ අය ඒ ගැන මොකවත් හිතන එකක් නැහැ!"

ඔවුන් එය තැකුවේ නැහැ. ඉගෙනීම අඩු වූ තරමට එය හොඳයි. අලුත් ඇරියෝ අපහසුවට පත් වූ කලක මෙන් සිනාසුණා. මම්සලී රොජර්ගේ විහිළු එතරම් ප්‍රාණවත් නැති බව ඔවුන්ට සිතුණා.

"දැන්..... පළමුවෙන්ම අපි බලමු පසුගිය වාරයේ නාට්‍යයේ ප්‍රධාන චරිත කළේ කවුද කියලා" මම්සලී කිව්වා. "ඔයා, ඇලිසියා, මොන චරිතය ද ඔයා කළේ ?"

ඇලිසියාට ඇසුණේ නැති නිසා ඇය පිළිතුරු දුන්නේ නැහැ. බෙටී ඇයට වැලමිටෙන් ඇන්නා. "ගිය වාරයේ නාට්‍යයේ ඔයා මොන කොටස ද කළේ ?" ඇය හඬනගා ඇසුවා.

"ඕ ! අනේ මම්සලී, ඔයා කියපු දේ මට හරියට ඇහුණේ නැහැ" ඇලිසියා කිව්වා. "මම කළේ එඬේරාගේ කොටස"

"මම හිතන්නේ ඒ ඊට ඉස්සර වාරයේ" මම්සලී කිව්වා. ඇලිසියාට නැවත මම්සලී කී දෙය ඇසුණේ නැහැ. බෙටී එය හඬනගා කිව්වා. "මම්සලී කිව්වේ ඔයා.... ඒක..... ගිය වාරයේ.... ඉස්සර.... කළා කියලා"

මම්සලී විමතියට පත්වුණා. ඇය කියන හැම දේම බෙටී එලෙස නැවත කියන්නේ ඇයි ? එකෙනෙහිම මම්සලී ඩූපොන්ට් ඇයට ඇලිසියා ගැන කියා තිබූ යමක් සිහිවුණා.... ඕ, ඔව්, නරක දඟ කෙල්ල ! ඇය බිහිරි බව අඟවලා තිබුණා කිව්වා නේද.... මම්සලී රොජර්ට ඇය ඒ කපටිකම කරන්නයි යන්නේ.

"ඔ, නැහැ, නැහැ !" මම්සලී රොජර් තරහින් තමාටම කියා ගත්තා. "මේක ඉවසන්න බැහැ ! මාත් එක්ක ඒවා බැහැ !"

"ඇලිසියා" තම හිස පිටුපස කුඩා කොණ්ඩ ගැටයට තට්ටු කරමින් ඇය කතා කළා. "ඔයා විකාර ළමයෙක්.... ඔයා කරන්නේ විකාර වැඩ. මමත් විහිළුවලට කැමති නිසා විහිළු වැඩ කරනවා. පැහැදිලි අකුරින් ප්‍රංශවලින් ලියන්න 'මම්සලී රොජර්ගේ පන්තියේ දී බිහිරි වෙන්නෙ නැහැ' කියලා පනස් වතාවක්"

"මොකක් ද කිව්වේ, මම්සලී ?" තම තම ප්‍රථමව කියනු ඇසුණු මුත් අන් කිසිවක් පැහැදිලිව ඇසුණේ නැති නිසා ඇලිසියා ඇහුවා. "මට හරියට ඇසුණෙ නැහැ"

"ඔ, ඇහෙන්නේ නැහැ !" නිතර හදිසියේ කෝපවන සුපුරුදු රළු කටහඬින් මම්සලී කෑගැසුවා. "ඇලිසියා, දැන් අහගන්නවා, හොඳට ! තමුසෙ ලියන්න ඕනෑ 'මම මම්සලී රොජර්ගේ පන්තියේ දී බිහිරි වෙන්නේ නැහැ' කියලා සිය වතාවක් !"

"ඒත් දැන් කිව්වේ පනස් වතාවක් කියලනේ" බෙටී නොරුස්සනා හඬින් කිව්වා.

"තමුසෙත්, ඔව්, තමුසෙත් ලියන්න ඕනෑ 'මම බාධා කරන්නේ නැහැ' කියලා සිය වතාවක්" මම්සලී කෑගැසුවා. පන්තිය නිහඬ වුණා. මම්සලී රොජර්ගේ කේන්තිය ඇවිස්සුණ මෙවැනි අවස්ථා ගැන ඔවුන් දැන සිටියා. ඈ කාට හෝ වාක්‍ය පේළි සියය පැටවිය හැක. පාසලේ සිටි වඩාත් සිත් රිදවන ගුරුවරිය ඇයයි.

මම්සලී කළුලෑල්ලේ යමක් ලිවීමට හැරෙත්ම බෙටී ඇලිසියාට යමක් කෙඳිරුවා. එහෙත් අසරණ ඇලිසියාට කිසිවක් නෑසෙන බව පෙනුණා. එහෙයින් ඇය කොළ කැබැල්ලක යමක් කුරුටු ගෑවා.

"ඔයාට පේළි සීයක් ලියන්න වෙනවා. දෙවියන්ගේ නාමෙට ආයෙත් කිසි දෙයක් ඇහෙන්නේ නැහැ කියන්න එපා. පේළි දාහක් ලැබෙයි. එයාට යකා ගිහින් ඉන්නේ"

ඇලිසියා හිස සැළුවා. මම්සලී යමක් කී කල ඇයට කිසිවක් නෑසුණ ද "හොඳයි මම්සලී" කීමට ඇයට සිදුව තිබුණා. එහෙයින් ඇයට සමාව ලැබෙනු ඇතැයි ඇය සිතුවා.

ඊළඟ පාඩම සඳහා පොට්ස් ගුරුතුමිය පැමිනුණා. නැවතුණ මම්සලී දිලිසුණ දෑසින් යුතුව ඇයට කතා කළා. "අපොයි මිස් පොට්ස්, ඔයාගෙ ළමයෙක්, ඇලිසියා, ආයෙත් වතාවක් බිහිරි වෙලා. හරි දුකයි නේද ? ඒ වගේ නිරෝගී ළමයෙක්"

මෙසේ කියමින් මම්සලී රොජර් ඉවතට ගියා. පොට්ස් ගුරුතුමිය නුරුස්නා බැල්මෙන් ඇලිසියා දෙස බැලුවා.

"මම හිතුවේ නැහැ ඔයා ඒ මෝඩ වැඩේම ආයෙත් කරන්න හදයි කියලා ඇලිසියා." ඇය කිව්වා. අසරණ ඇලිසියා ! පොට්ස් ගුරුතුමිය කී දෙය ඇයට ඇසුණෙ නැති නිසා ඇය විමසිල්ලෙන් ඈ දෙස බැලුවා.

"ඔය ඩෙස්කය අතහැරලා ඔයා ඉස්සරහා පෙළේ එකට එන්න" පොට්ස් ගුරුතුමිය කිව්වා. "ජීන් ඇලිසියා එක්ක තැන් දෙක මාරුකර ගන්න. ඩෙස්වල තියෙන දේවල් පස්සෙ මාරුකර ගන්න."

පොට්ස් ගුරුතුමියගේ ඇසට නිතර ලක්වන පළමු පෙළේ ස්ථානයක් අතහැර කවුරුත් ආශා කරන පසු පෙළ ආසනයකට යාමට ලැබීම ගැන මහත් සතුටට පත් ජීන් නැඟිට ගත්තා. එකිනෙකාට කොඳුරා ගැනීම, දඟවැඩ කිරීම හා කුඩා ලිපි කැබලි හුවමාරු කර ගැනීම වැනි දේ පසු පෙළේදී ඉතා පහසු වුණා. කිසිවක් නෑසුණ නිසා ඇලිසියා හෙලවුණේ හෝ නැහැ. හදිසියේ ඇගේ දෙසවන් තුළ ඝෝෂාකාරී හඬවල් නැගෙන්නට වුණා.

"නැඟිටිනවා, මෝඩියේ !" බෙටී තියුණු කෙඳිරියකින් කිව්වා. "යනවා.... යනවා ජීන් ඉන්න තැනට"

ඇලිසියාට සිදුවන දේ අවබෝධ වුණා. ඇය මහත් කනස්සල්ලට පත් වුණා. අපොයි ! එතරම් ආශා කරන පසුපෙළ ආසනය අතහැර යන්න, බෙටී ළඟම තියෙන ආසනය අතහැර යන්න..... සැම ගුරුතුමියකගේම උකුසු ඇසට හසුවන ඉදිරි පෙළට යන්න. ඉදිරි පෙළෙහි කිසිදු විනෝදයක් නැති බව කවුරුත් දැන සිටියා.

"අනේ, මිස් පොට්ස්" ඇය දොම්නසින් කතා කළා. "අවා... මගේ කන් ඇහෙන්නේ නැහැ. ඒ වතුර යට පිහිනපු නිසයි"

"ඔයා මීට ඉස්සර දවසකත් කන් ඇහෙන්නේ නැහැ කියලා බොරු කළා" අනුකම්පාවකින් තොරව ගුරුතුමිය කිව්වා.

"ඒත් මේ සැරේ නම් ඇහෙන්නෙම නැහැ." තම කන් ... එතරම් සෝෂාවක් නොතිබෙන්නේ නම් යැයි සිතමින් ඇලිසි... කිව්වා. "අනේ, මිස් පොට්ස් මම මෙතැනම ඉන්නම්"

"දැන්, ඇලිසියා" බිහිරි වුවත් නැතත් නිසැකවම ඇහෙ... පරිදි පැහැදිලි ස්වරයකින් උස් හඬින් පොට්ස් ගුරුතුමිය ක... කළා. "මම කියන දේ අහලා එකඟ ද නැද්ද කියන්න. ක... ඇහෙන්නේ නැහැ කියලා කපටිකම් කරන්නත් මා ළඟම හි... ගන්න එක හොඳයි. ඒ වගේම ඇත්තටම කන් ඇහෙන්නේ නැ... නම් පස්සේ පෙළේ ඉද්දි ඇහෙන්නේ නැති නිසා ඔයාව මෙතැනි... තියා ගන්න එක තමයි නුවණක්කාරම වැඩේ. මොකද ඒ ගැ... හිතන්නේ ?"

සැබැවින්ම ඇලිසියාට එකඟවෙනවා හැර වෙන යමක් කරන්න පුළුවන් වුණේ නැහැ. ඇය තරමක් මුහුණ අඳුරු කරගෙ... ජීන්ගේ ආසනයේ වාඩි වුණා. සැබැවින්ම ඇයට එතනදී තරම්... හොඳින් ඇසුණා. ඉන්පසුව සිදුවුණේ තවත් විහිළුවක්. එක්වර... ඇගේ කනේ අගුල් ඇරුණා. ඇය හිස සෙලෙව්වා. අපොයි, අපො... දැන් ඇගේ කන් දෙක හොඳටම සනීපයි. දැන් ඇයට සුපුරු... පරිදි ඇසෙනවා.

ඇඩි සතුටට පත් ඇය තමා අසලම සිටි මේරි ලෝවි... කනට කෙඳිරුවා. "කන් අගුල් ඇරුණා. මට දැන් ඇහෙනවා"

පොට්ස් ගුරුතුමියට තිබුණේ තියුණු ඇහුම්කන්දීමේ හැකියාවක්. කෙඳිරුම ඇසුණ ඇය කළු ලෑල්ල වෙතින් හැරුණ... "ඒ කියපු දේ කරුණාකරලා ආයෙත් කියනවා ඇලිසියා ?" ඇ... කිව්වා.

"මම කිව්වේ මගේ කන් දැන් ඇහෙනවා කියලා" ඇලිසියා කිව්වා.

"බොහෝම හොඳයි" පොට්ස් ගුරුතුමිය කිව්වා. "මම හිතුවා ඔයා ඉස්සරහා පේළියට ආපු ගමන් කන් ඇහෙන්න පටන් ගනියි කියලා"

"ඒත් මිස් පොට්ස්, මම....." ඇලිසියා පටන් ගත්තා.

"ඒ ඇති" පොට්ස් ගුරුතුමිය කිව්වා. "බිහිරි හරි, නැතිව හරි ඔයාගේ කන් ගැන කතා කරලා කාලය නාස්ති නොකර අපි පාඩම පටන් ගනිමු"

තම තමන්ගේ ඩෙස්කවල තිබූ දේවල් විවේකයේ දී මාරු කර ගැනීම සිදුවූ හෙයින් ඇලිසියා තදින් කෝප වී සිටියා. ඇය පළමු පෙළේ සිටීම ඇඩි සේ අප්‍රිය කළා. ආසන මාරුව ගැන ජීන් සිටියේ ඇඩි සොම්නසින් !

"පස්සට යන්න මම මොන තරම් ආශාවෙන් ද හිටියේ" ජීන් කිව්වා. "දැන් ඒක හරි"

"ඒක අසාධාරණයි" ඇලිසියා මැසිවිලි නැගුවා. "ඇත්තටම මට උදේ කන් ඇහුණෙ නැහැ. ඊට පස්සේ එක පාරටම හරි ගියා. මිස් පොට්ස් මාව විශ්වාස කරන්න වටිනවා"

ඩැරල් නිතර කාගෙත් පිහිටට සිටිය ද ඇයට සිනා නොවී බැරිවුණා. කවටකම් ඉසිලිය නොහැකි තත්ත්වයක සිටි ඇලිසියා රවා බැලුවා.

"ඕ..... ඇලිසියා. හිනාවෙන්න හොඳ නැහැ කියලා මම දන්නවා" ඩැරල් කිව්වා. "ඒත් අවංකවම ඒක හරිම විහිළුවක් ! මුලදි මම්සලීව රවට්ටන්න ඔයා බොරුවට බිහිරි වුණා. ඊට පස්සේ ඔයා ඇත්තටම බිහිරි වුණත් කවුරුවත් විශ්වාස කළේ නැහැ. ඒක අර උපමා කතාවේ කොටියා කෑවෝ කියලා කෑගහපු එඬේර කොල්ලාගේ කතාව වගේ."

"මම හිතුවා ඔයා මගේ යාළුවෙක් කියලා" ඇලිසියා තදින් කිව්වා. "මට බණ කියන්න එනවට මම කැමති නැහැ"

"ඕ..... මම බණ කියනවා නෙමෙයි අනේ" ඩැරල් කිව්වා. "අහන්න ඇලිසියා, මම ඔයාට ලියන්න තියෙන එකෙන් භාගයක්

ලියලා දෙන්නම්. ඔයාට ජේලි සීයක් ලියන්න කල්පයක් ...
මම දන්නවා ඔයා ලියන වැඩවලට කැමති නැහැ කියලා"

"හරි.... ඔයාට ස්තුතියි" සිත සතුටු කරගත් ඇලිසියා ...

එලෙස මම්සලී රොජර්ට එදින සැන්දෑවේ ජේලි සී... ලියැවුණු පත්‍රිකා ලැබුණා. ඉන් භාගයක් තරමක් තරකටත්, ... ඉතා කදිමටත් ලියැවී තිබුණා. "එකම ළමයා එක වැ... ලස්සනටයි, අනිත් පැත්තේ කැතටයි ලියන එක හරි අමුතු වැඩ..." මම්සලී පුදුමයෙන් කිව්වා. එහෙත් ඇලිසියාගේ වාසනාවට මම්ස... පුදුම වුවා මිස ඉන් එහාට ඇලිසියා පසුපස පැත්තුවේ නැහැ.



# 10

එය තද පැවිලි සහිත දවසක් වුණා. ඇරියන් බොහෝ වේලාවක් පිහිනුම් තටාකයේ ගත කළා. වඩදිය අඩු වී රැල්ල ගසා තටාකය නොපිරුණ විට ඔවුන් කන්කෙඳිරි ගෑවා. එහෙත් වඩදිය ඇති විට පිරෙන ජලයෙන් පාසලේ සියලු දෙනාටම නෑමට තරම් තටාකය විශාල වීම වාසනාවක් වුණා.

පළමුව ටෙනිස් ක්‍රීඩා වටයකින් අනතුරුව තටාකයට පැන ස්නානය කිරීමට ඩැරල් ඇලුම් කළා. එවිට ජලයේ කොතරම් සිසිලසක් දැනෙන්නේ ද ! ගොන්ඩොලින් හෝ මේරි ලෝව් බියෙන් ඇකිළෙන්නේ මන්දැයි ඇයට වටහා ගැනීමට නොහැකි වුණා. එහෙත් දවස උණුසුම් වන තරමට ජලය සීතල බව පවසන ඔවුන් දියට බැසීමට තදින් අකමැති වුණා.

"ඒක තමයි වතුරවල තියෙන අමුතුම විනෝදේ" ඩැරල් කිව්වා. "මෙ වගේ ගිනි ගහන දවසක සීතල දැනෙනවා නම් කොයි තරම් හොඳද ? අඟලෙන් අඟල යන්නෙ නැතිව එක පාරට පනින්න හිත හදාගන්න පුළුවන් නම් ඔයාලටත් ආස හිතෙයි. ඔයාල නම් හරිම බයගුල්ලියෝ, ඔය දෙන්නම"

මේරි ලෝව්වත්, ගොන්ඩොලින්වත් තමන්ට බයගුල්ලියන් සේ අමතනවාට කැමති වුණේ නැහැ. ගොන්ඩොලින් හා සමව තබා ඩැරල් තමාට සැලකීම ගැන මේරි ලෝව් මනාප වූවේ නැතුවා පමණක් නොව තමාගේ බියසුලුකම ගැන අවමන් කිරීම ගැන ද ඇය කැමති වුණේ නැහැ. ඇය ඩැරල්ව සතුටු කිරීමට ඇ පසුපසම දිවගිය අතර ඩැරල්ගේ කබඩය අස්පස් කර පිළිවෙළට තැබීම ද ඇය අතින් ඉටු වූ මුත් ඩැරල් තවත් කිපුණා. ඒ ඩැරල් පිළිවෙළට තබන දේ මේරි ලෝව් නැවත වෙනස් කිරීම නිසයි.

"කෝ මගේ කෑම පෙට්ටිය. මට මතකයි ඒක මේකට ඉස්සරහින් තිබ්බෙ. ඉතින් දැන් මගෙ ලියන කඩදාසි පොතත් නැහැ. අයියෝ, මට ලොකු හදිසියක් !"

මෙසේ කබඩ් ලාච්චුවේ ලට්ට ලොට්ට සියල්ල බඩු හැළෙනවා! මේරි ලෝව් හැඬුම්බරව බලා ඉන්නවා.

"අනේ.... මම ඒවා ලස්සනට අස් කළා" ඇය කියනවා.

"හරි.... ඒත් එපා !" ඩැරල් නියෝග කරනවා. "ඇයි ඔයා ගිහින් වෙන කෙනෙකුගේ දේවල් එක්ක ඔට්ටු වෙන්න බැරි ඔයා කෙළින්ම එන්නේ මගේ දේවල්වලට. බඩු අස් කරනවා කියලා එක එක තැන දාන්න ඔයාට පිස්සුවක් තියෙනවා. ගිහින් ඇලිසියාගේ බඩු අස් කරලා දෙන්න. ඒව මගෙ ඒවට වඩා අවුල් මගෙ ඒවා මෙහෙම තිබුණාවේ !"

"මම එහෙම කරන්නේ ඔයාගෙ උදව්වට" මේරි ලෝව් මුමුනනවා. සමහර විටක ඩැරල් ඇලිසියාගේ දේවල් පිළිවෙළකට තැබීමට කැමති විය හැක. ඩැරල් ඇලිසියාට මහත් සේ ඇලුම් කරන බව ඇය දැන සිටියා. එසේ නම් ඇලිසියාට ද උදව් කරනවා.

එහෙත් ඇලිසියා ඩැරල් තරම් හෝ එය ඉවසුවේ නැහැ. "ඔයා වගේ චූටි ආයම්මා කෙනෙක් අපි පස්සේ කැරකෙන එකට අපි කැමති නැහැ කියලා ඔයාට තේරෙන්නේ නැද්ද ? බලනවා අර පින්තූරය දිහා ! තමුසෙගෙ අවුල් කිරීමෙන් ඒක කැලිවලට කැඩිලා"

මේරි ලෝව් වැලපුණා. යමෙක් ඇයට දොස් කියන විට ඇය නිතරම බිය වුණා. කාමරයෙන් පිටවත්ම ඇය කොරිඩෝවේ සිටි ගොන්ඩොලින්ගේ ඇඟේ හැපුණා.

"හලෝ ! ආයෙත් අඬනවා ද ? මේ සැරේ මොකක් ද ?" අනිත් අයගේ ගැටුම් ගැන නිතර උනන්දුවක් දැක්වූ ගොන්ඩොලින් ඇසුවා. එහෙත් ඇය කිසි දිනක දයාවක් දැක්වූයේ නැහැ.

"මොකවත් නැහැ ! මම උදව් කරන්න යද්දි නිතරම ඩැරල් ඇලිසියා දෙන්නම සැර වෙනවා" තමා ගැන ඉතා දුක හිතුණු අසරණ මේරි ලෝව් වැලපුණා.

"ඕ.... ! ඩැරල්, ඇලිසියා වගේ අයගෙන් ඔයා මොනවා ද බලාපොරොත්තු වෙන්නේ. ඔව්, බෙටීත් ඒ වගේමයි" තම සතුරන් ගැන නපුරු වචන ඇසීමට මනාපව ඉතා සතුටින් ගොන්ඩොලින් ඇසුවා. "නිතරම තමන් ගැන ලොකුවට හිතාගෙන අනිත් අයට බණින්න ලෑස්තිවෙලා ඉන්නේ. මට හිතා ගන්න බැහැ ඇයි ඔයාට ඒ අය එක්ක යාළුවෙන්න ඕනෑ කියන එක"

"මා අතින් දැන් ඇලිසියාගේ අම්මගෙ පින්තූරය බිඳුණා" දෙනෙත් පිස ගනිමින් මේරි ලෝව් කිව්වා. "ඒකයි සිද්ධ වුණේ"

"හොඳයි එයා ඔයාට සමාව දෙන එකක් නැහැ" ගොන්ඩොලින් කිව්වා. "දැන් ඔයාට ගැලවීමක් නැහැ. එයා අම්මට හරිම ආදරෙයි. ඒ පින්තූරය කාටවත් අල්ලන්නවත් දෙන්නේ නැහැ. ඔයා කරලා තියෙන දේ, මේරි ලෝව් !"

කතා කරන අතරම ඉතා අපූරු සිතුවිල්ලක් ගොන්ඩොලින්ට පහළ වුණා. නැවතුණ ඇය දිලිසෙන දෙනෙතින් යුතුව මොහොතක් කල්පනා කළා. එක මොහොතකින් ඇයට දකින්න පුළුවන් වුණා ඩැරල්ගෙන් හා ඇලිසියාගෙන් පළිගන්න පුළුවන් කොහොම ද කියලා. "ඔව්, මෝඩ මේරි ලෝව්ටත් අපල කාලයක් උදා කරන්න පුළුවන්." මේරි ලෝව් කුතුහලයෙන් ඇය දෙස බැලුවා.

"මොකද ගොන්ඩොලින් ?" ඇය ඇසුවා.

"මොකුත් නැහැ.... පොඩි අදහසක්" ගොන්ඩොලින් කිව්වා. මේරි ලෝව්ගේ පුදුමයට මෙන් ගොන්ඩොලින් ඇගේ අත තම අත හා පටලවා ගත්තා.

"ඔයා මා එක්ක යාළු වෙන්න" ඇය මිහිරි හඬකින් කිව්වා. "මං ඔයාට ඩැරල් වගේවත්, ඇලිසියා වගේවත් සලකන්නේ නැහැ. මට ඇලිසියාට වගේ හැකර කටක්වත්, ඩැරල්ට වගේ අපහාස කරන ඇස් දෙකක්වත් නැහැ. ඉතින් මා එක්ක යාළු වෙන්නකෝ. මම ඔයාට විහිළු කරන්නේ නැහැ. තේරුණා ද ?"

මේරි ලෝව් සැකයෙන් ගොන්ඩොලින් දෙස බැලුවා. ඇය ගොන්ඩොලින්ට කිසිසේත් ඇලුම් කළේ නැති නමුත් ගොන්ඩොලින් මිහිරි ලෙස සිනාසෙද්දී ඇයට කෘතගුණ පූර්වක බවක් දැනුණා. එමෙන්ම ඇය උදව් කිරීමට සැරසෙද්දී ඩැරල් හා ඇලිසියා ඇයට සලකා තිබුණේ ඉතා නපුරු ආකාරයකට. එවිට ගොන්ඩොලින් තමාව වතුරේ ඔබාගෙන සිටි අයුරු ඇයට මතක් වුණා.

ඇය ගොන්ඩොලින්ගේ අතින් තම අත ඉවතට ගත්
"නැහැ" ඇය කිව්වා. "මට ඔයා එක්ක යාළු වෙන්න බැ
ගොන්ඩොලින්. එදා තටාකයේ දී ඔයා මට හුඟාක් තුවාල ද
එදා ඉඳලා මම හීනෙන් බය වෙනවා"

මෝඩ පොඩි කෙල්ල. මේරි ලෝව්, තමා සමග මිතුරු වී
ප්‍රතික්ෂේප කිරීම ගැන ගොන්ඩොලින් කෝප වුණා. එහෙත් ඇ
දිගටම සිනාමුසුව සිටියා. ඇය නැවතත් මේරි ලෝව්ගේ අත ගත්

"මම ඒක හිතල කළ දෙයක් නොවෙයි කියලා ඔයා දත්තව
ඇය කිව්වා. "ඒක විහිළුවක්. අනිත් අයවත් එහෙම වතුරේ ඔබනව
ඔයා දැකලා තියෙනවා. මම තදින් ඔබාගෙන හිටියා නම් ඒ
කනගාටුයි. මම දැනගෙන හිටියේ නැහැ ඔයා ඒ තරම් බය
කියලා"

යමකට සිත යොමු කළහොත් ගොන්ඩොලින්ට තිබුණේ
ගැන දැඩි අධිෂ්ඨානයක්. ගැලවී යන්නේ කෙසේදැයි මේරි ලෝව්
අදහසක් තිබුණේ නැහැ. එහෙයින්, සුපුරුදු ලෙස ඇය යටත්
වුණා.

"හොඳයි" පැකිළෙමින් ඇය කිව්වා. "හරි.... ඔයා මට
ඇත්තටම කරදරයක් කරන්න හිතුවේ නැත්නම්, ගොන්ඩොලින්
මම යාළු වෙන්නම්. ඒත් මම ඩැරල්ටයි, ඇලිසියාටයි විරුද්ධ
කතා කරන්නේ නැහැ"

ඇගේ අත මිරිකා තවත් මිහිරි සිනහවකින් සංග්‍රහ කළ
ගොන්ඩොලින් හදිසියේ පහළ වූ තම සැලසුම ගැන සැහසිල්ලේ
සිතීමට ඉවතට පා තබා ගියා.

"ඒක අපූරුයි" ඇය කල්පනා කළා. "මේරි ලෝව් නිතර
ඩැරල්ගේ පස්සෙ යන නිසා එයා මොන තරම් තරහින් ද ඉන්නේ
කියලා හැම කෙනෙක්ම දන්නවා. පින්තූරය බිඳපු නිසා ඇලිසියා
ඉන්නේ මොන තරම් තරහින් ද කියලා හැම කෙනෙක්ම දන්නවා.
මම මේරි ලෝව්ට මොනවා හරි කළොත් ඒ ඩැරල් හරි ඇලිසියා
හරි තරහට කරපු දේවල් කියලා හැම කෙනෙක්ම හිතයි ! අන්න
හොඳයි. ඒක එතරම් අමාරු වැඩක් නොවෙයි"



මැද මිදුලේ වාඩි වූ ඇය කල්පනා [illegible] ගත්තා.
ඇය අප්‍රිය කළ තිදෙනාගෙන් පළි ගැනීමට අදහස් කර ඇය
සැලසුමක් ගැන සිතුවා. ඇය මේරි ලෝව්ව දැඩි ලෙස භීතියකට
පත් කරනවා. එහෙත් ඒ ඩැරල් හෝ ඇලිසියා බව අනිත් අයට
ඒත්තු ගන්වනවා. එවිට ඔවුන්ට බැණුම් හා දඬුවම් ලැබෙනු ඇත.

"මම මේරි ලෝව්ට සමීපම යාළුවා වුණොත් ඒ දේවල්
කරන්නේ මම කියලා කවුරුත් සැක කරන්නේ නැහැ"
ගොන්ඩොලින් සතුටින් සිතුවා. "ඇත්තටම මම හරිම දක්ෂයි.
අපේ පන්තියෙ කිසිම කෙනෙකුට මට වගේ මෙහෙම දෙයක්
ගැන හිතා ගන්නවත් බැහැ"

ඇය නිවැරදි විය. ඔවුන්ට නොහැකි වුණා..... ඒ ඔවුන්
අනුවණ වූ නිසා නොවෙයි, ඔවුන් එතරම් පහත් වැඩ නොකරන
නිසයි. ගොන්ඩොලින්ට එය වැටහුණේ නැහැ. තමා කරන්නේ
පහත් වැඩක් බව ඇයට අවබෝධයක් තිබුණේ නැහැ. ඇය එයට
කිව්වේ 'හැම දෙනාටම හොඳ පාඩමක් !'

ඇය ඉතා ප්‍රවේශමෙන් ඇගේ සැලසුම දියත් කළා. ඇය
බලා සිටියා ඇලිසියාට හෝ ඩැරල්ට පන්තිය අස්පස් කර මල්
බඳුන්වලට ජලය පිරවීමේ කාර්යය එළඹෙන තුරු. එවිට ඩෙස්කයට
යමක් දැමීම හෝ ඉන් යමක් ගැනීමට ඔවුන්ට අවස්ථාව ඇති බව
සැම කෙනෙක්ම පිළිගන්නවා.

ඇය මේරි ලෝව්ගේ ඩෙස්කයට කළු කුරුමිණියෙක්
රිංගවනවා. නැතහොත් පණුවෙක් දෙන්නෙක්..... එසේත් නැතිනම්
අල්ලා ගැනීමට හැකි නම් මීයෙක්. එහෙත් නැහැ..... තමාම මීයන්ට
බියක් දක්වන නිසා මීයෙකු දැමීමේ අදහස ගොන්ඩොලින් ඉවත්
කර ගත්තා. ඇය කළු කුරුමිණියන්ව හා පණුවන්ව ද පිළිකුල් කළ
නමුත් ගිනිපෙට්ටියක් වැනි යමකට උන්ව ඔබා ගැනීමට ඇයට
හැකියාව තිබුණා.

ඇයට එය කළ හැකියි. එමෙන්ම මේරි ලෝව් ආශා කරන
පැන්සල් ඇගේ පෙට්ටියෙන් පිටතට ගෙන ඩැරල්ගේ කබඩයේ
සැඟවීමට ඇයට හැකියි. මෙවැනි දේවලින් අසරණ වන මේරි
ලෝව්ට කොතරම් අනුකම්පා කිරීමට තමාට හැකි ද ?

ගොන්ඩොලින් මිදුල වටා හාරා අවුස්සමින් කෑමින් සෙවී
ආරම්භ කළා. ගෙවතු වැඩට ආශා කළ මෙන්ම පාසල් වත්තෙ
බොහෝ වගාවන්ට උදව් වන ජීන්, ගොන්ඩොලින් කුඩා මුල්ලුවකින
පස් හාරනු දැක විමතියට පත්වුණා.

"ඔයා මොනවා ද කරන්නේ ?" ඇය ඇසුවා. "වළලපු මළ
කට්ටක් ගොඩ ගන්න හදනවා ද ?"

"මෝඩ කතා කියන්න එපා" ජීන් ඇගේ කාර්යය ඇසී
ගැන කෝප වූ ගොන්ඩොලින් කිව්වා. "මට ගෙවතු වැඩ කරන්න
හොඳ නැද්ද ? ඔයාට විතර ද පුළුවන් ?"

"හොඳයි, මොනව ද ඔයා හිටවන්න යන්නේ ?" තම
කුතුහලය ඇවිස්සෙන සෑම දෙයකම සියල්ල දැන ගැනීමට කැමති
ජීන් ඇසුවා.

"නිකම් හාරනවා" ගොන්ඩොලින් කිව්වා. "පස් බුරුල්
වෙන්න. හොඳටම වේළිලා"

මුවින් නොයෙක් හඬ පිට කිරීමට සමත් ජීන් විශේෂයෙන්
ගොන්ඩොලින්ට පාවිච්චි කරන අමුතු හඬ නැගුවා.

ඉන්පසුව ගොන්ඩොලින් පණුවන් සෙවීම නතර කළා
මකුළුවන් සෙවීමට ඇය තීරණය කළා. එහෙත් ලී මඩුවේ සි
විශාල මකුළුවෙකු දුටු ඇයට පණ කඩාගෙන දුවන්න හිතුණා
එසේ වුවද ඒ මේරි ලෝව්ගේ ඩෙස්කයට සරිලන පරිදිම විශාල
එකෙක් වුණා. ඌ කොතරම් අපූරු ලෙස පිටතට පැමිණෙනු
ඇති ද !

කෙසේ හෝ ගොන්ඩොලින් ඌ අල්ලා ගත්තා. ගැහෙමින්
වුවද ඇය ඌව මල් පෝච්චියකට මැදිකර ගත්තා. කුඩා කාඩ්බෝඩ්
පෙට්ටියකට ඌව දමා ගැනීමට ඇය සමත් වුණා. තම දක්ෂ
ගැන සතුටු වී අනතුරුව නියම වේලාවට ගැනීමට අදහස් කර
පෙට්ටිය තම කබඩයේ තැබීමේ අදහසින් යුතුව ඇය පො
කාමරයට ගියා.

එදා සැඳෑවේ ඇය කතාව මකුළුවන් වෙතට යොමු කළා
"අද මඩුවේ දී මකුළු දැලක් මගෙ ඔළුවෙ පැටලුණා" ඇය කිව්වා



"ඌහ්... මට හොඳටම බය හිතුණා. මට මකුළුවන්ව පේන්න බැහැ"

"අපේ අයියා, සෑම්, එක සැරයක් හීලෑ කරපු මකුළුවෙක්
ඇති කළා" ඕනෑම සිද්ධියක දී පවුලේ ඉතිහාසයෙන් යමක්
ගෙනහැර පාන ඇලිසියා කතාව පටන් ගත්තා. "ඌ හිටියෙ අපේ
මිදුලෙ මල් ගහක් යට. අම්මා මල්වලට වතුර අද්දි ඌ හැමදාම
වතුර බොන්න එනවා"

"ඌ....හ්....! මට නම් බලන්නවත් හිතෙන්නෙ නැහැ."
සිරුරේ වෙව්ලුමක් සමග මේරි ලෝව් කිව්වා. "මම මකුළුවන්ට
හුඟාක් බයයි"

"ඔයා මොට්ටියක්" බිඳුණු ඡායාරූපය ගැන තවමත් තරහින්
සිටි ඇලිසියා කිව්වා. "අරකට බයයි, මේකට බයයි..... මොනවට
ද ඔයා බය නැත්තෙ, මේරි ලෝව්. මට හිතෙනවා ලොකු
මකුළුවෙක් හොයලා ඔයාගෙ බෙල්ලෙන් පහළට දාන්න"

මේරි ලෝව් සුදුමැලි වුණා. ඇගේ හදවත බියෙන්
ගැහෙන්නට එම සිතුවිල්ල පමණක් ප්‍රමාණවත් වුණා. "එහෙම
කළොත් මම මැරෙයි" ඇය සෙමින් මිමිනුවා.

"බයගුල්ලි" ඇලිසියා කම්මැළිකමින් කිව්වා. "හොඳයි.
ඉන්නවකෝ මට ලොකු මකුළුවෙක් හම්බවෙනකම්"

ගොන්ඩොලින් කිසිවක් කිව්වේ නැහැ...... එහෙත් ඇය
කොතරම් සතුටු වුණා ද ! ඊටත් වඩා තව මොනවා ද හොඳ ! තමා
බලාපොරොත්තු වූ දේටත් වඩා බොහෝ දේ ඇලිසියා කියා තිබුණා.
පළමු පන්තියේ සෑම දැරියකටම එය පැහැදිලිව ඇසී තිබුණා. එය
ඉතා අපූරුයි.

"ඇලිසියයි, ඩැරලුයි සඳුදා පන්තියේ වැඩට යනතුරුම
ඉවසන්න ඕනෑ" ඇය කල්පනා කළා. "ඊට පස්සේ මම හොඳ
වැඩක් කරන්නම්. හැම කෙනාටම පාඩමක් උගන්වනවා"

ගොන්ඩොලින් එලෙස තම මොහොත එළඹෙන තුරු
කල්මැරුවා. ඩැරල්ගෙත්, ඇලිසියාගේ හා බෙටීගෙත් පුදුමයට
මෙන් ගොන්ඩොලින් මේරි ලෝව් සමග සෑම තැනකම ගියා.
මේරි ලෝව් කෙසේ නම් නපුරු ගොන්ඩොලින් සමග මිත්‍ර වුණි ද,

විශේෂයෙන් කෘෘර ලෙස දියේ ඔබාගෙන සිටීමෙන් පසු
පළමු පන්තියේ අයට සාමාන්‍ය දෙයක් ලෙස පෙනුණා.

ගොන්ඩොලින්ගේ අවස්ථාව පැමිණි අතර ඇය
ප්‍රයෝජන ගත්තා. පාසලේ සවස පන්තිවලින් පසුව ඇයට
කාමරයේ ඇති යමක් රැගෙන එන ලෙස නියෝගයක් ලැ
එය රැගෙන ඒමට දුව ගිය ඇය ආපසු පන්ති කාමරයට දිව
කාඩ්බෝඩ් පෙට්ටිය ද සමගයි. පෙට්ටිය විවර කළ ඇය වි
පාද ඇති මකුළුවා ඩෙස්කය තුළට මුදා හැරියා. අඳුරු මූල
දුව ගිය ඌ එහි ගුළි වුණා.

කිසිවෙකු තමාව නොදුටු බව පසක් කරගත් ගොන්ඩො
ආපසු දිව්වා. විනාඩි දෙකකට පසුව ඩැරල් හා ඇලිසියා
බඳුන්වලට ජලය පිරවීමට ආවා. මෙය ගොන්ඩොලින්
වාසනාවක් !



# 11

එදින සවස පළමු පාඩම වූයේ මනෝමයෙන් ගණන් සෑදීමයි. අයිරින් වැනි ක්ෂණිකව සිතිය හැකි අය හැර සියලු දැරියන් කෙඳිරි ගෑවා. එහෙයින් ඩෙස්ක විවෘත කිරීමට අවශ්‍යතාවයක් තිබුණේ නැහැ. ඒ එය වාචිකව කෙරෙන දෙයක් නිසයි.

එය දැඩි ලෙස උණුසුම් දිනයක් නිසා පොටිස් ගුරුතුමිය දැරියන්ට පක්ෂපාතී වුණා. මනෝමය ගණිතයට එතරම් දක්ෂ නොවූ ඩැරල් පොට්ස් ගුරුතුමිය වෙනදා මෙන් දැඩි නොවීම ගැන සතුටු වුණා.

ඊළඟ පාඩම නියමිතව තිබුණේ මම්සලි ඩූපොන්ට්ටයි. එය මම්සලි විසින් ප්‍රංශ බසින් අසනු ලබන සරල ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු සංවාදාත්මක පාඩමක් වුණා. පොට්ස් ගුරුතුමිය පිටව ගිය පසුව උණුසුම් නිසා සුපුරුදු ප්‍රසන්න බවින් තොරව මම්සලි පැමිණුණා.

"ළමයි වාඩි වෙන්න" ඇය කියූ අතර එම කාලගුණයට අනුව පිහිනීමට පාඩමක් තිබුණා නම් යැයි සිතමින් දැරියෝ සතුටු සිතින් යුතුව වාඩි වුණා.

පාඩම සෙමින් හා තැන්තැන්වල නවතිමින් ඉදිරියට ඇදුණා. දැරියන්ගේ බසින් ප්‍රංශ සංවාදය කඩිනම් නොවූ අතර නිතර ඇතිවන නිහඬ විරාමයන් ගැන මම්සලිගේ හිත රිදුණා.

"අයියෝ" ඇය අවසානයේ දී කෑගැසුවා. "ඔයාලා වගේ මෝඩ ළමයි එක්ක හවස් වරුව ගත කරන එක තවත් අමාරුවක්! ඔය මෝඩ මොළවලට මොනව හරි ටිකක් ඇතුළු කරලා සංවාදයට හුරු කරන්න නම්, ගන්න ඔයාලගෙ ව්‍යාකරණ පොත්. මම පොඩි පැහැදිලි කිරීමකින් ටිකක් මතක් කරල දෙන්නම්"

ව්‍යාකරණ පොත් ගැනීමට ඇරියෝ ඩෙස්ක විවෘ...
මේරි ලෝව් ඩෙස්කය විවෘත කරන විට කුමක් සිදුවේදැයි...
ගැනීමට ගොන්ඩොලින් උනන්දුවෙන් බලා සිටියා. එහෙත් කි...
සිදු වූයේ නැහැ. මේරි ලෝව් මකුළුවා දැක්කේ හෝ ඌව ක...
කළේ හෝ නැහැ. ඇය ඩෙස්කය වැසුවා.

සියලු ඇරියෝ මම්සලී අණ කළ පිටුව පෙරළා ගත්තා...
ප්‍රංශ පොත වෙනුවට ඉංග්‍රීසි පොත ගෙන ඇති බව මේරි...
දුටුවේ එවිටයි. ඇය නිවැරදි පොත ගැනීමට නැවත ඩෙ...
විවෘත කළා.

"මොනව ද කරන්නේ, මේරි ලෝව් ?" නිතර ඩෙ...
ඇරීම වැසීම නුරුස්සන මම්සලී ඇසුවා. "මොනව ද හොයන්...

ඉංග්‍රීසි පොත ඩෙස්කයේ පසුපසට ඔබා ඇමූ මේරි...
ප්‍රංශ පොත ඉවතට ගත්තා. පොතේ හැපී පසෙකට වීසි වූ මකු...
බියෙන් පිටතට දුව ආවා. ඌ මේරි ලෝව්ගේ අත අසලටම පැ...
විටයි ඇය ඌව දුටුවේ. විශාල හඬක් නගමින් වැටෙන සේ...
පියන අත හැරිය ඇය ඇඟ හිරිවට්ටවන ලෙස යටිගිරියෙන්...
නැගුවා.

සෑම කෙනෙක්ම ත්‍රස්තව උඩ විසි වුණා. මේසය උඩ...
පොත් ගොන්නක් ද බිම පෙරළාගෙන මම්සලී නැගී සිටියා...
මේරි ලෝව් දෙස රවා බැලුවා.

"ඇයි, මොකක් ද මේ සද්දේ මේරි ලෝව්, පිස්සු හැදිලා...

මේරි ලෝව්ට කතා කළ නොහැකි වුණා. තමා වෙතට...
ආ විශාල මකුළුවාගේ දර්ශනය නිසා ඇය ත්‍රස්තව සිටියා...
පසුපසට තල්ලු කර පෙරළාගෙන නැගී සිටි ඇය පියන...
මකුළුවා ඈ වෙත පනිනු ඇතැයි ඇස් මහත් කර බලාගෙන සි...

"මේරි ලෝව්" මම්සලී ගෝරනාඩු කළා. "තමුසෙට මේ...
සිද්ධ වෙලා තියෙන්නේ කියලා කියනවා ? ඇයි මේ ?"

"ඕ.... මම්සලී..... අතන.....අතන ලොකු මකුළුවෙක් ඉන්...
යෝධ මකුළුවෙක්, මගෙ ඩෙස්කය ඇතුළෙ !" සුදුමැලි වී...
මේරි ලෝව් ගොත ගැසුවා.



"මකුළුවෙක් ?" මම්සලී ඇසුවා. "තමුසෙ මෙතන කලබල කරලා කෑගහලා අපිවත් බය කරනවා. මේරි ලෝව් තමා ගැන ලජ්ජා වෙන්න ඕනා. මට තමුසෙ ගැන හරිම තරහයි. වාඩි වෙනවා!"

"අනේ.... මට....මට නම් බැහැ" මේරි ලෝව් වෙව්ලමින් කිව්වා. "ඌ එළියට එයි මම්සලී. ලොකු එකෙක්"

මකුළුවෙකු සිටිනවා ද, නැද්ද යන්න ගැන විශ්වාස කිරීමට මම්සලීට අපහසු වුණා. පසුගිය සතියේ ඇලිසියාගේ කන් නැසීම වගේ දෙයක් ද ?

අයිරින් සිහින් සිනාවක් නැගුවා. රවා බැලීමකින් මම්සලී ඇව නිසල කළා. "අපි බලමු මකුළුවෙක් ඇත්තටම ඉන්නවා ද කියලා" ඇය ඇඩි ස්වරයෙන් කිව්වා. "මම තමුසෙට කියන්නේ මේරි ලෝව්, මේක දඟ වැඩක් නම්, මකුළුවෙක් නොහිටියොත්, තමුසෙව මිස් පොටිස් ළඟට යවනවා දඬුවම් විඳින්න. මම තමුසෙගෙන් නිදහස් වෙනවා"

ඇය ඩෙස්කය වෙතට ආවා. ඇය ලතාවකට එහි පියන විවෘත කළා. තදින් හුස්මක් ඇදගත් මේරි ලෝව් හැකිතාක් දුරට පසුපසට ගියා. ඇය බියපත් දෙනෙතින් යුතුව ඩෙස්කය ඇතුළට නෙත් දල්වාගෙන සිටියා.

මකුළුවෙක් පෙනෙන්න සිටියේ නැහැ. සැබැවින්ම ඌ සොයා ගත නොහැකි අඳුරුම මුල්ලක ගුළි වී සිටියා. මම්සලී විමසිලිමත් දෙනෙතින් ඇතුළත පරීක්ෂා කර බලා අසරණ මේරි වෙතට හැරුණා.

"නරක කෙල්ල" ඇඩි පොළොවේ හප්පමින් කිව්වා. "තමුසේ නිශ්ශබ්දව හොඳට ඉඳලා මාවත් රවට්ටනවා නේද ? අහිංසක මම්සලීව. මම ඒවට ඉඩ තියන්නේ නැහැ"

"මම්සලී, මාව විශ්වාස කරන්න" එලෙස දොස් ඇසීම දරාගත නොහැකිව දුකට පත් වූ මේරි ලෝව් ආයාචනා කළා. "ඌ එතැන ඉන්නවා. හුඟාක් ලොකු එකෙක්"

මම්සලී වියරුවෙන් ඩෙස්කයේ තිබූ පොත් ඇවිස්සුවා. "මකුළුවෙක් නැහැ. මොකෙක්වත් නැහැ." ඇය කිව්වා. "තවමත්

ඌ මේක ඇතුළෙ ඉන්නවා නම්. කියනවා ඌ කොහාට ද ගිහිල්ලා තියෙන්නේ කියලා"

වියරු ඇවිස්සීමෙන් මකුළුවා කලබල වුණා. හදිසියේ එළියට පැනගත් ඌ මම්සලීගේ අතට පැන බාහුව දිගේ දුවන්න වුණා.

තම දෙනෙත් ඇදහිය නොහැකි පරිද්දෙන් මම්සලී මහත් දෙනෙතින් විශාල මකුළුවා දෙස බැලුවා. මේරි ලෝව් කෑගැසුවා වඩා වැඩි හඬකින් ඇය බෙරිහන් දුන්නා. ඇය ද මකුළුවාට මහත් බියක් දැක් වූ අතර මෙහිදී එවැනි විශාල එකෙක් ඇගේ සිරුරේ දුවනවා.

අයිරින් සිනාවෙන් පිපිරුණා. එය පන්තියේ අනිත් අයට විනෝදයට එක්වීමේ සංඥාව වූ අතර සියලු දෙනාම මම්සලී වටකර ගත්තා. "ඕ.. ඌ කොහෙ ද ? යක්ෂයා. ළමයි ඔයාලා පේනව ද ?" මම්සලී වැලපුණා.

"ඌ මෙතන" කියමින් නපුරු ඇලිසියා මම්සලිගේ කොන්ද දිගේ ඇඟිල්ලක් ගෙන ගියා. ඒ මකුළුවා දුවනවා යැයි සිතූ ඇය යටිගිරියෙන් හඬ තැළුවා.

"ඌව ගන්න, ඇලිසියා. අනේ අහකට දාන්න !"

"මම හිතන්නේ ඌ කොලර් එකෙන් ගවුම ඇතුළට රිංගුවා මම්සලී" බෙටී කියද්දී මම්සලී ක්ලාන්ත වීමට ආසන්න වුණා මකුළුවා තම සිරුරේ රැඳී සිටින බව නිසැකවම දැනගත් ඇය ගැහෙන්න පටන් ගත්තා.

ඇලිසියා ඇගේ ගෙල පිටුපසට කිති කැව්වා. උඩ පැන්න ඇය කෑගැසුවා. "ඕ...ල....ලා ! ඕ....ල....ලා ! අනේ මම වගේ අවාසනාවන්ත ගැහැනියක් ! කොහේද මේ යක්ෂයා ? ළමයි ළමයි ඌ ගිහින් ද කියන්න"

දැන් පළමු පන්තියේ ඇත්තේ එකම ගාලගෝට්ටියක් දෙවැනි පන්ති කාමරයේ සිටි පොට්ස් ගුරුතුමිය විමතියටත් කෝපයටත් පත් වුණා. ඇගේ පන්තියේ අය මොනවා කරනවා විය හැකි ද ? මම්සලී පන්තියෙන් පිටතට ගොස් ඇති නිසා ඔවුන් උමතු වීද ?



"විනාඩියකට සිතියම් වැඩ කරන්න" පළමු පන්ති කාමරයෙන් එන ශබ්දය ඇසී විමතියෙන් එකිනෙකා දෙස බැලූම් හෙළන දෙවැනි පන්තියේ දැරියන්ට ඇය කිව්වා. පන්තියෙන් පිටවුණු ඇය කඩිනමින් පළමු පන්තියේ දොර වෙතට ගියා.

ඇය දොර විවෘත කළවිට කිසිම ගුරුවරියක් ඇයට දැකගත හැකි වුණේ නැහැ. ඇය සිතුවේ දැරියන් හුදෙකලා වී ඇති බවයි. ඉන් පසුව ඇය දැරියන් පිරිස මැද ඇති මම්සලීගේ හිස දැක ගත්තා. කුමක් සිදුවන්නේ ද ?

"ළමයි !" ඇය කතා කළ නමුත් ඇගේ හඬ කිසිවෙකුට ඇසුණේ නැහැ. "ළමයි !" හදිසියේම ඈ දුටු අයිරින් එකිනෙකාට වැලමිටෙන් ඇන්නා. "ඒයි ඔන්න පොට්ටි ඇවිදින්" ඇය සිහින් හඬින් කෙඳිරුවා.

ජල කඳක් මෙන් ඔවුන් මම්සලීගෙන් ඉවතට ඇදී ගියා. ඉතා සුළු මොහොතක දී සෑම කෙනෙක්ම තම ඩෙස්කය වෙත ගියා. සිදුවන්නේ කුමක්දැයි සිතමින් මම්සලී වෙවුලමින් තනිව සිටගෙන සිටියා. මේ යක්ෂ මකුළුවා කොහේ ගියා ද ?

"මම්සලී හැබෑටම !" දැරියන් ඉදිරියේ ගුරුතුමියන් එකිනෙකාගේ වැරදි පෙන්වාදීම නොකළ යුතු බවට වූ නීතිය ද අමතකව පොට්ස් ගුරුතුමිය කිව්වා. "ඔයා මේ පන්තියට එද්දි මේ පන්තියට සිද්ධ වෙන්නේ මොකක් ද කියලා මට නම් හිතා ගන්න බැහැ"

මම්සලී වේගයෙන් ඇසිපිය සලමින් පොට්ස් ගුරුතුමිය දෙස බැලුවා. "මකුළුවෙක් ඇවිදින්" ඇය තමාගේ සිරුරේ ඉහළ පහළ බලමින් පැහැදිලි කළා. "ඕ ! මිස් පොට්ස්, යක්ෂ මකුළුවෙක්. ඌ මගේ අත දිගේ නැගලා අතුරුදහන් වුණා. ඕහ් ! ඌ මගේ ඇඟ පුරාම යනවා වගේ දැනෙනවා"

"මකුළුවෙකුට බැහැ ඔයාට තුවාල කරන්න" අමනාපයෙන් හා අනුකම්පා විරහිතව පොට්ස් ගුරුතුමිය කිව්වා. "ඔයා ගිහින් ටිකක් හිත හදාගෙන එනවා ද මම මෙයාලා ගැන බලා ගන්නම්"

"ඕනැ නැහැ" මම්සලී කෝපයෙන් කිව්වා. "පන්තියේ අය

හොඳයි. ළමයි ආවේ මට උදව් කරන්න. මකුළුවව අරන් දැක් නුභාක් ලොකු එකෙක් ඒකා, මිස් පොට්ස් !"

තරමක විශාල ගෙම්බෙකුගේ ප්‍රමාණය දක්වමින් ඇත් දික් අතිශයෝක්තියෙන් කතා කරන මම්සලී දෙස ඇදහිය නොහැ අයුරින් පොට්ස් ගුරුතුමිය බලා සිටියා.

සෑම දෙයක්ම දැරියන්ට මහත් විනෝදයක් වුණා. මෙ ප්‍රංශ පාඩමක් ද ! ගොන්ඩොලින් පවා විනෝදයට පත්වුණ සැබැවින්ම එයට හේතුව ඇය බව කිසිවෙක් දැන සිටියේ නැහැ ව්‍යාජ ලජ්ජාශීලී බවකින් ඇකිළී ඇය තම අසුනේ වාඩි ගුරුතුමියන් දෙදෙනා දෙස සමීපව බලා සිටියා.

එවිට හදිසියේම යමෙක් තම පාදය දිගේ දුවනු ඇය දැනුණා. ඇය පහත බැලුවා. ඒ මකුළුවා ! බොහෝ වේලාවක ඉහත දී මම්සලී හැර ගිය ඌ රහසේ ඩෙස්කය යටට රිංගාගෙන තිබුණා. ඒ මේ අත දිවෙන පාදවලට චප්ප වේවියැයි ඌ බියව තිබුණා. දැන් සාමය ස්ථාපිත වී ඇති බව දැනුණ මකුළුවාට වඩා ආරක්ෂිත තැනක් සොයා ගැනීමට අවශ්‍යව තිබුණා. ඌ ගොන්ඩොලින්ගේ සපත්තුවට නැග මේස් දිගේ දණහිස් ඉහළට දිව්වා. ඇය දෙකන් බිහිරි කරවන බෙරිහන් දීමක් කළා. සෑම කෙනෙක්ම නැවත උඩ විසි වුණා. පොට්ස් ගුරුතුමිය දරුණු බැල්මක් හෙළුවා.

"ගොන්ඩොලින්, පන්තියෙන් එළියට යනවා ! පෙනෙයි ද බය නැතිව කෑගහන හැටි. එපා, මකුළුවා දැක්කා කියලා කියන්න නම් එපා. මට මකුළුවා එපා වෙලා ඉන්නේ. හැම කෙනෙක් ගැනම මට ලැජ්ජයි"

"ඒ මකුළුවා තමයි" ඇය පටන් ගත්තා. "ඌ....."

"ගොන්ඩොලින් ! මම මොකක්ද තමුසෙට කිව්වේ ! කාලකණ්ණි මකුළුවා ගැන වචනයක්වත් එපා." තම කටහඬ කෝපයෙන් වැඩි කරමින් පොට්ස් ගුරුතුමිය කිව්වා. "යනවා පන්තියෙන් එළියට! දඬුවමක් විදිහට මුළු පන්තියම පැයක් කල් ඇතිව නින්දට යන්න ඕනෑ. තමුසේ, ගොන්ඩොලින්, පැය දෙකක් කල් ඇතිව!"



වැලපෙමින්, ගොන්ඩොලින් පිටතට දිව්වා. පිටතට ගිය වහාම මකුළුවා තවමත් තමාගේ සිරුරේ කොහේ හෝ සිටීදැයි වෙවුලමින් ඇය පරීක්ෂා කර බැලුවා. ඇගේ මහත් සහනයට මෙන්, ඇය හදිසියේම ඌ කොරිඩෝව ඔස්සේ දුව යනු දුටුවා.

ඇය බිත්තියට හේත්තු වුණා. වෙන කෙනෙකු වෙතට නොගොස් මකුළුවා තමා වෙතට දුව ආ එක මොන තරම් අවාසනාවක් ද ! දැන් ඇයට දෙගුණ වූ දඬුවමක් ලැබී තිබුණා. එහෙත් මේරි ලෝව්ගේ ඩෙස්කයට මකුළුවා දැමුවේ ඇලිසියා හා ඩැරල් බව ඇය ඒත්තු ගන්වනු ඇත ! එලෙස තමාට කඩා පැනීමට තරම් පොට්ස් ගුරුතුමිය කොතරම් අප්‍රසන්න ද?. මකුළුවා තමා වෙතට ඒමේදී ඇයට කළ හැකි දෙයක් තිබුණේ නැහැ.

කෙසේ වෙතත් පොට්ස් ගුරුතුමිය පන්තියට පැමිණ සියල්ල ඇකගත් එකත් හොඳයි. සමහර විට මකුළුවා ඩෙස්කයට දැම්මේ ඩැරල් හා ඇලිසියා බව ගුරුතුමියට ඉඟි කිරීමට තමාට හැකිවනු ඇත.

මේ මොහොතේ පොට්ස් ගුරුතුමිය පිටතට පැමිණියා. ඇය අප්‍රසාදයෙන් යුතුව ගොන්ඩොලින් දෙස බැලුවා.

"මිස් පොට්ස්, මකුළුවා අර පහළට දිව්වා" නැවත පොට්ස් ගුරුතුමියගේ හොඳ හිත දිනා ගැනීමේ අරමුණින් ගොන්ඩොලින් කිව්වා.

මඳ හෝ තැකීමක් නොකළ ගුරුතුමිය දෙවැනි පන්ති කාමරයට වැදී දොර වසා දැමුවා. ගොන්ඩොලින්ට දැඩි අවමානයක් දැනුණා. ඉතින් ඇය කුමක් කරන්න ද ? පිටත නැවතී ඉන්න ද.... නැතහොත් පන්තිය තුළට යන්න ද ? විදුහල්පතිනිය, ග්‍රේලින් මහත්මිය, යම් හෙයකින් පැමිණියහොත් ඇයට අසුවීමට නොහැක. ඇය ඇතුළට යාමේ අවදානම ගැනීමට තීරණය කළා. දොර විවෘත කළ ඇය ඇතුළට රිංගා ගත්තා.

"හා ! තමුසෙ ආපහු ආවා ! කවුද එන්න කිව්වේ ?" ඇති වූ සිද්ධියේ දී තමා ලජ්ජාවට පත් වී සිටි නිසා අහුවෙන ඕනෑම කෙනෙක් මතින් තම අවමන් සහගත හැඟීම පිටකර ගැනීමට



සුදානම්ව සිටි මම්සලී තදින් කතා කළා. "තමුසේ කෑගහලා මි
පොට්ස්ගේ තරහා ඇවිස්සුවා"

"හරි, මම්සලී ඔයත් කෑගැසුවානේ" රිදුන කටහඬි
ගොන්ඩොලින් විරෝධය පෑවා. "මටත් වැඩිය හයියෙන් මි
හිතන්නේ"

මම්සලී අසුනින් නැගිට්ටා. ලජ්ජාවට පත්ව සිටි තමා ඉත
කුඩා බවත්, ඇය ඉතා විශාල බවත් ගොන්ඩොලින්ට පෙනුණ
ඇගේ කළු ඇස්ගෙඩි දෙක දිලිසුණා.

"තමුසෙ එකට එක කියන්න එනවා. මට, මම්සලී ඩූපොන්
අවුරුදු විස්සක් මෙහෙ උගන්වලා තියෙන මා එක්ක වාද කරන්
එනවා. තමුසෙ..... තමුසේ...."

ආපසු හැරුණු ගොන්ඩොලින් පැන දිව්වා. එවැනි වූ
අවස්ථාවක මම්සලීට මුහුණ දෙනවාට වඩා දවසම වුවද පිට
සිටගෙන සිටීම යහපත් බව ඇයට සිතුණා.



# 12

මකුළු සිද්ධිය, එය හැඳින්වූයේ එසේයි, දවස හමාර වීමට පෙර සෑම තැනම පැතිරුණා. ඉන් මහත් සිනාවක් ඉපදුණා. මම්සලී රොජර්ට එය ආරංචි වූ විට ඇය අවඥාවෙන් සිනාසුණා.

"ප්‍රංශ ගැහැනියක් ඒ තරම් මෝඩයි කියලා හිතන්න පුළුවන් ද ?" ඇය කිව්වා. "මම නම් මකුළුවොවත්, කන්වැයොවත්, කාවෝ තියා සර්පයොවත් ගණන් ගන්නෙ නැහැ ! ඒ වගේ ප්‍රදර්ශනයක් කරපු එක ගැන මම්සලී ඩූපොන්ට් ලජ්ජා වෙන්න ඕනැ !"

වෙන කාටවත් වැඩියෙන් ඒ ගැන කතා කළේ පළමු පන්තියේ දැරියෝයි. මේරි ලෝව් ගැන මතක් වූ සෑම විටම ඔවුන් ගුම් හඬින් සිනාසුණා. මම්සලී හා ගොන්ඩොලින් දෙදෙනාම එකම මකුළුවාගේ ගොදුරක්ව තිබුණා

"හරිම අපූරු මකුළුවා !" අයිරින් කිව්වා. "පන්තියේ ඌට බය තුන්දෙනාවම ඌ දැනගෙන හිටියා"

"මට හිතා ගන්න බැරි ඇයි ඌ මගෙ ඩෙස්කයම තෝර ගත්තෙ කියන එකයි"

"හරි ලජ්ජාවක්" ගොන්ඩොලින් කිව්වා. "අහිංසක මේරි ලෝව්! ඔයා හුඟාක් බය වෙන්න ඇති ඌව ඉස්සෙල්ලාම දකිද්දි. මම කල්පනා කරන්නේ කවුද ඌව දැම්මෙ කියලයි"

නිහඬතාවයක් ඇතිවුණා. කවුරුන් හෝ මකුළුවා හිතාමතාම එහි දමන්නට ඇති බවට ප්‍රථම වතාවට පළමු පන්තියට හිතුණා. ඔවුන් එකිනෙකා දෙස බලා ගත්තා.

"අහිංසක මේරි ලෝව්ගෙ ඩෙස් එකට ඌව දාපු එක කැත වැඩක්" ජීන් කිව්වා. "එයා හුඟාක් දේවලට බයයි. ඌ දකිද්දි එයා පණ බයේ කෑගහන්න ඇති කියලා මට හිතෙන්නෙ. විහිළුකාරී කවුරු වුණත් මං හිතනවා ඌව ඇලිසියා වගේ කෙනෙකුගේ ඩෙස්කයට දැම්මා නම් හොඳයි කියලා"

"විහිළු වැඩවලට ඔයා හුඟාක් ආසයි නේද ඇලිසියා ? ... ඩැරලුයි හවස පන්තියට ඉස්සර පන්තියෙ හිටියා. අපි ... මතකයි ඔයා මකුළුවෙකුව මේරි ලෝව්ගේ ඇඟට දානවා ...

එසේ කියමින් සිටියේ ගොන්ඩොලින්. ඇලිසියා ඇ... බැල්මක් හෙළුවා. "හරි, ඔයා හුරතල් ගොන්ඩොලින් මේරි, ... ඒක කළේ නැහැ. කවුරු හරි කළා නම් ඒ ඔයාමයි කියලා ... හිතෙන්නේ !"

"මේරි ලෝව් මගේ යාළුවා" ගොන්ඩොලින් කිව්වා. "... එහෙම දෙයක් එයාට කරන්නේ නැහැ"

"හරි, එක සතියක ඔයා එයාව ගිල්වන්න හැදුවා නම් ඊළඟ සතියේ ඔයා එයාගේ ඩෙස්කයට මකුළුවෙක් දැම්මා කියලා හිතන්න පුළුවන්" ඩැරල් කිව්වා.

"කට වහනවා" කැතරින් කෙටියෙන් කිව්වා. "ඒ ඩැරල්වත් ඇලිසියාවත් නොවෙයි කියලා අපි දන්නවා. ඒ මොකද එයාලා නැහැ කියනවා. මකුළුවා අහම්බෙන් එතෙන්ට එන්න ඇත්තේ එච්චරයි"

"හොඳයි, මම හිතන්නේ...." ගොන්ඩොලින් පටන් ගත් තැන්... පන්තියම එකවර ගැයුමක් ඇරඹුවා.

"කට වහනවා, ගොන්ඩොලින්; ගොන්ඩොලින් කට වහනවා කට වහනවා, ගොන්ඩොලින්; ගොන්ඩොලින් කට වහනවා !"

කට වසාගැනීම හැර වෙනත් කළ හැකි දෙයක් තිබුණේ නැහැ. ගොන්ඩොලින් කෝපයෙන් බුම්මා ගත්තා. එය කොතරම් හොඳ අදහසක් වුවද ඉන් සිදුවූයේ ඇයට දෙගුණයක දඬුවමක් ලැබීම හා දඟ වැඩය කළේ ඇලිසියා හෝ ඩැරල් යන්න කිසිවෙකුට ඒත්තු ගැන්වීමට නොහැකිව පරාජයක් ලැබීම පමණකි. ඇත්තෙන්ම පළමු පන්තියට පැයක් කල් ඇතිව නින්දට යාමට සිදු වුවද ඔවුන් සියලු දෙනා එය යහපතක් ලෙස සැලකුවා.

ගොන්ඩොලින් සම්පූර්ණ සිද්ධිය දුෂ්ටකමක් ලෙස සැලකුවා. පළමු උත්සාහය අසාර්ථක වුවද අවසානයේ ඇලිසියා හා ඩැරල් නිවැරදිකරුවන් බවට කවුරුත් පිළිගන්නා තුරු මේරි ලෝව්



...නොයෙකුත් නපුරුකම් කිරීමට ඇය අධිෂ්ඨාන කර ගත්තා. මේ දේවල් පසුපස සිටින්නේ ඇලිසියා හා ඩැරල් බව පොට්ස් ගුරුතුමියට ද ඇඟවීමට ඇය කල්පනා කළා.

එහෙත් ඇයට ඒවා කරමින් වැඩිදුර යාමට නොහැකි වුණා. ගෙදර වැඩක් සම්බන්ධව ඇයට පොට්ස් ගුරුතුමිය හමුවට යාමට සිදු වූ අතර ගුරුතුමිය හා මම්සලී ඩුපොන්ට් උතුරු කුලුනෙහි වෙසෙන කුඩා කාමරය වෙත ගිය ඇය ගුරුතුමිය පසෙකින් යටහත් පහත්ව සිටගෙන සිටියා.

"මිස් පොට්ස්, එදා මකුළුවාගේ සිද්ධිය ගැන මට හුඟාක් කනගාටුයි" ඇය පටන් ගත්තා. "ඇත්තෙන්ම ඇලිසියයි, ඩැරලුයි කලින් පන්තියේ හිටියා. මේ ගැන එයාලා මොනවා හරි දන්නවා කියලා මට විශ්වාසයි. මට ඇහුණා ඇලිසියා කියනවා....."

පොට්ස් ගුරුතුමිය හිස ඔසවා බැලුවා. "ඔයා කතා හදන්න ද යන්නේ ?" ඇය ඇසුවා. "හොඳ භාෂාවෙන් අහනවා නම්, කේළාම් කියන්න ? එහෙම නම් මාව අල්ල ගන්න එපා. මම ගිය බෝඩිං ඉස්කෝලේ, ගොන්ඩොලින්, අපි කේළම්කාරියන්ට හොඳ දඬුවමක් දුන්නා. නිදන කාමරයේ දී කේළම්කාරියට හැම ළමයෙක්ම ලොකු පනාවෙන් පස්ස පැත්තට පාර දුන්නා. මට කියන්න ඔයා ළඟ හුඟාක් රසවත් දේවල් ඇති. ඒත් වැඩක් නැහැ. මම ඒවට කන් දෙන්නේ නැහැ. මෙහෙ ළමයිනුත් කේළම්කාරියන්ට දඬුවම් දෙනවා ද දන්නේ නැහැ. මම අහලා බලන්න ඕනෑ ?"

ගොන්ඩොලින් ගිනි ගෙන රතු වුණා. කේළම්කාරියක් ! පොට්ස් ගුරුතුමිය කෙසේ නම් ඇයට චෝදනා කරන්නද ! ගොන්ඩොලින් මේරි ලැසී, කේළම්කාරියක් ! මේ සියල්ල සිදුවුණේ ඇය කරුණාවන්ත ලෙස කුඩා ඉඟියක් දීමට යාමෙන්. කුමක් කියන්නදැයි ගොන්ඩොලින් දැන සිටියේ නැහැ. ඇයට කඳුළු පෙරාගෙන ඇඬීමට සිතුණ ද පොට්ස් ගුරුතුමිය එවැනි ළමුන්ව නොරුස්සනා බව ඇය දැන සිටියා. ඇය කාමරයෙන් පිට වූයේ නිවසේ දී මෙන් තදින් දොර වැසීමේ මහත් ආශාවෙන් යුතුවයි. එහෙත් එසේ කිරීමට තරම් ඇය නිර්භීත වූයේ නැහැ.

සතිය ගෙවී ගියා. එම සතියේ දුකින් සිටි එකම කෙනා මේරි ලෝව් පමණයි. සුළු සුළු දේවලින් ඇයට කරදර පැමිණ තිබුණා.

උදාහරණයක් ලෙස ඇඳුම් [illegible] කාමරයේ තිබූ
ඇඳුම් වතුර ගොඩට දමා තිබූ නිසා තෙත බරිත වී තිබුණා.
ඒවා වේලා ගැනීමට නේවාසිකාගාර පාලිකාව වෙතට යාමට
වුණා.

පාලිකාව කෝප වුණා. "මේරි ලෝව්, ඔයාට බැරිද ඔයාගේ
දේවල් කාමරයේ හරියට එල්ලලා තියන්න. තටාකයේ ඉඳලා
යන ළමයි නිසා කාමරයේ බිම නිතරම වතුර තියෙනවා
ඔයා දන්නේ නැද්ද ?"

"මම එල්ලලා තිබුණේ, මේට්‍රන්" මේරි ලෝව් සෙමින් කිව්වා.
"මට හොඳට මතකයි එල්ලුවා කියලා"

ඉන්පසු මේරි ලෝව්ගේ ටෙනිස් පිත්තේ නූල් තුනක් හදිසියේ
කැඩී ඇති බව පෙනුණා. ඒවා ගෙවී ගිය බවක් නොපෙනුණ
කපා දමා ඇති බවක් පෙනුණා. මේරි ලෝව් හිරිහැරයට පත්වුණා.

"මගේ අලුත් රැකට් එක" ඇය කිව්වා. "බලන්න ගොන්ඩොලින්
අලුත් රැකට් එකට මෙහෙම වෙන්න පුළුවන් ද ?"

"බැහැ" එය හොඳින් පරීක්ෂා කර බලන බවට අඟවමින්
ගොන්ඩොලින් කිව්වා. "නූල් තුනක් කපලා මේරි ලෝව්,
හරි ඔයාට කැත වැඩ කරනවා. හරිම ලජ්ජයි"

මේරි ලෝව් කනගාටුවට පත්වුණා. තමාට කිසිදු සතුරෙක්
සිටින බව ඇයට ඇදහිය නොහැකි වුණා. එහෙත් ඇගේ
ඇඳුමේ බොත්තම් කපා දමා තිබෙණු දුටු විට යම් අයෙකු
නපුරුව දුෂ්ටකම් කරන බව ඇය දැන ගත්තා. ගොන්ඩොලින්
ඇයව සැනසුවා.

"දුක්වෙන්න එපා. මම ඔයාට ඒවා මහලා දෙන්නම්.
මැහුම්වලට කැමති නැහැ. ඒත් ඔයාට ඒ වැඩේ කරලා දෙන්නම්
මේරි ලෝව්"

එලෙස, මහත් අනුකම්පාවක් දක්වමින් ගොන්ඩොලින්
රාත්‍රියක නිල් පැහැ බොත්තම් ඇල්ලීම කළා. පළමු පන්තියේ
දැරියෝ පුදුමයෙන් ඈ දෙස බැලුවා. බැරිම තැනක දී හැර
කිසි දිනක තම ඇඳුමක් හෝ මසා ගන්නේ නැති බව ඔවුන් දැන
සිටියා.



"කොහොමද ඔය බොත්තම ගැලවුණේ ?" ජීන් ඇසුවා.

"ඒක තමයි මමත් දැන ගන්න කැමති" ගොන්ඩොලින්
අහංකාර ලෙස කතා කළා. "බොත්තම් හයක්. ඇදලා ගලවලා.
කවුරු හරි මේරි ලෝව්ට කැත වැඩ කරන නිසා මම මේවා
ඇල්ලලා දෙනවා. ඒ වගේම මම දැන ගන්න කැමතියි එයාගේ
ටෙනිස් රැකට් එකේ නූල් කැපුවේ කවුද කියලා"

දැරියෝ එකිනෙකා දෙස බලා ගත්තා. මෑතක සිට මේරි
ලෝව්ට එක එක කරදර පැමිණීම සැබැවින්ම අමුතු දෙයක් ලෙස
පෙනුණා. ඇගේ යාච්ඤා පොත පවා අතුරුදහන්ව තිබුණා.
එමෙන්ම ඇගේ පැන්සල් නැති වී තිබුණා. ඇත්තෙන්ම ඒවා
ඇලිසියාගේ ඩෙස්කයේ තිබී හමු වූ අතර කවුරුත් සිතුවේ එය
අහම්බෙන් සිදුවූ දෙයක් බවයි. දැන් කවුරුන් හෝ ඒවා එසේ
දැමුවාදැයි ඔවුන් කල්පනා කරන්න පටන් ගත්තා. ඇලිසියා විය
නොහැකියි. ඇලිසියා එවැනි දේ කරන්නේ නැහැ. එහෙත් කවුරුන්
හෝ කෙනෙක් !

වාර විභාගය ආසන්න වෙමින් තිබුණා. සමහරෙකුගේ
දෙමාපියන් පැමිණීමට නියමිතව තිබූ නිසා බොහෝ දෙනෙක්
ඇඩි ප්‍රීතියෙන් යුතු වුණා. වැඩි දුර බැහැරක ජීවත් නොවූ ඕනෑම
දෙමාපියකු ඒම සිරිතයි. ඩැරල් මහත් සේ සොම්නස් වූයේ ඇගේ
මව හා පියා එන නිසයි. ඔවුන් ඉතා ඈතක ජීවත් වුවද සතියක
නිවාඩුවක් ගෙන කොන්ඩොල් බලා පැමිණ, ඒ අතරතුරදී ඩැරල්
බැලීමට ඒමට තීරණය කර තිබුණා.

දැරියෝ තම පවුල් ගැන කතා කළා. "මගෙ අයියලා තුන්දෙනා
ආවොත් හොඳයි" ඇලිසියා කිව්වා. "අපිට සෙල්ලම් කරන්න
පුළුවන්"

"මගේ නංගි ආවොත් හොඳයි." ජීන් කිව්වා. "මම ආසයි
එයාට මැලෝරි ටවර්ස් පෙන්වන්න"

"ඔයාගේ අම්මා එනවා ද සැලී ?" මේරි ලෝව් ඇසුවා.

"නැහැ" සැලී කිව්වා. "එයා හුඟාක් දුර ඉන්නේ"

සතියකට දෙකකට ඉහත දී තම මව ලියුමක ලියා එවා තිබූ
දෙයක් හදිසියේම ඩැරල්ට මතක් වුණා. ඇය ලියා එවා තිබුණේ

ඇයට සැලී හොප්ගේ මව මුණ ගැසුණ බවයි. සැලීගේ පුංචි සොයුරිය, මාස තුනක බිළිඳියක ද, ඇය දැකගත් බව ලියා තිබුණා. ඩැරල් මේ සියල්ල සැලීට කීමට සිටිය ද ඇයට එය අමතක වී තිබුණා. මේ වේලාවේ ඇයට එය මතක් වුණා.

"ඔ, සැලී..... මම හිතන්නේ ඔයාගෙ අම්මා එන්නේ නැත්තේ බබා නිසා" ඇය කිව්වා.

සැලී සෘජු වුණා. තම සවන් ඇදහිය නොහැකි කලක මෙන් ඇය ඩැරල් දෙස දෙනෙත් අයා බැලුවා. ඇගේ මුහුණ සුදුමැලි වූ අතර ඇය කතා කරන විට උගුර හිරවන බවක් පෙනුණා.

"ඔයා කියන්නේ මොනව ද කියලා ඔයා දන්නේ නැහැ" ඇය කිව්වා. "මොන බබෙක් ද ? අපිට බබෙක් නැහැ. අම්මා එන්නේ නැත්තේ දුර වැඩි නිසා. මම කිව්වේ ඒකයි !"

ඩැරල් ව්‍යාකූල වුණා. "ඒත් සැලී මෝඩ වෙන්න එපා. අපේ අම්මා ලියමනකින් කියල එවලා තිබුණා එයා ඔයාගේ පුංචි නංගිව දැක්කා කියලා. එයාට මාස තුනයි කියලා තිබුණා"

"මට චූටි නංගි කෙනෙක් නැහැ !" අමුතු පහත් හඬකින් සැලී කිව්වා. "මම විතරයි ඉන්නේ. තාත්තා හුඟාක් වෙලාවට ඈත යන නිසා අම්මයි, මමයි දෙන්නා විතරයි ඉන්නේ. මට පුංචි නංගියෙක් නැහැ"

ඇරියෝ කුතුහලයෙන් සැලී දෙස බැලුවා. ඇයට කුමක් සිදුවී ද? ඇය ඉතා අසාමාන්‍ය බවක් පෙන්නුවා.

"හා හොඳයි" ඩැරල් අපහසුවෙන් කිව්වා. "ඔයා දැන ගත්ත එක හොඳයිනේ. කොහොම වුණත්, ඔයා නංගි කෙනෙකුට කැමති ඇති. නංගි කෙනෙක් ඉන්නවා නම් කොයි තරම් හොඳද"

"මට නංගිලා ඕන නැහැ" සැලී කිව්වා. "මට වෙන කෙනෙක් එක්ක මගෙ අම්මව බෙදා ගන්න ඕන නැහැ"

මුහුණ රළු කරගත් ඇය කාමරයෙන් පිටතට ගියා.

"හරි, මම අම්මට ඇත්තටම ලියලා යවන්න ඕනෑ ලොකු වැරදීමක් වෙලා කියලා" කී ඩැරල් එය ඒ විගසම කළා. ඊළඟ වතාවේ සැලී හමු වූ වහාම ඇය ඒ ගැන කිව්වා.



"මට කනගාටුයි, ඔයාට නංගි කෙනෙක් ඉන්නවා කියලා මම කරපු වැරදීමට" ඇය සැලීට කිව්වා. "මම අම්මට ලියලා යැව්වා ඔයාට නංගි කෙනෙක් නැහැ, ඔයාගෙ අම්මා කියපු දෙය එයා වැරදි විදිහට තේරුම් අරගෙන කියලා"

සැලී ගල්ගැසී නැවතී හදිසියේම මහත් පිළිකුලක් දක්වන ලෙස ඩැරල් දෙස රවා බැලුවා. "ඔයාට මොකට ද අනුන්ගේ දේවල් ?" ඇය තරහින් පිපිරුණා. "මාවයි, මගෙ පවුලෙ අයවයි අතහරින්න ! ඔයා හැම තිස්සෙම අනුන්ගේ දේවල්වලට හොට දානවා"

ඩැරල්ගේ ඉවසීමේ සීමාව පැන්නා. "මම එහෙම නැහැ." ඇය කිව්වා. "ඔයා කට පරිස්සම් කර ගන්න සැලී. මම හොට දාන්න ආවේ නැහැ. මට හිතා ගන්න බැරි ඔයා මේ තරම් කලබලයක් කරන්නේ ඇයි කියලා. ඔයාට නංගි කෙනෙක් හිටියත් නැතත් මට වැඩක් නැහැ."

"ඔයාගේ අම්මටත් කියන්න ඇඟිලි ගහන්න එපා කියලා !" "මගෙ පවුලෙ අය ගැන ලියුම් ලියන්න ඕනෙ නෑ" සැලී කිව්වා.

"ඔ.... මෝඩ වෙන්න එපා" ඩැරල් කේන්තියෙන් කෑගැසුවා. ඇය සැබෑ ලෙස කෝපයට පත්වුණා. "ඔයා හැසිරෙන විදිහට හිතෙනවා ලොකු අබිරහසක් තියෙනවා කියලා ! කොහොම වුණත් ඊළඟ සැරේ අම්ම ලියල එවන්නේ මොනවා ද කියලා මම බලන්නම්. ඊට පස්සේ ඔයාට කියන්නම්"

"මට දැනගන්න ඕනෑ නැහැ" ඩැරල්ව පසකට පැන්නීමට මෙන් අත දිගු කරමින් ඇය කිව්වා. "මට ඔයාව පේන්න බැහැ, ඩැරල් රිවර්ස්..... ඔයයි ඔයාව බලන්න එන, ඔයාට හැම දේම එවන ලියුම් ලියන අම්මවයි ! ඔයා ඒ ගැන කයිවාරු ගහනවා. ඔයා හිතාමතා මේවා කරන්නේ. ඔයා පහත්ම පහත්...!"

ඩැරල් ඇඩි මවිතයට පත්වුණා. මොනවද දෙයියනේ සැලී කියන්නේ ? ඇය පිටව යන දැරිය දෙස තුෂ්ණිම්භූතව බලා සිටියා.

# 13

වාර මැද සතිය ආරම්භ වන විට දැරියන් ඇඩි උනන්දුව යුක්ත වුණා. බොහෝ දෙනෙක් සෙනසුරාදා දිනයේ දෙමාපියන් හමුවනු ඇත. එමෙන්ම ක්‍රීඩාභාර රෙමිංටන් ගුරුතුමි දෙමාපියන්ගේ සතුට උදෙසා කුඩා පිහිනුම් සංදර්ශනය පැවැත්වීමට හදිසියේ තිරණය කර තිබුණි. මැලෝරි ටවර්ස් ආගිය කවුරුත් ස්වාභාවික තටාකය දැක මුසපත් වූ අතර කවුරු එහි සුන්දරත්වය දැකීමට ප්‍රිය කළා.

එහෙත් වාර මැද බදාදා දිනයේ ඔවුන්ගේ ස්ථාන කියන විට ඩැරල් මහත් කම්පනයට පත්වුණා. ඇය බලාපොරොත්තු වූ ලෙස පළමු තුන් හතර දෙනා අතර සිටිනු වෙනුවට ඇය අන්තිමයාගේ සිට දහවැනි ස්ථානයේ සිටියා. ඇයට තම සවන් ඇදහිය නොහැකි වුණා ! කැතරින් පළමුවැනියා. ඇලිසියා පස්වැනියා. බෙටී අටවැ වෙනියා. ගොන්ඩොලින් අන්තිමයා. මේරි අන්තිමයාගේ සිට හයවැනියා. ඩැරල්ට වඩා එතරම් පහළ ස්ථානයක් නොවේ!

ඉතිරි ලකුණු කියන අතරේ ඩැරල් නිහඬව වාඩි වී සිටියා. දැරියන් තිහක් පමණ ඇගේ පන්තියේ සිටි අතර දැරියන් විස්සක් පමණ ඇයට වඩා හොඳින් වැඩකර තිබුණා. ඒකාන්තයෙන් යම් වැරදීමක් සිදුව තිබුණා.

හිත කරදර වූ පෙනුමකින් යුතුව ඒ ගැන කතා කිරීමට ඇය පොට්ස් ගුරුතුමිය හමුවට ගියා. "මිස් පොට්ස්" ඇය කතා කළේ තරමක් බියෙන්. ඒ ගුරුතුමිය ප්‍රශ්න පත්‍ර හරි වැරදි බලමින් යුහුසුළුව සිටිනු පෙනුණ නිසයි. "මිස් පොට්ස්, බාධා කරනවට සමාවෙන්න මට දෙයක් අහන්න පුළුවන් ද ?"

"මොකක් ද ඒ ?" නිල් පැන්සලෙන් ඉරක් අඳිමින් ගුරුතුමිය ඇසුවා.



"පන්තියේ ස්ථාන ගැන" ඩැරල් කිව්වා. "මම ඇත්තටම ඒ තරම් පහළ ද ?"

"ඉන්න බලන්න..... ඔයා කීවෙනියා ද ? හුඟාක් පහළ" ලකුණු ලැයිස්තුව ඇද බලා ගුරුතුමිය කිව්වා. "ඔව්, හරි. මම පුදුම වෙනවා වගේම කලකිරෙනවා, ඩැරල්. ඔයා පළමු සති දෙකේ හොඳින් වැඩ කළා."

"ඒත් මිස් පොට්ස්" කී ඩැරල් නැවතුණා.

කෙසේ වෙතත් ඉක්මනින් සැම දෙයම අවබෝධ කර ගන්නා පොට්ස් ගුරුතුමියට ඇගේ දුෂ්කරතාව පෙනුණා. "ඔයා මගෙන් අහන්න ආවේ ලේසියෙන් ඉහළ ස්ථානයක ඉන්න තරම් පුළුවන්කම තියෙද්දි ඇයි අන්තිම අය අතරට ආවේ කියන එක" ඇය කිව්වා. "හොඳයි, මම කියන්නම් ඩැරල්. තමන්ගෙයි අනිත් අයගෙයි කාලය නාස්ති කර කර පන්තියේ මෝඩ වැඩ කරලත් ඉගෙනීම් වැඩ හොඳට කරන ඇලිසියා වගේ අය ඉන්නවා. ඒ වගේම තමන්ගෙත්, අනුන්ගෙත් කාලය නාස්ති කර කර මෝඩ වැඩ කරන.... ඒත් අවාසනාවට වැඩවලින් පහළට වැටෙන ඔයා වගේ අයත් ඉන්නවා. ඔයාට තේරෙනවා ද ?"

ඩැරල් ලජ්ජාවෙන් රතු වූ අතර පොළොව පළාගෙන යාමට තරම් සිත් වුණා. ඇය හිස සැලුවා.

"ඔව්" ඇය සෙමින් කිව්වා. ඇය තම දීප්තිමත් දුඹුරු දෙනෙතින් පොට්ස් ගුරුතුමිය දෙස බැලුවා. "පන්තියෙ ස්ථානයට ඒ විදිහට බලපෑමක් එනවා කියලා දන්නවා නම් මට ඒ තරම් මෝඩ විදිහට හැසිරෙන්නෙ නැතිව ඉන්න තිබුණා" ඇය කිව්වා. "මම..... මම හිතුවා මට ඉගෙන ගන්න පුළුවන්කම තියෙන නිසයි, හොඳ මතකයක් තියෙන නිසයි ප්‍රශ්නයක් වෙන එකක් නැහැ කියලා. අම්මයි තාත්තයි හොඳටම කලකිරෙනවා"

"අනිවාර්යයෙන්ම වෙනවා" පැන්සල නැවත අතට ගනිමින් ගුරුතුමිය කිව්වා. "මම ඔයා නම්, මම ඇලිසියාවයි, බෙටීවයි එතරම් කොපි කරන්නේ නැහැ ඩැරල්. අනිත් අයව කොපි නොකර ඔයා ඔයාගේ ක්‍රමයට ඉගෙන ගන්නවා නම් ඔයා හුඟාක් හොඳ

චරිතයක් වෙනවා. බලන්න, ඔයා කරන දේවල් ඔයා මුළු හිති... කරනවා...."

"මට තේරෙනවා" ඩැරල් කිව්වා. "මගේ තාත්තා වගේ. එ... මුළු හිතින්ම වැඩ කරන කෙනෙක්. එයා ශල්‍ය වෛද්‍යවරයෙ... එයා මිනිසුන්ට සනීපයයි, සතුටයි ආපසු ලබා දෙනවා. එයා වැ... කරන්නේ මුළු හදින්ම.... ඒ නිසා එයා හරිම අපූරු කෙනෙ...

"හරියට හරි" ගුරුතුමිය කිව්වා. "එයා හුඟාක් දේවල් බදාගෙ... යන්නමින් අතපත ගාලා කළා නම් ඒ වගේ අපූරු ශල... වෛද්‍යවරයෙක් නොවෙන්න තිබුණා. වෛද්‍යවරයෙ... ගුරුවරයෙක් නැතිනම් ලේඛකයෙක් හරි චිත්‍ර ශිල්පියෙක් හ... වෙන්න අවශ්‍ය නම් ඒ ගැන කැපවීමෙන් වැඩ කරන්න ඕන... දෙවැනි පෙළේ හෝ තුන්වැනි පෙළේ කෙනෙක් වුණාට කම... නැහැ. පළමු පෙළේ කෙනෙක්ම වෙන්න ඕනැ නම් ඒ සඳ... කුඩා කාලයේ ඉඳලම කැපවීම අවශ්‍යයි"

පළමු පෙළේ කෙනෙකු වීමේ ලක්ෂණ තමා වෙත ඇත්දැ... ගුරුතුමියගෙන් ඇසීමට ඩැරල්ට අවශ්‍ය වුවද ඇය එසේ නොකළ... නමුත් තමාට එම ලක්ෂණ ඇති බව ඇය සිතුවා. ඇය පිටත... ගියේ මදක් දමනය වීමෙන් පසුවයි. තම වැඩ ගැන කැප නො... ඇලිසියා හා බෙටී සමග මෝඩ වැඩ මුළු හිතින්ම කර පන්තියේ... පහළට රූටා එන්නට තරම් ඇය අනුවණ වීම කොතරම් අපරාධය... ද !

ගොන්ඩොලින්ගේ මව හා ඇගේ පරණ ආයා, වින්ට... මහත්මිය සෙනසුරාදා පැමිණීමට නියමිතව තිබුණා. අනිත් ඇ... ඉදිරියේ ජේත්තු ලෙස හැසිරෙන්නට ගොන්ඩොලින් ආශාවෙ... මග බලා සිටියා. පාඩම් ගැන කතා කිරීමේ දී වින්ටර් මහත්මි... ඉතා සුළුකොට සලකමින් තමා සෑම දෙයකටම කොතරම් දක්... දැයි ඇයට පුරසාරම් දෙඩිය හැකි ද !

මේරි ලෝව්ගේ දෙමාපියන් නොපැමිණෙන අතර ඇ... කලකිරී සිටියා. ගොන්ඩොලින් ඇයට කරුණාවෙන් කතා කළ... "කමක් නැහැ මේරි ලෝව්. ඔයාට පුළුවන් අපේ අම්මයි, මි... වින්ටරුයි එක්ක දවස ගෙවන්න. මම ඔයාට තනිකමක් දැනෙන්... දෙන්නෙ නැහැ"



ගොන්ඩොලින් සමග දිනය ගත කිරීමට මේරි ලෝව්ට එතරම් අවශ්‍ය වුණේ නැහැ. ගොන්ඩොලින්ගේ අනවශ්‍ය සෙනෙහස දැක්වීම හා ඇගේ පවුලේ පුරාජේරු කතාන්දරත්, ඇය කොතරම් අපූරු චරිතයක් ද යන්න පෙන්වීමට කියන දේත් මේරි ලෝව්ට එපා වී තිබුණා.

එහෙත් මේරි ලෝව් ආශ්‍රය කිරීමට නොහැකි තරම් දුර්වල චරිතයක් වුවද එවැනි නිහඬ සවන් දෙන්නියක සිටීම ගැන ගොන්ඩොලින් මහත් සතුටට පත්ව සිටියා.

මේරි ලෝව්ගේ දෙමාපියන් වාර මැද සෙනසුරාදාවේ නොපැමිණෙන බව ආරංචි වූ විට ඩැරල් ඇයව හමුවන්න ගියා. 'ඔයා කැමති ද මායි, අම්මයි, තාත්තයි එක්ක එන්න ?" ඇය ඇසුවා. "අපි කාරෙකෙන් එළියට යනවා දවල් කෑමට. අපි අපූරු සවාරියක් යනවා"

මේරි ලෝව්ගේ හදවත ගැස්සුණා. සතුටින් හා සෙනෙහසින් ඇය ඩැරල් දෙස නෙත් දල්වා බැලුවා. ඩැරල් සමග නිවාඩු දිනය ගත කිරීමට ඇත්නම් ඊටත් වඩා තව අපූරු දෙයක් නැහැ! මෑතක සිට ඩැරල් ඇයට දොස් පවරා කරදරයක් ලෙස පසෙකට දමා සිටිය ද මෙලෙස ආරාධනා කිරීමට තරම් ඇය විනීත වී තිබුණා.

ඒ සමගම ඇයට ගොන්ඩොලින්ගේ ඇරයුම ද සිහි වූ අතර ඇගේ මුහුණ අඳුරු වුණා. "අනේ" ඇයට කියවුණා. "ගොන්ඩොලින් කිව්වා එයා එක්ක එන්න කියලා.... ඉතින් මම පොරොන්දු වුණා"

"හරි, ගිහින් එයාට කියන්න මමයි ඔයාට එන්න කියන්නෙ කියලා. අනික මගෙ අම්මයි, තාත්තයි ඔයාව හම්බ වෙන්න බලා ඉන්නවා කියන්න" ඩැරල් කිව්වා.

"එයාට තරහා යයි...... හුඟක්ම එයා ඔයා එක්ක තරහා නිසා ඩැරල්"

"මම හිතන්නේ ඒ ඔයා මා එක්ක යනවට වඩා ගොන්ඩොලින් එක්ක යන්න කැමතියි කියන එක" ඩැරල් අකරුණාවෙන් කිව්වා. මේරි ලෝව් බියපත් බැල්මක් හෙළන සෑම විටම ඇගේ සිත රිදුණා. "හොඳයි, යන්න එහෙනම්"

"ඩැරල් ! කොහොමද එහෙම කියන්නේ ?" දෙනෙතේ කඳු පුරවාගෙන මේරි ලෝව් කෑගැසුවා. "ඇයි මම....ම...මම ඩැ එක්ක එන්න ඕනෑ දෙයක් කරනවා"

"හොඳයි. ගොන්ඩොලින්ට ගිහින් කියන්න එහෙනම්" ඩැ කිව්වා

"එතරම් වුවමනාවක් තියෙනවා නම් ඔයාට ඒකට ධෛ උපදවා ගන්න පුළුවන්. ඔයා අන්තිම එපා කරපු බයගුල්ලියක්

"ඔ, මම දන්නවා" මේරි ලෝව් දුකින් කිව්වා. "ඒක නිස්සෙම කියන්න එපා. ඒකෙන් මම තවත් නරක් වෙනවා ! ඩැ ගොන්ඩොලින්ට කියන්න. ඩැරල්"

"කොහෙත්ම බැහැ" ඩැරල් කිව්වා. "මම ඔයාගෙ වැ කරන්න යන්නෙ නැහැ. කොහොම වුණත් මේ වගේ මෙ බබෙක්ව නිවාඩු දවසෙම මට එල්ලගෙන ඉන්න වුවමනා නැ

දුකින් බලා සිටි මේරි ලෝව්ව හැර ඇය ඉවතට පා තැබූ අසල සිට සියල්ලම පාහේ අසා සිටි ජීන්ට මේරි ලෝව් ගැ කනගාටුවක් ඇති වුණා. ඇය ඩැරල් පසුපසින් ඇවිද ගියා.

"මම හිතන්නේ ඔයා එයාට සැරවුණා ටිකක් වැඩියි" ඇ තම සෘජු ස්කොට් කටහඬින් සැල කළා.

"හොඳයි... ඒක එයාගේ හොඳට" ඩැරල් කිව්වා. "එයා ටිකක් ධෛර්ය එන්න මම සැලැස්සුවා නම් එයා මට ස්තූ කරයි. මම ඒවා කිව්වේ හිතාමතාමයි. ලැජ්ජා කරලා ගොන්ඩොලි ළඟට යවන්න"

"ඔයා ලැජ්ජා කළ එක ඇත්ත. ඒත් ධෛර්ය උපදින විදිහ නම් නොවෙයි" ජීන් කිව්වා. "ඔයා කරපු ලැජ්ජාවෙන් වෙන්නෙ තවත් දුකට පත්වෙන එකයි"

නිවාඩු දිනයේ දී මේරි ලෝව්ට ඩැරල් සමග යාමට ස කළ බව ගොන්ඩොලින්ට ආරංචි වූ අතර මේරි ලෝව් ඒ යාමට කැමැත්තක් නොදක්වන බව පෙනුණ ඇය සතුටට පත්වුණ ඇය ඒ ගැන ඇ සමග කතා කළා.



"මම ඔයාට මා එක්ක එන්න කියලා තියෙද්දිත් ඩැරල් ලැජ්ජා නැතිව ඔයාට එන්න කීවාලු" ඇය කිව්වා. "ඔයාට බැහැ කියන්න පුළුවන් වීම ගැන මට සතුටුයි මේරි ලෝව්. ඔයාට නිතරම කොන්ද පණනැති පණුවෙක් කියන ඒ වගේ කෙල්ලක් එක්ක යන්න ඔයා කැමති නැ කියලා මම දන්නවා. "නැහැ" කී මේරි ලෝව්ට තවත් දෙයක් කියාගන්න බැරිවුණා. එහෙම නොවෙයි කියලා ඇයට කෙළින්ම කියාගන්න නිර්භීතකමක් තිබුණා නම් ! එහෙත් ඇයට එසේ කළ නොහැකි වුණා.

වාර මැද නිවාඩු දිනයේ උදය එළඹුණා. එය පැහැදිලි දීප්තිමත් සුන්දර දවසක් වනු ඇත. කණ්ණාඩියක් මෙන්ම නිසල වූ මුහුද හිරුඑළියෙන් බැබළුණා. සවස දෙක වන විට වඩදිය රැල්ල එනු ඇත. තටාකය සකස්වනු ඇත. කොතරම් වාසනාවක් ද!

ඇඳි නැති පුටු රාශියක් ගෙන තටාකය වෙත ගිය දැරියෝ ඒවා ඉහළ ගල්තලා මත තැබුවා. තටාකයෙන් ඉහළ ගල්තලාවට වඩදිය ළඟාවූයේ බොහෝම කලාතුරකින්. එය කදිම නැරඹුම් වේදිකාවක් වුණා. එදින දෙමව්පියන් දැක ගැනීමේ සතුටින් ඉපිලුණ ඩැරල් හඬනගා ගීයක් ගයමින් ඒ මේ අත ගියා. මේරි ලෝව් ගී ගැයුවේ නැහැ. ඇය සන්සුන් නමුත් දුකින් බරවූ පෙනුමකින් යුතුවුණා. සැලී හෝප් ද සන්සුන් බවක් පළ කළ නමුත් වෙනදාටත් වඩා ඇය මුලුගැන්වී ඇති බවක් ඩැරල්ට හිතුණා.

ඇලිසියා ඇඩි උද්දාමයකින් සිටියා. ඇගේ මව හා පියා එක් සහෝදරයෙකු ද සමග පැමිණීමට සිටියා. බෙටීගේ දෙමව්පියන් නොඑන නිසා ඇත්තෙන්ම ඇය ඇලිසියා සමග යනු ඇත.

පුටු කීපයක් රැගෙන ගල්තලාවට නැග එන සැලීගේ මුහුණේ වූ ශෝකාකුල බැල්ම දුටු ඩැරල්ගේ හිත උණු වුණා.

"හායි ! සැලී හෝප්. ඔයාලගේ ගෙදර අය එන්නේ නැහැ නේද? ඔයා කැමති ද අපිට එකතු වෙන්න? කැමති ඕනෑම කෙනෙක් මට එක්ක යන්න පුළුවන්"

"ස්තුතියි. ඒත් මගේ කැමැත්තක් නැහැ" මඳක් ලැජ්ජාශීලී බවක් දක්වමින් කී සැලී තවත් වචනයක් හෝ නොකියා ගල්තලාව

නගින්නට වුණා. "හොඳයි, එයත් විකාර කෙල්ලක්" ඇ මේ වනතුරු කතා කර තිබූ දැරියන් දෙදෙනාම ආරාධනය ප්‍රතික්ෂේප කිරීම ගැන සිත රිදුණ ඩැරල් සිතුවා. දෙමව්පියන් නොපැමිණෙන කවුරුන් හෝ දැරියක සොයා ගැනීමට ඇය පිටත්ව ගියා. ඇගේ මව තවත් කවුරු හෝ දැරියක පිටතට කැඳවාගෙන යාමට කැමති බව කියා තිබූ නිසා ඇය කෙසේ හෝ තවත් අයෙකු සොයා ගත යුතුයි. "පුළුවන් නම් ඔයා විශේෂයෙන් කැමති කෙනෙක්" මව ලියා තිබුණේ එයයි.

එහෙත් ඩැරල්ට විශේෂ යෙහෙළියක් සිටියේ නැහැ. ඇය ඇලිසියාට බොහෝ ඇලුම් කළ ද ඇලිසියා බෙටීගේ මිතුරිය වූ. ඇය අයිරින්ට ද කැමති නමුත් අයිරින්ට කිසිදින මිතුරියකගේ අවශ්‍යතාවයක් ඇති තිබුණේ නැහැ. සෑම දෙයක් වෙනුවෙන්ම ඇයට සංගීතය තිබුණා.

"ඕ, හරි කොහොමද එමිලිගෙන් ඇහුවොත්?" ඩැරල් කල්පනා කළා. ඉගෙනීමෙහි සමත්කම් දැක්වූ, ශාන්ත ගති පැවතුම් ඇති සෑම සැඳෑවකම මැහුම් ගෙතුම් දක්ෂ ලෙස කරන එමිලිට ඇගේ වැඩි ඇල්මක් තිබුණේ නැහැ. ඇගේ පවුලේ කිසිවෙකු පැමිණීමට නියමිතව නොතිබුණ අතර කිසිවෙක් ඇයව එකතු කර ගැනීමට කතාකර තිබුණේ නැහැ.

ඇය එමිලිට කතා කළ අතර සතුටින් මුහුණ රතු කර ගත් එමිලි තමා ඉතා සතුටින් ඒමට කැමති බව පැවසුවා. මේ බව දැනගත් මේරි ලෝව්ගේ දෙනෙත් කඳුළින් පිරුණා. ඩැරල්ගේ දෙමව්පියන් හමුවීමට සතුටින් යන දෙදෙනා දෙස ඇය ශෝකයෙන් බලා සිටියා. ඉතා ආශාවෙන් තමාට ලබා ගැනීමට තිබූ සංග්‍රහය එමිලිට හිමිවනු දැකීම ඇයට දරාගත නොහැකි වුණා. ඒ ඇයට එතරම් ධෛර්යයක් නොතිබීම නිසයි.



# 14

මැලෝරි ටවර්ස් වෙත පිවිසෙන මාවත නොයෙක් හැඩයේ හා ප්‍රමාණයේ මෝටර් රථවලින් පිරී ගියා. ඒවායින් බැස ගත් දෙමව්පියෝ දැරියන් සොයා ආවා. සතුටු හඬින් කෙරෙන පිළිගැනීම් හා සිනාහඬින් අවට පිරුණා.

"අම්මා! තාත්තා ! ඔයාලා ඉක්මනට ආ එක හොඳයි."

"අම්මා ! මම හිතුවේ නැහැ ඉක්මනින් එයි කියලා. ඔයාව දැක්කාම මට හුඟක් සතුටුයි."

ඩැරල් ඇගේ මව හා පියා සොයමින් සිටියා. පියා විසින්ම පදවාගෙන එන ඔහුගේ සාමාන්‍ය කළු මෝටර් රථය ඇය දැක ගත්තා. එමෙන්ම ඩැරල්ව දැක ගැනීමේ සතුටු මුහුණින් යුතුව ලස්සන අලුත් ඇඳුමෙන් සැරසී පියාට පසෙකින් වාඩි වී සිටින ඇගේ මවද ඇය දැක ගත්තා.

තම මව එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටින ගොන්ඩොලින්ව හැප්පෙන්නට යමින් ඩැරල් ඊ තලයක් මෙන් දොරකඩ හරහා දුවගොස් මාවත වෙතට දිව්වා. ඇය දෙමව්පියන් වෙතට පියඹා ගියා. "අම්මා! මම මඟ බල බලා හිටියේ. ඕ, මට හරිම සතුටුයි. තාත්තා ඔයාද දිගටම එළවාගෙන ආවේ?"

හඬනගා කතා කරමින් ඩැරල් ඔවුන්ව පාසල තුළට කැඳවගෙන ගියා. "ඔයාලා මගේ නිදන කාමරය දකින්න ඕනෑ. මගේම ඇඳත්, නිදන කාමරයේ ජනේලයෙන් පෙනෙන දර්ශනය හරිම ලස්සනයි."

ඇගේ ඇඩි සන්තුෂ්ටිය නිසාම ඇයට එමිලි ගැන සියල්ල අමතක වුණා. එමිලි ඒ අසලම ඉවසිල්ලෙන් මඟබලා සිටියා. හදිසියේම ඩැරල් ඇව දුටුවා.

"අනේ එමිලි! අම්මා, ඔයා කීවා නේද එළියට එක්ක යන්න

කාවහරි තෝර ගන්න කියලා. මෙන්න එයා ඉන්නවා. මේ එමි
ලේක්, මගේ පන්තියේ ළමයෙක්"

රිවර්ස් මහත්මිය එමිලි දෙස බලා පුදුම වුණා. ශාන්ත, සන්සු
දැරියක් ඇය බලාපොරොත්තුව තිබුණේ නැහැ. මේ වන විට
ඩැරල්ට ස්ථිර මිතුරියක නොසිටි බව ඇය දැන සිටියේ නැහැ
එමිලිගේ අතට අත දුන් ඇය ඔවුන් සමග පැමිණීම ගැන සතු
වන බව කිව්වා.

ඉන්පසුව ඩැරල්ගේ සොම්නස් කතා බහට හා ඇගේ
මව්පියන්ගේ තෘප්තිමත් පිළිතුරුවලටත් සවන් දෙමින් එමිලි ඔවුන්
පසුපසින් ඇදුණා. ඇය ඩැරල්ගේ මව්පියන්ට ඇලුම් කළා. ඇගේ
මව සුන්දර, සතුටු සිත් ඇති අවබෝධයෙන් යුතු කෙනෙක්
එමෙන්ම ඇගේ පියා, යහපත්, දුටු පමණින්ම ඕනෑම කෙනෙකුට
විශ්වාසය තැබිය හැකි පුද්ගලයෙක්. ඔහුගේ ප්‍රියමනාප කඩවසම්
පෙනුම හා ඩැරල්ගේ මෙන් දුඹුරු නමුත් ඊට වඩා විශාල දෑ
පැහැ දෙනෙත් දෙස බලමින් එමිලි සිතුවා.

ඩැරල් තම දෙමව්පියන් ගැන ආඩම්බර වුණා. ඇය ඔවුන්ව
කාටත් පෙන්වීමට ආශා කළා. ගොන්ඩොලින් තවත් කාන්තාවන්
දෙදෙනෙකු සමග සිටිනු ඇය දුටුවා. එක් අයෙක් පැහැදිලිවම
ඇගේ මව. ඇයට තිබුණේ ගොන්ඩොලින්ගේ මෙන් දිදුලන රන්
වන් කෙස් කළඹක් හා ළදරුවෙකුගේ වැනි වූ හිස් බැල්මෙන් යුතු
මුහුණක්. අනෙක් කෙනා ආයා, වින්ටර් මහත්මිය විය යුතුයැයි
ඩැරල් කල්පනා කළා.

සිනාසීමට උත්සාහ කළද සැබැවින්ම නොසතුටින් සිටි මේරි
ලෝව් ඔවුන් සමග සිටියා. ලැසී මහත්මියට හෝ වින්ටර් මහත්මියට
ඇගේ කැමැත්තක් නොතිබුණ අතර ගොන්ඩොලින් ඔවුන්ට පවසන
අමූලික බොරු ඇසුණ ඇය පුදුමයට පත්ව සිටියා.

"අපේ පන්තියේ ටෙනිස් ගහන හොඳම කෙනා මම්"
ගොන්ඩොලින් කියනු ඇයට ඇසුණා. "මාව තරග කණ්ඩායමට
තෝරා ගනියි කියලා හිතනවා, අම්මා"

"ඕ, දුව ඔයා මොනතරම් දක්ෂ ද?" ලැසී මහත්මිය ආදරයෙන්
කිව්වා. මේරි ලෝව් පුදුමයෙන් දෙනෙත් මහත්ව ගොන්ඩොලින්



දෙස බැලුවා. ඇයි, හැම කෙනෙක්ම දැන සිටියා, ගොන්ඩොලින්
ක්‍රීඩාවලදී මෝඩ ලෙස කටයුතු කරන බව.

"මමසලී මගේ ප්‍රංශ වැඩ ගැන හුඟක් සතුටුයි." ගොන්ඩොලින්
කියාගෙන ගියා.

"මම ප්‍රංශවලින් පළමුවෙනියා වෙයි. එයා කියනවා මගේ
උච්චාරණය ඉස්තරම් කියලා"

වින්ටර් මහත්මිය සතුටින් බැබළුණා. ඇය ආදරයට
ගොන්ඩොලින්ට ඇමතුවේ ග්වෙන් කියලයි. "ඕ, ග්වෙන් දුවේ,
කොයිතරම් අපූරුද ! මමත් ඔයාට පුළුවන් තරම් හොඳට
ඉගැන්නුවා. ඒත් මම හිතුවේ මම ප්‍රංශයට ගිහින් නැති නිසා මම
ඒ තරම් හොඳට ඉගැන්නුවේ නැද්ද කියලයි"

ගොන්ඩොලින් නිතරම ප්‍රංශවලදී පන්තියේ අන්තිම බව
කීමට මේරි ලෝව්ට සිතුණ ද ඇයට එතරම් නිර්භීතකමක් තිබුණේ
නැහැ. එතරම් ගල් පැළෙන බොරු කියන්නේ කෙසේ ද? ඒවා
කෙසේ නම් විශ්වාස කරන්න ද?

"අද හවස පිහිනුම් තරගයට ඔයත් ඉන්නවා ද?" තම උරහිස
මත රන්වන් කෙස් කළඹ විදහාගෙන සිටින නිසා ඇය සුරංගනාවක්
වැනි යැයි සිතමින් ලැසී මහත්මිය තම දියණියගෙන් ඇසුවා.

"නැහැ. අද මට බැහැ කියලා හිතුණා, අම්මා" ගොන්ඩොලින්
කිව්වා. "අනිත් අයට අවස්ථාව දෙන එක හුඟක් හොඳයි. කොහොම
වුණත් හුඟක් දේවල් මම හොඳින් කරනවා."

"මගේ හොඳ දුව, අනිත් අය ගැන හිතනවා" කී ලැසී මහත්මිය
ගොන්ඩොලින්ගේ අත මිරිකුවා.

එහෙත් ඩැරල් ඒ සියල්ල විනාශ කළා. ඇය මව හා පියා
සමග යමින් සිටි අතරේ ඇගේ සුන්දර පෙනුමට හිත ගිය ලැසී
මහත්මිය ඩැරල්ගේ පියකරු ප්‍රීතිමත් සිනාව දැක ගත්තා.

"අන්න අපූරු ළමයෙක් දුවේ" ඇය ගොන්ඩොලින්ට කිව්වා.
"එයා ඔයාගේ යාළුවෙක් ද? අපි එයාට කතා කරමු."

"ඕ, එපා. එයා මගේ යාළුවෙක් නොවෙයි." ගොන්ඩොලින් පටන් ගත්ත ද ඩැරල්ව පසසනු දුටු මේරි ලෝව් ඉන් සොම්නස්ව ඩැරල්ට අඬ ගසන්නට වුණා. "ඩැරල්, ඩැරල් මිසිස් ලැසිට ඕනෑ ඔයා එක්ක කතා කරන්න."

ඩැරල් ලැසී මහත්මිය වෙත ගිය අතර ඔරවා ගොන්ඩොලින් විසින් ඇව හඳුන්වා දෙනු ලැබුවා. "ඔයා අද පිහිනුම් තරගයට ඉන්නවාද?" ලැසී මහත්මිය ඇසුවා.

"අපේ ගොන්ඩොලින් දුව නම් යන්නේ නැහැ"

"ගොන්ඩොලින් ! ඕ, එයාට අඩියක්වත් පිහිනන්න බැහැ" ඩැරල් කිව්වා.

"මෙයා වතුරට කකුල් දාගෙන විනාඩි පහක් විතර බලා ඉන්නකොට අපි මෙයාට කෑ ගහනවා. නැද්ද, ගොන්ඩොලින් ?"

මේ සියල්ල කියවුණේ මහත් හාස්‍යයෙන් හා විනෝදයෙන්. එහෙත් ගොන්ඩොලින්ට සිතුණේ ඩැරල්ව ඒ මොහොතේම ගල්තලාවෙන් පහළට පෙරළා දැමීමටයි. ඇය රතුවුණා.

ලැසී මහත්මිය සැබැවින්ම සිතුවේ ඩැරල් විහිළු කරන බවයි. තමා ඉතා සුන්දරව සිනාවන බව සිතමින් ඇය තම උපරිම සිනාහඬ නැගුවා. "මම හිතන්නේ ගොන්ඩොලින් ආවොත් ඔයාල ඔක්කෝම පරාදයි" ඇය කිව්වා. "ටෙනිස්වලදියි, අනිත් විෂයයන්වල් වගේ. මම හිතන්නේ."

මවිත වූ ඩැරල් ගොන්ඩොලින් දෙස බැලුවා. ඇය ඩැරල් දෙස රවාගෙන සිටියා. ඇගේ මුහුණ රතුව තිබුණා. "මම හිතන්නේ ගොන්ඩොලින් මෙතැන බේගල් අතහරිනවා වගේ." හඬනඟා සිනාවක් නැගූ ඇය තම පිරිස හා එක්වීමට ගියා.

"හරිම අවංක, කෙළින් කතා කරන ළමයෙක්" ව්‍යාකූලත්වයටත්, පුදුමයටත් පත් වූ වින්ටර් මහත්මිය කිව්වා.

ගොන්ඩොලින් සැනසිල්ලට පත්වුණා. "ඕ, එයා හොඳ ළමයෙක් නොවෙයි." ඇය කිව්වා. "කවුරුවත් එයාට කැමති නැහැ. අඩුම තරමේ එයාට කිසිම යාළුවෙක් නැහැ. ඔයාට තේරෙයි



ඇයි කියලා. එයා නිතරම අනිත් අය පහත් කරනවා. ඊර්ෂ්‍යාව මම හිතන්නේ. එයා ගැන හිතන්න එපා. අම්මා මේ ඉන්න මේරි ලෝව් කියයි මම ටෙනිස්වලිනුයි, අනිත් ඒවායෙනුයි පළමුවැනියා කියලා.

එහෙත් බියගුලු මේරි ලෝව්ට එය ඇරිය නොහැකි වූ අතර ඇය වඩාත් බියපත් බවක් පෙන්වූවා. මම්සලී සමග යමක් කතා කිරීමට ඇති බව මුමුනමින් ඉවතට ගිය ඇය ලැසී පවුලින් මොහොතකට හෝ මිදීම ගැන සතුටට පත්වුණා.

උතුරු කුලුනේ ඉහළ සිට පෙනෙන දර්ශනයේ සිට තමා පිළිවෙළට තබාගෙන තිබුණ ඩෙස්කය දක්වා තමාට සිතා ගත හැකි සෑම දෙයක්ම ඩැරල් තම දෙමව්පියන්ට පෙන්වූ පසු මෝටර් රථය බලා යන ගමනේ දී ඔවුන් සැලී හෝප් දුටුවා.

"ආ, අර සැලී හෝප් නේද?" රිවර්ස් මහත්මිය කිව්වා. "එයා තමයි, එයාගේ හොඳ පින්තූරයක් තියෙනවා එයාගේ අම්මාගේ කාමරයේ. මම දවසක් එහේ ගිය වෙලාවේ දැක්කා.

"ඔව්, ඒ සැලී" ඩැරල් කිව්වා. "එයාට කතා කරන්න ඕනැද, අම්මා?"

"ඔව්, එයාගේ අම්මගෙන් එයාට පණිවිඩයක් තියෙනවා." රිවර්ස් මහත්මිය කිව්වා. ඒ නිසා ඩැරල් පැහැදිලිව හඬනගා කතා කළා. "සැලි ! සැලී හෝප්, විනාඩියකට මෙහාට එනවද?"

සෑම කෙනෙකුටම ඒ හඬ ඇසුණ නිසා සැලීට ද එය ඇසිය යුතුයි. එසේ වුවද ඇය කිසිදු තැකීමක් කළේ නැහැ. ඇය මල් පඳුරු කිපයක් අතරට පැන අතුරුදහන් වුණා.

"ඔහේ ගියාවේ" ඩැරල් කිව්වා. "මම හිතන්නේ මම කෑගහනවා එයාට ඇහුණා. මම එයාට අපිත් එක්ක එන්න කිව්වා අම්මා. ඒත් එයා කැමති වුණේ නැහැ.

ඩැරල් හා එමිලි රථයට ගොඩවුණා. එමිලි ඉතා සතුටින් පසුවුණා. රිවර්ස් මහත්මිය කදිම කෙනෙක් වූ අතර ඇගෙන් ඈ පිළිබඳව බොහෝ ප්‍රශ්න ඇසුවා. සාමාන්‍යයෙන් බොහෝ දෙනෙක් එමිලි ඇල්මැරුණ කෙනෙකු ලෙස සලකා ඇව නොසලකා හැරියා.

එහෙත් එමිලි ... ලෙස සිතා ...

මහත්මිය කුතුහලයෙන් යුතුව ඈ ගැන දැන ගැනිමට උත්ස... කළා.

එමිලි මැහුම් ගෙතුම්වලට වඩා දක්ෂ බව ඇය ඉක්මනින් අවබෝධ කර ගත්තා. ඇය ඒ ගැන උද්‍යෝගයෙන් කතා කරද්දී ඩැරල් අසා සිටියා. එමිලි එතරම් කතා කරනු ඇය මින් පෙර ... තිබුණේ නැහැ. දෙවියනේ ! ඇය නිම කරමින් සිටින කුෂ... කවරයක් ගැන කතා අහන්න වටිනවා. වර්ණ, ගෙතුම ... හැමදේම.

"එම්බ්‍රොයිඩර් වැඩවලට ඩැරල් කැමති නැති එක ගැන ... නිතරම කලකිරිලා ඉන්නේ" රිවර්ස් මහත්මිය එමිලිට කිව්වා. "මම ඒකට හරි කැමතියි. මමත් ගෙදර පුටු හයකට විතර මගේ අතින් ... කවර අලා තියෙනවා."

"ඕ, ඇත්තද?" එමිලි සතුටින් ඇසුවා. "මමත් කළා. ... තවම දෙකයි. මම ඒ වැඩේට හරිම ආසයි."

"සමහර විට ඔයාට පුළුවන් වෙයි ඩැරල්ටත් ආසාව ඇති කරන්න." හඬනගා සිනාසෙමින් රිවර්ස් මහත්මිය කිව්වා. "අණ්ඩයක් අල්ලන හැටි කියලා දෙන්නත් ගෙදරදී මට ... මහන්සියක් වෙන්න සිද්ධ වෙනවා."

"හරි, එයා කැමති නම් මම ඩැරල්ට මහන හැටි කියලා දෙන්නම්" මේ කදිම රිවර්ස් මහත්මිය සතුටු කරනු පිණිස එමිලි කිව්වා.

ඩැරල් තදින් බියපත් වුණා. දෙවියනේ, ඇය එමිලිව කැඳ... ආවේ ඇයට මැහුම් උගැන්වීමට මව සමග සැලසුම් කිරීමට නොවෙයි. ඇය වහාම මාතෘකාව වෙනස් කර ගොන්ඩොලින් තම මවට හා ආයාට පුරසාරම් දොඩන අයුරු ගැන කතාව පටන් ගත්තා.

වැඩි කලක් ගත නොකොට ඔවුන් වෙරළේ සිට ඩැරල් ... වාරයේ භුක්ති විඳ තිබුණ හොඳම ආහාර වේල ගනිමින් සිටියා. කුකුල් මස් හා අච්චාරු. පාසලේදී අච්චාරු දකින්නට හෝ තිබුණේ



නැහැ. කුඩා බඳුන්වල ... ප්‍රණීතයි. ජැම්පාන් හා අයිස්ක්‍රීම් තැවරූ චොකලට් පෙති. කොතරම් නදිම ආහාර වේලක් ද!

"මේවා කැපිලා යන්න මෙන්න ජින්ජර් බියර්" වීදුරු පුරවමින් රිවර්ස් මහත්මිය කිව්වා. "තව කුකුල් මස්, ඩැරල්. හුඟක් තියෙනවා."

දිවා ආහාරයෙන් පසු නියමිතව තිබුණේ ක්‍රීඩා සඳහා ආපසු යාමයි. එමිලි පිහිනීම සඳහා නොසිටි නිසා තරග නැරඹීමට ඩැරල්ගේ දෙමව්පියන්ට හොඳ තැනක් සොයන බව ඇය පැවසුවා. ආපසු පාසලට ගියපසු ඩැරල් දෙමව්පියන් එමිලිගේ භාරයේ තබා ඇඳුම් මාරු කර ගැනීමට ගියා.

එය ඉතා ප්‍රීතිමත් දවසක් වුණා. සෑම කෙනෙක්ම සැහැල්ලුවෙන් සිටි අතර විහිළු තහළු කර ගැනීම් සෑම දෙසින්ම ඇසුණා. මේ වාරයේ කිසි දිනක නොකර තිබූ පරිදි මම්සලීලා දෙදෙනා ද ඇත්වැල් අල්ලාගෙන එහෙ මෙහෙ ගියා.

පිහිනුම් තරගය ඉතා ප්‍රිය උපදවන්නක් වුණා. ඩැරල්ගේ ශක්තිමත් පිහිනීම, මනරම් කිමිදීම හා නිර්භීතකම දැක රිවර්ස් මහත්මිය මහත් සතුටට පත්වුණා. කුඩා දැරියන් අතුරින් දක්ෂතම එක් අයෙක් ඇය වුණා.



වැඩිමහලු දැරියන්ගෙ [illegible] යෙන් හයවන පන්තියේ ක්‍රීඩා නායිකාව මැරිලින්, කිමිදීමේ මහත් දස්කම් දැක්වූවා. ඇය ඉහළම කිමිදුම් ලෑල්ලේ සිට වැහිලිහිණි පිම්ම කරන විට සෑම දෙනාම ප්‍රීතියෙන් අත්පොළසන් දුන්නා.

"ඔයාටත් ඒ හැමදේම කරන්න පුළුවන්ද, මගේ දුවේ?" ලෑඩි මහත්මිය ගොන්ඩොලින්ගෙන් අසනු ඩැරල්ට ඇසුණා. ඩැරල් හා තවත් කිප දෙනෙකු අසල සිටිනු දුටු ගොන්ඩොලින් තම මව එවැනි අපහසුවට පත්වන ප්‍රශ්න ප්‍රසිද්ධියේ නොඅසන්නේ නම් මැනවැයි සිතුවා.

"ඔව්. හැම එකක්ම නොවෙයි" ඇය කී අතර වින්ටර් මහත්මිය ආදරයෙන් ඇගේ පිටට තට්ටු කළා.

තේ වේලාවේදී ඩැරල් හා එමිලි තම වැඩිහිටියන්ගේ මෙන්ම තමන්ගේ ද පිඟන්වල සෑහෙන පමණ ස්ට්‍රෝබෙරි හා අයිස්ක්‍රීම් පුරවා ගැනීමට වගබලා ගත්තා. එය කොතරම් රසවත් ආහාර වේලක් ද. ඊළඟට තේ. මේවාට අමතරව තව බනිස්, කේක් හා නොයෙක් වර්ගයේ බිස්කට් ද තිබුණා. මෙවැනි දේවල් හොඳින් කිරීමට මැලෝරි ටවර්ස් පාසලට තිබුණේ පුදුම දැනුමක්.

"අම්මා, අන්න ආයෙත් සැලී හෝප් ඉන්නවා." දුරින් වූ සැලීගේ හිස දැක ගත් ඩැරල් හදිසියේම කිව්වා. "මම එයාව විනාඩියකට එක්ක එන්නම්. ඒක නොවෙයි, ඔයා මට කිව්වේ නැහැ එයාට නංගියෙක් ඉන්නවා කියලා ඔයාට වැරදුණා කියන එක. ඔයා එහෙම කිව්වට එයාට නංගියෙක් නැහැ"

"ඒත් දුවේ, ඩැරල්, එයාට නංගි කෙනෙක් ඉන්නවා." ඇගේ මව විමතියෙන් කිව්වා. "මම එයාව දැක්කා."

"හරි. සැලී මොකක්ද මේ කියන්නේ කියලා මම එයා එක්ක කතා කරලා දැන ගන්න ඕනෑ"



# 15

එහෙත් සැලීව සොයා ගැනීම එතරම් පහසු වුණේ නැහැ. ඇය නැවතත් සම්පූර්ණයෙන් අතුරුදහන්ව තිබුණා. සැලී තමාව මඟහරිනවා දැයි ඩැරල්ට සැක පහළ වුණා. නමුත් නැහැ. ඒ කුමක් නිසාද? එයට හේතුවක් තිබිය නොහැකියි.

ඇය සැලී සොයා සෑම තැනම ගියා. ඇය කොහේ දැයි කිසිවෙකු දැන සිටියේ නැහැ. එය අමුතු දෙයක්. මේ වන විට වේලාව ඉකුත්ව යන හෙයින් ගතවන සෑම මොහොතක්ම දෙමව්පියන් සමග රැඳී සිටීම වටිනා නිසා ඇය ආපසු දෙමව්පියන් සොයා ගියා.

"සැලීව හොයා ගන්න නැහැ" ඇය කිව්වා. "එයා සම්පූර්ණයෙන්ම අතුරුදහන් වෙලා. මම එයාගේ අම්මාගේ පණිවිඩය කියන්නම්. ඒ මොකක්ද අම්මා?"

"ඕ, එයාගේ අම්මා සැලී ගැන ටිකක් දුක් වෙනවා. ඒ මොකද මේක එයාගේ පළවෙනි බෝඩිං ඉස්කෝලේ නිසා වගේම සැලී එයාට ලියන්නේ ටිකක් මෝඩ විදිහේ ලියුම් නිසා." රිවර්ස් මහත්මිය කිව්වා. "මම ඔයා ලියපු ලියුම් ටිකක් හෝප් නෝනාට පෙන්නුවා. ඒකට කමක් නැහැනේ දුවේ. ඉතින් එයා හිතනවා සැලීත් ඒ විදිහට හිතලා එයාට ලියුම් ලියනවා නම් හොඳයි කියලා. එයයි මෙයයි අතරේ සම්බන්ධය සම්පූර්ණයෙන්ම දුරස්වෙලා වගේ කියනවා. එයාට ඇත්තටම දුකයි. එයා මට කිව්වේ සැලීව හම්බවෙන්න මේ නිවාඩු දවසේ එන්න බැරිවීම ගැන කනගාටු වෙනවා කියලා කියන්න කියලා"

"මම එයාට කියන්නම්" ව්‍යාකූල වූ ඩැරල් කිව්වා. "ඒත් අම්මේ සමහර දේවල්වලදී සැලී හරි විකාර කරනවා. එයා මට අවංකව, පැහැදිලිවම කිව්වා එයාට නංගි කෙනෙක් නැහැ කියලා. ඉතින් එයාගේ අම්මා ගැන කියද්දී එයාට හුඟක් තරහා යනවා. එයා මට බනිනවා මම අනුන්ගේ දේවල්වලට හොට දානවා කියලා"

"හරි... ඒක එයා විහිළුවට කරනවා වෙන්න පුළුවන්" මිදෑ
වත්‍යාකූල වුවද රිවර්ස් මහත්මිය කිව්වා. "සැලී කොහොමත් දන්නවා
ගෙදර එයාට චූටි නංගි කෙනෙක් ඉන්නවා කියලා. ඒ නිසා
හෝප් නෝනාට සම්පූර්ණ කාලය බබා වෙනුවෙන් කැප කරන්න
සැලීව බෝඩිං ඉස්කෝලයකට එවලා තියෙන්නේ. ඒක ආදරයෙන්
කරන දෙයක්"

"ඇයි ඉතින් තවත් තරහින් වගේ?" ඇගේ පියා සරදමක්
මෙන් ඇසුවා. ඔහුගේ දිලිසෙන ඇස් දුටු ඩැරල් ලැජ්ජාවෙන්
රතුවුණා.

"ඔ, ඩැරල්. දැන් තරහා යන්නේ නැහැ නේද?" ඇගේ මව
කුතුහලයෙන් ඇසුවා.

ඩැරල් වෙනුවෙන් එමිලි පිළිතුරු දුන්නා. "ඔ, එයා මේ
ළඟදි දවසක පිහිනුම් තටාකයේ දී තරහින් පුපුරණ කෙනෙකුට
හොඳ පාරවල් ටිකක් දුන්නා. කුලුනේ උඩටත් සද්දේ ඇහෙන්න
ඇති"

"ඩැරල්" කම්පනයට පත්ව ඇගේ මව කතා කළා. ඩැරල්
මඳ සිනාවක් නැගුවා.

"ඒක නරකයි කියලා මම දන්නවා. ආයෙත් නම් මම එහෙම
කරන්නේ නැහැ. දැන් මට තරහා පාලනය කර ගන්න පුළුවන්"

"අපි ඔක්කෝටම ඔය කියන ළමයාට පාරක් දීගන්න ඕනෑ
වෙලා තිබුණේ" එමිලි කිව්වා. "අපි හැමෝම ඒ ගැන රහසේ සතුටු
වුණා."

ඔවුන් හැමෝම සිනාසුණා. තමා නැවත කිසිදින තේරී
ගන්නේ නැති බව සිතමින් ඩැරල් සතුටට පත්වුණා. මෙවැනි
දිනයක් නිමාවට පැමිණීම කොතරම් දුකක් ද !

එහෙත් එය නිමා වුණා. සවස හයවන විට සියලුම මෝටර්
රථ මාවත ඔස්සේ පිටත්වීම ආරම්භ කළා. ඒ අතර දැරියෝ දෑ
උනන්දුවෙන් අත් වනමින් වැඩිහිටියන්ට සමු දුන්නා. ඔවුන්ගේ
දෙමව්පියන් එකිනෙකා බැගින් වෙන්ව යද්දී උද්‍යෝගීමත් කෑගෑ
ගැසීම් අඩු වන්නට වුණා. දැරියෝ තම තමන්ගේ පොදු කාමරවල



ගොස් දවසේ සිදුවීම් ගැන කතා කරන්නට පටන් ගත්තා.

ටික වේලාවක් ගත වූ පසු තමා සැලී හෝප්ට කිවයුතු
ප්‍රණිවිධය ගැන ඩැරල්ට සිහිවුණා. ඇය පොදු කාමරය සිසාරා
බැලුවා. සැලී එහි සිටියේ නැහැ. ඇය කොහිද? ඇය නිතර
අතුරුදහන් වන බවක් පෙනෙන්නට තිබුණා.

"සැලී හෝප් කොහේ ද?" ඩැරල් ඇසුවා.

"මම හිතන්නේ එයා සංගීත පන්ති කාමරයක" කැතරින්
කිව්වා. "පාඩම් නැතිව අද පුහුණුවීම් කරන්න එයාට ඕනෑ වුණේ
ඇයි කියලා දෙවියෝ තමයි දන්නේ."

"මම ගිහින් බලන්නම්" කී ඩැරල් පිටතට ගියා. දැරියෝ
සෑම දින පුහුණුවීම් කරන සංගීත කාමර බලා ඇය පිටත් වුණා.
ඒවා කුඩා කාමර වූ අතර පියානෝවක්, මිටි බංකුවක් හා පුටුවක්
පමණක් එහි තිබුණා.

එවන් කුඩා කාමර දෙකකින් සංගීතය නිකුත් වුණා. ඉන්
පළමුවැන්නට එබී බැලූ ඩැරල් අයිරින් එහි සිටිනු දුටුවා. අයිරින්
කරමින් සිටි වාදනය මධුර තාලයක් නොවුණේ ඇය ඇඟිලි සඳහා
කළ අභ්‍යාසයක් හෙයින් තරමක ඒකාකාරී නාදයක් නැංවීම නිසයි.
එය ඩැරල් දන්නේ නැහැ. මඳ සිනාවක් පෑ ඩැරල් දොර වසා
දැමුවා. අයිරින් සැබෑ ලෙස සංගීතයට උමතු වූ අයෙක්.

සංගීතය නිකුත් වන ඊළඟ කාමරයට ඇය ආවා එය
ඇඟිලිවලට අභ්‍යාස ලබාදෙන සරල වැයුමක් ලෙස පෙනුණේ
නැහැ. අයිරින් මෙන් ඇඟිලි පහෙන්ම නංවන ඒකාකාරී නාදයක්
නොව ඉන් නැගුණේ තරමක කෝප බවක් දක්වන නාදයකුයි.

ඩැරල් දොර විවර කළා. සැලී කලබලයක් නැතිව එහි සිටියා.
ඇතුළතට වැදුණ ඩැරල් එහි දොර වසා දැමුවා. ආපසු හැරුණ
සැලී සැර පරුෂ ලෙස කඩා පැන්නා.

"මම පුහුණු වෙනවා" ඇය කිව්වා. "එළියට යනවා"

"මොකද වෙලා තියෙන්නේ?" ඩැරල් ඇසුවා. ඇයගේ සිත
බොහෝ සේ රිදුණා. "ඔයා ඇයි මගේ ඇඟට කඩා පනින්නේ.

මම දවස පුරාම ඔයාව හෙව්වා. අපේ අම්මාට ඕනෑ වුණා ඔයා... කතා කරන්න."

"හරි, මට එයාට කතා කරන්න උවමනාවක් නැහැ" කී සැලී පියානෝවේ ඒ මේ අත ඇඟිලි ගෙනියන්නට වුණා. ඉන්පසු කෝප... මුසු හඬක් නැඟුණා.

"හරි, ඇයි මගේ අම්මාට කතා කරන්න ඕනෑ නැත්තේ" ඩැරල් කෝපයෙන් ඇසුවා.

"ඔයාලගේ අම්මා කියපු පණිවිඩයක් කියන්න එයාට ඕනෑ වුණා."

පිළිතුරක් ලැබුණේ නැහැ. මීට පෙර සේම හඬ නඟමින් සැලීගේ ඇඟිලි වේගයෙන් පියානෝවේ ඒ මේ අත ගියා. ඩැරල්ගේ ඉවසීමේ සීමාව පැන්නා.

"ඕක නවත්වනවා." ඇය කෑ ගසා කිව්වා. "මේ විදිහට නපුරු වෙන්න එපා. ඔයාට මොකද වෙලා තියෙන්නේ."

සැලී පියානෝ පැඩලයට තදින් පය තදකර හැකි උපරිමයෙන් පියානෝව හඬ නැංවූවා. පැහැදිලිවම ඇය කිසිදු වචනයක් ඇසීමට සූදානම් නැහැ.

ඈ අසලට සමීප වූ ඩැරල් ඇගේ කනට මුව තබා නැ... ඇසුවා. "ඇයි ඔයාට නංගි කෙනෙක් නැහැ කියන්නේ? ඒ නිසා තමයි ඔයාගේ අම්මාට ඔයා බලන්න එන්න බැරි ! එයා ඔයාව ආදරයෙන් මතක් කරන්න කියලා තියෙනවා. ඒ වගේම...."

සැලී පියානෝව වෙතින් වේගයෙන් හැරුණා. ඇගේ මුහුණ සුදුමැලිව අමුතුම පෙනුමක් ගත්තා. "කට වහනවා" ඇය කිව්වා. "අනුන්ගේ දේවල්වලට හොටදාන කෙනා. මට ඉන්න දෙනවා... දවස පුරාම අම්මා එක්ක ඇවිටි ඇවිටි ඉඳලා මට ලොකුකම් පෙන්වන්න එනවා. මට තමුසේව පේන්න බැහැ"

"තමුසෙට පිස්සු" ඩැරල් කෑ ගසා ස්වර පැටලී අමුතු හඬක් නැගෙන පරිදි අතින් පියානෝ ඉත්තන්ට වේගයෙන් ඔබා ඇම්බා... "මම මොනවා හරි කියද්දි අහන්න බැහැ. ඒත් අහගන්නවා...



තමුසේගේ අම්මා අපේ අම්මාට කියලා තියෙනවා තමුසේ වීකාර මෝඩ ලියුම් ලියනවා කියලා. එයා කියනවා ....."

"මම අහන්නේ නැහැ" උගුර හිරවූ ස්වරයකින් කී සැලී වහා අසුනින් නැගී සිටියා. ඇය අන්ධයෙකු මෙන් ඩැරල්ව පසෙකට තල්ලු කර දැම්මා. එහෙත් තමා කෝපව සිටින විටක තමාව ඇල්ලීම ඩැරල්ට දැරිය නොහැකි වූ අතර ඇය මුළු වෙර යොදා ආපසු තල්ලු කළා. ඇය ශක්තිමත් කෙනෙක් නිසා සැලී කාමරය හරහා උඩින් විසි වී ගියා. ඇය පුටුවක් මතට ඇදගෙන වැටුණ අතර ඇය මොහොතක් එසේම සිටියා.

ඇය තම දෑත කුස මත තබා ගත්තා. "ඕ, රිදෙනවා" ඇය කිව්වා. "ඕ, තමුසේ නපුරු කෙල්ල, ඩැරල්"

සැලී වැනෙමින් කාමරයෙන් පිටතට යනතුරුත් ඩැරල් කෝපයෙන් වෙවුලමින් සිටියා. එහෙත් ඒ වහාම ඇගේ කෝපය සංසිඳුනා. විශාල භීතියක් ඇගේ සිත වසා පැතිරුණා. ඇය එතරම් අප්‍රසන්න ලෙස බිහිසුණු වූයේ කෙසේ ද? සැලී අසාමාන්‍ය, අනුවණ හා බියපත් අයෙක්, එය ඇත්තක්. එහෙත් ඩැරල් තම ශක්තිය යොදා ඇයව රිදවා තිබුණා. මීට ටික වේලාවකට ඉහත තම කෝපය පාලනය කර ගන්නා බවට දෙමව්පියන් ඉදිරියේ පුරසාරම් දෙඩූ ඇය නැවත ඉක්මන් කේන්තිකාරියක් වී තිබුණා.

සැලී පසුපස ගොස් සමාව අයැදීමට උනන්දුවෙන් ඇය දොර වෙතට දිව්වා. එහෙත් සැලී පෙනෙන්නට සිටියේ නැහැ. ඩැරල් ආපසු පොදු කාමරයට දිව ගියා. එහි ද සැලී සිටියේ නැහැ. පුටුවක වාඩි වූ ඇය තම උණුසුම් නළල අතගෑවා. පුදුම සිද්ධියක් ! කොතරම් පිළිකුල් ද? ඇයි ඇයට තම කෝපය පාලනය කරගත නොහැකි වුණේ ?"

"මේ මොකද?" ඇලිසියා ඇසුවා.

"ඕ. ඒතරම් දෙයක් නොවෙයි. සැලීගෙන් පොඩි කරදරයක් එච්චරයි. මට තරහා ගියා" ඩැරල් කිව්වා.

"මෝඩි" ඇලිසියා කිව්වා. "මොනවද ඔයා කළේ? පාරක් දුන්නද?"

ඩැරල්ට සිනාසිය නොහැකි වුණා. ඇය කඳුළු සැලීමට ආසන්නව සිටියා. එතරම් ප්‍රියකරු දිනයක කොතරම් බියකරු අවසානයක් ! සියලු සුන්දර දේවල අවසානයේ හදිසි රණ්ඩුවක් ඇයට මහත් වෙහෙසක් දැනුණා. මැහුම් වැඩක් ද ගෙන එළියට පැමිණෙන විට ඇය එතරම් මනාප වූයේ නැහැ.

කොයි මොහොතක හෝ සැලී පොදු කාමරයට එනු ඇතැයි ඩැරල් බලා සිටියා. එවිට ඈ වෙතට ගොස් තමා කනගාටු වන බව කීමට ඇයට පුළුවන් වනු ඇත. ඇය තමා ගැනම ලැජ්ජා වන අතර එය දුරුකර ගත හැක්කේ සැලී සමග කතා කිරීමෙන් පමණයි. අපොයි දෙවියනේ ! තමා නොදැනුවත්වම හදිසියේම කෝපයට පත්වීම කොතරම් අමිහිරි දෙයක් ද? එවැනි තරහායාමක් ඇති විට කෙනෙකුට කළ හැක්කේ කුමක් ද?

සැලී පොදු කාමරයට ආපසු පැමිණියේ නැහැ. රාත්‍රී කෑම සඳහා සීනුව නාද වූ අතර දැරියන් භෝජන ශාලාවට රොක් වුණා. ඩැරල් නැවතත් සැලී සොයන්නට පටන් ගත්තා. එහෙත් එහි ඇය සිටියේ නැහැ. සැබැවින්ම මෙය අමුතුම දෙයක්.

හිස් ආසනයක් ඇති බව පොට්ස් ගුරුතුමිය දුටුවා. "කවුද නැත්තේ ?" ඇය ඇසුවා.

"සැලී හෝප්" ඩැරල් කිව්වා. "මම අන්තිමට එයා සංගීත කාමරයක ඉන්නවා දැක්කා. පැයකට විතර ඉස්සර"

"හොඳයි, ගිහින් එයාව එක්ක එන්න." පොට්ස් ගුරුතුමිය නොඉවසිල්ලෙන් කිව්වා.

"ඕ, මම එතැන ඉද්දි එයා එළියට ගියා." ඩැරල් කිව්වා. "මම දන්නේ නැහැ එයා කොහෙද ගියේ කියලා"

"එහෙනම් එයා නැතිව අපි පටන් ගනිමු." ගුරුතුමිය කිව්වා. "එයාට සීනුව ඇහෙන්න ඇතිනේ"

ඔවුන් ගත කළ දිනය ගැන දැරියෝ දොඩමලු වන්නට වුණා. ඩැරල් පමණක් නිහඬව සිටියා. දුකට පත්ව සැලී කොහේ හෝ ඉන්නවා ඇත් ද? ඇයට කුමක් සිදුවී ඇත් ද? සමහර අවස්ථාවල ඇය එතරම් අමුතු ඇයි ? ඇය යමක් ගැන දුකින් පසු වෙනවාද



මේරි ලෝව් හඬනගා නාසයෙන් හුස්ම ඉහළට ඇද්දා.

"ඔයාගේ ලේන්සුව කොහේ ද?" පොට්ස් ගුරුතුමිය ඇසුවා. "ඔයාට ලේන්සුවක් නැද්ද? ඕ, මේරි ලෝව් නිතරම තමා ළඟ ලේන්සුවක් තියෙන්න ඕනෑ කියලා දන්නවානේ. දැන්ම ගිහින් එකක් හොයාගෙන එන්න. මට ඔය ඉහළට ඇදිල්ල පේන්න බැහැ"

පන්ති කාමරයෙන් පිටතට පැනගත් මේරි ලෝව් තරප්පු දිගේ ඉහළට නැග්ගා. සෑහෙන වේලාවක් ගත වන තුරු ඇය ආපසු පැමිණියේ නැහැ. පොට්ස් ගුරුතුමිය නොඉවසිලිමත් වුණා.

"ඇත්තෙන්ම ! මුළු හැන්දෑවේම මේරි ලෝව් ලේන්සු හොයනවා වගේ."

දුව එන පා හඬක් නැගුණ අතර භෝජනාගාරයේ දොර ගැස්සී විවෘත වුණා. වෙනදාට වඩා බියපත් පෙනුමකින් යුතුව මේරි ලෝව් ඇතුළතට පැමිණියා.

"මිස් පොට්ස් ! මි.. මිස් පොට්ස් ! සැලීව හම්බවුණා. එයා නිදන කාමරයේ නිඳි. එයා අමාරුවෙන් කෙඳිරි ගානවා."

"කෙඳිරි ගානවා ?" ඉක්මනින් නැගිටිමින් පොට්ස් ගුරුතුමිය ඇසුවා. "එයා බඩ අල්ලාගෙන "ඕ, මගේ බඩ" කියලා අමාරුවෙන් කෙඳිරි ගානවා." කඳුළු සලමින් අසරණ මේරි ලෝව් කිව්වා. "ඕ, මිස් පොට්ස්, අනේ .... ! ගිහින් බලන්න එයා මා එක්ක කතා කළේවත් නැහැ"

"ළමයි, ඔයාලා කෑම කන්න." කඩිමුඩියේ පොට්ස් ගුරුතුමිය කිව්වා. "සැලී ඕනෑවට වඩා ස්ට්‍රෝබෙරියි, අයිස්ක්‍රීමුයි කාලා වගේ. කැතරින් කරුණාකරලා ගිහින් මේට්‍රන්ට කියන්න එයාගේ නිදන කාමරයට එන්න කියලා"

ඇය කාමරයෙන් වහා පිටවුණා. දැරියෝ බියපත් මේරි ලෝව්ගෙන් නොයෙක් ආකාරයේ ප්‍රශ්න අසමින් කතාව පටන් ගත්තා. ඇගේ හදවත පුරා භීතියක් වෙළෙන අතරේ ඩැරල් පමණක් නිහඬව වාඩිවී සිටියා.

ඇය සැලීව තල්ලුකර දමා තිබුණ අතර සැලී පුටුවක් උඩට වැටී තිබුණා. ඒ වේලාවෙහි ඇගේ කුසේ වේදනාවක් හටගන්නට

ඇත. "උයි රිදෙනවා" යනුවෙන් ඈ කී ආකාරය ඩැරල්ට සිහිවුණා. ඒ වැඩිපුර ස්ට්‍රෝබෙරි හා අයිස්ක්‍රීම් කෑම නිසා විය නොහැක. මේ කරදරයට හේතුව විය හැක්කේ ඩැරල්ගේ ඉක්මන් කෝපකාරී බවයි.

ඩැරල්ට තව දුරටත් ආහාර ගත නොහැකි වුණා. ඇය පොදු කාමරයට ලිස්සා ගියේ හුදෙකලාව කල්පනා කිරීමටයි. ඒකාන්තයෙන්ම සැලීට මහත් අසාධ්‍ය තත්ත්වයක් සිදුව තිබිය නොහැක. සමහර විට සුළු සීරීමක් විය හැක. ඒකාන්තයෙන්ම පොටිස් ගුරුතුමිය පැමිණ සතුටින් සුබ ආරංචියක් පවසනු ඇත. "හොඳයි, හොඳයි ! කොහොම වුණත් සැලීට ලොකු අමාරුවක් නැහැ"

"ඔ, එයා එහෙම කිව්වොත් ! එයා එහෙම කියයි" තමාටම කියාගත් අසරණ ඩැරල් පොටිස් ගුරුතුමියගේ ඉක්මන් අඩි හඬ ඇසීමට නොඉවසිල්ලෙන් හා කුතුහලයෙන් යුතුව මග බලන්නට වුණා.



# 16

රාත්‍රී ආහාරයෙන් පසුව දැරියන් පොදු කාමරයට රැස්වුණා. නින්දට යාමට පෙර ඔවුන්ට පැය භාගයක් තිබුණා. ප්‍රීතිමත් දිනයෙන් පසුව ඔවුන් වෙහෙසට පත්ව සිටි අතර සමහරෙක් ඒ වන විට ද නිඳිබරව සිටියා.

ඇලිසියා ඩැරල් දෙස විමතියෙන් බැලුවා. "මොකද මූහුණ එල්ලාගෙන?" ඇය ඇසුවා.

"මම කල්පනා කළේ සැලී ගැන" ඩැරල් කිව්වා. "මම හිතනවා එයාට ඒතරම් අමාරුවක් නැහැ කියලා"

"ඇයි ඒතරම් අමාරු වෙන්නේ ?" ඇලිසියා ඇසුවා. "හුඟක් අයට ස්ට්‍රෝබෙරි කාපුවාම බඩේ කැක්කුම හැදෙනවා නැතිනම් පලු එනවා. මගේ අයියා කෙනෙකුටත් එහෙම වෙනවා."

ඇලිසියා ඇගේ පවුලේ ඉතිහාස කතාවකට බැස්ස අතර ඩැරල් නිහතමානීව අසා සිටියා. ගොන්ඩොලින් නිතර කළ ආකාරයට ඇලිසියා තම පවුල ගැන පුරසාරමින් යුතුව කතා කළේ නැහැ.

නින්දට යාමේ සීනුව නාද වූ අතර පළමු හා දෙවැනි පන්තිවල දැරියෝ තමන් අත තිබූ දේවල් ඉක්මනින් තැබුවා. නින්දට යන වේලාවේ දී ගාටනු දැකීම නේවාසිකාගාර පාලිකාව එතරම් ඉවසුවේ නැහැ. කඩිනම් කරවීමට බැරි තරම් දැරියන් විශාල සංඛ්‍යාවක් සිටියා.

පොටිස් ගුරුතුමිය ආපසු පැමිණ තිබුණේ නැහැ. නොඉවසිල්ල නැවතත් තමාව වෙළාගන්නා බව ඩැරල්ට දැනුණා. පාලිකාව මේ ගැන යමක් දන්නවා විය හැක. ඇය පාලිකාව හමුවීමට තීරණය කළා.

එහෙත් පාලිකාව එහි සිටියේ නැහැ. එහි සිටියේ මම්සලීයි. ඔවුන් සියලු දෙන එදින අත්විඳි ප්‍රීතිමත් දිනය හේතුවෙන් සෑම

කෙනෙක් සමගම ප්‍රියමනාපව සිනාසුණා. මම්සලී සතුටු ලීලාවකින් පසුවුණා.

"ආයුබෝවන්, මම්සලී ! මේට්‍රන් කොහේ ද?" විමතියට පත් ඩැරල් ඇසුවා.

"සැලී හෝප් ළඟ" මම්සලී කිව්වා. "අපොයි, අහිංසක ළමයා එයාට හුඟක් අමාරුයි."

"එයා අසනීප කාමරයේ. එයාට හොඳටම අසනීපයි." මම්සලී නැවතත් කිව්වා. අනතුරුව අතිශයෝක්තියට වඩා කැමති ඇය එක් කළ තවත් වැකි කිපයක් නිසා ඩැරල්ගේ හදවත පහතටම කඩා වැටුණා. "ඒ ළමයාගේ බඩ... ඔව්, බඩ තමයි හොඳටම රිදෙන්නේ"

"අපොයි" ඩැරල්ට කියවුණා. "ඒකට... ඒකට හේතුව මොකක්ද කියලා දන්නවාද? සැලී කොහේ හරි වැටිලා ද?"

මම්සලී එය දැන සිටියේ නැහැ. "ඒ ස්ට්‍රෝබෙරි හෝ අයිස්ක්‍රීම් නිසා නොවෙයි කියන එක මම දන්නවා" ඇය කිව්වා. "ඒ මොකද සැලී ඒවා කෑවේ නැහැ කියලා මේට්‍රන් එක්ක කියලා තියෙනවා."

ඒ ඩැරල්ගේ දැඩි තල්ලු කිරීම හා ඒ නිසා වැටීම නිසා සිදුවූ දෙයක් බව දැන් තවත් තහවුරු වෙනවා. අහිංසක ඩැරල් ! ඇය ඉතා අවාසනාවට පත් වූ අතර මම්සලීගේ තියුණු බැල්මට ඇගේ මැලවුණ මුහුණ අසුවූ හෙයින් තවත් දැරියක් අසනීප වීමට යන්නේ දැයි ඇයට සිතුණා.

"ඔයාට අසනීපයක් නැහැ නේද, පුංචි ඩැරල්?" ඇය සානුකම්පිත කටහඬකින් ඇසුවා.

"ඔ, නැහැ ස්තුතියි." විමතියට පත් ඩැරල් කිව්වා. "මට හොඳටම සනීපයි. නිකම් මහන්සිය විතරයි, මම හිතන්නේ"

එදින රාත්‍රියේ ඩැරල්ට නින්ද ගියේ නැහැ. සිදුව තිබූ දෙය ගැන ඇය මහත් භීතියට පත්ව සිටියා. ඇයට එතරම් තදින් කේන්ති ගියේ කොහොමද? එලෙස ඇය සැලීට කඩා පැන්නේ කොහොමද? ඇය සැලී උඩින් විසි වෙන්නට තල්ලු කළේ කොහොම ද?" ඇය සිතන්නට වුණා.



දැන් සැලී සිටින්නේ අසනීපව මහත් වේදනාවක. ඩැරල්ගේ ඉක්මන් කෝපය ගැන ඇය යමක් කියා ඇති ද? ශ්‍රේලින් මහත්මියට දැනුම් දුන්නොත් ඇය කුමක් කරනු ඇති දැයි යන සිතුවිල්ලත් සමග ඇගේ සිරුර සීතල වන්නට වුණා.

* * * * * * *

එය ඉරිදාවක්. එදින ඩැරල් දැඩි දුකකින් පසු වූ අතර කිසිවෙක් ඇයව ඉන් මුදවා ගත්තේ නැහැ. ඇය අසනීප වීමට යනවා දැයි සැක සිතූ පොටිස් ගුරුතුමිය විමසිලිමත් ඇසක් ඈ වෙත රඳවා ගත්තා. දුකට පත් මේරි ලෝව් යම් අයුරකින් උදව් කිරීමට සිතමින් ඈ අවට ගැවසුණා. එමෙන්ම පළමු වතාවට ඩැරල් ඇයට කරුණාවන්තව සැලකූ අතර දෙස් තගා පන්නා දැමුවේ නැහැ. ඇයට මේරි ලෝව්ගේ ඇලුම් කිරීම හා දයාව මහත් සහනයක් වුණා.

එදින සැලීව බැලීමට වෛද්‍යවරු දෙදෙනෙක් පැමිණුණා උතුරු කුලුනේ නිවාස තුළ මේ ප්‍රවෘත්තිය පැතිරුණා. "එයාට හුඟාක් අමාරුයි. ඒත් ඒක බෝවෙන දෙයක් නොවන නිසා අපිව වෙන් කරලා තියන්නේ නැහැ; ටෙසී කිව්වා අද එයා ප්‍රින්සිපල් මැඩම් හම්බ වෙන්න ගිය වෙලාවේ එයාට ඇහුණලු උඩ කාමරයේ සැලී කෙඳිරි ගානවා."

එදින තමා සමග මව සිටිනවා නම් යැයි ඩැරල් පැතුවා. එහෙත් තම දෙමව්පියන් කොහේ ගොස් තිබුණේ දැයි ඇය දැන සිටියේ නැහැ. ඔවුන් කොහේ හෝ යන බවක් කියා තිබුණ ද පෙර දා තිබූ දැඩි සතුට නිසා ඇයට එය අමතකව තිබුණා. මුහුද අසල ගල්තලාවේ කොනක වාඩි වූ ඇය කල්පනා කරන්නට වුණා.

කළ වැරැද්ද කීමට ඉදිරිපත්වීමට තරම් තමා නිර්භීත බව දැන සිටියදීත් පාසලින් අස් කරන බියට එසේ තමා බියගුල්ලියක් බව සිතමින් ඇයට තව දුරටත් බියගුල්ලියක් වී සිටීමට නොහැකි වුණා. එහෙත් ඇය එය කිවයුත්තේ කාටද?

"මම සැලීගේ අම්මට ලියලා යැව්වොත් හොඳයි" ඇයට සිතුණා. සැලීට වඩාත් සමීප ඇයයි. රණ්ඩුව ගැනයි, ඒක සිද්ධ වුණේ කොහොමද කියන එකයි හැමදේම මම එයාට ලියලා

යවනවා. එයාට නංගි කෙනෙක් නැහැ කියලා සැලී කියන හැටියි මම එයාට ලියනවා. මේක සම්පූර්ණයෙන්ම අමුතු දෙයක් වුණත් හෝප් නෝනා තේරුම් ගනියි. එතකොට එයා කැමති දෙයක් හෝප් නෝනාට කරන්න පුළුවන්. ඔනෑ නම් ප්‍රින්සිපල්ට කියයි. මම හිතන්නේ අපොයි ! ඒත් ඒක කළාම මට සහනයක් දැනෙයි.'

ගල් තලාවෙන් නැගී සිටි ඇය ආපසු උතුරු කුලුන වෙතට ගියා. ලිපුම් ලියන පොත ගත් ඇය ලිවීම ආරම්භ කළා. එය රචනා කිරීමට අපහසු ලිපියක් වුවද ලිවීම නිතර පහසු දෙයක් වූ ඩැරල්. හෝප් මහත්මියට සියල්ල ලියන්න වුණා. දබරය, එයට හේතු වූ දෙය, සැලී රිවර්ස් මහත්මියට කතා කිරීමට ප්‍රතික්ෂේප කිරීම හා ඇය කොතරම් අසතුටින් ඉන්නවාද යන වග. තමා සැලී ගැන කොතරම් දේ දන්නවාද යන්න දැන ගත් විට ඇය මහත් පුදුමයට පත්වනු ඇත !

ලිපිය අවසන් කළ වහාම ඇයට මහත් සහනයක් දැනුණා. ඇය එය නැවත කියවූවේ නැති නමුත් ලිපි කවරයේ මුද්දරයක් ඇලවූ ඇය වහාම එය තැපැල් කළා. ඊළඟ උදයේම හෝප් මහත්මියට එය ලැබෙනු ඇත.

ඉන්පසුව තවත් කටකතාවක් උතුරු කුලුනේ පැතිරුණා. "සැලීගේ තත්ත්වය බරපතළ වෙලා ! විශේෂඥයෙක් එනවා එයාව බලන්න. එයාගේ ගෙදර අයට ටෙලිග්‍රෑම් ගහලා ! එයාලා හෙට එනවා !"

එදින ඩැරල්ට කිසිසේත් කෑම ගැනීමට නොහැකි වුණා. එය ඇය ගතකර තිබූ දීර්ඝම දිනයයි. ඩැරල්ගේ දූකට පත් මුහුණ දැක මේරි ලෝව් බියපත් වුණා. ඩැරල් මෙතරම් අවාසනාවන්ත පෙනුමෙන් සිටිනුයේ ඇයි දැයි මේරි ලෝව් දැන නොසිටි අතර එය ඇසීමට තරම් ඇය එඩිතර වූවේ නැහැ. තම දුර්වලකම හා දුබලකම් ගැන ඩැරල් කරන අවමාන හා සමච්චල් අමතක වූ ඇයට ඩැරල්ට උදව් කිරීමට අවශ්‍ය වුණා.

පොට්ස් ගුරුතුමිය ඒ වන විටත් ඩැරල් වෙත විමසිලිමත් ඇසක් යොමා සිටියා. ඇයට කුමක් සිදුවීද? සැලීගේ අසනීපය ද ඇගේ සිතට වද දෙන කාරණය? එය විය නොහැකියි. ඇය සැලී



සමග එතරම් මිත්‍රශීලීව සිටියේ නැහැ. කිසිවෙක් සැලී සමග මිතුරුව සිටියේ නැහැ.

අවසානයේ නින්දට යන වේලාව එළඹුණා. සැලීට තදබල ලෙස අසනීප බව හැර වෙනත් දෙයක් කීමට නේවාසිකාගාර පාලිකාව දැන සිටියේ නැහැ. ඇයව බැලීමට කිසිවෙකුට අවසර තිබුණේ නැහැ. මොහොතකට දෙකකට ඇව බැලීමට යාමට ඩැරල් අවසර ඉල්ලා ආයාචනා කළ විට පාලිකාව කම්පනයට පත්වුණා.

කල්පනා කරමින් ඩැරල් ඇඳේ වැතිර සිටියා. තුන්වන හා හතර වන පන්ති නින්දට පැමිණුණා. පස්වන පන්තිය පැමිණි පසු හය වන පන්තිය. ඉන්පසුව පාලිකාව. මම්සලි හා පොට්ස් ගුරුතුමිය ද පැමිණුණා. විදුලි පහන් නිවන හඬ ඩැරල්ට ඇසුණා. බොහෝ ද බෝව් තිබුණා. පිටත තිබුණේ ඝන අඳුරක්. ඩැරල් හැර සෑම දෙනාම තද නින්දේ පසුවුණා.

"හිත හිතා මට මේ විදිහට ඉන්න බැහැ" දෙමිනස් වූ ඩැරල් තමාටම කියා ගත්තා. ඇය පොරෝනා පසෙකට ගසා දැමුවා. "මට පිස්සු හැදෙයි. මම නැගිටලා මැද මිදුලට යනවා. රෝස මල්වල සුවඳ හමනවා ඇති. ටිකක් සීතලේ ඉඳලා ආවාට පස්සේ නින්ද යයි."



උඩු ගවුම දමා ගත් ඇය නිහඬව නිදන කාමරයෙන් පිටවුණා. කිසිවෙක් සෙලවුණේ හෝ නැහැ. පුළුල් තරප්පු පෙළ බැස ගිය ඇය මැද මිදුලට පිවිසුණා. අනතුරුව, රාත්‍රී නිහඬ බව තුළින් කන්ද නැග මැලෝරි ටවර්ස් බලා එන මෝටර් රථයක හඬ ඇයට ඇසුණා. එය පිටත නැවතුණා. ඒ කවුරුන් විය හැකි ද? මේ දෙගොඩහරි යාමයේ ? ඩැරල් අසනීප කාමරයේ ජනේල වෙතට බැල්මක් හෙළුවා. එහි දීප්තිමත් ආලෝකයක් දැල්වී තිබුණා. සැලි නිදා සිටිනවා විය නොහැක. එසේ නම් එහි තිබිය යුත්තේ මැද ආලෝකයකි. දැන් කුමක් සිදුවෙනවා විය හැකිද? අපොයි, ඇයට දැනගත හැකි නම් !

මැද මිදුලින් පිටතට පිවිසෙන ආරුක්කු දොරටුවෙන් පිටතට ඩැරල් සෙමින් පිවිසුණා. ඔව්, කළු පැහැ මෝටර් රථයක් එහි තිබූ අතර කිසිවෙක් සිටියේ නැහැ. එහි පැමිණි පසු කවුරුන් හෝ පාසල තුළට ගොස් තිබුණා. ප්‍රධානියාගේ ගොඩනැගිල්ලට පිවිසෙන දොරටුව වෙතට ඩැරල් ගියා. කවුරුන් හෝ එය ඇර දමා තිබුණා. දොර තල්ලු කර ඇය ඇතුළට වැදුණා. දැන් සිදුවන්නේ කුමක් ඇයි ඇයට දැක බලා ගත හැකියි.



# 17

පිටත ශාලාවේ කුඩා එළියක් දැල්වුණා. විදුහල්පතිනියගේ කාමරය අඳුරේ ගිලී තිබුණා. විදුහල්පතිනිය ඉහළ මාලයේ අසනීප කාමරයේ බව පැහැදිලිව පෙනුණා. ඩැරල් නිහඬව උඩු මහලට නැග ගත්තා. සෑම තැනම දීප්තිමත්ව එළි දැල්වුණ අතර කඩිමුඩියක් ඇති බව පෙනුණා. අසරණ සැලීට කුමක් සිදුවෙනවා විය හැකි ද?

සිදුවන්නේ කුමක් ඇයි ඩැරල්ට තේරුම් ගත නොහැකි වුණා. මධ්‍යම රාත්‍රියේ මෙතරම් පිරිසක් කලබලවීමට තරම් සැලි තදින් අසනීපව සිටිනවා විය හැක. ඩැරල්ගේ හදවත බරවුණා. කවුරුන් හෝ දකිවි යන සැකය නිසා ඩැරල්ට තව දුරටත් ඉදිරියට යාමට නොහැකි වුණා. එහෙත් ඇය තමා සිටින තැනම නැවතී සිටිය යුතුයි. ඇය යමක් දැන ගත යුතුයි. සිදුවන්නේ කුමක් ඇයි දැන ගන්නේ නැතිව ඇයට නින්දට යාමට නොහැකි වුණා. එය ඇයට කෙසේවත් කළ නොහැකියි.

ජනේලයක් අසලට ගිය ඇය තිරය පිටුපසට වී එක් කාමරයක සිට තවත් කාමරයකට කඩිමුඩියේ යමින් කතා කරන අයෙකු කියන දේ අසා ගැනීමට තදින් සවන් යොමු කළා. ඒ නේවාසිකාගාර පාලිකාවගේ කටහඬ. උතුරු කුලුනේ පාලිකාව! තවත් කටහඬක් පැමිණි අතර ඒ අසනීප කාමර භාර පාලිකාව ඉක්මන් තියුණු ස්වරයකින් යමක් නියෝග කරන හඬ. පිරිමි කටහඬක් ද නැගුණ අතර ඩැරල් තම හුස්ම අල්ලාගෙන අබිරහස් හඬවලට සවන් දුන්න ද ඇයට එක් වචනයක් හෝ තේරුණේ නැහැ.

පැය භාගයක් පමණ ඇය එහි රැඳී සිටියා. ඉන්පසු හදිසියේම මෙන් නොදැනුවත්වම ඇය එතැනම තද නින්දකට ඇද වැටුණා සහ තිරය පසුපස වෙහෙස දුරු වන තුරු ඇයට නින්ද ගියා

කොතරම් වේලාවක් ඇය නිදා සිටියේ ද යන්න ඇය දැන සිටියේ නැහැ. නැවතත් ශබ්දයක් ඇසී ඇය අවදි වුණා. තමා

සිටින්නේ මොන ලෝකයක ඇයි මවිතයට පත්වී ඇය ජනෙල් පඩිය මත වාඩි වුණා. අනතුරුව ඇයට සියල්ල සිහිවුණා ඇත්තෙන්ම, ඇය සිටියේ අසනීප කාමරය අසල. ඇය පැමිණ තිබුණේ සැලීට සිදුවන්නේ කුමක් දැයි දැන ගැනීමටයි.

එක්වරම, නැවත වතාවක් භීතියක් හා චකිතයක් ඇ වෙළා ගත්තා. ඇය අතරමංව හුදෙකලා වූ බවක් දැනුණා. කතා කරන ශබ්දයන් ළඟ ළඟම එනු ඇසී ඇය ජනේල තිරය පසුපස හොඳින් සැඟවුණා. ඒ වෛද්‍යවරු ද? හෙදියන් ද? විදුහල්පතිනිය ද?

ඒ සමගම ඩැරල්ගේ හෘද ස්පන්දනය නැවතුණාක් බඳුවුණා යමෙක් ඇය වාඩි වී සිටි ජනෙල් පඩිය අසලින්ම යමින් සිටියා. ඇය හඳුනන හා ඉතා ආදරය කරන කටහඬකින් කතා කළ යමු අයෙක්. "එයාට සනීප වෙයි" එම කටහඬ කිව්වා. "හොඳ වෙලාවට එයාගේ අසනීපය හොයා ගන්න පුළුවන් වුණේ"

තමා හොඳින්ම දන්නා එම කටහඬට සවන් දෙමින් ගල් බවට පත්වූ කලෙක මෙන් ඩැරල් වාඩි වී සිටියා. එය විය නොහැකියි. එය විය නොහැකියි! ඒ තමාගේ පියාගේ කටහඬ විය නොහැකියි.

හදිසියේ ම ඇයට සෙලවීමට හැකි බව දැනුණා. ජනේල තිරය වහා පසෙකට කළ ඇය ඔවුන් දෙස බැලුවා. තම පියා උනන්දුවෙන් කතා කරන නේවාසිකාගාර පාලිකාව සමග ඇවිද යනු ඇය දුටුවා. ඔව්, ඒ ඔහු. ඇත්තෙන්ම ඒ ඇගේ පියා.

"තාත්තා" සැතපුම් ගණනාවක් දුර සිටිනවා යැයි ඇය සිතූ ඇගේ පියා ඒ අසලම කොරිඩෝවේ ගමන් කරනවාය යන කාරණය හැර අන් සියල්ල අමතකව ගිය ඩැරල් හඬ නගා කෑ ගැසුවා.

"තාත්තේ, ඕ, තාත්තා. නවතින්න, මම ඩැරල්"

තද පහරක් වැදුණ කලක මෙන් ඇගේ පියා නැවතුණා. ඔහුට තම දෙසවන් ඇදහිය නොහැකි වුණා. ජනේල පඩියෙන් පැන ගත් ඩැරල් කුඩා කාලතුවක්කු උණ්ඩයක් මෙන් ඔහු වෙතට පැන්නා. ඔහුගේ සිරුරේ එල්ලී ඇය හඬන්නට වුණා.

"මේ මොකද ළමයෝ ?" විමතියට පත් ඇගේ පියා ඇසුවා. "ඇයි ඔයා මෙතැන?"



මවිතයට පත්ව මඳ අප්‍රසාදයක් පළ කරමින් ග්‍රේලින් මහත්මිය ඇමිණියා.

"ඩැරල්. ඔයා මොනවටද මෙහාට ආවේ, ළමයෝ ? ඩොක්ටර් ජුර්ස් කරුණාකරලා මගේ පහළ කාමරයට එන්න."

ඩැරල්ව වඩා ගත් ඇගේ පියා ග්‍රේලින් මහත්මිය පසුපසින් ශාලාවට යන අතරේ කලබලයට පත් කිකිළියක මෙන් පාලිකාව කෙකර ගාමින් පසුපසින් ආවා. කිසි කලක අත නොහරින මෙන් ඩැරල් තම පියාගේ ගෙල බදා ගත්තා. මේක සිහිනයක් ද? මේ දෙගොඩහරි යාමයේ මේ පැමිණ ඇත්තේ තමාගේම පියා ද? ඇයි හෝ කොහොමද තම පියා පැමිණියේ ? යන්න ඩැරල්ට සිතා ගත නොහැකි වුවද ඔහුගේ පැමිණීම පමණක් ඇයට සෑහුණා.

ඩැරල්ව දණහිස් මත තබාගෙන ඔහු ලොකු ඇඳි පුටුවක වාඩි වුණා. පාලිකාව නොපෙනී ගියා. ග්‍රේලින් මහත්මිය පමණක් එහි සිටි අතර ඇය ව්‍යාකූලව ඩැරල් හා පියා දෙස බැලුවා. ඇයට තේරුම් ගත නොහැකි දෙයක් එතැන තිබුණා.

"ඔනෑ තරමක් අඬලා මට කාරණය මොකක්ද කියලා කියන්න." ඩැරල්ගේ පියා කිව්වා. "ඇයි ඊයේ දකිද්දි ඔයා හරි සතුටින් හිටියා නේද? කමක් නැහැ, මම් ඉන්නවනේ. මම ඔයාට ඕනෑම දෙයක් කරලා දෙන්නම්."

"ඔයාට බැහැ" ඩැරල් වැලපුණා. "මම නපුරු වුණා. ආයෙත මට ඉක්මනින් තේරුණේ නෑ. ඕ, තාත්තා. මගේ වරදින් සැලී එතරම් අසනීප වුණේ"

"ඇයි ළමයෝ මොනවාද මේ කියන්නේ ?" ව්‍යාකූල වූ ඇගේ පියා ඇසුවා. ඔහුගේ ගෙල යට හිස ඔබා ගත් ඩැරල්ට මහත් සහනයක් දැනෙන්න වුණා. තාත්තාට නිතරම හැම වැරැද්දක්ම හරි ගැස්සීමට හැකිවුණා. මට ද එසේමයි. අද රෑ මිදු පැමිණීම කොතරම් ආශිර්වාදයක් ද!

අනතුරුව හිස එසවූ ඇය පුදුමයෙන් කතා කළා. "ඒත්, තාත්තා ඇයි ඔයා ආවේ ? මම හිතුවා ඔයා හුඟක් ඈතක ඉන්නවා කියලා"

"ඔව් ඒක ඇත්ත" රිවර්ස් මහතා කිව්වා. "ඒත් මිස් ශ්‍රේලින් මට ටෙලිෆෝන් කරලා කිව්වා පුංචි සැලීට ඇපැන්ඩිසයිටිස් කියලා. සුපුරුදු ශල්‍යවෛද්‍යවරයා අසනීප නිසා මට ඇවිදින් ඔපරේෂන් එක කරන්න පුළුවන් ද කියලා ඇහුවා. ඉතින් ඒකයි මම ආවේ. මම කාරෙකට නැගලා ඉක්මනින් එනකොට මෙහේ හැම දෙයක්ම සූදානම්ව තිබුණා. ඒක සුළු ඔපරේෂන් එකක් නිසා සැලීට ඉක්මනින්ම සනීප වෙලා තව සති දෙක තුනකින් ආපසු පන්තියට එන්න පුළුවන් වෙයි."

ඩැරල්ගේ හදවතෙහි වූ විශාල බරක් ඉවතට වැටුණා. එය ඉවතට රෝල් වී යන බවක් ඇයට දැනුණා. කෙනෙකුට ඇපැන්ඩිසයිටිස් හැදෙන්නේ ඇයි? ඇගේ පියා නිතර එයට ප්‍රතිකාර කරනවා. ඇය කුතුහලයෙන් යුතුව කතා කළා.

"තාත්තා. තල්ලු කළාම ඇපැන්ඩිසයිටිස් හැදෙනවාද? නැත්නම් වැටුණාම?"

"දෙවියනේ, නැහැ" ඇගේ පියා කිව්වා. "සැලීට මේ අමාරුව සෑහෙන කාලයක ඉඳලා තිබුණා කියන එකේ සැකයක් නැහැ. මේ වාරය ඉස්සරලා ඉඳලා මම හිතන්නේ. ඒත් ඇයි ඒ වගේ ප්‍රශ්නයක් ඇහුවේ ?"

අනතුරුව සියල්ල එළියට ආවා. සැලී කොතරම් විකාර අමුතු හා නපුරු ද යන වග. ඩැරල්ට කේන්ති ගිය ආකාරය දරුණු තල්ලු කිරීම. වැටීම. හැම දෙයක්ම.

"ඉතින් මම දුක්වුණා. දුක්වුණා. දුක්වුණා" ඉකියක් ගසමින් ඩැරල් කිව්වා. "මට හිතුණා මිස් ශ්‍රේලින් දැන ගත්තොත් මාව ඉස්කෝලෙන් අස් කරයි කියලා. එතකොට අම්මටයි, තාත්තටයි හොඳටම ලැජ්ජා හිතෙයි කියලා. මට නින්ද ගියේ නැහැ. මම නැගිටලා ...."

"මොන තරම් මෝඩ කෙල්ලක් ද?" කී ඇගේ පියා හිස සිං ගත්තා. "ඒ වගේ මෝඩ විදිහට හිතනවා නම් අපිම ඔයාව මැලෝරි ටවර්ස්වලින් අස් කරගෙන ගෙදර එක්ක යන එක හොඳයි වගේ ඩැරල්"



"අනේ එපා, එහෙම කරන්න එපා" ඩැරල් කිව්වා. "අනේ තාත්තා සැලී අසනීප වුණ එකට මගේ සම්බන්ධයක් නැහැ කියලා දැන ගත්තට පස්සේ මට දැනෙන හැටි ඔයා දන්නවා නම්. ඒත් ...පොයි. මම හෝප් නෝනාට මේ ගැන ලියලා යැව්වා. එයා ...මානවා හිතයි ද?"

ඉන් පසුව ලියුම ගැන හා ඈ එහි ලියූ සියල්ල ගැන ඇයට කියන්න සිදුවුණා. තමාට කුඩා සහෝදරියක නැති බව සැලී කියන අපූරු ඇසී ඇගේ පියාත්, ශ්‍රේලින් මහත්මියත් මහත් සේ ව්‍යාකූල වුණා.

"විසඳිය යුතු අමුතු යමක් මෙතැන තියෙනවා" රිවර්ස් මහතා ශ්‍රේලින් මහත්මියට කිව්වා. "එහෙම නැතිනම් එයා සනීප විය යුතු කාලයට වැඩි කාලයක් යයි. හෝප් මහත්මයයි, නෝනයි කවදාද එනවා කිව්වේ ?"

"හෙට" ශ්‍රේලින් මහත්මිය කිව්වා. "මම එයාලව හමුවෙලා පැහැදිලි කරන්නම්. දැන්, රිවර්ස් මහත්මයා අපි මෙතේ ඇඳක් ලෑස්ති කරන්න ද? දැන් හුඟක් රෑ වෙලා."

"ඕ, එපා" රිවර්ස් මහත්මයා කිව්වා. "හුඟක් රෑවෙලා එහෙ මෙහේ ගිහින් මට හුරුයි. මම ආපසු යන්න ඕනෑ, ස්තූතියි. ඩැරල් නිදාගන්න යන්න ඕනෑ. දැන් තවත් දුක්වෙන්න එපා ළමයෝ, හැම දෙයක්ම හරි. ඔයා තල්ලු කළ එකෙන් සැලීට හානියක් නැහැ. එයාගේ බඩ දවසේම රිදි රිදී තියෙන්න ඇති. ඒත් වැටුණ එකෙන් ඒක ටිකක් වැඩි වෙන්න ඇති. අහිංසක ළමයා."

"මම හෙමින් නොවෙයි තල්ලු කළේ. හුඟක් හයියෙන්." ඩැරල් කිව්වා.

"මට කේන්ති එන පුරුද්ද ඔයාට භාර දුන්න එක ගැන මම දැන් දුක් වෙනවා." ඇගේ පියා කී අතර ඩැරල් ඔහුගේ ගෙල බදා ගත්තා.

"දුක් වෙන්න එපා. මම ඒකෙන් ගැලවෙන්නම්." ඇය කිව්වා. "මමත් ඉක්මනටම ඔයා වගේ වෙනවා. ප්‍රයෝජනවත් වැඩක යෙදෙනවා."

"හොඳයි, සුබ රාත්‍රියක් දුව" කී පියා ඇව සිප ගත්තා. "ඉඩ දුන්න වහාම ගිහින් සැලීව බලන්න. එතකොට ඔයාට තවත් සහනයක් ඇතෙයි. මම හිතන්නේ"

"මට දැන් සතුටුයි." කී ඩැරල් ඔහුගේ දණහිසින් බිමට බැස්සා. ඇගේ ඇස රතු වී තිබුණ ද ඇය සිනා මුසුව සිටියා. ඇයට කොතරම් සහනයක් ද! සියලු දොම්නස් පහව ගියා.

මෝටර් රථය පණ ගන්වා ගත් ඇගේ පියා අඳුරේ නොපෙනී ගියා. ග්‍රේලින් මහත්මිය විසින්ම ඩැරල්ව ඇඳට කැඳවාගෙන ගියා. විදුහල්පතිනිය කාමරයෙන් පිටවීමටත් පෙර ඩැරල් නින්දට වැටුණා.

එමෙන්ම, අසනීප කාමරයේ සිටි සැලීට නින්ද ගොස් තිබුණා. ඇගේ වේදනා පහව ගොස් තිබුණා. ඇගේ අඛණ්ඩ ඒකාකාර හුස්ම ගැනිම ගැන සතුටුව පාලිකාව ඈ දෙස බලා සිටියා. ඩැරල්ගේ පියා කොතරම් දක්ෂ කඩිසර ශල්‍යවෛද්‍යවරයෙක්ද ! සැත්කමට ගියේ විනාඩි තිහක් පමණයි. හදිසියේ පැමිණීමට තරම් ඔහු ළඟක සිටීම කොතරම් වාසනාවක් ද!

දීප්තිමත්ව හා පැහැදිලිව ඊළඟ උදය එළඹුණා. සූදානම් වීමේ සීනු නාදය සමග පිබිදුණ ඩැරල් වෙහෙසින් යුතු වුවද සතුටින් සිටියා. වැතිරීගෙනම ඇය විනාඩියක් පමණ කල්පනා කළා. ඇගේ හදවත සොම්නසින් බර වුණා. සැලීට සනීපවනු ඇත. ඇගේ පියා එසේ කියා තිබුණා. එමෙන්ම ඇගේ අසනීපය සමග ඩැරල්ගේ සම්බන්ධයක් නැති බවද ඔහු කියා තිබුණා.

'හැම දෙයක්ම මේ විදිහට සිදුවීම ගැන මම සතුටු වෙනවා කියන එක පෙන්වන්න මොනවා හරි කරන්න ඕනෑ' ඇඳෙන් බිමට පනිමින් ඩැරල් සිතුවා.

'ඒත් මට කරන්න පුළුවන් දෙයක් නැහැ. අද සැලීට කොහොමද දන්නේ නැහැ'

ඇත්තෙන්ම සැලී හොඳින් සුව අතට පත්වෙමින් සිටියා. ඇගේ මව හා පියා ඈ බැලීමට එන බව ඇසුණ ඇයට තම දෙසවන් ඇදහිය නොහැකි වුණා.



'ඒත් අම්මා එයිද?" ඇය නිතර නිතර ඇසුවා. අම්මා එයි කියලා විශ්වාස ද? ඒත් ගිය සෙනසුරාදා එයාට එන්න පුළුවන් වෙලා තිබුණේ නැහැ. ඇත්තටම එයා එයිද?"

ග්‍රේලින් මහත්මිය හෝප් මහත්මයා හා මහත්මිය පිළිගත්තා ශාලයට පත්ව සිටි හෝප් මහතා උස මහත අයෙක්. සුන්දර මුහුණක් ඇති හෝප් මහත්මිය සෞම්‍ය කාන්තාවක්.

"සැලී තවම ඔයාල දකින්න සූදානමක් නැහැ" ග්‍රේලින් මහත්මිය කිව්වා. සනීප වෙමින් ඉන්නවා. රිවර්ස් මහත්මයා, මේ ළඟ හෝටලයක හිටපු නිසා අපි එයාව කැඳවා ගත්තා. එයා ශල්‍යවෛද්‍යවරයෙක්. එයා අපේ ඉස්කෝලේ ඩැරල් රිවර්ස් කියන ළමයාගේ තාත්තා."

"ඕ, ඩැරල් රිවර්ස්" කී හෝප් මහත්මිය ලිපියක් අතට ගත්තා. 'අද මට එයාගෙන් අමුතු ලියුමක් ලැබුණා මිස් ග්‍රේලින්" ඇය කිව්වා. "සැලීගේ අසනීපයට හේතුව එයා කියලා හිතනවා වගේ පෙනෙනවා. ඒත් එහෙම නොවෙයි. ඒත් එයා කියලා තියෙන අනිත් දේවල් ගැන මට හිතට දුකයි. මේක කියවලා බලන්න. අපි සැලී බලන්න ඉස්සර ඩැරල් හමුවුණොත් හොඳයි කියලා හිතනවාද?"

ලිපිය කියවා බැලූ ග්‍රේලින් මහත්මිය බැරෑරුම් බවක් පළ කළා. "මෙතැන මොකක්ද පැටලිල්ලක් තියෙනවා" ඇය කිව්වා. "හොඳින්ම දැන දැනත් ඇයි සැලී නංගි කෙනෙක් නැහැ කියන්නේ?"

"මම දන්නේ නැහැ" හෝප් මහත්මිය දුකින් කිව්වා. "ඩැනත් බබා ආව දා ඉඳලා සැලී අමුතු වුණා. එයා බබා දිහා බලන්නේවත්, කතා කරන්නේවත් නැහැ. දවසක්, මම බලාගෙන ඉන්නවා කියලා දන්නේ නැතිව එයා ඩැනත්ව නපුරු විදිහට කොනිත්තනවා මම දැක්කා. ඒත් සැලී නපුරු ළමයෙක් නොවෙයි."

"ඔයාට තව දරුවෝ ඉන්නවා ද?" ග්‍රේලින් මහත්මිය ඇසුවා. හෝප් මහත්මිය හිස වැනුවා.

"නැහැ" ඇය කිව්වා. "ඩැනත් ඉපදෙන කොට සැලීට දොළහයි. ඒ වෙන තුරු එයා එකම දරුවා. මම හිතුවා නංගි කෙනෙක්

ලැබෙන එක ගැන එයා හුඟක් සතුටුවෙයි කියලා. අපි සැලීව නරක් කළේ නැහැ. ඒත් ඩැනත් එනතුරු එයා අපිව කා එක්කවත් බෙදාගන්න කැමති වුණේ නැහැ. සමහර වෙලාවට මට හිතෙනවා එයා...... ඔව් ... ඊර්ෂ්‍යායි."

"ඇත්තෙන්ම ඒක තමා" ශ්‍රේලින් මහත්මිය එක්වරම කිව්වා. "මම හිතන්නේ හෝප් නෝනා, සැලී ඔයාට හුඟක් සමීප නිසා බබා එක්ක ආදරය බෙදා ගන්න කැමති නැහැ. එයා ගැන තරකට හිතයි කියලා ඒක එයාට කියාගන්න බැහැ."

"ඔ, එයා වචනයක්වත් ඒ ගැන කියලා නැහැ" හෝප් මහත්මිය කිව්වා. "එයා වෙනස් වුණා විතරයි. එයා වෙනදා වගේ සතුටින් හිටියේ නැහැ. එයා අපි ළඟට ඇවිදින් ආදරය පෙන්නුවේ නැහැ. බබාට කැමති නැති බව පෙනුණා. මම හිතුවා ඒක නැතිවෙලා යයි කියලා. ඒත් එහෙම නොවුණ නිසා මටත් අසතිප වුණ නිසා අපි හිතුව හොඳම දේ එයාව බෝඩිං ඉස්කෝලයකට එවන එක කියලා. සැලී ගැන මහන්සි නොවී එතකොට මට බබාට හුඟක් අවධානය යොමු කරන්න පුළුවන්"

"ඔව්, මට තේරෙනවා." ශ්‍රේලින් මහත්මිය කල්පනාබරව කිව්වා. "ඒත් සැලී හිතන්නේ දැන් ඔයාට එයාව ඕනෑ නැති නිසා එයාව ඇත් කළේ බබාට හුඟක් ආදරයයි, අවධානයයි දෙන්න කියලා. මිස් හෝප් මේ වගේ පොඩි වයසේ ළමයින්ගේ ඊර්ෂ්‍යාව සාමාන්‍ය වගේම ස්වාභාවික නිසා ඔයා සැලීට බනින්න එපා. ඒ වගේම ඒක වර්ධනය වෙන්න දෙන්නත් එපා. වෙනදා වගේම ඔයා සැලීට ආදරෙයි කියන එක එයාට දැනෙන්න දෙන්න. එතකොට හරියයි. දැන් අපි ඩැරල්ව කැඳවා ගනිමු ද?"

ඩැරල්ට පණිවිඩයක් යැවුණා. හෝප් මහත්මිය මොනවා කියාවි දැයි බිය වී චකිතයෙන් යුතුව ඇය ඇතුළට ආවා. එහෙත් ඉක්මනින්ම සාමාන්‍ය තත්ත්වයට පැමිණි ඇය දන්නා සියල්ල පැවසුවා.

ශ්‍රේලින් මහත්මිය හෝප් මහත්මිය දෙසට හැරුණා. "මම හිතන්නේ ඔයාලා යන්න ඉස්සර ඩැරල් ටික වෙලාවකට සැලීව බලන්න යැව්වොත් හොඳයි කියලා" ඇය කිව්වා. "ඔයාලා ඇවිදින්



...ලා සැලීට කියන්න කියලා අපි එයාට කියමු. ඒ වගේම එයාව ...න්න එන්න හදිස්සි නිසා බබාව අලා ඉක්මනට ආව බව ...ට කියන්න කියමු. ඒක කරන්න පුළුවන් ද?"

ඩැරල් හිස සැලුවා. ඇයට සැලීගේ ගැටලුව හොඳින් අවබෝධ ... තිබුණේ. ඇයි, ඇය තම ළදරු නැගණිය ගැන ඊර්ෂ්‍යාවෙන් ...වුණා. කොතරම් ඊර්ෂ්‍යා ද යත් තමාට නැගණියක් සිටින බව ...ත් පිළිගැනීමට ඇය සූදානම් නැහැ. ඇය කොතරම් ...සනාවන්ත ද යන්න සැලී දැන සිටියේ නැහැ.

"මම එයාට කියන්නම්" ඩැරල් උද්‍යෝගයෙන් කිව්වා. "ඔයාලා ගියාට පස්සේ නංගි කෙනෙක් ඉන්න එක මොනතරම් සතුටක් ද කියලා තේරෙන්න මම සැලීට පුළුවන් විදිහට දැනෙන්න සලස්වන්නම්. මටත් යමක් කරන්න ඕනෑ. මම එහෙම කරන්න හුඟක් ආසයි"

## 18

ඩැරල් ඉහළ මාලයේ අසනීප කාමරයට ගියා. ග්‍රේලින් මහත්මිය විසින් පාලිකාවට ලියන ලද කුඩා ලිපි කැබැල්ලක් ද ඇ අත තිබුණා.

"සැලීගේ දෙමව්පියන් පැමිණීමට කලින් ඩැරල්ට විනාඩි කීපයකට සැලීව හමුවීමට ඉඩ දෙන්න."

විමතියට පත්ව එතරම් මනාපයක් නොදැක්වූ පාලිකාව ඩැරල්ට ඇතුළු වීමට දොර විවෘත කළා. ඩැරල් හඬ නොනගා ඇතුළු වුණා. අපූරු සුදු ඇඳන් තුනක් හා විශාල ජනේලයෙන් පිටත පෙනෙන සුන්දර දර්ශනයක් සහිත එය කදිම කාමරයක්. සෑම දෙයක්ම පැහැදිලි සුදුපැහැ ගත් අතර ඉතා පියකරු ලෙස පිරිසිදුව තිබුණා. අවසාන ඇඳෙහි සැලී වැතිර සිටියා. සුදුමැලි වුවද දීප්තිමත් දෑසක් ඇයට තිබුණා.

"හෙලෝ සැලී" ඩැරල් කිව්වා. "මම ඔයා ගැන හුඟක් දුකෙන් හිටියේ. දැන් ඔයාට සනීප ද? අපේ තාත්තා ඔයාව සනීප කළා ද?"

"ඔව්. මම එයාට හුඟක් කැමතියි. එයා හරි කරුණාවන්තයි" සැලී කිව්වා.

"සෙනසුරාදා දවසේම මම හුඟක් අමාරුවෙන් හිටියේ, ඩැරල්. ඒත් මට ඒ ගැන කාටවත් කියන්න බැරිව හිටියේ. ඒ දවස මතක් කරන්න මට බැහැ"

"මම හිතන්නේ ඔයා හුඟක් නිර්භීතයි" ඩැරල් කිව්වා. "මේ .... කියන්න බලන්න ඔයාව බලන්න ඇවිදින් ඉන්නේ කවුද කියලා"

"අපේ අම්මා නම් නොවෙයි" දිලිසෙන ඇසින් යුතුව සැලී කිව්වා. ඩැරල් හිස සැලුවා. "ඔයාගේ අම්මයි, තාත්තයි දෙන්නම ඇවිත්. දන්නවාද සැලී, ඔයා බලන්න ඉක්මනට එන්න ඕනෑ



... එයාලා ඔයාගේ චූටි නංගි ගෙදර අලා ඇවිදින්. බලන්නකෝ ... අම්මා ඔයා ගැන හුඟක් හිතනවා. ඒ මොකද චූටි ළමයෙක්ව ... එන එක අම්මලාට හිතන්නවත් බෑ"

තමාට සහෝදරියක නැති බව තමා ඩැරල්ට කියා තිබූ බවක් සැලීට අමතක වුණා. ඇය ඩැරල්ගේ අත අල්ලා ගත්තා. "එයා බබාව ගෙනැවිල්ලා නැද්ද?" ඇය කෙඳිරුවා. "එයාව අලා ඇවිදින්ද? සත්තකින්ම ඇත්තද?"

"ඔව්, පව් පොඩි එක්කෙනා" ඩැරල් කිව්වා. "එයාට තනි ඇති. මටත් චූටි නංගි කෙනෙක් ඉන්නවා. නංගි කෙනෙක් ඉන්න එක කොයි තරම් අපූරු ද! මගේ නංගි මා දිහා බලන්නේ මම හරි පුදුම කෙනෙක් කියලා හිතාගෙන. මම හිතන්නේ ඔයාගේ නංගිත් එහෙම ඇති."

නංගිලා ගැන සැලීගේ අදහස හදිසි වෙනසකට භාජනය වුණා. සෑම දෙයක්ම නිසි පරිදි නිසි ලෙස ස්ථානගත වෙන්න වුණා. ඈ ඩැරල් වෙත ස්තුති පූර්වක මඳ සිනාවක් පෑවා. "ඔයාට පුළුවන් වෙලාවක ඇවිදින් මාව බලනවා නේද?" ඈ ඇසුවා. "මොකවත් කියන්න එපා. මගේ .... මගේ මෝඩකම ගැන. හරිද? අනිත් අයට. මම කියන්නේ ...."

"ඇත්තෙන්ම නැහැ. ඒක මෝඩකම නොවෙයි. ඒක ඔයා අතින් වුණ වැරැද්දක්" ඩැරල් කිව්වා. "ඇයි, ඔයාගේ අම්මා දිහා එක සැරයක් බලන ඕනෑම කෙනෙක් කියයි එයා හරි හොඳ අම්මා කෙනෙක් කියලා. මම කියන්නේ තව කොයිතරම් දරුවෝ හිටියත් ඔයාට ඒ තරම් ආදරය කරන කෙනෙක් ඔයා මොනවා කළත් එයා හරි ආදරෙයි."

"මමත් ආදරෙයි" සුසුමක් හෙළමින් සැලී කිව්වා. "මම ඔයාට නපුරු වුණ එක ගැන මට කනගාටුයි, ඩැරල්"

"ඔයාට ඒ තරම් බඩේ කැක්කුමක් තියෙද්දිත් මම ඒ විදිහට ඔයාව තල්ලු කළ එක ගැන මමත් හුඟක් දුක් වෙනවා" ඩැරල් කිව්වා.

"ඔයා මාව තල්ලු කළාද?" සැලී ඇසුවා. "මට මතක නැහැ. අර බලන්න, මෙට්‍රන් මොකක්ද කියන්නේ?"

පාලිකාව ඩැරල්ට පිටතට එන මෙන් හිසෙන් සංඥා කරමින් සිටියා. හෝප් මහතා හා මහත්මිය දොරින් පිටත සිටියා. ඉක්මනින් සමුගත් ඩැරල් නිහඬව පිටතට ගියා. හෝප් යුවළ ඇතුළට එන විට මව දැක සැලී ප්‍රීතියෙන් කෑ ගසන හඬ ඩැරල්ට ඇසුණා.

උඩ පනිමින් තරප්පුපෙළ පහළට දුවගිය ඩැරල් දෙවීන් මෑත් වී මැද මිදුලට ආවා. ඈ තම පන්ති කාමරය ඇති ගොඩනැගිල්ල වෙතට දිව්වා. පාඩමක් අවසාන වීමට සීනුව නාද වෙමින් තිබුණා.

ඩැරල් පළමු පන්ති කාමරයට රිංගා ගත්තා. ඇරියෝ හිස ඔසවා ඇය දෙස බැලුවා.

"කොහේද හිටියේ ? හුඟ වෙලාවක ඉඳලා නැහැ. ගණිත පාඩමෙ භාගයක්ම මඟ ඇරුණා. ඊරි"

"මම සැලී බලන්න ගියා" ඩැරල් නොඉවසිල්ලෙන් කිව්වා.

"බොරුකාරී ! තවම කාටවත් එයාව බලන්න අවසර නැහැ" අයිරින් කිව්වා.

"හරි, මම ගියා. එයා කියනවා අපේ තාත්තා එයාව සනීප කළා කියලා." එවැනි පියෙකු සිටීම ගැන ආඩම්බරයෙන් ඩැරල් කිව්වා. "එයා ඊ ආවේ. මම දැක්කා"

"ඩැරල් රිවර්ස්, ඔයා මේ හැමදේම ගොතලා කියන්නේ" ඇලිසියා කිව්වා.

"නැහැ, අවංකවම නැහැ. ඇත්තමයි." ඩැරල් කිව්වා. "හෝප් නෝනයි, මහත්තයයි මට හම්බ වුණා. දැන් එයාලා සැලීව බලනවා. එයාලා අද රෑට මිස් ග්‍රේලින් එක්ක නැවතිලා උදේ යනවා."

"ඉතින් දැන්වත් අපේ සැලී දන්නවාද එයාට පුංචි නංගි කෙනෙක් ඉන්නවද නැද්ද කියලා?" ගොන්ඩොලින් ඇද පැද ඇසුවා.

කෝපයේ ගිනි ඇල්ලක් නැඟ එනු ඩැරල්ට ඇනුණ ද ඇය වහා එය මැඩ ගත්තා. "ඔයාට ඒකෙන් වැඩක් නැහැ. වොකු ඇනලා හදාගන්න ඔයාට අක්කලා හය දෙනෙක් විතර හිටියා නම් තමයි හොඳ" ඩැරල් කිව්වා.



"එතකොට ටිකක් හරි හොඳ වෙන්න තිබුණා"

"ෂ් ...... ෂ් ........ මම්සලී එනවා." දොර අසල සිටි දැරියන් කී ... එදින තුන පන්තියේ දැරියන් ඉතා අනුවණ ලෙස වැඩ කර ... නිසා මම්සලී ඇතුළට පැමිණියේ ඒ කෝපය ද සමගයි. එදින ...මසලී හෝ පොට්ස් ගුරුතුමිය කිපී සිටියත් ඩැරල් එය තැකුවේ නැහැ. ඈ සැලීගේ සතුට ගැන සිතමින් සිටියා. සැලී කුමක් කරනු ඇති දැයි ඈ සිතමින් සිටියා.

සැලී මව හා පියා සමග සතුටින් එක්ව සිටියා. ඇගේ ඊර්ෂ්‍යාව ...නව ගොස් තිබූ නිසා ඇය හා මව අතර ඉදිකරගෙන තිබූ අසාමාන්‍ය බිත්තිය බිඳ වැටී තිබුණා. ඇගේ මව ඇව බැලීමට ...ඳදිසියේ ඒමට බිලිඳිය දමාවිත් තිබුණා. එහෙයින් සැලී තෘප්තිමත් වුණා. බිලිඳු ඩැනන් අමුත්තන් සමග තනිකර ඒම ඇයට අවශ්‍ය වුණේ නැහැ. එහෙත් එය තම මව තමාට ඉතා ආදරය කරන හා සලකන බව පෙන්වන සලකුණක්. විකාරකාර සැලී !

"අපි හෙට යන්න ඉස්සර ආයෙත් ඔයාව බලන්න එන්නම්" එය හෝප් මහතාට හා මහත්මියට පිටව යාමට වේලාව බව පාලිකාව ඇන්වූ විට ඇගේ මව කිව්වා. "ඔයාට ඕනෑ නම් මම තව දවසක් ඔයා එක්ක නවතින්නම්. මම නැතිව තාත්තාට ගෙදර යන්න පුළුවන්."

"එපා" සැලී සුසුමක් පිටකරමින් කිව්වා. "නංගිව හුඟක් වෙලා තනිකරලා තියන්න එපා ! අනික තාත්තා කැමතියි ඔයා එයා එක්ක යනවා නම්. දැන් මට සනීපයි අම්මා. මට හොඳටම හොඳ වෙයි. එතකොට මට ලොකු වෙනසක් දැනෙයි."

මෙවිට සැලී නැවතත් තම ආත්මාර්ථකාමී නොවූ කුඩා දියණිය බව දැනගත් හෝප් මහත්මිය සතුටට පත්වුණා. ඩැරල් රිවර්ස් ලියා එවූ දෙයින් කොතරම් යහපතක් නම් සිදුවුණා ද! දැන් සියල්ල නිරාකරණය වී හමාරයි.

අනෙක් අයට අවසර ලැබීමට බොහෝ කාලයකට පෙර සිට ඩැරල්ට සැලීව දිනකට දෙවරක් බැලීමට අවසර ලැබුණා. සැලී ඇයව උනන්දුවෙන් පිළිගත්තා. සැලී දැන් බොහෝ සේ වෙනස් වෙලා. තව දුරටත් කුළෑටි හා රහසිගත ආවරණයකට

මුවා නොවූ ඇය තම පවුලේ විස්තරත්, බල්ලන් හා ගෙවත්ත ගැන කියමින් ඩැරල්ගෙන් පාඩම් හා ක්‍රීඩා ගැනත්, මම්සලී තරහින් යන වගත්, පොට්ස් ගුරුතුමිය කියන්නේ මොනවාද යන්නත් ගොන්ඩොලින් හා මේරි ලෝව් තවත් මිතුරු ද යන්නත් අසන්නට වුණා.

"දන්නවද සැලී" ඩැරල් කතා කළා. "මම ඔයාට තුවාල කරන්න ඇති නරක විදිහට කියලා හිතලා මාව ඉස්කෝලෙන් අස්කරයි කියලා මම හුඟක් බයෙන් හිටපු වෙලාවේ මට හිතුණා මේරි ලෝව් වගේ වුණොත් කොහොම වෙයිද කියලා. නිතරම හැමදේටම බයයි. ඉතින් මම මේරි ලෝව්ට ඔච්චම් කරන එක ගැන දුක හිතුණා."

"අපි මේරි ලෝව්ට හොඳින් සලකමු" නැවත වතාවක් යථා තත්ත්වයට පත්වීමට තිබූ ශක්තිය හා ඩැරල්ගේ නිතර පැමිණීමේ මිත්‍රත්වයෙන් ලද සතුටත් සමග තමාට ගොන්ඩොලින්ට ද යහපත් ලෙස සැලකිය හැකියැයි සිතුණ සැලී කිව්වා. "එයාට කියන්න ඇවිදින් මාව බලනවා නම් සතුටුයි කියලා"

මේ පණිවිඩයත් සමග මේරි ලෝව් සතුටින් ඉපිලුණා. සැලිව බලන පළමු අය අතරට තමාව ද තෝරා ගැනීම සිතන්නවත් බැරි තරම් දෙයක්. බාර්ලි බීම බෝතලයක් අතැතිව ඇය අසනීප කාමරයට ගියා. සැලී තරමක් සුදුමැලි වුවද වෙනස් වූ අයෙකු ලෙස පෙනුණා. ඇගේ ඇස දිලිසුණ අතර ඇය මඳ සිනාවක් පෑවා. ඇය උදාරම් ලෙස මේරි ලෝව්ව පිළිගත්තා.

ඔවුන් කතා කරන අතරේ මේරි ලෝව්ගේ හිසේ මලක් පිපුණා. ඇය සැලීට බියක් දැක්වූවේ නැහැ. ඇය බොහෝ දේ කීමෙන් අනතුරුව දුක්මුසු පෙනුමකට හැරුණා.

"ඔයා දන්නවාද සැලී, මම කැමති නැහැ ගොන්ඩොලින් නිතරම ඩැරල් ගැන නරක දේවල් කියනවාට. එයා උත්සාහ කරනවා මට ඒත්තු ගන්වන්න ඩැරල් මට නපුරුකම් කරනවා කියලා. එහෙම නැත්නම් ඇලිසියා කරනවා කියලා. ඊයේ මගේ තීන්ත කුප්පිය සිතියම් පොත පුරා ඉහිරිලා. ගොන්ඩොලින් කියනවා එයා හොඳටම දන්නවාලු ඒක කළේ ඩැරල් කියලා. ඒ මොකද ඩැරල්ගේ අතේ තීන්ත තියෙනවා එයා දැක්කාලු"



"ඩැරල් කවදාවත් එහෙම කරන්නේ නැහැ" සැලී කෝපයෙන් කිව්වා. "එයා ඒ වගේ දේවල් කියද්දි ඔයා කොහොමද අහන් හිටියේ?"

"මට එයාව නවත්වන්න බැහැ" නැවතත් බියපත් පෙනුම ළඟට එන අතරේ මේරි ලෝව් කිව්වා. "බලන්නකෝ, එයා කියයි මට එයාගේ යාළුවා නිසා ඕනෑම දෙයක් කියන්න පුළුවන් කියලා."

"ඔයා එයාගේ යාළුවද?" සැලී තදින් ඇසුවා.

"නැහැ, ඇත්තෙන්ම නැහැ. ඒත් මම යාළු නැහැයි කියලා කියන්න මම කැමති නැහැ" මේරි ලෝව් කිව්වා. "මම බයගුල්ලියක් කියලා කියන්න එපා. මම ඒක දන්නවා. ඒත් කරන්න දෙයක් නැහැ."

"යන්න වෙලාව හරි, මේරි ලෝව්" ඇතුළට එමින් පාලිකාව කිව්වා. "ඩැරල්ට කියන්න තව පැය භාගයකින් එන්න පුළුවන් කියලා. සෙල්ලම් කරන්න මොනවා හරි දෙයක් ගේන්න කියන්න"

පසුව, කාඩ් කුට්ටමක් අතැතිව ඩැරල් පැමිණියා. එහෙත් දැරියෝ දෙදෙන කාඩ්වලින් සෙල්ලමක් කළේ නැහැ. ඔවුන් මේරි ලෝව් හා ගොන්ඩොලින් ගැන කතා කළා.

"ගොන්ඩොලින් විසකුරුයි" සැලී කිව්වා. "එයා නිතරම ඔයාටයි, ඇලිසියාටයි විරුද්ධව කතා කරනවා. මේරි ලෝව්ට කැත වැඩ කරන්නේ ඔයා කියලා කියනවා."

"මටත් පුදුමයි ඒවා කරන්නේ කවුද කියලා" ඩැරල් කිව්වා "වෙන පන්තියක ළමයෙක් කියලා ඔයා හිතනවද?" බටහිර කුලුනේ ඉන්න ඉව්ලින් වෙන්න බැරි ද? එයා නිතරම මෝඩ කපටිකම් කරනවා"

"නැහැ. මම නම් හිතන්නේ ගොන්ඩොලින්ම කියලයි" තම අත වූ කාඩ්පත් දෙස බලාගෙන සැලී කිව්වා. ඇස මහත් කර ගත් ඩැරල් විමතියෙන් ඇය දෙස බැලුවා. "ඕ, නැහැ" ඈ කිව්වා. "ඇයි ගොන්ඩොලින් මේරි ලෝව්ගේ යාළුවනේ."

"එහෙම තමයි ගොන්ඩොලින් කියන්නේ. ඒත් මේරි ලෝව් වෙනස් කතාවක් කියන්නේ" සැලී කිව්වා.

"ඔව්, ඒත් .... බොරුවට යාළුකම් පෙන්වලා ඒ වගේ කැත වැඩ කරන්න වෙන කාටවත් බැහැ." ඩැරල් කිව්වා. "ඒක පිළිකුල් සහගත වැඩක්"

"මම හිතන්නේ ගොන්ඩොලිනුත් පිළිකුල් සහගතයි." සැලී කිව්වා. "මට එයාව රුස්සන්නේ නැහැ. එයා හැර ලෝකේ අනිත් කිසිම කෙනෙක්ව තුච්ඡුවකට ගණන් ගන්නේ නැති දෙපිටකාට්ටු කෙනෙක්"

ඩැරල් සැලී දෙස බැලුවා. "මම හිතන්නේ ඔයා හරි දක්ෂයි කියලා." ඈ කිව්වා. "ඔයාට අනිත් අයව හඳුනාගන්න පුළුවන්, මට වැඩියෙන්. මට විශ්වාසයි මට වැඩියෙන් ඔයා මේරි ලෝව් ගැනත් දන්නවා ඇති කියලා"

"මම කැමතියි මේරි ලෝව්ට" සැලී කිව්වා. "එයා හැමදේටම බය වෙන එක නවත්වා ගන්න පුළුවන් නම් එයා හරි අපූරු කෙනෙක් වෙයි."

"ඒත් අපි කොහොමද ඒක කරන්නේ?" කාඩ් කුට්ටම අතමින් සිතුවිල්ලකින් තොරව ඩැරල් කිව්වා. "අපොයි! බලන්න මම කරලා තියෙන දෙයක්. කමක් නැහැ. දැන් කාඩ් සෙල්ලමට වඩා කතා කරන එක රසවත්. අපි කොහොමද මේරි ලෝව්ව මුදවා ගන්නේ? මම එයාව බය ගන්නලා ලැජ්ජා හිතෙන්න සැලැස්සුවා. ඒත් ඒකෙන් වැඩක් වුණේ නැති පාටයි"

"එයා දැනටමත් එයා ගැන ලැජ්ජා වෙනවා කියලා ඔයාට පෙනෙන්නේ නැද්ද?" හදිසියේම සැලී ඇසුවා. "ලැජ්ජාවෙන් එයා ධෛර්යට පත්වෙන්නේ නැහැ. එයාටම හැර වෙන කාටවත් එයාට හයියක් දෙන්න බැහැ"

"හොඳයි. එයාට හයියක් ගන්න පුළුවන් වෙන ක්‍රමයක් ගැන හිතන්න" ඩැරල් කිව්වා. "ඕනෑ ඔට්ටුවක් ඔයාට බැහැ"

"අද රෑට නින්දට යන්න ඉස්සර මම හිතන්නම්" සැලී කිව්වා. "ඔයා හෙට උදේ මාව බලන්න එද්දි මම සැලසුමක් දෙන්නම් ඔන්න බලන්නකෝ."



# 19

ඊළඟ දිනයේ උදේ විවේක කාලයේ දී ඩැරල් සැලීව බැලීමට ගියා. සැලී උනන්දුවෙන් ඇයට සුබ පැතුවා. "හරි, මම යමක් ගැන හිතුවා. ඒක හුඟාක් හොඳ එකක් නොවෙයි. ඒත් ඒක ආරම්භයට හොඳයි"

"මොකක්ද ඒක?" දිලිසෙන දෙනෙතින් හා මුහුණේ සුවපත් පෙනුමින් යුතු සරල සැලී කොතරම් සුන්දර දැයි සිතමින් ඩැරල් ඇසුවා.

"හොඳයි, අහගන්න. අවස්ථාවක් ලැබුණ වෙලාවක ඔයා පිහිනුම් තටාකයේ ඉද්දි කරදරයක වැටුණා වගේ බොරුවක් කරලා මේරි ලෝව්ට කියන්න. ඉක්මනට දුවල ගිහින් ජීවිතාරක්ෂක කඹය අරගෙන ඇවිදින් දාන්න කියලා" සැලී කිව්වා. "එයා ඒක කරලා වතුරේ ගිලෙන්න යද්දි ඔයාව බේරා ගත්තා කියලා හුඟක් සතුටුවෙයි. කඹය ලෙහලා වතුරට දාන්නේ කොහොමද කියලා අපි හැමෝම දන්නවානේ. එයා ඒක ලේසියෙන් කරයි."

"ඔව්, ඒක හොඳ අදහසක්" ඩැරල් කිව්වා. "මම හෙට ඒක කරලා බලන්න ඕනෑ. මම අනිත් අයට කියනවා මේරි ලෝව් ඒක කරන තුරු එයාලට කලබල වෙන්න එපා කියලා. විශ්වාස කරන්න පුළුවන් අයට විතරයි කියන්නේ. ඒ කියන්නේ හුරතල් ගොන්ඩොලින්ට කියන්නෙත් නැහැ. ඔයා හිතනවාද එයා ඒක කළාට පස්සේ එයා කරන්න බය දේවල්වලට එයාගේ බය නැතුව යයි කියලා?"

"හොඳයි යමක් කරන්න පුළුවන් තරම් කල්පනාවකුයි ධෛර්යයකුයි තමන්ට තියෙන බව එයා දැන ගන්න තුරු එයාට කිසිම දේකට මුහුණ දෙන්න බැරි වෙයි" සැලී බැරෑරුම් ලෙස කිව්වා. "යමක් කරන්න බැහැ කියලා හිතනවා නම් කිසිම දෙයක් කරන්න බැහැ. ඒත් පුළුවන් කියලා හිතුවොත් කරන්න බැරි ඕනෑම දෙයක් කරන්න පුළුවන්"

"ඔයා කොහොමද ඒ වගේ දේවල් දන්නේ ?" ප්‍රසංශාත්මකව ඩැරල් ඇසුවා.

"මටත් එහෙම පුළුවන් නම්"

"ඕ, ඒක ඇත්තටම අමාරු දෙයක් නොවෙයි" සැලී කිව්වා "කරන්න ඕනෑ දෙය තමයි තමාවත් අනිත් අයගේ තත්ත්වයට අලා ඒ අය මේ වගේ තැනකදි යමක් කරන්නේ කොහොමද කියලා හිතලා ඒ විදිහට කරන එක. මම කියන එක පැටලිලි සහිතයි. ඒත් මට කියන්න ඕනෑ දේ මට කියාගන්න බැහැ. මට ගැළපෙන වචන නැහැ"

"ඕ, මට තේරෙනවා ඔයා කියන දේ හරියටම" ඩැරල් කිව්වා. "ඔයා කියන්නෙත් අපේ අම්මා නිතරම කියන දේ. මොන කෙනෙකුගේ චරිතයකට ආරූඪ වෙලා හරි ඒ අය හිතන විදිහට හිතලා වැඩ කරන්න. ඒත් මට ඉවසීමක් නැහැ. මම මගේ චරිතයටම කොටු වෙලා. ඔයා එහෙම නැහැ. ඔයා හරි දක්ෂයි සැලී. ඒ වගේම කරුණාවන්තයි"

රතු වූ සැලී සතුටට පත් බවක් පළ කළා. "මම දක්ෂ නැහැ. ඒ වගේම ඔයා දන්නවා මම ඩැනන්ට සලකපු විදිහෙන් මම කරුණාවන්තත් නැහැ කියලා" ඇය කිව්වා. "ඒත් කොහොම වුණත් ඔයා එහෙම හිතන එක හොඳයි. ඔයා හිතනවද අර අදහස වැඩ කරයි කියලා, ඩැරල්"

"ඕ, ඔව්. මම එහෙම හිතනවා" ඩැරල් කිව්වා. "හෙට තටාකයේ ඉද්දි මම ඒක කරලා බලන්නම්. මේරි ලෝව්ට ටිකක් හෙම්බිරිස්සාව වගේ නිසා මේ සතියේ එයාට නාන්න අවසර නැහැ. ඒ නිසා එයා පැත්තකට වෙලා බලාගෙන ඉඳියි. එයාට ලේසියෙන්ම දුවලා ගිහින් කබය ගෙනත් මට විසිකරන්න පුළුවන්. එයාට සතුටු හිතෙයි නේද?"

"මම හිතනවා හෙම්බිරිස්සාව තියෙන එක ගැන එයා මේ සතියේ සතුටු වෙනවා ඇති" සිනාවක් නගමින් සැලී කිව්වා. "එයා ඒ තරම්ම වතුරට කැමති නැහැ. ඕනෑම ඔට්ටුවක් එයා කවදාවත් පිහිනන්න ඉගෙන ගන්නේ නැහැ."



"මේරි ලෝව්ට හෙම්බිරිස්සාව නිසා වතුරට බහින්න එපා නාද්දී හරි විකාර වැඩක් වුණේ" ඩැරල් කිව්වා. "ඒ එක්කම අපේ ගොන්ඩොලින් පන්තිය ඉවර වෙනතුරුම හොටු සූරන්න පටන් ගත්තා.

"ගොන්ඩොලින් කිව්වා එයාට මේරි ලෝව්ගෙන් හෙම්බිරිස්සාව බෝවෙලා කියලා. ඉතින් මිස් පොට්ස් එයාව මෙට්‍රන් ළඟට යැව්වා. මෙට්‍රන් කිසිම කරුණාවක් නැතිව තිත්ත බෙහෙත් ගොඩාක් එයාට පෙව්වා. එයා ගොන්ඩොලින්ට නාන්න එපා කිව්වේ නැහැ. ලුණු වතුරට සනීප වෙයි කියලා කිව්වා.

"අන්න බෙල් එක" ඇය කිව්වා. "මම දවල් කෑමෙන් පස්සේ ඇවිදින් වගතුග කියන්නම්. ඇලිසියායි, බෙටීයි, මම්සලිගේ මේසය උඩ තියෙන පොත් ගොඩක තූලක් ගැටගහලා මම්සලි බලාගෙන ඉද්දී පොත් නටවපු හැටි මම තවම ඔයාට කිව්වේ නැහැ. මම හිතුවා අයිරින් හිනාවෙලා මැරෙයි කියලා. ඔයා දන්නවානේ එයා හිනාවෙලා පිපිරෙන හැටි"

"ඕ, ඔව්. අනේ ඇවිදින් මට හැමදේම කියන්න" වෙනත් කිසිම දෙයකට වඩා ඩැරල්ගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටින සැලී කිව්වා. "ඔයා කතා කරද්දි අහගෙන ඉන්න මම හුඟක් ආසයි."

සැලී සම්පූර්ණයෙන්ම වෙනස් වී සිටීම හරිම පුදුමයක්. ආපසු හැරී බලා නිහඬ, මුලුගැන්වුණ, බැරෑරුම් පෙනුමින් නිතර සිටි කුඩා සැලී හෝප් ගැන ඩැරල්ට මතක් වන විට ඇය නිතර සිනාසෙන, උද්‍යෝගිමත්, දිලිසෙන දෑසින් යුතු කෙනෙකු බවට පරිවර්තනය වීම සිතිමට පවා අපහසු දෙයක් ලෙස පෙනුණා. නිතර විහිළුවට බර, සිහිබුද්ධිය ඇති කරුණාවන්ත දැරියක්.

"එයා ඇලිසියා තරම්ම විහිළුකාරියක් නම් නොවෙයි" ඩැරල් තමාටම කියා ගත්තා. "ඒත් එයා හුඟක් විශ්වාසවන්තයි. කොහොම වුණත් එයාගේ කට සැර නැහැ. එයාට අනිත් අයව තේරුම් ගන්න පුළුවන්"

මේරි ලෝව්ගේ ධෛර්ය උපදවා ඉක්මනින් සිතීමට පොලඹවන සැලසුම ගැන ඩැරල් ප්‍රවේසමෙන් කල්පනා කළා. එය ඉතා පහසු දෙයක් විය යුතුයි. තටාකයේ ගැඹුරු කොටසේ

තමා තනිවනු පිණිස අනෙක් දැරියන් අනෙක් අත්තයට රැගෙන යන ලෙස ඇලිසියාට හා බෙටීට ඇය කිවයුතු බව ඈ සිතුවා. ඉන්පසුව ඇයට කකුලේ මස්පිඩු පෙරළුන බව බොරුවට හඟවා ඇඟලිය හැකියි.

"මම මොරදීලා මේරි ලෝව්ට කෑ ගහනවා" ඈ සිතුවා. "එතකොට මේරි ලෝව් ඒක කරයි. මම හති අරිමින් කතා කරනවා. "ඕ, මේරි ලෝව් ඔයා මගේ ජීවිතය බේරා ගත්තා. ඊට පස්සේවත් මේරි ලෝව් තමා ගැන තියෙන අදහස වෙනස් කර ගත්තේ නැත්තම් ඒක අමුතු දෙයක් වෙයි. ඒ වගේ දෙයක් තමන්ට කරන්න පුළුවන් කියලා එයාට එක සැරයක් හරි දැනගන්න පුළුවන් වුණොත් එයාගේ මෝඩ බය නැතිවෙලා ඕන දෙයකට මුහුණ දෙන්න හිතහදා ගනියි"

ඇත්තෙන්ම එය හොඳ සැලසුමක් මෙන් පෙනුණා. ඩැරල් ඇලිසියාට හා බෙටීට රහස පැවසුවා. "ඇත්තෙන්ම ඒක සැලීගේ අදහසක්" ඩැරල් කිව්වා.

"හොඳ අදහසක් කියලා ඔයාලට හිතෙන්නේ නැද්ද?"

"හොඳයි. ඔයා මොකටද කරදර වෙන්නේ ඒ මෝඩ මේරි ලෝව් කෙල්ල ගැන" ඇලිසියා පුදුමයෙන් ඇසුවා. "ඔයා කවදාවත් එයා ගැන සැලකිල්ලක් දැක්වූවේ නැහැ. එයාගෙන් වැඩක් නැහැ"

"ඒත් එයාව හදන්න පුළුවන්" ඇලිසියා අදහස භාරගත් ආකාරය ගැන තරමක් කලකිරී ඩැරල් වාද කළා.

"ඒතරම් දෙයක් බැරිවෙයි" ඇලිසියා කිව්වා. "මම හිතන්නේ එයා තටාකය ළඟට වෙලා කෑ ගසමින් ඉඳියි වෙන කෙනෙක් ජීවිතාරක්ෂක කඹය අරගෙන එනතුරු. එයා හොඳටම බය වෙන එක විතරයි වෙන්නේ. එතකොට හැම කෙනෙක්ම එයාව ගණන් ගන්නේ නැතුව ගියොත් එයා තවත් නරක්වෙන එකයි වෙන්නේ"

"අපොයි" අධෛර්යමත් වූ ඩැරල්ට කියවුණා. "ඒක නම් නරක දෙයක්. ඕ, ඇලිසියා මට එහෙම දෙයක් හිතුණේ නැහැ"

ඇලිසියා කී දෙය ඩැරල් සැලීට කිව්වා. "මට තේරෙනවා එයා කියන දෙය" ඇය කිව්වා. "හැදෙනවා වෙනුවට මේරි ලෝව්



...ත් නරක් වෙයි. ඒ මොකද අනිත් අය එයාට හිනාවෙන්න ...ත් ගනියි. ඇලිසියාට හොඳ කල්පනාවක් තියෙනවා. සැලී, අපි ...ගැන හිතුවේ නැහැ නේද?"

"ඔව්, ඇලිසියාට තියෙන්නේ හොඳ කල්පනාවක්" සැලී ...මින් කිව්වා. "ඒත් සමහර වෙලාවට එයාගේ කල්පනාව ඕනෑවට ...ඩියි ඩැරල්. එයාට තවත් වැදගත් දෙයක් අමතක වෙලා"

"ඒ මොකක්ද?" ඩැරල් ඇසුවා. "එයාට අමතක වෙලා ඔයයි ...තුරේ දඟලමින් කෑ ගසන්නේ කියන එක" සැලී කිව්වා. "හැම ...කෙනෙක්ම දන්නවා මේරි ලෝව් ඔයා ගැන ඉහළින් හිතනවා ...සුලා. ලෝකේ ඕනෑම දෙයක් ඔයා වෙනුවෙන් එයා කරයි ඔයා ...ටට අවස්ථාවක් දුන්නොත්. හොඳයි, ඔන්න දැන් අවස්ථාව ...තියෙනවා, එයා කරයි. බලන්න මම වැරදිද කියලා. මේරි ලෝව්ට ...අවස්ථාවක් දෙන්න ඩැරල්. ඇලිසියා දකින්නේ එයා දුර්වල, අඩන ...බෙක් වගේ. ඒත් එයා ආදරය කරන කෙනෙක් වෙනුවෙන් ඊට ...වා ලොකු දෙයක් එයාට කරන්න පුළුවන්"

"හරි, මම එයාට අවස්ථාවක් දෙන්නම්" ඩැරල් කිව්වා. "ඒත් ඇලිසියා හරි කියන එක මට නොහිතා ඉන්න බැහැ. එයාට හොඳ ...අවබෝධයක් තියෙන නිසා අනිත් අය මැන ගන්න පුළුවන්. එයා බෙටීගේ යාළුවා නොවී මගේ යාළුවා වුණා නම් කියලා හිතෙනවා"

සැලී තවත් කිසිවක් කීවේ නැහැ. ඇය ඩැරල් සමග කාඩ් සෙල්ලම් කළ අතර බොහෝ දුරට නිහඬව සිටියා. ටික වේලාවකින් පැමිණ ඇයව පිටතට යැවූ නිසා ඇයට සූදානම් පන්තියට යාමට සිදුවුණා.

"මම සැලීගේ අදහස කරලා බලන්න යන්නේ" ඈ ඇලිසියාට කිව්වා. "ඔයයි, බෙටීයි අනිත් අයව නොගැඹුරු හරියට එක්ක යන්න. ඒ මේරි ලෝව් ගැඹුරු පැත්තේ ඉන්න වෙලාවට. එතකොට මම කෑ ගහලා බලන්නම් මේරි ලෝව්ට කඹය අරගෙන මා ළඟට විසි කරන්න තරම් පුළුවන්කම තියෙනවද කියලා. ඒක ඒ තරම් දෙයක් නොවෙයි"

"ඒක එයාට කරන්න බැරි තරම් ලොකු දෙයක්" තමා ඩැරල්ව අධෛර්යයට පත් කර තිබියදීත් ඇය ඒ අදහසම නැවතත්

ක්‍රියාවට නැගීමට යනු ඇත මඳක් සිත රිදුන ඇලිසියා කිව්වා. "ඒත්, අපි බලමු."

එලෙස, ඊළඟ සවස සැලසුම ක්‍රියාත්මක වුණා. පළමු පන්තියේ දැරියෝ තම නාන ඇඳුම් හා වෙරළේදී අඳින ඇඳුම්වලින් සැරසී කතා බස් කරමින් තටාකය බලා ඇවිද ගියා. බොරු හෙම්බිරිස්සාව ගැන පන්තියේ ඔච්චම් නිසා බුම්මාගත් ගොන්ඩොලින් ද ගියා.

දිය නෑමට ඇඳුම් මාරුකර ගැනීමට සිදු නොවීම ගැන මේරි ලෝව් දැඩි සතුටින් පසුවුණා. ඇයට වතුර එතරම් පිළිකුල්. ඩැරල් ඇයට අඬ ගැසුවා. "ඔයාට පුළුවන් ගැඹුරු පැත්තට කාසි විසි කරන්න. එතකොට මම ඒවා ගන්න කිමිදෙනවා. මේරි ලෝව් මම ගැඹුරු පැත්තේ කිමිදෙන හැටි බලන්න."

"හරි" කී මේරි ලෝව් සතුටින් කාසි කිහිපයක් සාක්කුවේ දමා ගත්තා. ඇගේ ප්‍රතිශ්‍යාව බොහෝ දුරට සුවවී තිබුණා. කොතරම් සතුටක් ද! නෑමට නොලැබීම ගැන ඇය කොතරම් සතුටු වෙනවාද!

දැරියෝ වතුරට පැන්නා. සමහරු ජලයේ කිමිදුණා. ගොන්ඩොලින් පමණක් සෙමින් පඩිපෙළේ පහළට බැස්සා. එහෙත් වේගයෙන් ගැස්සී ගිය ඇය දියේ ගිලී ගියා. ඒ කවුරුන් හෝ ඇයව තල්ලු කළ නිසයි. ජලයේ අතපය ගසා මුව විවර කර හුස්ම ගනිමින් ජලය කලඹා ඇය නැගී සිටියේ කෝපයෙන් හා දැඩි අසතුටින් වුවද කිසිදු දැරියක් ඇය සමීපයේ නොසිටි නිසා එය කළේ කවුද යන්න ගැන ඇයට කිසිදු අදහසක් තිබුණේ නැහැ. ඒ ඩැරල් හෝ ඇලිසියා වියහැකි යැයි ඈ සිතුවා. යක්ෂණියෝ !

අනිත් අය දෙස බලමින් මේරි ලෝව් සිටියේ ගැඹුරු අන්තයේ. බොහෝ විට ඇය බලා සිටියේ කුඩා නැව් නාශක උණ්ඩයක් මෙන් තම දුඹුරු ඇත්වලින් ජලය කපාගෙන පැහැදිලිව වේගයෙන් ඉදිරියට තල්ලු වෙමින් ඩැරල් පිහිනන ආකාරයයි. මේරි ලෝව් සාක්කුවට අත දමා කාසි ස්පර්ශ කර බැලුවා. කිමිදී කාසි සෙවීමට ඒවා වතුරට විසි කරන ලෙස තමාගෙන් ඉල්ලීම ඇයට මහත් සතුටට කාරණයක් වුණා. ඉතා කුඩා දෙයක් වුවද නිතර ඩැරල්ට යමක් කර දීමට තිබුණේ නම් එය අපූරු දෙයක් වුණා.



"එන්න අනිත් කෙළවරට. අපි තරගයක් තියමු." හදිසියේම ඇලිසියා කිව්වා. "එන්න, හැමකෙනාම"

"මම ටිකක් මෙතැන නැවතිලා කාසි ගන්න කිමිදෙන්නම්" ඩැරල් කෑ ගසා කිව්වා. "මම තරගයට ලෑස්තියි. ඔයාලා පටන් ගන්න කොට මම එකතු වෙනවා. හායි, මේරි ලෝව්. ඔයා ළඟ කාසි තියෙනවද?"

සැලසුම ගැන දැන සිටියේ ඇලිසියා හා බෙටි පමණක් හෙයින් ඔවුන් සිදුවන්නට යන දෙය දෙස බලා සිටියා. ඩැරල් කෑ ගසන විට මේරි ලෝව් අඩා වැලපෙමින් ගල් තලාවට මුල් ඇදගෙන සිටිනු ඇතැයි ඔවුන් ඒකාන්තයෙන්ම දැන සිටියා. දුවගොස් ජීවිතාරක්ෂක කඹය ගෙන ඒමට තරම් ඇයට ධෛර්යයක් නොතිබෙනු ඇත.

අනෙක් දැරියෝ ජලය ඉසිමින් තරගය සඳහා තම ස්ථානවලට යන්නට වුණා. මේරි ලෝව් ජලයට කාසියක් විසි කළ අතර ඩැරල් එය ගැනීමට කිමිදුණා.

ඇය එය ජයග්‍රාහී ලෙස රැගෙන මතුපිටට ආවා. "තව එකක් විසි කරන්න, මේරි ලෝව්" ඇය කෑ ගැසුවා. ජබෝග් ! තවත් කාසියක් වැටුණා. කරදරයට පත් වූ බව බොරුවට ඇඟවීමට කාලය හරි බව සිතමින් ඩැරල් නැවත කිමිදුණා. ඇය අයාගත් මුවින් හුස්ම පිට කරමින් මතුපිටට පැමිණුණා. "බේරාගන්න ! බේරාගන්න" ඇය හඬ තැලුවා. "මගේ මස් පෙරළුනා. ඉක්මනට මේරි ලෝව් ජීවිතාරක්ෂක කඹය ...., ජීවිතාරක්ෂක කඹය ..... උදව් කරන්න ... උදව් කරන්න ....!" ඇත් විසි කරමින් වතුරේ දඟලමින් ඇය මඳක් වතුරේ ගිලුණා. මේරි ලෝව් සම්පූර්ණයෙන් ගල්ගැසී බලා සිටියා. ඇලිසියා බෙට්ට වැලමිටෙන් ඇන්නා.

"මම හිතුවා හරි" ඇය පහත් කට හඬකින් කිව්වා. "ජීවිතාරක්ෂක කඹේ ගේන්න දුවන්නත් බැරි තරම් බබෙක් !"

"බේරා ගන්න" ඩැරල් කෑ ගැසූ අතර ඇය ඇත්තෙන්ම කරදරයට පත්ව ඇතැයි සිතූ දැරියෝ දෙතුන් දෙනෙක් වේගයෙන් ඈ වෙතට පිහිනා ඒමට පටන් ගත්තා.

එහෙත් වෙනත් කෙනෙක් ඊට ප්‍රථමව ඩැරල්ට සමීප වුණා. වතුරට වැටෙන හඬ දෝංකාර දෙන අතරේ හොඳින් ඇඳුම්වලින් සැරසී සිටි මේරි ලෝව් තමා දැන සිටි පිහිනුම් ක්‍රම ස්වල්පය මතක් කර ගනිමින් පිහිනා ආවා. ඩැරල් වෙතට සමීප වූ ඈ අත් දිගුකර ඩැරල්ව අල්ලාගෙන උදව් කිරීමට සැරසුණා.

දෙවන වතාවට මතුපිටට ඉපිලුණ ඩැරල් තමා අසලම ඇති මේරි ලෝව්ගේ තෙතබරිත හිස දැක මහත් විමතියට පත්වුණා. තම දෙනෙත් ඇදහිය නොහැකි කලක මෙන් ඇය මහත් වූ දෙනෙතින් බලා සිටියා.

"මාව අල්ල ගන්න ඩැරල්. මාව අල්ලා ගන්න" මේරි ලෝව් හතිහරිමින් කිව්වා. "මම ඔයාව බේරා ගන්නම්"



# 20

එවිට අනෙක් පිහිනුම්කාරියන් දෙතුන් දෙනා පැමිණ තියුණු හඬින් කෑ ගැසුවා. "මොකද ඩැරල් ? පැත්තකට වෙන්න, මේරි ලෝව්" එහෙත් මේරි ලෝව්ට නොහැකි වුණා. ඇය විශාල උත්සාහයක් දරා ජලයට පැන ටික දුරක් පිහිනාවිත් තිබුණා. එහෙත් දැන් ඇගේ ශක්තිය හීනව තිබූ අතර ඇඳුම්වල බරින් ඇය පහතට ඇදුණා.

එක් පිහිනුම්කාරියක් ඇයව පරෙස්සමෙන් එක් පැත්තකට රැගෙන ගිය අතර යකඩ බටයක් අල්ලා ගත් ඈ ආපසු හැරී උරහිස මතින් ඩැරල් ආරක්ෂිත දැයි බැලුවා.

දිලිසෙන ඇසින් යුතුව ඉක්මන් අත් පහරවලින් වේගයෙන් තමා වෙතට පිහිනා එන ඩැරල් දුටු මේරි ලෝව් ඇය මස්පිඩු පෙරළීමෙන් සුවය ලබා ඇති බව සිතුවා.

"මේරි ලෝව් ! පිහිනන්න ඒතරම් බැරිව ඉද්දිත් ඔයා එක පාරටම වතුරට පැන්නා ! ඔයා මෝඩියක්. ඒත් මම දැකලා තියෙන නිර්භීතම මෝඩි ඔයා" ඩැරල් කෑ ගැසුවා.



කවුරුන් හෝ වෙවුලමින් සිටි විමතියට පත් මේරි ලෝව්ට තටාකයෙන් පිටතට යාමට උදව් කළා. දිය බේරෙන ඇඳුම්වලින් යුතුව අපහසුවෙන් තටාකයෙන් පිටතට එන අතරේ ඉතා උනන්දුවෙන් වට කරගෙන පිටට තට්ටු කරමින් හා ප්‍රශංසා කරමින් මේරි ලෝව්ට දැරියන් උදව් කරන අතරේම පොට්ස් ගුරුතුමිය ද ගල්තලාව දිගේ පැමිණ පුදුම වී බැලුවා.

"මොකක්ද වුණේ ?" පුදුමයෙන් සිටි ගුරුතුමිය ඇසුවා. "මේරි ලෝව් වතුරට වැටුණ ද?" උද්‍යෝගීමත් කට හඬවල් සිදුව තිබූ දෙය කිව්වා. "එයා ඩැරල්ව බේරා ගන්න වතුරට පැන්නා ! ඩැරල්ගේ කකුලේ මස් පෙරළිලා ජීවිතාරක්ෂක කඹය ඉල්ලා කෑ ගැසුවා. ඒත් මේරි ලෝව් කෙළින්ම වතුරට පැන්නා ඩැරල්ව බේරා ගන්න. අනික එයාට පිහිනන්නත් බැහැ"

අනිත් සෑම කෙනෙකුම මෙන්ම පොට්ස් ගුරුතුමිය ද විමතියට පත්වුණා. මේරි ලෝව් ! එහෙත් කන් වැයෙකු දුටු පමණින් ද මේරි ලෝව් හඬ තලනවා. කොතරම් පුදුම සහගත දෙයක් ද!

"ඇයි එයා ජීවිතාරක්ෂක කඹය විසි කළේ නැත්තේ ?" ඇලිසියා ඇසුවා.

"ඒක එත.... එතන තිබුණේ නැහැ" සීතලෙන් ද, ත්‍රාසයෙන් හා කම්පනයෙන් ද වෙවුලමින් මේරි ලෝව් පිළිතුරු දුන්නා. "ඒක නැහැ. ඒක අලුත්වැඩියාවට ගෙනිහින්. ඔයාලා දන්නේ නැද්ද?"

එය තිබූ තැන නොතිබුණ බව කිසිවෙක් දැන සිටියේ නැහැ. මේරි ලෝව් මෝඩියක් නොවෙයි. ඩැරල්ව බේරා ගැනීමට ජීවිතාරක්ෂක කඹය එහි නොතිබූ බව ඇ දැන සිටි අතර ඇය කර තිබුණේ ඊළඟට කළ හැකි හොඳම දෙයයි. තමාම වතුරට පැනීම. හොඳයි, කවුරු නම් එසේ සිතත් ද?

පොට්ස් ගුරුතුමිය මේරි ලෝව්ව ඉක්මනින් ගල්තලාවේ ඉහළට කැටුව ගියා. දිලිසෙන ඇසින් යුතුව ඩැරල් ඇලිසියා දෙස බැලීමට හැරුණා.

"හොඳයි .... කවුද හරි? සැලී ද? ඔයා ද? ඇයි, මේරි ලෝව් එඩිතරයි. එයා වතුරට කැමති නැති එක විතරක් නොවෙයි. එයාට හරියට පිහිනන්නත් බැහැ. එයා අපි වගේ නොවෙයි අපිටත් වඩා එඩිතරයි. නැත්නම් ඊට වඩා හුගක් බය වෙන්නයි තිබුණේ."

තමා වැරදි බව ඔප්පු වුවද ඇලිසියාට එය අවංකවම පිළිගැනීමේ හැකියාව තිබුණා. ඇ හිස සැලුවා. "ඔව්, එයා ඇත්තටම එඩිතරයි. මම නම් ඒක කවදාවත් හිතුවේ නැහැ. ඒත් ඔයා හැර වෙන කෙනෙක් වුණා නම් එයා කවදාවත් ඒක කරන්නේ නැහැ."

මේ ගැන සැලීට කීමට ඩැරල්ට ඉවසීමක් නැතිව ගියා. තේ වේලාවෙන් පසුව ඇ බබළන මුහුණින් යුතුව කඩිනමින් ගියා. "සැලී, ඔයාගේ අදහස නම් විස්මයජනකයි ! හරිම අපූරුයි. දන්නවාද එතැන ජීවිතාරක්ෂක කඹය තිබිලා නැහැ. ඉතින් මේරි ලෝව් ඇඳුම් පිටින්ම පැනලා මාව බේර ගන්න හැමදේම කළා."

"අපොයි" සැලීට කියවුණ අතර ඇගේ මුහුණ ද බැබළීමට පටන් ගත්තා. "මට ඒක කවදාවත් කල්පනා වුණේ නැහැ. ඔයාටත් එහෙම නේද ඩැරල්, ඒක පුදුමයක්. දැන් ඔයාට පුළුවන් වෙයි මේරි ලෝව්ව හරියට හඳුනා ගන්න"

"ඒ කියන්නේ මොකක්ද?" ඩැරල් ඇසුවා.

"හොඳයි. එයාට කියන්න කවුරුවත් නොහිතපු විදිහට එයා මොනතරම් නිර්භීත ද කියලා. එයාට අනිත් දේවල්වලදීත් ඕනෑ නම් නිර්භීත වෙන්න පුළුවන් කියන්න" සැලී කිව්වා.

"ඔයා නම් පුදුම මොළකාරියක්" ඩැරල් සැලීව අගය කරමින් කිව්වා. "මට කවදාවත් ඔයාට වගේ හිතන්න බැහැ. හරි, මම මගේ කොටස කරන්නම්. මේරි ලෝව් ඔයාව බලන්න ආපුවාම මොනවා හරි ටිකක් ඔයත් කියන්න"

එලෙස, ඩැරල්ව බේරා ගැනීමට මේරි ලෝව් ජලයට පැන්න ආකාරය ගැන කතාව පාසලේ සෑම අස්සක මුල්ලකම කතාවෙද්දි ඇගේ මහත් පුදුමයට මෙන්, මේරි ලෝව් දිනයේ වීරවරිය වී තිබුණා.

"තවදුරටත් මුල්ලකට ගුළිවෙලා ඉන්න එකේ හෝ මකුළුවෙකු දැකලා බෙරිහන් දෙන එකේ තේරුමක් නැහැ" ඩැරල් කිව්වා. "දැන් අපි දන්නවා ඔයා මොනතරම් එඩිතර ද කියලා. අපි කැමතියි තවත් ඔයාගේ එඩිතරකම් දකින්න"

"ඔ, ඔව්" මේරි ලෝව් සතුටින් ඉපිලෙමින් කිව්වා. "මම උත්සාහ කරන්නම්. මම දන්නවා මට එඩිතර වෙන්න පුළුවන් කියලා. ඒක අමුතුයි. කරන්න බැහැ කියලා හිතුවොත් හැමදේම අමාරුයි. මම කවදාවත්ම හිතුවේ නැහැ ඒ විදිහට ගැඹුරු පැත්තට පනින්න පුළුවන් වෙයි කියලා. ඒත් මම පැන්නා ! මම එහෙම දෙයක් හිතලාවත් තිබුණේ නැහැ. ඒත් මම කළා."

මේරි ලෝව්ට ප්‍රසංශාත්මකව වචනයක් හෝ කීමට නොතිබුණ එකම කෙනා ගොන්ඩොලින් පමණයි. මේරි ලෝව් ගැන ඇති වූ මෙම කලබලය ඇය ඊර්ෂ්‍යා සහගත වීමට එක හේතුවක්. තමාට හැකි නම් ඕනෑම දෙයක් කිරීමට හැකියාව තිබෙන බව මේරි ලෝව්ට අවබෝධ කරවීමට මෙය හොඳ අවස්ථාවක් නිසා ගුරුවරියන් පවා මෙහිදී බොහෝ දේ කළා.

ගොන්ඩොලින් මේ කලබලය ඉවසුවේ නැහැ. විශේෂයෙන් මේරි ලෝව් වතුරට පැන තිබුණේ ඩැරල්ව බේරා ගැනීමටයි.

"එයාට යහපතක් කරන්න කාටවත් ඕනෑ කියන එක හිතන්නවත් බැහැ" කෝප වූ දැරියගෙන් ඇයට වැදුණ දැඩි අතුල් පහර මතක් වීමෙන් ඇය සිතුවා. "මම නම් ගිලෙන්න අරිනවා. මෝඩ මේරි ලෝව් ! මම හිතන්නේ දැන් එයා අහංකාර වෙයි."

එහෙත් මේරි ලෝව් එසේ වූයේ නැහැ. ඇය තම සුපුරුදු ලැජ්ජාශීලී නිහඬ බවින් යුතුවුවද ඇය වැඩි විශ්වාසයක් හා තමා වෙනුවෙන් නැගී සිටීමට හැකියාව තිබුණා. ඇය සතුටටත්, ආඩම්බරයටත් පත්ව සිටිය ද ගොන්ඩොලින් වැනි දැරියක කරන ආකාරයට ඇය එය පෙන්නුවේ නැහැ.

ඇය ගොන්ඩොලින්ට නිර්භීතව මුහුණ දුන් අතර ගොන්ඩොලින් දැඩි ලෙස සිත් රිදීමටත්, කෝපයටත් පත්වුණා. එමෙන්ම, සැලි නැවත පාසලට පැමිණි විට සති දෙකකට පසුව ඇය ද වෙනස් වී ඇති බව පෙනුණ අතර ඇය ද ගොන්ඩොලින්ගේ විකාර ඉවසුවේ නැහැ. ඇය මේරි ලෝව්ගේ පැත්ත ගත් අතර ගොන්ඩොලින් මේරි ලෝව්ට කඩා පනින විට ඇයට දොස් කිව්වා.

වාරය ඉක්මනින්ම ගෙවී යන්නට වුණා. නිවාඩුවට තිබුණේ තව සති තුනයි. කාලය මෙතරම් ඉක්මනින් පියඹා යාම ගැන ඩැරල්ට ඇදහිය නොහැකි වුණා.



ඈ හොඳින් වැඩ කළ අතර සතියේ ලකුණුවලදී ඈ දෙවරක් පස්වන ස්ථානයට පැමිණ තිබුණා. එක දිගට පහතම රැඳී සිටි එකම කෙනා ගොන්ඩොලින් පමණයි. මේරි ලෝව් පවා ස්ථානයක් දෙකක් පසුකර විත් තිබුණා. ලකුණු වාර්තාව ගෙදර ගෙන යන විට වාර අවසානයේ තමා හැම දෙයකම ඉහළින්ම සිටින බව කියා ගොන්ඩොලින් තම දෙමව්පියන් කෙසේ නම් රවටනු ඇති දැයි ඩැරල් සිතුවා. ඇගේ බිහිසුණු අසමත්කම වාර්තාවේ හොඳින් දැක්වීම ඒකාන්තයි.

ඩැරල් දිනක් ඇය සමග ඒ ගැන කතා කළා. "ගොන්ඩොලින්, මේ වාරයේ පන්ති වැඩ ඔයා මොනතරම් නරකටද කරලා තියෙන්නේ කියලා වාර්තාව දකිද්දී ඔයාගේ අම්මයි, තාත්තයි මොනවා කියයිද?" ඈ කුතුහලයෙන් ඇසුවා.

ගොන්ඩොලින් බියපත්ව බැලුවා. "ඒ කියන්නේ මොකක්ද, මගේ වාර්තාව?" ඇය ඇසුවා.

"දෙවියනේ ! ඔයා දන්නැද්ද වාර්තාව මොකක්ද කියලා?" විමතියට පත් ඩැරල් ඇසුවා. "බලන්න. මම මගේ පරණ එකක් පෙන්වන්නම්. මගේ පරණ ඉස්කෝලෙන් දුන්න අවසාන එක මට ගෙනෙන්න සිද්ධවුණා මිස් පොට්ස්ට පෙන්වන්න"

ඇඩි භීතියකින් දෙනෙත් මහත්කර ගෙන සිටි ගොන්ඩොලින්ට ඈ එය පෙන්නුවා. මොනවා ! සියලුම විෂයන්ගේ ලයිස්තුවක්. ලකුණුත් එක්ක, ඒ වගේම පන්තියේ තත්ත්වය, කරපු වැඩ ගැන විස්තරයක්, තම වාර්තාවේ සටහන් වන විස්තර ගැන ගොන්ඩොලින්ට හොඳින් සිතා ගැනීමට හැකි වුණා.

"ප්‍රංශ : ඉතා දුර්වලයි හා කම්මැළියි"

"ගණිතය : සුළු හෝ උත්සාහයක් නැහැ. නිවාඩු කාලයේ දී වැඩිපුර ඉගැන්වීම සුදුසුයි."

"ක්‍රීඩා : අවමන් සහගතයි. ක්‍රීඩාව පිළිබඳව හෝ කණ්ඩායම් හැඟීම නැත." ඒ ආදි වශයෙන්. අසරණ ගොන්ඩොලින්. මේ ආකාරයට ඇගේ අයහපත් වැඩ හා හැසිරීම වාර්තාවකින් තම දෙමව්පියන් වෙත යවනු ඇතැයි ඇයට මොහොතකට හෝ

කල්පනා වී තිබුණේ නැහැ. පුටුවකට ඇද වැටුණ ඈ මහත් වූ දෙනෙතින් ඩැරල් දෙස බලා සිටියා.

"ඒත්, ගොන්ඩොලින් මීට ඉස්සර ඔයාගේ වැඩ ගැන වාර්තාවක් ලැබිලාම නැද්ද?"

"නැහැ" මානය බිඳුණ ගොන්ඩොලින් කිව්වා. "මෙහේ එන්න ඉස්සර මම කවදාවත් ඉස්කෝලයකට ගිහින් තිබුණේ නැහැ. මිස් වින්ටර් විතරයි මට උගන්වලා තියෙන්නේ. එයා කවදාවත් වාර්තා හැදුවේ නැහැ. එයා අම්මාට කිව්වේ මම හොඳින් වැඩ කරනවා කියලා විතරයි. ඉතින් අම්මා එයාව විශ්වාස කළා. මම මෙහෙට එනතුරු ඒ තරම දුර්වලයි කියලා මම දැනගෙන හිටියේ නැහැ."

"හොඳයි, මම හිතන්නේ ඔයාගේ දෙමව්පියෝ ඔයාගේ වාර්තාව දැක්කාම හොඳටම කම්පනය වෙයි." ඩැරල් අනුකම්පාවකින් තොරව කිව්වා. "මම හිතන්නේ ඉස්කෝලේ නරකම වාර්තාව ඔයාගේ එක වෙයි. නිවාඩුව එක්ක වාර්තාව ගෙදර ගෙනියද්දි වාරමැද නිවාඩුවේදි ඔයා අම්මාටයි, මිස් වින්ටර්ටයි ඒ තරම් බොරු කියපු එක ගැන ඔයාට කනගාටු වෙන්න වෙයි.

"මම ඒක ඉරලා දානවා" තම වාර්තාව දුටු විට දෙමාපියන් කොතරම් විමතියට, කලකිරීමට හා කෝපයට පත්වනු ඇතිදැයි දැනුණ ගොන්ඩොලින් නපුරු ලෙස කිව්වා.

"ඒක කරන්න බැහැ" ඩැරල් කිව්වා. "ඒක තැපෑලෙන් යන්නේ. හත් හා ! ඔයා අම්මාටයි, මිස් වින්ටර්ටයි කියපු මෝඩ දේවල් ගැන මට මේරි ලෝව් කිව්වා. මීයෙකුට තරම්වත් මොළයක් නැතුව තියෙන මොළෙන් වැඩක් ගන්නෙත් නැතිව එහෙම කයිවාරු ගැහීම ගැන හිතන්නවත් බැහැ."

ගොන්ඩොලින් නිරුත්තර වුණා. ඩැරල් මොනතරම් නිර්භීත ලෙස ඇයට කතා කරනවා ද? නිවාඩු දවසේ දී තමා මවට කී දේ අසා සිට ඒවා නැවත අන් අය සමග කීමට මේරි ලෝව් මොනතරම් නිර්භීත වෙලාද? පලකට නැති, කුළෑටි, පිළිකුල් සහගත අවලම් කෙල්ල ! ඈ මෙයට පළිගත යුතුයි. ඈ ඇගේ තීන්ත පෑන ගෙන එය පාගා කඩා දමනවා ! ඇය කරනවා. ඇය ඒක කරනවාමයි ....



ඔ, ඒ නපුරු කළගුණ නොදත් කෙල්ලගෙන් පළිගැනීමට ඇයට තව කොතරම් දේ කළ හැකිද!

"මම එයත් එක්ක යාළු වුණාට පස්සේ" ගොන්ඩොලින් කෝපයෙන් සිතුවා. "උඹට මගේ හිතවත්කමක් නැහැ. මම වෛර කරනවා"

අනතුරුව ඇය තම වාර්තාව ගැන සිතුවා. තම පියා එය කියවන බව සිතුණ ඇයට මහත් බියක් දැනුණා. ඇය කම්මැළි හා පලකට නැතිව තමා ගැන ආඩම්බරයෙන් හිතන කෙනෙක් බව ඔහු කියා තිබුණා. ඒ නිසයි ඔහු ඇයව පාසලකට එව්වේ. ඔහු ඉතා බිහිසුණු දේ කියා තිබුණා. ගොන්ඩොලින් ඒවා අමතක කිරීමට උත්සාහ කළ ද නිතර නිතර ඒවා ගොන්ඩොලින්ගේ මතකයට ආවා.

ඇය කැමති ලෙස බොරු කීමට ඇට පුළුවන්කම තිබුණා. කැමති ලෙස පුරසාරම් කීමට ඇට පුළුවන්කම තිබුණා. එහෙත් කම්මැළි, අහංකාර, අවිශ්වාස, වගකීම් නොදරන හා මෝඩ යන වචන වාර්තාවේ තියෙනවා. ඒ තමාට හොඳින්ම හිමිවන වචන. හොඳයි. ඇගේ බොරු හා කයිවාරුවලින් පලක් වන්නේ නැහැ.

"තව සති දෙක තුනක් තියෙනවා" ගොන්ඩොලින් වියරු වැටී සිතුවා. "මේ සති කීපයේ දී මගේ වාර්තා හොඳ කර ගන්න පුළුවන් වෙයිද? මට උත්සාහ කරන්න සිද්ධ වෙනවා. ඉස්කෝලෙ වාර්තා තියෙනවා කියලා මට ඉස්සර හිතුණේ නැත්තේ ඇයි? මම ටිකක් මහන්සියෙන් වැඩ කරන්න තිබුණා. දැන් මට වහලියක් වගේ වැඩ කරන්න වෙනවා."

එමෙන්ම, පොටිස් ගුරුතුමියගේ මහත් විමතියට එමෙන්ම මම්සලීගේ ද එවන් වූ පුදුමයට මෙන් ගොන්ඩොලින් වැඩ කිරීම ආරම්භ කළා. ඈ වැඩ කළ තරමක්. ඈ දිගටම පොත් කියවූවා. ඈ රචනා ලියා නැවත ඒවා හොඳ අත් අකුරින් ලිව්වා. පන්තියේ හොඳම අවධානයෙන් සිටි කෙනා ඇයයි.

"ගොන්ඩොලින්ට මොකද වෙලා තියෙන්නේ?" පොටිස් ගුරුතුමිය මම්සලීගෙන් ඇසුවා. "මට විශ්වාසයි එයාට තියෙනවා ටිකක් හරි මොළයක් අන්තිමට"

"මටත් හිතෙනවා" මම්සලී කිව්වා. "බලන්න මේ ප්‍රංශ අභ්‍යාසය. එක වැරැද්දයි ! මීට ඉස්සර ගොන්ඩොලින්ගේ වැඩ මෙහෙම තිබුණේ නැහැ. එයා අලුත් පිටුවක් පෙරළන්නයි යන්නේ"

මහන්සි වී වැඩ කිරීමෙන් ගොන්ඩොලින් විනෝදයක් ලැබුවේ නැහැ. ඇයට සිනාසුණ ඩැරල් හදිසියේ එවැනි වෙනසක් ඇතිවීමට හේතුව අනිත් අය සමග පැවසුවා.

"එයා කැමති නැහැ වාර මැද නිවාඩු දවසේ එයා කිව්වේ බොරු කියලා ගෙදර අය දැන ගන්නවාට" ඇය කිව්වා. "එහෙම නේද, මේරි ලෝව්?"

"කයිවාරු ගහන කොට වෙන්නේ ඕක තමයි. ගොන්ඩොලින් කවදාහරි දවසක තමන් කියපු දේවල් පස්සෙන් එනවා."

මේරි ලෝව් ද සිනාසුණා. ඩැරල් හා සැලී සිටින තැනකදී වුවද ඇය නිර්භීතව සිනා සී කටයුතු කළා. ගොන්ඩොලින් ඇයට රවා බැලුවා. වෙස්මාරු කරන කපටි කෙල්ල !

මේරි ලෝව්ගෙන් පළිගැනීමට, ඊළඟ දිනයේ ගොන්ඩොලින්ට අවස්ථාව උදා වුණා. කිසිවෙකු නැති අතරතුරේදී ඇ පොදු කාමරයට ගියා. මේරි ලෝව්ගේ කබඩයේ තිබුණේ ඇය ඉතා ආදරයෙන් ආරක්ෂා කළ තීන්ත පෑනයි. ගොන්ඩොලින් එය එක්වරම දැක ගත්තා.

"මේක තමයි ඒකේ අවසානය" එඩිරිවාදිකම පිරිමසා ගැනීමට සිත් වූ ඈ එය බිමට දමා ගැසුවා. ඇය එයට තදින් පා ඔබා ඇමූ විට සුනුවිසුනු වූ පෑනින් විසිවුණ තීන්ත ලී පොළොව මත විසිරුණා.



# 21

තැළී, පොඩි වූ පෑන පළමුවෙන් දුටුවේ ජීන්. පොතක් ගැනීමට පොදු කාමරයට පැමිණි ඈ ගෙබිම මත තිබූ තීන්ත හා පෑනේ සුන්බුන් දැක වහා නැවතුණා.

"දෙවියනේ !" ජීන්ට කියවුණා. "කවුද මේක කළේ ? හරිම කැත වැඩක් !" එමිලි හා කැතරින් ද පැමිණුණා. ජීන් පෑන පෙන්වූවා. "අන්න. බලාගන්න"

"මේක, මේරි ලෝව්ගේ පෑන" කැතරින් ඇඩි කලකිරීමෙන් කිව්වා. "හරිම අපරාදයක්. කවුරු කරන්න ඇති ද? මේක බැරිවීමකින් වුණ දෙයක් නොවෙයි."

මේරි ලෝව් ඇතුළට පැමිණියේ කලබල නැති වයලට් සමග. කැබලි වූ පෑන දුටු විට ඈ එතැන සිටගෙන වැලපෙන්නට වුණා. "අනේ ! කවුද මේක කළේ ? මේක උපන්දිනේට මට අම්මා දුන්නේ. ඒක වජ්ප කරලා ආලා!"

සියලු ඇරියන් රොක් වුණා. කතාබහේ නිරතව පැමිණි ඩැරල්, සැලී හා අයිරින් එතරම් ඇරියන් පිරිසක් නිහඬව වටවී සිටිනු දැක මවිතයට පත් වුණා. ඔවුන් පිරිසට එකතු වුණා. ඔවුන් මේරි ලෝව් නැවත හඬ නගා විලාප දෙනු දැක එතරම් පුදුමයට පත්වුණේ නැහැ.

"අම්මා මොනවා කියයිද? මේක ඉස්කෝලෙට ගෙනියනවා නම් අම්මා මට කිව්වා හොඳට පරිස්සම් කර ගන්න කියලා"

සිවුරුවම් හඬක් නගමින් ආ ඇලිසියා ද තද දම් පැහැ තීන්ත පැල්ලම් මත පොඩි වී තිබූ පෑන දැක මවිතයට පත්වුණා. කෙනෙකුට එසේ කිරීම කොතරම් පිළිකුල් සහගත දෙයක් ද!

"කවුද මේක කළේ ?" ඇය තදින් ඇසුවා. "මේක පොට්ටිට කියන්න දෙයක්. ඕනෑ ඔට්ටුවක් ගොන්ඩොලින්. ඊර්ෂ්‍යාකාර කපටි කෙල්ල"

"කෝ ගොන්ඩොලින්" කැතරින් ඇසුවා. කිසිවෙක් ඇත සිටියේ නැහැ. ඇත්තෙන්ම ඇය සිටියේ දොරටුවට පිටතින්. අනෙක් අය මෙන් ඇය ද බිඳුණු පැන දැක එය කළ කෙනාට දෙස් දෙවොල් තැබීමට සූදානම්ව සිටියා. ඇය බොරු රඟපෑමක් කිරීමට සිටියද දැරියන්ගේ කෝපාවිෂ්ට කෑගැසීම ඇසී ඇගේ හදවත ඇය පසුපසට අදින්නට වුණා. පැකිළෙමින් ඇය සවන් දීගෙන සිටියා.

"මේ බලන්න" ඇලිසියා කිව්වා. "මේක කළේ කවුද කියලා හොයා ගන්න හොඳ ක්‍රමයක් තියෙනවා. අපි ඒක කරමු."

"ඒ මොකක්ද?" කැතරින් ඇසුවා.

"හරි, මේ පෑන පාගලා පොඩි කරපු කෙනාගේ සපත්තු අඩියේ අනිවාර්යයෙන්ම දම්පාට තීන්ත පැල්ලම් තියෙන්න ඕනෑ" ඇලිසියා කෝප වූ කටහඬින් කිව්වා.

"ඔව්, හරි" අනෙක් අය කිව්වා. "ඇත්තම තමා"

"ඔයා හරි දක්ෂයි, ඇලිසියා" කැතරින් කිව්වා. "අපි උතුරු කුලුනේ හැම කෙනාගේම සපත්තු කුට්ටම පරීක්ෂා කරමු. දම්පාට තීන්ත පැල්ලම් තිබුණොත් අපිට කවුද මේක කළේ කියලා අල්ලා ගන්න පුළුවන්"

"මට නම් බලන්නේ නැතිව වුණත් කියන්න පුළුවන්" ඩැරල්ගේ අවඥා සහගත කටහඬ කිව්වා. "ගොන්ඩොලින්ට හැර වෙන කෙනෙකුට මේ වගේ දෙයක් කරන්න බැහැ. මේ වගේ දෙයක් කරන්න තරම් පහත් කෙනෙක් ඉන්නවා නම් ඒ ගොන්ඩොලින්"

ගොන්ඩොලින් කෝපයෙන් ද, භීතියෙන් ද වෙවුලන්නට වූවා. ඇය ඉතා ඉක්මනින් තම පාවහන් යුවළ දෙස බැල්මක් හෙළුවා. ඔව්, ඒවායේ දම්පැහැ තීන්ත තැවරී තිබුණා. හදිසියේම කොරිඩෝව දිගේ දුවගිය ඈ කුඩා ගබඩා කාමරයට පැන එහි තිබූ දම්පැහැ තීන්ත කුප්පියක් ගෙන දැරියන් සාමාන්‍යයෙන් පාවහන් අසුරා තබන කබඩය වෙත වේගයෙන් දුවගියා. හැකි ඉක්මනින් එතැනට යාම පමණයි ඇයට අවශ්‍ය වුණේ.



පාවහන් පිරික්සීමට පෙර සියල්ල පිරිසිදු දැයි බැලීමට අනෙක් අය යුහුසුලුව සිටි හෙයින් ඇයට අවශ්‍ය තරම් කල් තිබුණා. ඩැරල්ගේ පාවහන්වලින් එකක් ගත් ගොන්ඩොලින් එහි අඩියේ හොඳින් දම්පැහැ තීන්ත තැවරුවා. අනතුරුව ඇය ඒ අසලම තිබූ කුඩා කබඩයට තීන්ත කුප්පිය විසිකර දමා හැකි තරම් ඉක්මනින් තමාගේ තීන්ත තැවරී තිබූ පාවහන් ගලවා දැමුවා. ඈ ඒවාද එම කුඩා කබඩයටම ඔබා දැමුවා. එතුළ තිබූ සෙරෙප්පු ජෝඩුවක් ගත් ඇය ඒවා පැලඳ ගත්තා.

මැද මිදුලට දුවගත් ඇය හැකි පමණ ශාන්තව හා කලබල වීමකින් තොරව පොදු කාමරයේ දොරටුව අසලට පා තබා ගියා. ඔහ් ! අවශ්‍ය විටකදී රඟපෑමට ගොන්ඩොලින්ට පුදුම හැකියාවක් තිබුණේ. "මෙන්න ගොන්ඩොලින් !" ඇලිසියා කෑ ගැසුවා. "ගොන්ඩොලින්, ඔයා මේරි ලෝව්ගේ පෑනට වුණ දේ දන්නවා ද?"

"පෑන? එයාගේ පෑනට මොනවා වෙලා ද?" ගොන්ඩොලින් අහිංසක ලෙස ඇසුවා.

"කවුරු හරි ඒක පාගලා කුඩු කරලා" සැලී කිව්වා

"හරිම තිරිසන් වැඩක්" ඇඩි පිළිකුල් සහගත බැල්මක් හෙළූ ඈ කිව්වා. "කවුද එහෙම දෙයක් කළේ?"

"අපිත් ඒකම තමයි දැන ගන්න ඉන්නේ" ගොන්ඩොලින්ගේ අහංකාර ස්වරය ගැන කෝප වූ ඩැරල් කිව්වා. "අපි ඒක තමයි හොයන්න යන්නේ. තේරුණා ද?"

"මම හිතනවා හොයා ගනියි කියලා" ගොන්ඩොලින් කිව්වා. "මම දිහා ඔය විදිහට රවලා බලන්න එපා ඩැරල්. මම නොවෙයි මේක කළේ. හුඟක් දුරට ඔයා කළා වගෙයි පෙනෙන්නේ. ඔයාව බේරා ගන්න මේරි ලෝව් වතුරට පැන්න දවසේ ඉඳලා මම දැක්කා ඔයා එයාට හුඟක් ඊර්ෂ්‍යා කරනවා වගේ."

සෑම කෙනෙක්ම මුව අයා ගත්තා. එවැනි දෙයක් කීමට තරම් ගොන්ඩොලින් කොතරම් ඊර්ෂ්‍යා සහගත ද? ඩැරල්ගේ කෝපය උණු වන්නට වුණා. සුපුරුදු රතු ගිනිදලු නැගෙන බව ඇයට දැනුණා. ඇගේ මුහුණ දුටු සැලී තම අත ඇගේ බාහුව මත

තැබුවා. "කලබල වෙන්න එපා, කෙල්ලේ" ඇය මෘදුව කී අතර ඩැරල් සන්සුන් වුණා. එහෙත් සිනාමුසුව සිටින ගොන්ඩොලින් කෙරෙහි නැගුණ කෝපය ඇගේ උගුරේ හිරවුණා.

"ගොන්ඩොලින්" කැතරින් කතා කළා. "අපි හිතනවා මෙ පෑන පාගපු කවුරු හෝ කෙනාගේ සපත්තු අඩියේ දම්පාට තීන්ත තැවරිලා ඇති කියලා. ඉතින් අපි හැම කෙනාගේම සපත්තු පරීක්ෂා කරලා ඒ විදිහට මේක කරපු කෙනාව හොයා ගන්න පුළුවන් කියලා විශ්වාස කරනවා."

ගොන්ඩොලින් තම මුහුණේ හැඟීම් කිසිසේත් වෙනස් කළේ නැහැ. "ඒක හොඳ අදහසක් !" ඇය උණුසුම්ව කිව්වා. "ඇත්තෙන්ම හොඳ අදහසක්. ඒක මටම හිතුණ නම් කියලා හිතෙනවා. අහිංසක මේරි ලෝව්ගේ පෑන විනාශ කරපු පහත් කෙනා කවුද කියන එක අනිවාර්යයෙන් ඒකෙන් කියන්න පුළුවන්."

මේ වචන ඇසී සියලු දෙනා මවිත වුණා. සුළු සැකයක් දැරියන්ගේ සිත් තුළට ඇතුළු වුණා. ගොන්ඩොලින් පෑන පාගා කැඩුවා නම් එවැනි අදහසක් ඒ තරම් සතුටින් භාර ගනීවිද? කෙසේ වෙතත් ඇය එය කළා විය නොහැක.

"ඉස්සරලාම ඔයාලට පුළුවන් මගේ සපත්තු බලන්න" කී ගොන්ඩොලින් ප්‍රථමව එක් පාදයක් ද අනතුරුව අනෙක් පාදය ද හරවා පෙන්නුවා.

"කබඩ් එකේ තියෙන සපත්තුත් අපිට බලන්න වෙනවා." කැතරින් කිව්වා. ඒත්, ඉස්සරලාම කවුරුත් ඔයාලගේ සපත්තු හරවලා පෙන්වන්න."

සෑම දෙන එය කළ නමුත් කිසිවක තීන්ත සලකුණු තිබුණේ නැහැ. ඉන්පසු පළමු පන්තියේ කණ්ඩායම ම ඔවුන්ගේ සපත්තු තබන කබඩ ඇති ඇඳුම් කාමරයට ගියා. වෙන අයෙකුගේ නොව ගොන්ඩොලින්ගේ සපත්තුවල තීන්ත සලකුණු තිබිය යුතුමයි හැමෝම අනුමාන කළ පරිදි කැතරින් ගොන්ඩොලින්ගේ පාවහන් යුවළ ප්‍රථමව පරීක්ෂා කළා. නමුත් ඒවායේ කිසිවක් තිබුණේ නැහැ.

දීප්තිමත් තීන්තවලින් පැල්ලම් සෑදී තිබුණේ ඩැරල්ගේ පාවහන් යුවළින් එකකයි. එය පිටතට ඇදගත් කැතරින් වඩාත්



මවිතයෙන් හා භීතියෙන් දෙනෙත් මහත් කර එදෙස බැලුවා. නිහඬව ඇය එය ඩැරල්ට අල්ලා පෙන්නුවා.

"මේක... මේක ඔයාගේ සපත්තුවක් !" ඇය කිව්වා. "ඔ. ඩැරල්"

ඩැරල් නිරුත්තරව තීන්ත පැල්ලම් සහිත සපත්තුව දෙස බැලුවා. ඇය තමා අසල සිටි නිශ්ශබ්ද දැරියන්ගේ මුහුණු දෙස බැලුවා. සමහරු ඔවුන්ගේ දෑස් ඉවතට හරවා ගත්තා. ඇලිසියා ඇගේ මුහුණ වෙතට දැඩි බැල්මක් හෙළුවා.

"හොඳයි, හොඳයි කවුද හිතුවේ ඒ අපේ අවංක ඩැරල් කියලා" ඇලිසියා වාචාල ලෙස කිව්වා. "මම ඒ ඔයා කියලා කවදාවත් හිතුවේ නැහැ, ඩැරල්" ඇය පිළිකුල් සහගත බැල්මකින් යුතුව පසෙකට හැරුණා. ඩැරල් ඇයගේ අතින් අල්ලා ගත්තා.

"ඇලිසියා ! මේක කළේ මම කියලා ඔයා ඇත්තටම හිතන්නේ නැහැ ! මම කළේ නැහැ. මම ඇත්ත කියන්නේ. මම කළේ නැහැ! ඒ තරම් පිළිකුල් සහගත දෙයක් කරන්න මට හීනෙකින් වත් හිතෙන්නේ නැහැ. ඕ, ඇලිසියා. මම ඒක කළා කියලා කොහොමද ඔයා හිතන්නේ?"

"හොඳයි, ඔයාගේ සපත්තුවේ තීන්ත තැවරිලා තියෙන එක නැහැ කියන්න බැහැ." ඇලිසියා කිව්වා. "ඔයාට භයානක විදිහට ඉක්මනට තරහා යනවා ඩැරල්. තරහා ගිය වෙලාවක ඔයා මේරි ලෝව්ගේ පෑන පාගලා දැම්මා කියන එකේ මට සැකයක් නැහැ. ඇයි කියලා අහන්න එපා. මට ඔයාට වගේ තරහා යන්නේ නැහැ."

"ඒත් ඇලිසියා මම නින්දිත කෙනෙක් නොවෙයි." ඩැරල් කෑ ගැසුවා. "ඔයා ඒක දන්නවා ඇලිසියා. මම හිතුවා ඔයා මගේ යාළුවෙක් කියලා. ඔයයි, බෙටීයි නිතරම ඉන්නේ මා එක්ක. යාළුවෙක් ගැන ඔයාට එහෙම දෙයක් විශ්වාස කරන්න බැහැ"

"ඔයා මගේ යාළුවෙක් නොවෙයි" කී ඇලිසියා කාමරයෙන් පිටතට ගියා.

"මොකක් හරි වැරද්දක් වෙලා" ඩැරල් ඇඩිව කිව්වා. "ඕ. මම මේක කළා කියලා විශ්වාස කරන්න එපා. අනේ, ඒක විශ්වාස කරන්න එපා"

"මම විශ්වාස කරන්නේ නැහැ ඔයා කළා කියලා" දෙකම්මුල් දිගේ කඳුළු රූරා වැටෙන අතරේ මේරි ලෝව් කිව්වා. ඈ තම අත ඩැරල්ගේ අතෙහි පටලවා ගත්තා. "මම දන්නවා ඔයා එහෙම කරන්නේ නැහැ කියලා ඩැරල්. මම ඔයත් එක්ක ඉන්නවා"

"මමත් එහෙමයි, ඇත්තටම" සැලීගේ මෘදු ස්වරයෙන් කියවුණා. "මටත් විශ්වාස කරන්න බැහැ ඒක ඔයා කළා කියලා. ඩැරල්"

අනුකම්පා විරහිත ඇස්වලින් යුතුව වටවී බලා සිටින ඇරියන් හමුවේ වැලපීමට තරම් සිත්වූ ඩැරල්ට යෙහෙළියන් දෙදෙනෙකු සිටීම ගැන ඉතාම සතුටක් දැනුණා. සැලී ඇයව කාමරයෙන් පිටතට කැඳවාගෙන ගියා. කැතරින් කැරකී අනෙක් අය දෙස බැලුවා. ඇගේ මුහුණේ කලකිරීමෙන් හා ව්‍යාකූලත්වයෙන් පිරි බැල්මක් තිබුණා.

"මමත් විශ්වාස කරන්නේ නැහැ ඒ ඩැරල් කියලා" ඇය කිව්වා. "මේක වැරදියි කියලා ඔප්පු වෙනකම් අපට එයාව සැක කරන්න සිද්ධ වෙනවා. අපි හැමෝම ඩැරල්ට කැමති නිසා මේක අපිට දුකක්"

"මගේ නම් කැමැත්තක් නැහැ" ගොන්ඩොලින්ගේ ද්වේශ සහගත කටහඬින් කියවුණා. "මම හොඳටම දැනගෙන හිටියා ඩැරල්ට ඕනෑම පහත් වැඩක් කරන්න පුළුවන් කියලා. ඒ තරමට එයාට තරහා යනවා."

"කට වහනවා." සැර පරුෂව ජීන් කී අතර ගොන්ඩොලින් කට වසා ගත්තා. එහෙත් තමා කළ කී දේවල්වලින් ඈ ඇඩී සතුටට පත්ව සිටියා.

එතැන් පටන් සැලී හා මේරි ලෝව් ඩැරල්ගේ හොඳ මිතුරියෝ වුණා. ඔවුන් ඇය හා ඇලීගැලී ඇයට උදව් කර ඇඩී ලෙස ඇයව ආරක්ෂා කර ගත්තා. මේරි ලෝව් එළිපිටම ගොන්ඩොලින්ට විරෝධය පෑවා. පෑන කඩා දැමීමට දඬුවමක් දිය යුතුයැයි කිසිවෙකු යෝජනා නොකළ හෙයින් දඬුවමක් නොලැබුණ ද වටාපිටාවෙන් එල්ල වන ඇනුම් බැනුම් ඉතා අප්‍රසන්න දෙයක් වුණා.



මේ කාරණය ගැන මේරි ලෝව් මහත් තැවුලට පත්වුණා. ඒ ඇගේ පෑන නිසයි ඩැරල් මේ කරදරයට පත් වූවේ. එහෙත් ඈ දැන සිටියා ඩැරල් එය නොකළ බව. සැලී මෙන්ම ඇයට ද ඩැරල්ගේ ස්වාභාවික අවංකකම හා කරුණාවන්ත බව කෙරෙහි විශ්වාසයක් තිබුණා. ඒ නිසා ඇය කිසිදින පහත් කපටිකම් නොකරන බවට විශ්වාසයක් තිබුණා.

හොඳයි, එසේ නම් මෙය කවුරු කරන්න ඇති ද? ඒ මේරි ලෝව්ටත්, ඩැරල්ටත් හතුරුකම් කරන කෙනෙකු විය යුතු අතර ඒ කෙනා ගොන්ඩොලින් විය යුතුයි. ඒ නිසා ගොන්ඩොලින් ඩැරල්ගේ සපත්තුවේ තීන්ත තැවරුවා විය හැක.

එහෙත් එමෙන්ම සිදුවිය හැක්ක නම් ගොන්ඩොලින්ගේ සපත්තුවක ද තීන්ත තැවරී තිබීමයි. එමෙන්ම ඇය තම පාවහන් පෙන්වන විට ඒවායේ තීන්ත තැවරී තිබුණේ නැහැ.

එක් රාත්‍රියක මේරි ලෝව් ඇඳෙහි වැතිරී මේ ගැටලුව ගැන කල්පනා කරන්නට වුණා. එය කෙසේ කරන්නට ඇති ද? ඔවුන් පාවහන් පරීක්ෂා කරන්න සැලසුම් කරන වේලාවේ ගොන්ඩොලින් එතැන සිටියා ද? නැහැ, ඈ එතැන සිටියේ නැහැ.

එහෙත් පිටත සිට ඇය සවන් දීගෙන සිටියා විය හැක. සපත්තු කබඩය වෙත දුවගොස් ඩැරල්ගේ සපත්තුවල තීන්ත තවරා තම පාවහන් ඉවත් කර පොදු කාමරයට පැමිණ අන් අය හා එක් වන්නට ඇයට කාලය තිබෙන්නට ඇත.

තැතිගත් මේරි ලෝව් ඇඳෙහි වාඩි වුණා. සිදුව ඇත්තේ එය බව හදිසියේම ඇයට තහවුරු වුණා. බිය වූ විට හෝ තැතිගත් විට සුපුරුදු ලෙස සිදුවන පරිදි ඇය මඳක් ගැහුණා. ගොන්ඩොලින් ඇගේ සපත්තු කොහේ සඟවන්නට ඇති ද? කෙසේ වෙතත් සපත්තු කබඩ අසලම යම් තැනක විය යුතුය. ඈ ඒවා ගෙන නැවත වඩාත් සුරක්ෂිත තැනක සඟවන්නට ඇති ද? නැතහොත් ඒවා එතැනම තියෙනවා විය හැකි ද?

ඉතා රෑ බෝවී තිබූ අතර අඳුර ඝනව තිබුණි. සෑම කෙනෙක්ම දිගු වේලාවකට පෙර නින්දට වැටී තිබුණි. තමාට ඇඳුම් කාමරයට ගොස් වටපිටාව බැලීමට තරම් නිර්භීතකමක්

ඇතිදැයි ඇය කල්පනා කරන්නට වුණා. මෙම පිළිකුල් සහගත කටයුත්ත අවසාන කිරීමට ඇයට ඇඩි උවමනාවක් තිබුණා.

එහෙත් ඇ අඳුරට දැක්වූවේ මහත් බියක් ! එමෙන්ම, ඩැරල්ව බේරා ගැනීමට වතුරට පනින තුරු ඇය වතුරට ද බියව සිටියා. එහෙත් ඩැරල්ට උදව් කිරීමට තම ඇය අඳුරට ද බිය නොවනු ඇත. ඇය උත්සාහ කර බැලිය යුතුයි.

මේරි ලෝව් ඇඳෙන් නැගිට රහසේ පිටතට ගියා. ඇය උඩු ගවුමක් දමා ගත්තේ නැහැ. ඒ ගැන ඇයට සිහියක් තිබුණේ නැහැ. ඇය දොරින් පිටතට රිංගා ගත්තා. දෙවියන්ට ස්තුති වන්න පිටත මන්දාලෝකයක් තිබුණා. කොරිඩෝව මඳ එළියෙන් ආලෝකමත්ව තිබුණා.

කොරිඩෝව ඔස්සේ ගිය ඇ තරප්පුපෙළ බැස පහත කාමර වෙත ගියා. ඇය ඇඳුම් කාමරය වෙතට ගියා. අපොයි, එතුළ වූයේ ඇඩි අඳුරක්. මේරි ලෝව්ට තම කොඳු නාරටිය ඔස්සේ සීතල වෙව්ලුමක් ඇදී යනු දැනුණා. ඇය භීතියට පත්වුණා. තව මොහොතකින් ඇ යටිගිරියෙන් හඬ තළනු ඇත. ඇය එසේ කරනු ඇතැයි ඇය දැන සිටියා.

"මේ ඩැරල් වෙනුවෙන් ! මම යමෙකු වෙනුවෙන් යමක් කරනවා. ඉතින් ඒක හරි වැදගත්" හැකි පමණ ඇඩි ලෙස ඇ තමාටම කියා ගත්තා. "මම කෑ ගහන්නේ නැහැ. ඕ, ඒත් ස්විච් එක කොහේ ද?"

එය සොයා ගත් ඇය විදුලි පහන දැල්වූවා. ආලෝකයත් සමග ඇඳුම් කාමරය පැහැදිලිව දැකගත හැකි වුණා. මේරි ලෝව් දිගු සුසුමක් ඇද ගත්තා. දැන් සියල්ල හරි. තව දුරටත් ඇය සිටින්නේ අඳුරේ නොවෙයි. කොතරම් අවශ්‍යතාව දැනුණත් යටිගිරියෙන් හඬ නොතැලීම නිසා ඇය තමා ගැන ආඩම්බර වුණා.

ඇය කබඩ් තුළ බැලුවා. ගොන්ඩොලින්ගේ කබඩය ඉදිරියේ තිබුණා. ඒ වෙත ගිය ඇ සියලු පාවහන් පිටතට ගත්තා. නැහැ තීන්ත තැවරුණු එක් සපත්තුවක් හෝ තිබුණේ නැහැ. තීන්ත තැවරුණු ඒවා කොහේ සඟවා ඇත් ද?



# 22

අසල වූ කුඩා කබඩය මේරි ලෝවගේ නෙත ගැටුණා. එහි තබා ඇත්තේ මොනවා දැයි ඇය දැන සිටියා. පරණ පන්දු, පිහි කිහිපයක්, ඉරුණු ක්‍රීඩා පාවහන් හා තවත් ඉවත දමන දේවල්. ගොන්ඩොලින්ගේ සපත්තු එහි තිබිය හැක. මකුළුවෙකු, කැරපොත්තෙකු එළියට පනීවි යන බියෙන් ඇ පරිස්සමෙන් කබඩයේ දොර විවෘත කළා.

දූවිලි සහිත කසළ ගොඩට එබී බැලූ ඇ ඇඟිලිවලින් එය අවුස්සන්නට වුණා. ඇ ටෙනිස් රැකට් පිත්තක් පිටතට ගනිද්දී යමක් බරට වැටුණා.

ශබ්දය ඇසී යමෙකු අවදි වේවි යන බියෙන් යුතුවූ මේරි ලෝව් හුස්ම ඉහළට ඇද ගත්තා. එහෙත් කිසිවෙකුට ඇසුණු බවක් පෙනුණේ නැහැ. ඇය නැවතත් අවුස්සන්නට වුණා.

ඇයට ගොන්ඩොලින්ගේ සපත්තු හමුවුණා. ඇයට දම්පාට තීන්ත කුඩුව හමුවුණා. හඬනගා වැටී තිබුණේ එයයි. මේරි ලෝව් තීන්ත කුඩුව දෙස බලා ගොන්ඩොලින් එය පාවිච්චි කර තිබුණේ කුමක් සඳහා දැයි දැන ගත්තා. ඇය සපත්තු දෙස බැලුවා. දකුණු කකුලේ සපත්තුවේ විශාල දම් පැහැ පැල්ලමක් තිබුණා.

වෙව්ලන දෑතින් යුතුව මේරි ලෝව් සපත්තුව ඇතුළේ නම බැලුවේ සැකහැර දැන ගැනීමට. ඕව්. වින්ටර් මහත්මියගේ කුඩා අකුරින් ලියවුණු නම එහි තිබුණා. ගොන්ඩොලින් ලැසී.

"එහෙනම් ඒ ගොන්ඩොලින්! ඒක හරි. මම දැනගෙන සිටියා ඩැරල් නොවෙයි කියලා" මේරි ලෝව් මහත් සතුටින් සිතුවා. "මම කෙළින්ම ආපසු ගිහින් අනිත් අයව කුද්දනවා. මම එකපාරටම කියනවා. හොඳයි. නැහැ. එහෙම නොවෙයි. සමහරවිට කැතරින්ට තරහා යයි මම රෑ හොරෙන් එහෙ මෙහෙ ගියා කියලා"

මේරි ලෝව් තීන්ත කුඩුව හා පාවහන් යුවළ ගත්තා. විදුලි පහන නිවා දැමූ ඇය අඳුරේ සිට ගත්තා. එහෙත් ඇ ඒ ගැන

සිතුවද? සුළුවෙන් හෝ නැහැ. වේගයෙන් කරප්පු නැග යන අතරේ ඇ අඳුර ගැන වරක් හෝ සිතුවේ නැහැ. උසස් සොයා ගැනීම ගැන ඇගේ මනස පිරී තිබුණා. එය කර තිබුණේ ඩැරල් නොවෙයි ! එය කර තිබුණේ ඩැරල් නොවෙයි !

උදයේ ප්‍රථමයෙන් අවදි වූවේ මේරි ලෝව්. කැතරින්ගේ ඇඳ අසලට ගිය ඇ විමතියට පත් නායිකාව සෙලවූවා. "නැඟිටින්න ! මට ඔයත් එක්ක කියන්න වැදගත් දෙයක් තියෙනවා. අනිත් අයවත් නැගිට්ටවන්න."

මේ කලබලය ඇසී අවදි වූ අනෙක් දැරියෝ ඇඳන් මත වාඩි වී ඇස් පිසින්නට වුණා. ඇඳන් ඉදිරියේ සිටගත් මේරි ලෝව් හොඳින් පෙනෙන සේ ගොන්ඩොලින්ගේ පාවහන් යුවළ වැනුවා.

"බලන්න ! මම හොයා ගත්තා තීන්ත තැවරුණ තියම සපත්තු කුට්ටම. ඒ එක්කම මට හම්බවුණා දම්පාට තීන්ත කුප්පියත්. පේනවා ද? ඇත්තටම මගේ පැන වප්ප කරපු කෙනා එයාගේ සපත්තු කුට්ටම හංගලා ඩැරල්ගේ සපත්තුවල තීන්ත තැවරුවා. ඒක එයා කළා වගේ පෙනෙන්න."

"ඒත් ඔය කාගේ සපත්තු ද?" කැතරින් පුදුමයෙන් ඇසුවා. "ඔයා කොහෙන්ද ඕවා හොයා ගත්තේ ?"

"ඊයේ රෑ කරුවලේම මම පහළට බැහැලා ඇඳුම් කාමරය සෝදිසි කළා." මේරි ලෝව් ජයග්‍රාහී ලෙස කිව්වා. සෑම කෙනෙක්ම පුදුමයෙන් මුව අයා ගත්තා. මේරි ලෝව් තනියම කරුවලේ ගියා. ඇයි, එයා කරුවළට හරිම බයයිනේ. සෑම කෙනෙක්ම එය දැන සිටියා.

"එතන තියෙන කබඩ් එකෙන් මම සපත්තු ජෝඩුවයි, තීන්ත කුඩුවයි හොයා ගත්තා." මේරි ලෝව් කිව්වා. "මෙක ඇතුළේ ලියලා තියෙන නම මම කියවන්නද, නැහැ මම කියන්නේ නැහැ. ඔයාලම බලාගන්න. එතකොට කාගේ නමද තියෙන්නේ කියලා ඔයාලටම දැකගන්න පුළුවන්. එයාගේ මුහුණ දැක්කත් ඔයාලට කියන්න පුළුවන්."

එය සත්‍යයකි. ගොන්ඩොලින්ගේ මුහුණ ලැජ්ජාවෙනුත්, භීතියෙනුත් රතුව තිබුණා. ඇ කෝපයෙන් හා අවාසනාවෙන්



පුතුව මහත් වූ දෙනෙතින් මේරි ලෝව් දෙස බලා සිටියා. ඇයව අවසානයේ අසුවී තිබුණා. ඇයි ඇ ඒවා කල් ඇතුව ගෙන මුහුදට විසි නොකළේ ?

"ඒ ගොන්ඩොලින්" ත්‍රස්ත වී බුම්මා ගත් ගොන්ඩොලින්ගේ රතු වූ මුහුණ දෙස මහත් වූ දෙනෙතින් බැලූ දැරියෝ යටපත් කරගත් කෙඳිරිලි හඬින් කිව්වා. මෙවර ගොන්ඩොලින් කිසිවක් වසන් කිරීමට උත්සාහ කළේ නැහැ. ඇ මුහුණ කොට්ටයේ ඔබාගෙන ඇඳේ වැතිරුණා.

කැතරින් සපත්තු යුවළ හා තීන්ත කුඩුව පරීක්ෂා කළා. අනතුරුව ඩැරල්ගේ ඇඳ වෙත ගිය ඇය තම අත දිගු කළා.

"ඩැරල් මම ඔයාගෙන් සමාව ඉල්ලනවා මොහොතකට හරි ඒ ඔයයි කියලා හිතපු එක ගැන. මම ඇත්තෙන්ම හිතුවේ නැහැ. ඒත් වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ. මම ඇත්තෙන්ම ඔයාගෙන් සමාව ඉල්ලනවා."

"ඔ, ඒකට කමක් නැහැ" බබළන මුහුණින් යුතුව ඩැරල් කිව්වා. "ඒකට කමක් නැහැ. මටත් සෑහෙන්න අපහසුවක් ඇනුණා. ඒත් මේරි ලෝව්ත්, සැලීත් මා එක්ක හිටියා. ගොන්ඩොලින් එක්ක කවුරුවත් ඉන්න එකක් නැහැ"

දැරියෝ එකිනෙකා ඩැරල්ගෙන් සමාව ගත්තා. ඒ පිළිබඳව ඇලිසියා මඳක් මුරණ්ඩු වුණා. ඒ ඇය ඩැරල්ට කතා කළ නපුරු වචන නිසයි. ඇ දැඩි අදහස් ඇති කෙනෙක්. අන් අයව තේරුම් ගෙන අනුකම්පාව දැක්වීමට, තම දැඩි බව නැති කර ගැනීමට පෙර ඇයට තවත් බොහෝ පාඩම් ඉගෙන ගැනීමට තිබුණා.

"මම ආයෙත් යාළුවෙන්න කැමතියි" ඇ අපහසුවෙන් කිව්වා. "වෙනදා වගේ මායි, බෙට්ටියි එක්ක එන්න. ඔයා එනවා නේද?"

"හොඳයි" සැලීගේ සෘජු කුඩා මුහුණ දෙස හැරී බලමින් ඇ කතා කළා. "හොඳයි. මම හිතන්නේ ඔයා තරහා වෙන්නේ නැති නම් මම සැලීයි, මේරි ලෝව් එක්කයි ඉන්නම්. මම ඒ දෙන්නාට හොඳින් සැලකුවේ නැති වුණත් මම කරදරේ වැටිලා ඉද්දි ඒ දෙන්නා මා එක්ක හිටියා. දැන් ඒ දෙන්නා මගේ ඇත්තම යාළුවෝ"

"ඔහ් !" බබළන මුහුණින් යුතු මේරි ලෝව්ට කියවුණා. "ස්තුතියි, ඩැරල්"

සැලී කිසිවක් කිවේ නැති නමුත් සතුටින් කෙනිත්තීමක් ඇගේ වැලමිටට ඉහළින් දැනුණා. ඈ හැරී සිනාසුණා. ඇයට විශාල සතුටක් දැනුණා. දැන් වාරය අවසාන වනතුරු සියලු දේ යහපත් වනු ඇත. අපූරුයි !

ගොන්ඩොලින් මුනින් අතට හැරී කොට්ටයේ මුහුණ ඔබාගෙන ඇඳේ වැතිර සිටිනු ඈ දුටුවා. ඈ දැඩි දුකින් අඬමින් සිටියා. සතුටින් ඉපිලී සිටි ඩැරල් තම හතුරෙකු හෝ අවාසනාවට පත්ව සිටිනු දැකීම දැරිය නොහැකි වුණා. ඈ ගොන්ඩොලින් වෙතට ගොස් ඇයව සෙලවූ නමුත් ඒ අකරුණාවෙන් නොවෙයි.

"ගොන්ඩොලින් ! මම කිසිම කෙනෙකුට මේ ගැන වචනයක්වත් කියන්නේ නැහැ. ඒ වගේම මම එපා කිව්වොත් අනිත් අයත් මේ ගැන කාටවත් කියන්නේ නැහැ. ඒත් ඔයා කඩපු පෑන වෙනුවට ලස්සන පෑනක් මේරි ලෝව්ට අරගෙන දෙන්න. තේරුණා ද?"

"ඔව්" ගොන්ඩොලින්ගේ යටපත් කටහඬින් කියවුණා. "මම අරගෙන දෙන්නම්."

කාටත් ගොන්ඩොලින්ගෙන් අසන්නට ලැබුණේ එපමණයි. තමා කනගාටු වන බව කීමට ඇයට නොහැකි වුණා. ඇය මේරි ලෝව්ට ඉතා කදිම පෑනක් දෙන විට ලැජ්ජාවට පත් වචන කිපයක් හෝ කීමට ඇයට නොහැකි වුණා. තමාවම පාලනය කර ගත නොහැකි වූ ඇය මේරි ලෝව් සිටි දුර්වල තත්ත්වයටත් වඩා අන්ත ලෙස දුර්වලව සිටියා.

"එයා කවදාවත් හොඳ කෙනෙක් වෙන්නේ නැහැ. කැතරින්, නැද්ද?" දිනක් ඩැරල් කිව්වා. කැතරින් මඳ සිනාවක් නැගුවා.

"ඒක කියන්න පුළුවන් වෙන්නේ එයා කොයිතරම් කාලයක් මැලෝරි ටවර්ස්වල ඉන්නවාද කියන එකෙන්" ඈ කිව්වා. "මෙහේ කාලයක් ඉන්න තරමට හැදියාවත් හොඳ වෙන එක හරි අමුතු දෙයක්. එහෙම තමයි මගේ නැන්දා කියන්නේ. එයත් ආවේ මෙහාට. නරක කෙල්ලෝ හොඳ අය වුණ කතා හුඟක් එයා දන්නවා."



"එහෙනම් ගොන්ඩොලින් වගේ අය නොවෙයි" ඩැරල් කිව්වා. "කිසිම දේකින් එයා වෙනස් වෙන්නේ නැහැ. එයා අස්වෙලා යනවා නම් හොඳයි."

ගොන්ඩොලින්ගේ පැතුම ද එයම වුණා. වාරයේ අවසාන සති දෙක ඇයට එතරම් පියකරු වුණේ නැහැ. කිසිවෙකු පෑන හා සම්බන්ධ සිද්ධිය ගැන නැවත කතා නොකළද සැම කෙනෙක්ම ගොන්ඩොලින් දකින විට ඒ ගැන සිතූ අතර බැරිම තැනකදී හැර කිසිවෙකු ඇය දෙස බැලුවේ හෝ කතා කළේ නැහැ. මුළු වාරය පුරාම මේරි ලෝව්ට බිහිසුණු පහත් ක්‍රියා කළේ ඇයම බව සැම දෙනාම ඒකාන්තයෙන් දැන සිටියා.

අසරණ ගොන්ඩොලින් ! දැරියන්ගේ පිළිකුලත් වාරයේ ඉතිරිය වහලියක් සේ වැඩ කිරීමට සිදුව තිබූ නිසාත් ඇගේ කාලය පහසුවෙන් ගෙවුණේ නැහැ. ඇය වැපිරූ දේ ඇයට නෙළා ගැනීමට තිබූ නිසා ඇය මැසිවිලි නැගුවේ නැහැ.

වාරයේ ඉතිරිය පුරා ඩැරල් සතුටින් පසුවුණා. ඩැරල් ඉතා හොඳ වුණා. වාරයේ සති දෙක තුනක් මග හැරුණ හෙයින් හා අසනීප තත්ත්වය නිසා පන්තියේ වැඩවලට මහන්සි වීමට ඇයට ඉඩ නොලැබුණ හෙයින් සැලී එතරම් හොඳ වුණේ නැහැ.

කිසිවෙකු අපේක්ෂා නොකළ පරිදි ගොන්ඩොලින් සාර්ථක වී තිබුණා. "මේකෙන් පෙනෙන්නේ" පොට්ස් ගුරුතුමිය තරමක් දැඩිව කතා කළා. "මේකෙන් පෙනෙන්නේ, ගොන්ඩොලින් උත්සාහ කළොත් ඔයාට කරන්න පුළුවන් මොනවාද කියන එකයි. මට හිතා ගන්න බැහැ ඇයි ඔයා මේ උත්සාහය වාරයේ අවසාන සති දෙක වෙන තුරු තියාගෙන හිටියේ කියන එක. සමහර විට ඊළඟ වාරය පුරාම මේ විදිහට වැඩ කරන්න හිතට ගනියි."

අවසාන සති කිපයේදී මහන්සි වී වැඩ කිරීමට තමාට සිදුවූයේ කුමක් නිසා දැයි ගොන්ඩොලින් පොට්ස් ගුරුතුමියට කියන්න ගියේ නැහැ. පොට්ස් ගුරුතුමිය තම වාර්තාවේ ප්‍රශංසාත්මක වචන කිපයක් ලියනු ඇතැයි ඇය අපේක්ෂා කළා. එය කොතරම් බිහිසුණු වාරයක් ද! තමාට ආපසු ඒමට නොලැබේවායි ඈ ප්‍රාර්ථනා කළා. ලබන වාරයේ දී තමා මේ වාරයේ දී කළ දේවල් දැරියන්ට අමතක වන පරිදි වැඩ කිරීමට ඈ සිතා ගත්තා.

සැලීගේ අසනීප වීම හා මේරි ලෝව්ට බිහිසුණු උපායන්ගෙන් හිරිහැර කළේ තමා බවට දින දෙක තුනක් දැරියන් සැක කිරීම හැර ඩැරල්ට මෙම වාරය කදිම කාලයක් ලෙස පෙනුණා. එහෙත් ඩැරල් තම නරක කාලය ගැන කල්පනා කළේ නැහැ. ඇය සුබවාදී වූ අතර කදිම දේවල් ගැන පමණක් සිතුවා. වාරය අවසාන වීමට ඒම ගැන ඈ කනගාටු වුණා. එහෙත් එමෙන්ම නිවාඩු කාලය ද සුන්දර වනු ඇත.

සැලී නිවාඩු කාලය ඈ සමග ගත කිරීමට සිටි අතර ඇයද සැලී සමග සතියක් ගත කිරීමට සිටියා.

"ඔයාට මගේ පුංචි නංගිව බලාගන්න පුළුවන්" ඩැරල් කිව්වා "ඔයාට එයා ගැන ආශා හිතෙයි. එයා හරි සෙල්ලක්කාරයි."

"ඔයාටත් මගේ නංගි බලාගන්න පුළුවන්" මඳක් ලැජ්ජාවෙන් සැලී කිව්වා.

"මමත් එයාට උගන්වනවා සෙල්ලම් කරන්න. ඔයා වගේ"

ඩැරල්ට හෝ සැලීට සමීපයේ තමා ජීවත් වුණේ නම් තමාට ද ඔවුන්ව බැලීමට යාමට හැකිවෙන්න තිබුණේ යැයි මේරි ලෝව් සිතුවා. ඒකට කමක් නැහැ. තවත් වාරයක් හා ඊළඟට තවත් වාරයක් තියෙනවා. ඩැරල්ගේ නියම යෙහෙළිය සැලී බව දැන ගැනීමට තරම් මේරි ලෝව්ට විඥානය තිබුණා. එමෙන්ම ඒ තමා නොවීම ගැන ඈ ගාණකට ගත්තේ නැහැ. ඩැරල් ඇයට ඇලුම් කළාක් මෙන්ම ඇයව අගය කළා. කීකරු මේරි ලෝව්ට එපමණක් ප්‍රමාණවත් වුණා. ඇය අඳුරට බිය නැති බව තම මව දැන ගත්විට ඇය කොතරම් සතුටු වනු ඇතිද?

වාරය අවසාන දවස එළඹුණා. ට්‍රන්ක පෙට්ටි අසුරා ගැනීමේදී අවසාන මොහොතේ ඇතිවන චකිතය හා ඒවායේ නැතිවුණ යතුරු සොයා ගැනීමේ අරගලය මහත් විනෝදයක් වුණා. මුළු පාසලම එකම සර්කස් පිටියක් මෙන් දිස් වූ අතර උතුරු, දකුණු, නැගෙනහිර හා බටහිර කුලුනුවල සිටින සියලු දැරියන් එකම රොත්තක් ලෙස සෑම තැන පොකුරු ගැසී සිටියා.

"හැමදාම මේ අන්තිම දවස කාටත් පිස්සු හැදෙන දවසක්" මහත් උද්‍යෝගයෙන් යුතුව දුව පනින දැරියන් අතරින් තම මග



පාදාගෙන යමින් හති දමන මම්සලී කිව්වා. "ඩැරල් ! සැලී මට යන්න ඉඩදෙනවා ද? ඕ, මේ කෙල්ලෝ"

ඔනෑම කලබලයකදී ශාන්තව හා කාර්යක්ෂමව කටයුතු කරන පොට්ස් ගුරුතුමිය දෙමාපියන් සමග මෝටර් රථවලින් යන දැරියන්ගේ නම්වලට ඉදිරියෙන් හරි ලකුණක් දමා ගනිමින් ඔවුන්ගේ බෑග හා නැතිවූ යතුරු භාර දෙමින් උතුරු කුලුනේ සිටින සාන්තුවරියගේ කාර්යය ඉටු කරමින් සිටියා. නේවාසිකාගාර පාලිකාව පවා තම බඳ පටියෙහි රඳවාගෙන තිබූ ඇඳුම් ලයිස්තුවට අනුව දැරියන්ගේ ඇඳුම් ලබා දෙන අතරේ ඉවසිලිවන්තව කටයුතු කළා.

දුම්රියෙන් යන දැරියන් රැගෙන යාමට බස් රථ එකින් එක පැමිණුණා. "එන්න, ඩැරල්" සැලී කෑ ගැසුවා. "අපි ඉස්සරහා සීට් එක අල්ලා ගනිමු. කෝ මේරි ලෝව්?"



"එයා කාර් එකේ යන්නේ" ඩැරල් හඬනගා කිව්වා. "හායි ! මේරි ලෝව්, ආයුබෝවන් ! ඔයාගේ තොරතුරු දන්වලා මට ලියුමක් එවන්න. ආයුබෝවන් !"

"හරි, දැන් එන්න" පොට්ස් ගුරුතුමිය කෑ ගැසූ අතර ඇරියෝ කඩිමුඩියේ බස් රථවලට නැඟ ගත්තා. "මේ ඇලිසියා කොහේ ද? එයා ආයෙත් අතුරුදහන් වුණොත් මට ඇත්තටම පිස්සු හැදෙයි. ඇලිසියා! ඉක්මනට නගින්න. ආයෙත් බහින්න එපා. ආයුබෝවන්, ළමයි. හොඳින් ඉන්න. ඊළඟ වාරයේ දී ලෙඩ හදාගෙන එහෙම එන්න එපා"

"ආයුබෝවන්, පොට්ටි. ආයුබෝවන් !" ඇරියෝ මොර දුන්හ "අපේ පොට්ටිට ආයුබෝවන් !"

"දෙවියනේ !" මින් පෙර පොට්ස් ගුරුතුමියගේ මුහුණ ඉදිරිපිටම එසේ අමතනු අසා නොතිබුණ ඩැරල්ට කියැවුණා "මෙයාලා බය නැති හැටි"

"නිවාඩුවට ආයුබෝවන් කියද්දි විතරයි අපි එහෙම කියන්නේ" සිනාවක් නැගූ ඇලිසියා කිව්වා. "එයා ඒක ගණන් ගන්නේ නැහැ. බලන්න. එයාගේ මුහුණේ තියෙන හිනාව"

ඩැරල් බස් රථයෙන් හිස පිටතට දැම්මා. "ආයුබෝවන් පොට්ටි" ඈ කෑ ගැසුවා. "ආයුබෝවන් ! ආයුබෝවන්, මැලෝරි ටවර්ස්" ඈ කෙඳිරිලි හඬින් කිව්වා. "මම ආයෙත් ඔයාව දකින්න සතුටුයි."

ආයුබෝවන් ! නැවත හමුවන තුරු ආයුබෝවන්. ඩැරල්. සැලී හා සියලු දෙනාට එතෙක් වාසනාවන් !

මීළඟට මැලෝරි ටවර්ස් පාසල - 02

**"පොඩි හොරකමක්"** තුළින් හමුවෙමු.